## 2025 ජුලි මස 15 වන දින පෙරවරු 9.30 ට
## මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
## මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ජේ.ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජේ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි තිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝජන ප්‍රියදර්ශන අවන්තිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජීත් සිල්වෙස්ටර් ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ගෝමිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා වීරරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න අබේවික්‍රමාරච්චි මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ජේ. හර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ජේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ජේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | සුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ෆෙරෝසන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලීප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්ඩිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි එම්. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. මසඳ හර්ෂණ එදිරිනෝවා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදර්ශ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | පූ. සුදත් ශ්‍රියශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | පූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | පූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිලිනී ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මජිනා බන්කාර් මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුමාරි මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. විදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් අජිත්කුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. ජොයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රසාද් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී. වෙලින්ටන් හිමාෂ ක්‍රිස්ටිල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරීෂ් චන්දන පිලානාවිතානගේ මහතා |
| 48 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. දිනුෂි කෞශල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්. චිලිනි තොප්සරණී මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. පී. තාරකා ගුණසිංහ මහතා විසින් 2025.07.15 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 01. වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.

2025.06.24 දින පැවති මාසික මහා සභා වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2025.06.24 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය මහා සභා වාර්තාවේ මගේ කතාව තියෙනවා. 26 පිටුව ඒ පිටුවේ ග්‍රාමීය නියෝජනය කරන ගෞරවනීය ගම්පොළ සුමනධජ නායක ස්වාමීන්වහන්සේ කියලා තියෙන්නේ නමුත් එය සුමනධජ ස්වාමීන්වහන්සේ විය යුතුයි. ඒ වගේම කාඩිලාන මීසම් සේවක ගෞරවනීය නිව් කැමිලස් පියතුමා කියලා තියෙන්නේ, එය ලියෝ කැමිලස් පියතුමා ලෙස සඳහන් වෙන්න ඕනෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පළමුව අද ඔබතුමාට වෙලාව වැරදිලා තිබෙනවා හවසයි කියල නොවෙයි ඔබතුමා නවයයි විසි හයටයි සභාව පටන් ගත්තේ. විනාඩි හතරක් ඔබතුමා කලින් ඇවිල්ලා ගරු නගරාධිපතිතුමනි, මහා සභා වාර්තාවේ 34 පිටුවේ නාගරික ලේකම්ගේ ප්‍රකාශය සඳහන් වෙනවා ආඥා පනතේ 26 වගන්තියේ, 26 වගන්තිය ගැන නොවෙයි අපි කථා කළේ 26(3) වගන්තිය ගැනයි අපි කථාකළේ. මෙහි තිබෙන කරුණු සම්බන්ධයෙන් පොඩි ගැටලුවක් තියෙනවා එතුමා කියපු කද්වල්ල්ම ද මෙහි තියෙන්නේ කියලා. අනාගතයේ වුණත් එය සංශෝධනය වෙන්න ඕනෑ .

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 42 මගේ කතාවේ තියෙනවා 8 වන පේළියේ විල්චින් සිල්වා සහෝදරයා කියපු කරුණු අනුව මම කියපු එකක් තියෙන්නේ. ඔහු නිතරම කියනවා මෙහි තියෙන්නේ අපි ඔය කියලා පරිපාකේද වටනායක්. වෙනස් වෙන්න ඕනෑ, අපි අය වෙනස් කිරීමට

ප්‍රථම එම ලේඛනය තමා තුළ ඇති කර ගන්න. ඊට පසුව එහි පහළ පේළියේ තියෙනවා උතුමාගේ භාවිතාව නොවෙයි ඔබතුමාගේ භාවිතාව. ඊතුමාගේ කියන එක සංශෝධනය වෙන්න ඕන ඔබතුමාගේ කියලා. ඒ වගේම එම පිටුවෙම අවසානයේ පහළ ඉඳලා ගත්තොත් 2 වන පේළියේ එහි තියෙනවා ඔබතුමන්ලා. එයට එකතු විය යුතු කාරණාවක් තියෙනවා ජනාධිපතිවරණයේදී හා මහා මැතිවරණයේදී ජනතාවට කියපු කාරණා ඒ කියපු දේවල් එක්ක යන්නම කියලා එහෙම තියෙන්නේ. ඔය සංශෝධන ටික තමයි මගේ තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.සී. ශෙහාන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සභා වාර්තාවේ 20 වෙනි පිටුවේ මහජන උපයෝගිතා, කාන්තා හා ළමා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීමේදී සාමාජික අංක 02 යටතේ නියෝජ්‍ය නගරාධිපති එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා කියලා සඳහන් වෙන්නේ. එය මහා නගර සභා මන්ත්‍රී එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා ලෙස සංශෝධනය විය යුතුයි. ඒ වගේම පිටු අංක 65 එහි තියෙනවා මගේ කථාවේ අපිට පොදු නායකයක් නැහැ අපිට පොදු දේශපාලනයක් නැහැ කියලා. එය සංශෝධනය වෙන්න ඕනා, අපිට පුද්ගලික නායකයක් නැහැ අපිට පුද්ගලික දේශපාලනයක් නැහැ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 39 වෙනි පිටුවේ විශේෂයෙන් 02 වෙනි ඡේදයේදී මම සඳහන් කළා උත්සව ගැනීමක් විදියට ආතර් සී ක්ලාක් මහත්තයාගේ ද ඩීප් රේන්ජ් කෘතිය කියලා එහි තියෙන්නේ ඩීප් ත්‍රීම් කියලා. එය නිවැරදි විය යුතුයි. 39 අන්තිම ඡේදයේ තියෙනවා එහි හිටපු කොමසාරිස් කියලා තියෙන්නේ එය හිටපු කොමසාරිස් මාන්නප්පෙරුම මහත්තයා කියලා මම සඳහන් කළා. එය හිටපු නොවෙයි හිටපු විදියට නිවැරදි වෙන්න ඕනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. චමුන් ශරාමේල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 52 වෙනි පිටුවේ මගේ කථාවේ 11 වෙනි පේළියේදී තියෙනවා ඉදිබැද්ද බලාසිලුන් පල්ලියේ ශ්‍රීරෝද රථ සංගමය කියලා එහෙම එකක් නෑ. ගරු නගරාධිපතිතුමනි, මම කිව්වේ බලාසිලුස් මංසන්ධියේ ත්‍රීරෝද රථ සංගමය කියලා. එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සලසන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - ජේ.ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මටත් සංශෝධනයක්. දහවෙනි පිටුවේ තැන් කිහිපයක ජාතික ජන බලවේගය කියලා තිබෙන තැන් ගණනාවක ජාතික ජල බලවේගය කියලා තිබෙනවා. එය සංශෝධනය වෙන්න ඕනෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2025.06.24 දින පැවති මාසික සභා වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගත යුතුයැයි යෝජනා කරනවා.

මහා නගර සභා මන්ත්‍රී ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2025.06.24 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකච්ඡන්දව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u> :-

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

02(1) ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන් සියලුම මහා නගර සභා මන්ත්‍රීවරුන් වෙත දැනුම්දීමක් කරනවා වත්කම් බැරකම් ප්‍රකාශවල ආකෘති පත්‍ර ලබාදීම අද දින සිදු කරනවා. එම ආකෘති පත්‍ර කඩිනමින් සම්පූර්ණ කරලා 2025 ජූලි 31 දිනට රැස්වීම් අංශය වෙත ලබා දෙන්න කියලා දැන්වීම කරනවා.

02(2) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,පළාත් දෙපාර්තමේන්තුව විසින් අභිනව මහා නගර මන්ත්‍රීවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025 ජූලි මස 21, 22 දින පැවැත්වීමට නියමිත බව අප වෙත දැනුම්දීලා තිබෙනවා. ඒ පිළිබඳව නිල වශයෙන් දැනුම්දීමෙන් පසු මම සියලු දෙනාටම ඒ සම්බන්ධව විධිමත් දැනුවත් කිරීමක් කරනවා.

02(3) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අභිනව මහා නගර සභා මන්ත්‍රීවරුන් වෙත රාජකාරී තොරතුරු කඩිනමින් සන්නිවේදනය කිරීම සඳහා වට්ස්ඇප් සමූහයක් ආරම්භ කිරීමට අදහස් කර තිබෙනවා. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ වට්ස්ඇප් දුරකථන අංක, ලබා දී ඇති ආකෘතිය මඟින් සටහන් කර එවන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිනවා.

02(4) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුන් වෙනුවෙන් මේ සභාව මඟින් ඔබගේම ඉල්ලීමක් පරිදි, මෙම සභාව මඟින් සංවිධානය කරන දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සංසදයේ සම්පත් දායකත්වයෙන් 2025.07.29 වන දින පෙරවරු 9.00 සිට පස්වරු 12.30 දක්වා මොරටුව මහා නගර සභාවේදී පැවැත්වීමට අප කටයුතු යොදා තිබෙන බැවින්, ඒ සඳහා සහභාගීවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රීවරුනි, සභාවේ ඉදිරි වැඩ කටයුතු කර ගැනීමේදී ඉතා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා හැම දෙනාගේම උදව් අවශ්‍යයි කාලය කළමනාකරණය කර ගන්න. මම හිතනවා 2.30 ත් 3.00 ත් අතර කාලේක සභාව අවසන් කර ගැනීමට පුළුවන්කම තිබෙනවානම් අපි කාටත් හොඳයි.

## 03 සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

### 03(1) මහා නගර සභා මන්ත්‍රී - බී. සමින්ත සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, තෙලවල විජයරූපාරාම ධර්මායතනයේ ස්වාමීන් වහන්සේ විසින් සටහ ඔබතුමා මුණ ගැසෙන්න උත්සාහ කළා. ඔබතුමාගේ කාර්ය බහුලත්වයත් එක්ක එය බැරි වුණා. උන්වහන්සේ අපිට ලිපියක් යොමු කරලා තියෙනවා මීට පෙර අවස්ථාවකදී මෙම සභාවේදී සම්මත වූ යෝජනාව යෝගාශ්‍රම මාවත විජයරූපාරාම විහාර මාවත නමින් නම් කරලා පළාත් සභා අනුමැතියටත් යවලා යෝජනා සම්මත වුණ එකක්. එය තාම ඒ නමින් නම් කරලා නැති නිසා උන්වහන්සේ ඉල්ලීමක් කරලා තියෙනවා විශේෂ අවධානය පිණිසයි. තෙලවල විජයරූපාරාම ධර්මායතනය ප්‍රදේශයට පළාතට සුවිශේෂී ශාසනික, ජාතික, ආගමික සාමාජීය ආලෝකවත් කරන සියලු ජනකායගේ ප්‍රසාදයට පත් ආගමික කේන්ද්‍රස්ථානයකි. අප ධර්මායතනයේ උපසපන් භික්ෂූන්වහන්සේලා සය නමක් සහ සාමණේර හිමිවරුද ඇතුළුව විසි නමක් ආසන්න විනයගරුවන වැඩසිටින අතර, තුන් එක් නමක් පරිවේණාචාර්යවරයෙකු ලෙස සේවය කරයි. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තුන් නමක් පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාලයන්හි විද්‍යාර්ථීන් වන්නෙය. අනෙකුත් හිමිවරු කොළඹ විද්‍යෝදය පිරිවෙන පානදුර, පරත්ත ශ්‍රී විමලකීර්ති පිරිවෙන යන ආයතනයන්හි පිරිවෙන් අධ්‍යාපනය ලබති. එම කාරණය ද අප ධර්මායතනයේ පවත්වාගෙන යනු ලබන විජයානන්ද දහම් පාසලද ප්‍රදේශයට විශාල සම්පතක් වන බැවින් ද, ප්‍රසාදයට ලක්වීමට හේතු වී ඇත. අප ධර්මායතනයට තෙලවල සංඝාරාමයේ සිට පිවිසීමට ඇති මාර්ග එවකට නම් කර ඇත්තේ යෝගාශ්‍රම මාවත නමිනි. එයට හේතුව වන්නේ එවකට මෙම විහාරස්ථානය යෝගාශ්‍රමය නමින් හැඳින්වූ නිසාවෙනි. එහෙත් මෙවැනි සංකීර්ණ ප්‍රදේශයක යෝගාශ්‍රමයක් මෙවත් භාවනා යෝගී භික්ෂූන්

වහන්සේලාට වැඩ සිටීමට ස්ථානයක් යෝග්‍ය නැති බැවින්, එකී ධර්මායතනාධිපතින් වහන්සේ ලෙස පත් වූ පසු සියලුම විහාරාංගයන්ගෙන් සමන්විත අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට නව දැක්මක් සහිතව සංවර්ධනය වෙමින් යන අතරතුර, එකී නාමය විජයරූපාරාම ධර්මායතනය නමින් නාම කරන ලෙස උන්වහන්සේ ඉල්ලීම් කරන්නේ ඉතා දීර්ඝ වශයෙන් තියෙනවා. එහෙත් මම දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන්නේ නැහැ. නමුත් ඒ විහාරස්ථානයෙන් අද ඒ ප්‍රදේශයට විශාල වැඩ කොටසක් සිදු වෙලා තියෙනවා. සම්පූර්ණ කරපු විහාරස්ථානයක් බවට ලෙසට පත් වෙලා විශාල සේවයක් උන්වහන්සේ සිදු කරනවා ඒ ප්‍රදේශයේ ජනතාවගේ පහසුවකට ආසන්න ජනතාවක් අත්සන් කරලා ඒ ඉල්ලීම තැබූ එදා සම්මත වෙච්ච විජයරූපාරාම ධර්මායතන විහාර මාවත නමින් නාම කරලා නාම පුවරුව සවි කරලා දෙන්න කියලා. අපේ මේ සභාවේ විශේෂ අවධානය යොමු කරලා උන්වහන්සේගෙන් ඒ ප්‍රදේශයට, සමාජයට දුන් සේවයක් අගය කිරීමක් වශයෙන් ඒ කටයුත්ත සිදු කරලා දෙන්න. මීට පෙර අවස්ථාවක එය යෝජනා සම්මත වෙලා පළාත් සභාවේ ආණ්ඩුකාරතුමාගේ සහ මහා ඇමතිතුමාගේ අනුමැතියටත් යවලා යෝජනා සම්මත වුණ දෙයක්. ඒ නිසා එයට අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

03(2) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. මසඳ හර්ෂණ අලහකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, රත්මලාන, බොරුපන පාර, ජනප්‍රිය මාවත පිළිසකර කිරීම සම්බන්ධව ජනප්‍රිය මාවත පදිංචිකරුවන්ගේ සංසදය විසින් මා හට ලිපියක් එවලා තියෙනවා. මම ඔබට එය බලන්න. ඒ පාර ගන්නම දෙයක් නෑ, පයින්වත් යන්න බැරි තත්ත්වයක තියෙන්නේ. මේ ව්‍යාපෘතිය වයිනාවියේ පුද්ගලික සමාගමේ තමයි ඉංජිනේරු මම කථා කළා. එයාලට තියෙන්නේ නළ පද්ධතිය සකස් කරන්න විතරයි. ඒ නිසා එය හදන්න විදියක් නැහැ. එය මහා නගර සභාවේ කටයුත්තක් කියලා. මෙය අවුරුදු 02 ක කාලයක ඉඳලා ප්‍රතිසංස්කරණය කරලා නැහැ නගරාධිපතිතුමනි. එම නිසා බොරුපන ජනප්‍රිය මාවත කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලමින් සියලුම නිවාසවල සියලුම ගෘහ මූලිකයින්ගේ අත්සනින් අපට ලිපියක් යොමු කරලා තියෙනවා. ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරලා බොරුපන ජනප්‍රිය මාවත පිළිසකර කරදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. තව දෙයක් තමයි උස්වත්ත 2 වන පටුමගේ වීථි නාම පුවරුවක් නොමැති බැවින්, නාම පුවරුවක් සවි කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති අතර, ඒ සඳහා මූල්‍යමය දායකත්වයක් එකී පෙදෙසේ පදිංචිකරුවන් විසින් දරන බවත්, එම කටයුත්ත සිදුකිරීම සඳහා අවසර ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒවනි එක පාරේ නාම පුවරුවක් නැහැ. ඒගොල්ලොන්ම නාම පුවරුව සවි කර ගනී. ඒ සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

03(3) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අභියාචනයක් තියෙනවා. 8/2 හෝලිෆැමිලි ඇවනිව්, මොරටුව කියන ස්ථානයේ පදිංචි පුද්ගලයෙක් ඉදිරිපත් කරනවා. තමන්ගේ නිවසට යාබදව මෙය ඉදිරිපත් කරන්නේ නිශාන් ජයවර්ධන කියන මහත්මයා. තමන්ගේ නිවසට යාබදව හෝලිෆැමිලි ඇවනිව් එකේ පවත්වාගෙන යනවා වෑල්ඩින් වැඩ පළක්. ඒ නිසා විශාල ශබ්දයක් අල්ලපු ගෙදර ඉන්නෙක් එක සිත්තිතයක් වෙන් වෙලා තියෙන්නේ අල්ලපු ගෙදර ඉන්න බැරි තත්ත්වයට පත් වෙලා තියෙනවා. එතකොට ඒ අදාළ කර්මාන්ත ශාලාවට එහෙම නැත්නම් වැඩ පළට මහා නගර සභාව වෙළඳ බලපත්‍රය දීලා තියෙනවා. හැබැයි අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තයෙක් ඒ පැත්ත පළාතකට ගිහිල්ලා නැහැ බලන්නවත්. බලන්නවත් ගිහිල්ලා නැහැ. මෙය එකක් තමයි පරිසර බලපත්‍රයක් ලබාගෙන නැහැ. එහින් එක තමයි මේ මිනිස්සුන්ට දවල්ටවත් ගෙදර ඉන්න බැරි තත්ත්වයට පත් වෙලා තියෙනවා. මේ මිනිස්සු මානසිකව වැටිලා තියෙනවා මාර විදියට. ඒ නිසා ගරු ඔබතුමා එන්නත් මේ ගැන සාකච්ඡා කරලා තියෙනවා කියලා කිව්වා ඔබතුමා මේ

සම්බන්ධයෙන් අවබෝධයක් ඇතියි කියලා හිතනවා. මේ ශෝලී අනුප් මාවත පැත්ත කර්මාන්ත පුරයක් නොවෙයි. මෙය නේවාසික කලාපයක්. ඒක නිසා මෙහි කර්මාන්තයක් කරනවානම් කරන්න පුළුවන්නම් වෙන්නේ, අනිත් මිනිස්සුන්ට කරදරයක් නොවන ආකාරයට. අනිත් පැත්තෙන් කරනවා නම් අපි කියන්න පුළුවන් වෙන්නේ කර්මාන්ත පුරයකට වෙන් කරලා තියෙන්නේ කියලා. මෙය කර්මාන්ත ප්‍රදේශයකට වෙන් කරලා නැහැ. ඒ නිසා කරුණාකරලා ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරලා මේ මිනිස්සුන්ට නිදහසේ ජීවත්වීමට වටපිටාව සකස් කරලා දෙන්න. එර මනුස්සයා හමිට කර ගන්නට කමින් වගේ ඒ මනුස්සයා කියන්නේ නවත්වන්න බෙලෙයි මේ එක සද්දේ නවත්වලා දෙන්න කියලා කියන්නේ. ඒ මනුස්සයා එච්චර කුහක නැහැ. මේ සද්දේ නවත්වලා දෙන්න එයාට අවශ්‍ය උපදෙස් මහා නගර සභාව හරහා ලබාදීලා එයාට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා ඉල්ලීම කරනවා.

03(4) මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මුබීනා බක්කුර් මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, අභියාචනයක් ලැබිලා තියනවා.මොහොමඩ් රිෂාඩ් වන මා කටුබැද්ද සුපර් මාර්කට් හි පැරණි ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 31 දරණ ස්ථානයේ බොහෝ කාලයක් වෙළඳාම් කරමින් සිටි බවත්, එම පැරණි සුපර් මාර්කට් ගොඩනැගිල්ල ඉවත් කර නව වෙළඳ සංකීර්ණය ඉදි කළ පසු සියලුම වෙළඳාම් කළ අයට නව කඩ කාමර ලබා දුන්නත්, මා හට කඩ කාමරයක් ලබා නොදීම් හේතුවෙන් මා ඉතා දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටිමි. මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කර යෝග්‍ය කඩකාමරයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි. මේ සම්බන්ධව 2023 මහා සභා රැස්වීමේදී මම කතා කරලා තියෙනවා. 2023 ජනවාරි මාසයේදී, ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා කියනවා. සියලු දෙනාටම කඩකාමර ලබා දෙන අවස්ථාවේ මේ වෙළඳ ව්‍යාපාරිකයාට කඩකාමරයක් ලබා දෙන්නේ නැහැ. එතකොට මම මේ සම්බන්ධයෙන් කරුණු විමසන විට කිව්වා මිනු හරක් මස් විකුණනවා නිසා, සුපර් මාර්කට් එකේ හරක් මස් විකුණන්න බැහැ. ඒ නිසා කඩකාමරයක් ලබා දෙන්න කරලා නැහැ කියලා. මේ ව්‍යාපාරිකයා අවුරුදු ගණනාවක් තිස්සේ වෙළඳාම් කරනවා මේ සුපර් මාර්කට් එකේ. නමුත් එතුමාට තාවකාලිකව ගෙනල්ලා දානවා කටුබැද්දේ ජංෂන් එක ළඟට. ඒ අවස්ථාවේ කියන්න තිබුණා අපි සුපර් මාර්කට් එක ඩිසයින් කරනකොට එහි හරක්මස් විකුණන්න බැහැ කියලා. නමුත්, ඒ පිළිබඳව එතුමාට දැනුම් දෙන්නේ නැහැ. තාවකාලික කඩකාමරයක් දෙනවා ජංෂන් එක ළඟ. නමුත් අලුත් තැන එයාට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. එතකොට අවුරුදු 2 ½ ක් වෙනවා. තව වෙනතුරු එතුමාට පිළියමක් දීලා නැහැ. නැත්නම් අපිට කියන්න තිබුණා. මේ ව්‍යාපාරිකයා 2023 සැප්තැම්බර් මාසය වෙනකම් රු. 22,200/- ක මුදලක් මහා නගර සභාවට කුලියක් වශයෙන් ගෙවනවා. නමුත්, එතුමාට කඩ කාමරයක් නැහැ. ඇයි මේ අසාධාරණය ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

03(5) ගරු නියෝජ්‍ය නගරාධිපති - එච්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම්, පැමිණිලි යටතේ කාරණා කිහිපයක් තියෙනවා ඉදිරිපත් කර ගන්න. පළමුවෙනි එක එගොඩහේන ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන්නේ, වසා තිබෙන කානුවක් නැවත යථා තත්ත්වයට පත්කර ගැනීම සම්බන්ධයෙන්. එගොඩහේන ගම පියසට ඇතුළුවන මාර්ගයේ ආරම්භයේදීම පැළ දක්වා ඇති කානු පද්ධතිය එම මාර්ගයේ සිටින අය විසින් මේ වනවිට වසා දමා තිබේ. එම නිසා අධික වැසි පවතින අවස්ථාවල කානු උතුරා ගොස් එගොඩහේන ප්‍රදේශයේ සිටින ජනතාවට දැඩි ලෙස පීඩා විඳීමට සිදු වී තිබේ. අප ගම්වාසීන් පත් වී ඇති අපහසුතාවය සලකා මේ තත්ත්වය මගහැර දීමටත්, වසා තිබෙන කානු පද්ධතිය විවෘත කරදීමට කටයුතු කරන මෙන්, ඔබතුමා කාරුණික අවධානය යොමු කරන මෙන් සියලු ගම්වාසීන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා කියලා මෙවාසීන් අත්සන් කළ පෙත්සමක් මම මෙය සභාගත කරනවා.

03(6) ගරු නියෝජ්‍ය නගරාධිපති - එච්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, චින්තක දේශප්‍රිය, සභාපති, අරුණෝදය ප්‍රජා සංවර්ධන සමිතිය තමයි ඉදිරිපත් කරන්නේ, බොරුපන රාජසිංහ මාවතෙහි අතුරු මාර්ගයේ කානු පද්ධතිය සකස් කර ගැනීම

සඳහා. මොරටුව මහා නගර සභාවෙහි එක් සීමාවක් වන මොරුපන කොට්ඨාසයෙහි, රාජසිංහ මාවතෙහි අතුරු මාර්ගයේ දිගේවන කාණු පද්ධතිය මොරුපන ප්‍රධාන මාර්ගයේ සිට ගෙත්සිරි මාවත හරහා මංතෙල් මාවත තුළින් වේයස් ගඟට ගලා බැසීම සිදුවේ. මෙම කාණු නිසියාකාරයෙන් නොමැති බැවින්, කුඩා සුළු වැසි තත්ත්වයකදී පවා මාර්ග ගණනාවක් ජලයෙන් යට වී ගමනාගමනයට මෙන්ම අවට ජනතාවට ද මහත් අපහසුතා රැසකට මුහුණ පාමින් සිටී. මෙම අපහසුතාවය මග හරවා ගැනීම සඳහා මෙම අතුරු මාර්ගයේ කාණු පද්ධතිය නිසියාකාරයෙන් සකස් කර, කොන්ක්‍රීට් ලැලි දමා වැසීම තුළින් කාණුවට කුණු එකතුවීම අඩුවන අතර, එහි අළුත්වැඩියා කර ගැනීමට හැකි අතර, එමගින්, ජනතාවට ලැබෙන ප්‍රතිලාභය අතිමහත් වේ. එබැවින්, ඔබතුමාගේ අවධානය යොමු මෙම කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

03(7) <u>ගරු නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. පුනාශණී විකුම්සිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම විසින් ඉදිරිපත් කරන ඉල්ලීමක්, මෙම ඉල්ලීමේ කාරණය මම කෙටියෙන් පැහැදිලි කරන්නම්. අපි පසුගිය ජූලි 04 වෙනිදා හා ජූලි 09 වෙනිදා මහජන උපයෝගිතාව කමිටුව හරහා අපේ මොරටුව මහා නගර සභාව මගින් පාලනය වන පෙර පාසල්වල නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඒ නිරීක්ෂණ චාරිකාවේදී අත්දැකීම්වලට ලැබුණු කරුණක් සම්බන්ධයෙන් තමයි මම මේ ආයාචනය කරන්නේ. ගරු නගරාධිපතිතුමනි, අපි ඒ චාරිකාව යද්දී මොරටුව වැල්ල තීරුවේ පෙර පාසල් වලට යනකොට හරි අනාවාවික අත්දැකීමක් තමයි තිබුණේ. එහිදී දැන ගන්න ලැබුණා අපේ පෙර පාසල් වලට එන සමහර දරුවන්ට මේ වෙනකොට උප්පැන්න සහතිකයක් නැහැ. දෙමව්පියන්ගේ නොසැලකිලිමත් භාවය සහ එම දෙමව්පියන් අඩු වයසේ දෙමව්පියන්, එයාලා මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා මේ කාරණා නිසා එයාලා මේ දරුවන් මත දක්වන ප්‍රතිචාරය මට වචන කියන්න අත්හරන්නේත් නැහැ. එහි අඩුවක් තියෙනවා දෙමව්පියෝ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා දරුවෝ බලා ගන්න කෙනෙක් නැහැ. ඒ දරුවන්ට උප්පැන්න සහතිකයක් නැහැ. ඒ උප්පැන්න සහතිකය නැති නිසා අපි පුංචි ලිය කියවිල්ලක් දීලා පෙර පාසලට ගන්නවා. ඊට පසුව එම ලියකියවිල්ල අදාළ වෙන්නේ නැහැ දරුවට පාසලට යන්න. දරුවා පාසලට භාර ගන්න ක්‍රමයක් නැහැ. උප්පැන්න සහතිකය නැති නිසා ඒ නිසා දරුවෝ පාසලට ඇතුළත් වෙන්නේ නැහැ. ඒ දරුවන්ගේ ජීවිත එතනම සිරවීම් එතනින් නවත් වෙනවා. ඒ නිසා මම කරන ඉල්ලීම ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා ඒ වගේ දරුවෝ සැලකිය යුතු ප්‍රමාණයක් ඇති. ඒ පෙර පාසලට ගියාට පසුව එය හද කම්පාකාරී සිද්ධියක්. ඇත්තටම හරි අමාරුයි. ඒ නිසා ඉල්ලා සිටින්නේ අපි සභාවක් විදිහට මැදිහත් වෙලා අපිට පුළුවන් නම් සමාජ සේවා කාර්යාල හරහා, අපේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් හරහා මෙවැනි දරුවන් පිළිබඳව ගන්න වාර්තාවක්. එහෙම වාර්තා අරගෙන අදාළ ආයතනත් මැදිහත් කරගෙන අපි ඒ දරුවන්ට උප්පැන්න සහතිකයක් ලබා දෙන තැනට කටයුතු කරන්න කියන ඉල්ලීම තියෙන්නේ. ඊටත් එක්ක සමහර දරුවන්ගේ දෙමව්පියෝ අම්මා, තාත්තා දෙන්නම සිරගත වෙලා ඉන්නේ, ඒ දරුවන්ව බලා ගන්නවත් කෙනෙක් නැහැ. ඒ දරුවන් හරිම අනාරක්ෂිත තැනක ඉන්නේ. එවැනි දරුවන් පිළිබඳව සොයා බලලා, අදාළ ආයතන මැදිහත් කරගෙන, ඒ දරුවෝ ආරක්ෂා කරගන්න මොකක්ද කරන්න පුළුවන් කියලා ඒ ගැන අවධානය යොමු කරන්න කියන ඉල්ලීම තමයි මේ ආයාචනයෙන් කියවෙන්නේ.

03(8) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. නිලංකමිහිර් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දිගින් දිගටම මේ සභාවේ කටයුතු කර ගැනීම සඳහා කාලය කළමනාකරණය කර ගනිමින් සහයෝගය දක්වන්න කියලා ඔබතුමා ඉල්ලීම කළා. මේ වෙනකොටත් ඔබතුමාගේ පාලනය ගෙන යාම සඳහා අපි උදව් කරමින් පවතිනවා. හැබැයි එක අතකින් අපි කණගාටුදායක තත්ත්වයට පත් වෙනවා. එහෙම තත්ත්වයක් තිබියදීත් ඔබතුමා මහජන ඡන්දයෙන් ජයග්‍රහණය කළ අපේක්ෂකයෙක් හැටියටත්, මන්ත්‍රීවරයෙක් හැටියටත්, ඔබතුමාගෙන් අපේ ගමට සිදු විය යුතු කරුණු කාරණා ඔබතුමා මග හරිමින් පවතිනවා. ඔබතුමා ප්‍රායෝගිකව දන්නවා මෙම සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ජනතාවගේ කැමැත්තෙන් ඡන්දෙන් තමයි අපි මෙතැනට පත් වී තිබෙන්නේ. කුඩිමැද්ද කොට්ඨාසය දෙකම ඉඩිමැද්ද,

බටහිරින්, නැගෙනහිරින්. හැබැයි අපි ඔබතුමාගෙන මේ වනවිටත් ඉල්ලීම් රැසක් කරලා තියෙනවා. බොහොම සරල ඉල්ලීම් මාර්ගය ශුද්ධ පවිත්‍ර කරන ඒවා, මාර්ගයේ තියෙන පැළ ඒවා අපිට වහලා දෙන්න, සංවර්ධනය කරලා දෙන්න කියලා. හැබැයි ඔබතුමා ඒවා කරන්නට මැදිහත් වෙන්නේ නැතිව ඔබතුමා දිගින් දිගටම ඔබතුමාගේ වචනයක් තියෙනවා, ඔබතුමාගේ කැමැත්ත තමයි අපි හැමෝම සතුටින් ඉන්න එක කියලා. හැබැයි මේ වෙනකොට ඔබතුමා අපි ඇතුළු ඉඩිබැද්දේ ජනතාව බොහොම අසතුටුදායක තත්ත්වයකට පත් කරලා තියෙනවා. මේ මහජන ඡන්දයෙන් තේරුණු අපිට සැලකීම කරන්නේ නැතුව ඔබතුමා එන්පීපී එකේ පරාජයට පත් වූ අය හරහා අපේ ගම්වල අපි ඔබතුමාගෙන් ඉල්ලීම් කරන කාණුවක්, බෝක්කුවක් ශුද්ධ කරන්න

ගරු නගරාධිපති - කේ.සී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා. සමාවෙන්න මම ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලනවා ඔබ මට දැනුම්දීලා. යම් ලිඛිත දැනුම්දීමක් කරලා නොකරපු දෙයක් මොකක් හරි තියෙනවානම්

මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

ඔබතුමා කරපු දෙයක් මොකක්ද කියන්න. ඔබතුමාගේ අත්සනින්

ගරු නගරාධිපති - කේ.සී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

අපි ගොඩක් වැඩ කරලා දීලා තියෙනවා. කරපු වැඩ පිළිබඳවත් මට පැහැදිලි කිරීම් කරන්න පුළුවන්.

ගරු නගරාධිපති - කේ.සී. නිශාන්ත ප්‍රනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, හැමදෙනාටම උපරිම ආකාරයෙන් මහන්සිවෙලා ඒ වැඩ කටයුතු කරනවා. කැෂපේ ගැසීම නොගෑනා බොහොම සද්භාවයෙන් මම තීරීම විදියට හැමෙවින් සිට පිංදෙන විදියට මෙමෙනක් වැඩ කරලා නෑ. ඔබ දන්නවා ඔබ අපිට භාර දුන්න ආයතනය මොන මට්ටමේ ආයතනයක් ද කියලා. අපි උපරිමයෙන් මහන්සිවෙමින් සිටිනවා. මම ඕනෑ කෙනෙක් කිසි කෙනෙකුගේ වැඩ නැතුව හැරලා නෑ. බොහොම විනීතභාවයෙන් කියන්නේ. මම උත්තර දෙන්න ඕනා නෑ මේ අයිතමයට. නමුත්, මම කියන්නේ සාධාරණ වෙන්න.

මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමාගෙන් මාසයකටත් පෙර මේ ඉල්ලීම් කළේ පෙර සභාවටත් කලින් මේ වෙනකොට ඉඩිබැද්ද කුරේ ලේන් එකේ අහිතකර තත්ත්වයේ දරුවෝ ඉන්නවා. මෙම මාර්ගය ශුද්ධ පවිත්‍ර කරන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඉඩිබැද්ද මැක් වත්ත කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ වගේ ම බණ පිංකමක් තිබුණා. ඊට පසුව ගෞරවනීය ස්වාමීන්වහන්සේලාට දානමය පිංකමක් තියෙනවා. මේ මාර්ගයේ ඇළි කිහිපයක් තියෙනවා වසා දෙනන කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඉල්ලීම් භාර ගන්නවා අපි දන්නේ නැහැ ඊට මොනවද වෙනවද කියලා අද වෙනකම්. ඒ කිසි දේකට අපිට උත්තරයක් ලැබිලත් නෑ. ඒ දේවල් කරලත් නෑ. කිසි ප්‍රශ්නයක් නෑ ඔබතුමා දිගින් දිගටම මෙය කරන්න. ඔබතුමා දිගෙම කර කර කියනවා කාලය කළමනාකරණය කර ගන්න කියලයි, කතාව පවත්වාගෙන යන්නයි අපෙන් උදව් ඉල්ලනවා. හැබැයි ඔබතුමා ඉතරලා අපි මහජන නියෝජිතයෝ විදියට අපේ ගම් වලට කරන්න ඕනෑ දේවල් අපිට කරන්නෙත් නැහැ. ඒ ගැනත් හිතන්න. ගරු නගරාධිපතිතුමා පොඩ්ඩක් ඒ ගැනත් හිතන්න. අපි ඔබතුමාට සහයෝගය දක්වනවා කියලා පැහැදිලිව කියලා තියෙනවා. අපි සහයෝගය දක්වනවා. අපි ඔබතුමාලා වගේ විපක්ෂයේ ඉන්නකොට විපක්ෂයක් විදියට පිටුපස ඉඳගෙන කෑගැහුවා වගේ අපි කෑගහන්න යන්නේ නැහැ. අපහසුතාවයට පත් කරන්න යන්නේ නැහැ. වචනෙන් වචනෙට, අකුරෙන් අකුරට අපි කෑගහන්න යන්නේ නැහැ. අපිටත් අවස්ථාවක් ඉල්ලන්නේ. ඔබතුමා අපිත් මහජන නියෝජිතයෝ අපිත් ඡන්දෙන් පත්වෙච්ච අය අපිවත් මේවට සහභාගී කර ගන්න කියලා කියන්නේ. අපි ඔබතුමාට

කියන්නෙත් නෑ. සමහරක් නැහැ අරවා නැහැ මේවා නැහැ කාණු සුද්ද පවිත්‍ර කරන එකත් කරන්න ගරු නගරාධිපතිතුමා කරන්න ඇති කාමක් නැහැනේ. අපි නිව්ටවුන් එක සම්පූර්ණ පාරක් සංවර්ධනය කරලා දෙන්න ලක්ෂ ගණනක් වදන්න එක නොවෙයි අපි මේ කියන්නේ. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා අපි එහෙම දෙයක් කිව්වම ඔබතුමා, කරන වැඩ කරන්න ඔබතුමාගේ කට්ටියත් එක්ක කරන්න. අපිට හැට්ටුවක් නැහැ. අපිට ඕන ගම සුද්ද පවිත්‍ර වෙන්නයි. ඒවට අපිවත් සහභාගි කරගෙන අපිටත් දායකත්වයක් ලබා දෙන්න කියලා ඉල්ලීම කරන්නේ. ඔබතුමාලා කොච්චර මේ සභාව නියෝජනය කරත් මේ යැපේ තමයි ඔබතුමාලා මහජන නියෝජිතයන් විශේෂයෙන් ඡන්දෙන් පත් වෙලා එන්නේ. ඔබතුමාලා අවුරුදු ගාණක් තිබ්බේ එහෙම නොවෙයි. හැබැයි මම 2006 ඉඳලා, 2006, 2011, 2018, 2025 මේ ඡන්දකාලම දිනලා එන්නේ. එතකොට ඒ මිනිස්සුන්ට අපි ගැන ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. ඒ නිසා ඒ බලාපොරොත්තු ඉටු කරන්න ඔබතුමා අපිට ඒ සහයෝගය දක්වන්න කියලා ඉල්ලීම කරනවා.

03(9) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. ජෝනා දමියන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙවර විපක්ෂයෙන් තේරී පත් වූ නවක මන්ත්‍රීවරු සියලුම දෙනා වෙනුවෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් මේ නවක මන්ත්‍රීවරුන්ගෙන් චෝදනාවක් තියෙනවා ඒ අය නිලධාරීන්ගෙන් යම්කිසි ඉල්ලීමක් කරන්න සහ ඒ අය අඩු පාඩුවක් සකස් කරන්න ඉල්ලීමක් කරන වෙලාවට, ගොඩක් වෙලාවට නිලධාරීන් ගෙන් එතරම් ආන්සර් කරන්නේ නැහැ කියලා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ අදාළ අංශවල ඉන්න නිලධාරීන්ට කියන්න නවක මන්ත්‍රීවරු, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කියලා ප්‍රභේදයක් ඇති කර ගන්න එපා. පක්ෂ විපක්ෂ ආණ්ඩු පක්ෂෙට නම් ඒ ප්‍රශ්න මතුවෙන්නේ නැති වෙන්න පුළුවන්. සියලුම විපක්ෂේ මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දීලා ඒ අය වෙනුවෙන් කරන්න පුළුවන් දෙයක් සේවාවක් තියෙනවානම් ඉක්මනට සිද්ධ කරන්න කියලා. මේ සියලු දෙනාම මහජන ඡන්දය වෙනුවෙන් කැප වෙලා ඉන්න උදවිය නිසාවෙන් මම ඉල්ලීම තමුන්නාන්සේගෙන් කරනවා. මම බලාපොරොත්තු වෙනවා තමුන්නාන්සේගෙන් අදාළ නිලධාරීන්ට, ආයතන වලට මේ පණිවිඩය දෙයි කියලා.

03(10) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සභාව හමුවේ එන ආයාචනය යටතේ ලක්ෂපතිය අගුලාන යා කෙරෙන ලුනාව කලපුව හරහා වැටී ඇති පාලම් දෙකක් තියෙනවා. මේ පාලම් දෙක ඉදි කරලා වසර ගණනාවක් වෙනවා. නමුත් මේ පාලම් දෙකටම තවම විදුලිය ආලෝකය ලැබිලා නැහැ. ප්‍රදේශවාසීන් ඉදිරිපත් කරපු ආයාචනයක් තියෙනවා මේ සම්බන්ධයෙන්. ලක්ෂපතිය සහ අගුලාන යන ගම් දෙක යා කරමින් ජනතාව එදිනෙදා විශාල පිරිසක් භාවිතා කරනු ලබන මෙම පාලම් දෙක සාදා විශාල කාලයක් ගතවුවද මෙම පාලම් දෙකටම විදුලි ආලෝකය මේ තාක් ලබා දී නොමැත. පහන් කණු සිටුවා ඇතැම් තැන් සඳහා බල්බ සවිකර ඇති මුත් විදුලි සම්බන්ධතාවය ලබා දී නොමැත. පාලම මත රිය අනතුරු සමගින් සමාජ ගැටලු රැසකට ද මෙම ප්‍රදේශයේ ජනතාව ආලෝකය නොමැති හෙයින් මුහුණ දෙයි. මේ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර විදුලි ආලෝකය හැකි ඉක්මනින් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ ප්‍රදේශවාසීන් අත්සන් කරපු ආයාචනයක්.

03(11) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, තවත් ආයාචනයක් තියෙනවා. රංජිත් රණසිංහ, අංක. 140/4, ද මැල් පාර, ලක්ෂපතිය, මොරටුව කාණු පද්ධතියක් නොමැති කාමින් වැසි ජලය බැස යාමට නොහැකි තත්ත්වයක් ඇතිවීම. ඉතාමත් දීර්ඝ කාලයක් තිස්සේ ඉහත කී ප්‍රශ්නය සඳහා පදිංචි සියලු දෙනාටම මුහුණදීමට සිදු වී ඇත. වැසි දිනවල ජලය බැස නොයාම නිසා පයින් යාමට ඉතාමත්

අපහසු තත්ත්වයක් උදා වී ඇත. මෙම පාර කොන්ක්‍රීට් දමා ඇති අතර කාණුවක් බැඳීම සඳහා අතුරු පාරේ ළඟ සිට ද මැල් පාරේ කාණුව තෙක් වැලි සහිත තීරුවක් තබා ඇත. මෙම පාරේ පදිංචි අයගේ අත්සනින් යුතුව මෙම ඉල්ලීම ඉදිරිපත් කරමු. මෙලෙස කාණුවක් සකස් කර ගැනීම සඳහා ඔබතුමියගේ කාරුණික අවධානය යොමු කරන ලෙස ඉතාමත් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා. ප්‍රදේශවාසීන්ගේ අත්සන සහිත එම ආයාචනයත් සභාගත කරනවා.

03(12) <u>මහා නගර සභා මන්ත්‍රී - පූ.අතුරුමිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමිනි, මම ආයාචනා හා පෙත්සම් අයිතමය යටතේ මගේ වාචික ඉදිරිපත් කිරීමක් තියෙනවා. මොරටුව ප්‍රදේශයේ අපි නගර සැලැස්ම වැඩසටහන ක්‍රියාත්මක කරන දවසේ මොරටුව මහා නගර සභාවේ විදුලි සෝපානය අක්‍රිය වෙලා තිබුණා. ඒ වෙලාවේ විදුලි සෝපානයේ හිරවුණු අපේ මිත්‍රයා දන්නවනේ.. එය ක්‍රියාත්මක නොවීම නිසා දැඩි අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා පැය භාගයක් විතර. විදුලිය අක්‍රියවීම නිසා නමයි විදුලි සෝපානය අක්‍රිය වෙලා තිබෙන්නේ. ජනරේටරය ක්‍රියාත්මක කරන්න යනකොට ජනරේටරයත් අක්‍රිය වෙලා. විදුලි අංශයේ කැමිලස් ජනසෙනට ගිහිල්ලා මොනතරම් වෑයම් කළත් ඒ වෙනකොට ජනසෙතේ වැඩකට ගිහිල්ලා. අපි මෙය වැරදකට කියනවා නොවෙයි. මෙවැනි දේවල් මින් ඉදිරියට නොවිය යුතුයි කියන්න තමයි මම මේ අවස්ථාව ගන්නේ. ගරු නගරාධිපතිතුමිනි, කල්දෙමුල්ල ප්‍රදේශයේ මේ වෙනකොටත්, අප ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. මෙය නාමික මිත්‍රගාමී ලෙස නමයි ක්‍රියාත්මක වෙන්නේ. වසර දෙකකට වැඩි කාල සීමාවක් තමයි ව්‍යාපෘතිය කල්දෙමුල්ල ප්‍රදේශයේම නාමික එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යනවා. නමුත්, සතියකට පාරක් කැඩුවම ඒ පාරේ යන්න එන්න බෑ. ත්‍රීරෝද රථ රියදුරු මහත්වරුන්ගෙන් හැමදාම අපිට බැනුම්. ගෙම නියෝජිතයා විදියට. ඒ වගේම ඒ අසල්වැසියන්ගේ කල්දෙමුල්ල දහම් මාවත, සී.පී. ද සිල්වා මාවත, රීඩ් පෙදෙස මේ ප්‍රධාන පාරවල් තුළත් තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. මේ පාරවල් වල ඉන්න වැසියන් වෙන ජනතාවගේ හැමදාම චෝදනා එනවා. අපි වගකීමෙන් එකට කටයුතු කරනවා. ඒ නිසා ජල සම්පාදනයේ ඉන්න නිලධාරීන්ට කතා කරනවා මෙයට විසඳුමක් දෙන්න. ගරු නගරාධිපතිතුමිනි, මෙම ව්‍යාපෘතිය හොඳයි. මේ ව්‍යාපෘතිය ජනතාවට අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක්. අපිට කිසි ගැටලුවක් නෑ. අපි ඒ ආයතන වලින් ඉල්ලන්නේ මෙය ඉක්මනට ක්‍රියාත්මක කරන්න කියලා. ඔබතුමන් මේ පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න කියලා තමයි මගේ වාචික අදහස. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමිනි, කල්දෙමුල්ල ප්‍රදේශයේ සියලුම පාරවල්. දහම් මාවත නම් කාණු පිරිසිදු කළා. ඒකට පවුම්ග තියෙනවා. ඒ වගේම සී.පී. ද සිල්වා මාවත, සුධර්මාරාම පාර, ආනන්ද පෙදෙස, 4 වන පටුමග, 3 වන පටුමග, කල්දෙමුල්ල පාර ප්‍රධාන පාර මේ සියලුම පාරවල් කාලයක් තිස්සේම පිරිසිදු කිරීමකට ලක්වෙලා නෑ. ඒක නිසා ඉතා ඉක්මනින් මෙම පාරවල්වල කාණු පද්ධතිය පිරිසිදු කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. වාචික ඉල්ලීමක් කරනවා. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමිනි, කල්දෙමුල්ල ගොළුමඩම හන්දියේ ඉන්වලලාකින් අල්ලපු පාරක් තියෙනවා වසර කතිපයක පාර කියලා කාණු නැති නිසා. වැසි කාලෙට එම පාර සම්පූර්ණයෙන්ම පිරෙනවා. මෙපර යාපලක් තිබෙනවා. එකාරවීමින්ට කඳකත් තියෙනවා. තීරණ සංකීර්ණ දෙකක් තිබෙනවා ඒ පාරේ. ඒ පාරට කාණුවක් දාලා ඒ වගේම සමහර දවස් වලට සතියක් එකාකාමාරක් තිබෙනවා ඒ පාරේ වතුර. සතියකින් හරි කාමක් නෑ. ඉන්වර්ලාකින් බල් ටික ගලවලා හරි කොහොම හරි වතුර බැස යන්න ක්‍රමයක් හදන්න, එය මහා නගර සභාවක් විදියට අපි ජනතාවට කරන සේවයක් විදියට තමයි මේ පද් කරන්නේ.

03(13) <u>මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමිනි, ආයාචනා හා පෙත්සම් යටතේ මම මූලික වශයෙන් අපිට බලපානවා මහා නගර සභා ආඥා පනත, අපිත් පැත්තෙන් ආචාර ධර්ම පද්ධතිය. ඒ නිසා අපි මෙතන මහජන නියෝජිතයන් විදියට මොරටුවේ ජනතාවගේ ගෞරවය ආරක්ෂා කරන ස්වභාවයක් අපේ ඇඳුමෙන් පැළඳුමෙන් තිබෙනවා. අපේ ආචාර ධර්ම පද්ධතිය අනුව අපේ තියෙන නාගරික මන්ත්‍රීවරයෙක්නම් ඇඳින්න ඕන විදියක් තියෙනවා. ඒ වගේම අපේ මන්ත්‍රීවරියක් නම් සුදු සාරියක් තමයි ඇඳින්න ඕන. ගෙවර්ණ පැරනිට එකකට යනවා වගේ ඇඳින්න බෑ. මම මේ ගැන

කරන්නේ ඔබතුමාම මේ අඩු පාඩුව සභාව තුළ පෙන්වලා දීලා තියෙනවා. ඒ නිසා මැතිඇමති කාණ්ඩවලින් තුළ උතුර දකුණ යම් විදියකට පෙන්වන්න තමයි ඒ ආදර්ශය පෙන්නලා දීලා තිබෙන්නේ. ඒ නිසා මම සමය කියන්නේද නොකියන්නේද කියලා හිතුවේ. විධිමත් කිරීමෙන් එහාරයි අපිට මේ අඩු පාඩුව හදා ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමා මේ සභාවේ මතු කරලා තිබෙන විදියට මාලිමාවේ මන්ත්‍රීතුමියකගෙන් හෝ කාගෙන්හරි අඩු පාඩුවක් වෙලා තියෙනවානම් ඊළඟ සභාවේදී අදින්න ඕන සාරියේ වර්ණය අපිට ආචාර ධර්ම පද්ධතියෙන් කියලා දීලා තිබෙනවා. එය නිවැරදි කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මම මේ වනවිටත් ආචාර ධර්ම පද්ධතිය වෙනුවෙන් අපිට සභා ගත කරලා සියලුම මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සලස්සවනවා. සමහරක් විට නවක මන්ත්‍රීවරු නිසා මෙය දන්නේ නැහැ. ඒ නිසා එය ඔවුන්ගේ අඩුපාඩුවක් නොවෙයි. ඒ නිසා ආචාර ධර්ම පද්ධතිය පිළිබඳවත් යම් පුහුණුවක් හා මග පෙන්වීමක් කරලා ආචාර ධර්ම පද්ධතියක් ලබා දෙන්න පුළුවන්නම් ඔවුන්ට නොකාගෙනමද සභාව තුළ කටයුතු කරන්න ඕන කියන එක ගැන පූර්ණ අවබෝධයක් එනවා.

03 (14) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට ලිපියක් තමයි එවලා තියෙනවා. ලේකම්තුමා අත්සන් කරලා මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පතට සම්බන්ධයෙන්. මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත අදාළ ආයතනයෙන් ලිපි ගේන්න කියලා, තමන්ගේ නමට තියෙනවා කියලා. එහෙම එකක්නම් අපි මෙතෙක්කල් කරලා නැහැ. ඒ නිසා අපේ නමට තියෙන දුරකථන බිල අපි ඉදිරිපත් කරමින් පසුව අපි කාඩ් නම් කොහොමහරි එක කාඩ් කොහොමහරි එකට අපි මුදල් ගෙවලා ඒ අදාළ බිල්පත ඉදිරිපත් කළාට පස්සේ මහා නගර සභාව වැට් එක නැතුව රු. 6000/-ක උපරිමයකට යටත්ව ගෙවීම් කළා මෙතෙක්කල්. ඔබතුමාලා කියන්නේ යම් හෙයකින් වංචාවක් වෙන්න පුළුවන්නම්යන්, වංචාවක් කළොත් එහෙම ජීවිතේ කවදාවත්ම මන්ත්‍රීවරයෙක් වෙන්න බැරි වෙන වැඩේ වෙනවනේ අදාළ පුද්ගලයාට. මහා නගර සභාවෙන් අපිට වෙන කෙනෙක්ගේ නමට තිබෙන දුරකථන බිලකට සල්ලි ගන්න බෑ. එහෙම ගත්තොත් එය මුදල් වංචාවක්. ඒ නිසා කරුණාකරලා මන්ත්‍රීවරුව රස්තියාදු කරන්න එපා බිල් ගේන්න ආයතනවලට යවන්න ලියුම් ගේන්න. අදාළ බිල අපේ නමට එන්නේ ඒ අදාළ බිලට ගෙවීම් කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

03(15) <u>මහා නගර සභා මන්ත්‍රී</u> - එච්. <u>සුජීව් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. අද උදේ මම සභාවට එනකොට ලුනාව පාමර් පාලම් දෙපස ඔබතුමත් දන්නවා ඇති කාලපුර අසිනේ මම වගාවට එකතුවත් ගන්නා පාසල් ළමයින් යනවා බස් එනවා දෙපැත්ත පොඩ්ඩක් අවදානම් තත්ත්වයක තමයි තියෙන්නේ. කාණුව දෙපැත්ත. දරුවා පාසල් යනකොට බයිසිකල් තුමර යන දරුවෙක් බස් එක එකපාරට ඇවිත් ඔලුවෙන් බැලුවම එතන කාණ්ඩයේ තිබෙන බැම්මත් එක්ක ඒ දරුවා කාණුවට වැටුණා. මම ඔබතුමාගේ අවධානය යොමු කරලා කාලපුරවේ සිටින දිගේ කාණුවේ බැම්ම පොඩ්ඩක් උස්සලා කාණුවේ ඒ පාමර් ඒ හරිය කාලපුරවේ ඉඳලා ඉඳන් දිගටම ඒ ප්‍රශ්නේ තියෙනවා. එතන අලංකාර බැම්මක් තියෙන්නේ. ඔබතුමාගේ අවධානය යොමු කරලා ඉතා ඉක්මනින් එය පිළිසකර කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

03(16 ) <u>මහා නගර සභා මන්ත්‍රී</u> - <u>එච්. සුජීව් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2007 ලුනාව ශ්‍රී විශුද්ධාරාම පාර කියලා ලුනාව මං සන්ධියේ සිට පාර නම් කරලා තියෙනවා සජීවනී නිසංසලා මන්ත්‍රීතුමිය තමයි ඒ යෝජනාව ඉදිරිපත් කරලා මේ සභාවේ ඒකමතිකව ඒ යෝජනාව සම්මත වෙලා පාරේ නම දාලා තියෙනවා. ශ්‍රී විශුද්ධාරාම විහාර මාවත කියලා. ඊට පසුව මේ මහා නගර සභාවෙන් බෝඩ් ගහනකොට නැවත එය කැඩිලා එතැන ගහලා

තියෙනවා ශ්‍රී විශුද්ධාරාම පාර කියලා. ඒ බෝර්ඩ් එක ආයේ අබලන් වෙලා කැඩිලා තියෙනකොට ඒ බෝඩ් එක උඩින් දැන් ගිනිල්ලා අලවලා තිබුණා තියෙනවා උයන පාර කියලා. දැන් ඒ උයන පාරයි, ශ්‍රී විශුද්ධාරාම පාර බෝඩ් එක උඩින් ගෙඩියි උයන පාර කියලා අලවලා තියෙන්නේ. දැන් පාරවල් දෙකකට නම් මිශ්‍රවෙලා තියෙනවා අපේ ගෞරවනීය මන්ත්‍රීතුමත් දැක්කා. එතුමා ඒ බෝඩ් එක අරන් ගිනිල්ලා වෙනත් තැනක පයින් කරලා තිබුණා. දැන් ශ්‍රී විශුද්ධාරාම විහාර මාවත කියන එක ඇයි මේ විදියට පාරේ නම එකින් එකට අවනස වෙන්නේ කියන එකට ඔබතුමා මේය පොඩ්ඩක් බලලා එන සභාවේදී ධාර්තාවක් දෙන්න. මම ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නේ ශ්‍රී විශුද්ධාරාම විහාර මාවත කියලා ඒ පාරේ ඉතා ඉක්මනින් නාම පුවරුව සකසා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(17 )** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ශේෂකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අද මට උපාලකඩ සිරි සුමින හාමුදුරුවන් වහන්සේ ලබා දුන්නා ඒ පාරේ අතරමහියේ 8 වන පටුමග ඉදන් උන්වහන්සේගේ විහාරස්ථානයට යන පාර ශ්‍රී බෝධිරාජාරාම විහාර මාවත කියලා නම් කරලා දෙන්න කියලා එම උන්වහන්සේගේ ලිපියන් ලිපි දෙකම මම සභාගත කරනවා. ඔබතුමා ඒ ඉල්ලීම් දෙකම ඉෂ්ට කරලා දෙන්න කියලා අනුමැතිය ලබා දෙන්න කියලා මම ඉල්ලීම් කරනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - චිවන්ත සෙනෙහෙවීරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම විල්ලෝරාවත්ත අපේ ආදරණීය ජනතාව විසින් සභාවට ගෙනෙන ලද යෝජනාවක් ඉදිරිපත් කරනවා. මේ යෝජනාව ඉදිරිපත් කරන්න ඉඩ සලසලා මට යමක් කියන්න තියෙනවා. පෙර පාසලක් සම්බන්ධව අපේ විල්ලෝරාවත්තේ. මා දැක්ක පුදුම නැති එකක්. උචිත නැති එකක්. මම දන්නේ නැ පසුගිය සභාවෙන් කුමන ආධාර වර්ගයකට අනුව, ඒවට මුදල් වැය කළාද කියලා. මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා ගරු නගරාධිපතිතුමාට. ගරු නගරාධිපතිතුමා, මොරටුව මහා නගර සභාව, මොරටුව දැයට පිළිපන මිල් පරයේන්න ඉඩ නොහැකමු. දැනට විල්ලෝරාවත්ත ග්‍රාමයට ඇති නගර සභාවට අයත් එකම හා ඉතා අඩු වියදමකින් ළමුන්ට අධ්‍යාපනය ලබාදීමට ඇති පෙර පාසල දැයට පිළිපන පෙර පාසලයි. මෙම පෙර පාසල වැඩිකාලීනව පෙර ලකුණු සහල වෙමින් පවතී. පසුගිය දේශපාලකයින්ගේ අදූරදර්ශී තීරණ මත මෙම පෙර පාසල විල්ලෝරාවත්ත පුස්තකාලාව තුළ සිට මොරටුව ක්‍රීඩාංගනයට රැගෙන එන ලදී. මෙම පෙර පාසලේ වටපිටාව ගැන පිහන්නේ නම් එක් පසකින් දුගඳ හමින කාණුවකින් ද අනෙක් පසින් අනාරක්ෂිත බොල්ලොඩ ගහ තිබෙද පවතී. තවද, මදුරුවන් විශාල වශයෙන් බෝ කරන ක්‍රීඩාපිටිය කෙළවරක නියං හුදකලා ස්ථානයකි. ළමයෙකුට කිසියම් අනතුරක් හෝ අසනීපයක් වුවහොත් එය දැන ගැනීමට අවට ගම්වාසීන්ට හැකි වූයේ විශාල කාලයකට පසුවය. වැසි දිනකට නම් දෙමව්පියන් පෙර පාසලට ළමුන් රැගෙන නොයයි. එයට හේතුව ක්‍රීඩාපිටිය සම්පූර්ණයෙන්ම මඩ වගුරක් නිසාත්, මීට පෙර පෙර පාසල යටට අත්දැකීමක් ඇති නිසාය. තවද, ගුරුතුමිය පෙර පාසලේ අධ්‍යාපන කටයුතුවල නිරත වනුයේ දැඩි විසං ගෙනය. සතුරුන්, කිඹුලන් වැනි සීතාහේ සෙල්ලම් කරන නිවද සෙසන්. ගරු නගරාධිපතිතුමනි, මෙම ළමුන්ගේ අවදානම් ගැන අවධානය යොමු කර මෙම පෙර පාසල විල්ලෝරාවත්ත පුස්තකාලාව වෙත යොමු කරන්නේනම් දැයට පිළිපන මිල් දැයට විකසිත වනු ඇතැයි ගම්වාසීන් හැටියට අපහට විශ්වාසයක් පවතී.

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මේ පෙර පාසලේ දෙමව්පියන්ගේ ඒ සම්බන්ධව ඉල්ලීමකුත් තියෙනවා දැයට පිළිපන මිල් පෙර පාසල, විල්ලෝරාවත්ත මොරටුව ගරු නගරාධිපතිතුමා, මොරටුව මහා නගර සභාව. පුංචි මිල් කැකුළු වෙනුවෙන් කරන අවංක ඉල්ලීමකි. අපේ දරුවන් ඉගෙනුම ලබන දැයට පිළිපන මිල් පෙර පාසල දැනට පිහිටා ඇත්තේ විල්ලෝරාවත්ත මොරටුව ක්‍රීඩාංගනයේ කෙළවරක ඇති ඇළක් අසලය. මෙම ඇලේ දමා තිබෙන දිය බට්ටිය කොට ගැසී තිබෙන කුණු කසළ නිසා මදුරුවන් බෝවීම වැනි, විසත් ගුන්ගා වැනි රෝගයන් කෑදීමේ අවදානමද, කිඹුලන් හා නයින් වැනි සතුන්ගේ අවදානමද පවතී. තවද, පෙර පාසලට යාමට

කිසිම මාර්ගයක් නොමැති හෙයින්, වැසි දිනවලදී මඩ වන බැවින්, දරුවන් පෙර පාසලට ගෙන යාමේදී බොහෝ අපහසුතාවයන්ට ලක්වේ. පෙර පාසලත් පවත්වාගෙන යාමට තරම් දැන් මෙම පරිසරය සුදුසු නොවන බැවින්, කඩිනමින් අලුත් ගොඩනැගිල්ලට ගෙන යන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමියගේ අවධානය යොමු කරනවා. අපි ආයාචනා හා පෙත්සම් ඉදිරිපත් කරනවා නම් එහි ස්වභාවය මොකක්ද කියන එක ලුහුඬින් ප්‍රකාශ කරන්න කියලා තමයි තියෙන්නේ. සංදේශ පෙත්සම් යනාදිය කියලා තියෙනවා ස්ථාවර නියෝගවල, 8 වන පරිච්ඡේදයේ අ එකේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මන්ත්‍රීවරුන්ට සඳහන් කරන්න ආයාචනා හා පෙත්සම් කථා කරද්දී කාලය බලාගෙන කියන්නේ නැතුව ඒ අන්තර්ගතය කෙටියෙන් පැහැදිලි කරන්න කියලා.

03(19) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි. මම නියෝජනය කරන කඩුවැද්ද උතුර කොට්ඨාසයේ ආසිරි උයන ප්‍රජාසංවර්ධන සමිතියෙන් ඉදිරිපත් කරන ලද ලිපියක් ආසිරි උයන ප්‍රජාසංවර්ධන සමිතියට ඇතුළත් වෙනවා පාරවල් කිහිපයක් ඒ පාරවල් කිහිපයකම අබලන්වී තිබෙන බැවින් පිළිසකර කර ගැනීම පිළිබඳ ඉල්ලීමක්. මම හිතනවා මන්ත්‍රීතුමා කිව්ව කාරණයට හරි මම හිතනවා කාලය කළමනාකරණය කරගෙන මේක සම්පූර්ණයෙන්ම කියවීම අවශ්‍ය නැ. මම ඒ ලිපිය මේ වෙලාවේ සභාගත කරනවා ගරු නගරාධිපතිතුමනි, අපේ සභාවේ අවධානය යොමු වෙලා ඒ පාරවල් ගොඩක් වලවල් හැදිලා වැහි කාලෙට සම්පූර්ණයෙන්ම වතුර පිරිලා අනික්එක පාරවල් මුක්කම ඒකිනෙකට සම්බන්ධයි. ඒ නිසා වතුර පිරුණාම අපහසුතාවයට ඒ පැත්තේ මිනිස්සු පත් වෙනවා.

03(20) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. පුෂ්පේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිණිලි පනතමය යටතේ ආයාචනාවක් නොවෙයි පැමිණිල්ලක් විදියට මගේ කරුණ ඉදිරිපත් කරන්නේ, සියලුම දෙනාගේ දැන ගැනීම පිණිස මම කෙටියෙන් අදහසක් දක්වන්න කැමතියි මේ පෙත්සම සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමනි, ප්‍රනාන්දු සී වීඩි නිවාස සංකීර්ණය හඳුන්වන එහි නිවාස ඒකක 356 තියෙනවා. මේ 356 ක නිවාස ඒකකය හඳුන්වයි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙන් මේ නිවාස ඒකකවල ජීවත්වන ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වෙනවා නගර සභාව මගින් ඉටු කළ යුතු සේවාවන් ඉටු නොවීම සම්බන්ධයෙන්. එය විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි, මේ නිවාස ඒකක ලබාදීම සඳහා රටේ ප්‍රධාන පුද්ගලයන් හිමිපාදනා හා සියල්ල සඳහන් කරලා මේ නිවාස ඒකක වල වටිනාකමින් 25% ක් මුලින්ම ගෙවලා මේ නිවාස ඒකකය ලබන් කර ගන්නවා. තව 25% ක් ගෙවලා යතුර අරගෙන පදිංචි වෙනවා. ඉතුරු 50% බැංකුවක ණය පහසුකම් යටතේ ඒ නිවාසවාසීන්ට වාරික විදියට ගෙවන්න ලබා දෙන බවට තමයි මේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙන් ඒ නිවාස ලබා දුන්නේ. නමුත් මේ වනවිට ගරු නගරාධිපතිතුමනි මහා නගර සභාව මගින් වර්තමාන, අනුකූලතා සහතික, විධිමත්භාව සහතික මේ වගේ දේවල් නොලැබීම හේතුකොටගෙන ඒ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සම්පූර්ණ මුදල ගෙවපු අයට දුන්නත්, ඒ වගේම 50% ගෙවපු අයට දුන්නත්, සම්පූර්ණ ගෙවපු අයට ඔප්පුවක් ලබාදීලා තියෙනවා එය කිසි වැදගැම්මකට නැති ඔප්පුවක්. මොකද අපේ සභාව මගින් නිල විදියට දෙන්න ඕන ඒ සහතික දීපු නැති නිසා. ඒ වගේම 50% ගෙවපු ජනතාව මම අවුරුදු 03 ක් පදිංචියි. සමහරු අවුරුදු 04 ක් පදිංචියි. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙන්, මහා නගර සභාවෙන් මේ කොළ දැමීම හේතුකොටගෙන මම මේක පැහැදිලි කරන්නම් ගරු නගරාධිපතිතුමනි, පුංචි වෙලාවක් දෙන්න, මම මේක පැහැදිලි කරන්නම්. හැමෝටම මෙය දැන ගන්නඕන නිසා. එහි ජනතාවට විශාල වශයෙන් ලක්ෂ 06 ක, 07 ක, 08 ක දඩ පොලියක් ගෙවන්න සිද්ධවෙලා තියෙනවා. දැන් මේ නිවාස පළවෙනියෙන්ම ගන්න මොනතරම් ඉඳලා වාරික ගෙය කර ගන්න විදියක් නැහැ. බැංකු ණය පහසුකම් ලබා දෙන්නේ නෑ අනුකූලතා සහතික නැතුව, වර්තමාන

නැතුව, ඩිපෝසිට් නැතුව, අපේ සභාව කියන්නේ අපේ අද්දරලක් නිසා අපිට යම් මුදලක් අය වෙන්න ඕන කියලා. එය එදා මේ නිවාස සංකීර්ණය ඉදි කරනකොට හිටපු නිවාස ඇමති විමල් වීරවංශ මැතිතුමා එතුමා මෙය සඳහන් කළාම පැහැදිලිව පිළි ගත්තා. එතුමා මිලියන 10.2 ක් ලක්ෂ 1020 ක්. ඒ මුදල මහා නගර සභාවට ලබා දෙන්න කැබිනට් පත්‍රිකාවක් පවා දැම්මා. ඒත් 2015 ආණ්ඩුව වෙනස්වීමත් එක්ක එය අවලංගු වුණා. ඊත් ගරු නගරාධිපතිතුමිනි, ඒ හේතුව නිසා සභාවෙන් ලබා ගන්නේ නැ ඒ අනසුකම්. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය කියනවා ඒ ගොල්ලෝ බැඳී ඉඳලා නෑ ඒ සභාවට මුදල් ලබා දෙන්න. නමුත්, මේ තියෙන කුණු ඇදීම විසින් අර ජනතාවට විශාල වශයෙන් දඩ ගෙවී ගෙවන්න සිදුවෙලා තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමිනි, මම ඉල්ලා සිටිනවා මේ තත්ත්වය තවදුරටත් වර්ධනය වුණොත් ඉතාමත් බරපතල අසාධාරණය සිද්ද වෙන්නේ ඒ ජනතාවට මේ වෙනකොට ලුනාව සී වී ඩී අරසිඩන්ස් නිවාස සංකීර්ණයේ වැසියන් කල්ලගොන්නි මට්ටමට ඇවිල්ලා තියෙන්නේ. අයිතියක් නෑ. තමන්ට ඔප්පුව ලබා දුන්නත් ඔප්පුවේ වැදගත් කමක් නෑ. බැංකුවට තිබ්බලා මෝගේජ් කරන්නත් බෑ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා හැකි ඉක්මනින් මෙය කාලයක් තිස්සේ ඇදිච්ච ප්‍රශ්නයක් හැකි ඉක්මනින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීනුත්, අපේ මහා නගර සභාවේ නිලධාරීනුත්, ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ ප්‍රදේශයේ ඉන්න කමිටුව හා ඒ ප්‍රදේශවාසීන්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ සී වී ඩී රෙසිඩන්සිස් නිවාස සංකීර්ණයේ ඉන්න කමිටු දෙකක් තියෙනවා ඒ නිලධාරීනුත් ගෙන්නලා එක රැස්වීමක මේ සාකච්ඡාව අරගෙන මේ ප්‍රශ්නය නිරාකරණය කර දෙන ලෙස ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ ඒ යෝජනාව ඔබතුමා ඉදිරියේ තබනවා.

ගරු නගරාධිපතිතුමිනි, වාචිකව මම ඉදිරිපත් කරනවා ගරු අගි උතුම් මැල්කම් රංජිත් කාදිනල් උතුමාණන්ගේ මූලික මඟ පෙන්වීම යටතේ එතුමාගේ නමින් නැවසි මේ ගොඩනැගිල්ල සඳහා අයදුම්පත තියෙන්නේ. සෙබස්තියන් එකා පල්ලියට පාදවට වොලිබෝල් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කරලා තියෙනවා. මෙය ඉදි කරන්න ගොඩනැගිලි අනුමැතිය ගන්න සභාවට ඉදිරිපත් කරත්, එයට විශාල වශයෙන් ප්‍රමාදයක් ඇතිවෙලා තියෙනවා පසුගිය කාලේ. ඒ ප්‍රමාදය හේතුකොටගෙන කතෝලික සභාවෙන් දුන්න ආධාර මුදල් නැවත පෙනේ යන එක වැළැක්වීම සඳහා ඒ සභාවේ අනුමැතිය එනකන් මේ ගොඩනැගිල්ල ඉදි කරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමිනි, ලංකාවෙන්ම මම දැනගන්න විදියට මේ වගේ වොලිබෝල් කෝට් දෙකයි ලංකාවේ තියෙන්නේ එකක් මොරටුවේ. මොරටුවේ ඉන්න දරුවන්ට ඉතාමත් සතුටුදායි විදියට තමයි මොරටුවේ දරුවන්ට මේ වොලිබෝල් කෝට් එක පාවිච්චි කරන්න අවස්ථාව ලබාදීලා තියෙන්නේ. රට පුරාම දරුවෝ මේ වොලිබෝල් පුහුණුව සඳහා මේ ස්ථානයට පැමිණෙනවා. ඇත්තටම බස් රථ පවා ගාල් කරන්නේ මොරටුව මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගේ මැදිහත්වීම මත පොලිසියේ තමයි ඒ පිටින් එන බස් රථ පවා ගාල් කරන තත්ත්වයක් තියෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමිනි, මෙය මොරටුවට සම්පතක්. මොරටුවේ ජනතාවට, මොරටුවේ දරුවන්ට තියෙන සම්පතක්. මේ ඉදිකිරීම. දැන් මේ ප්‍රමාද ගාස්තුව හෝ මොකක් හෝ දෙයක් මත ලක්ෂ 16 ත 17 ත මුදලක් අදාළ පාර්ශවයට ගෙවන්න කියලා මහා නගර සභාවෙන් ලිපි එවලා තියෙනවා. ගරු නගරාධිපතිතුමිනි, මම ඔබතුමාගෙන් වාචිකව ඉල්ලන්නේ මේ පාර්ශවයන් දෙකම එක තැනකට ගෙනැල්ලා, සාකච්ඡා කරලා මේ මොරටුවේ දරුවෝ වෙනුවෙන් මේ කටයුත්තට සාධාරණයක් ඉෂ්ට කරන ලෙස, මේ සභාව, ඔබතුමා මැදිහත් වෙන ලෙස මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**03(21) <u>මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම පැමිණිලි හා සංදේශ යටතේ ඉදිරිපත් කරනවා. දේවගැති එස්. ප්‍රේමා නැමැති පාස්ටර්වරයෙක් ඉදිරිපත් කරපු පෙත්සමක්, රාවතාවත්ත, අන්ද්‍රිව්ස් සිල්වා මාවත. ඒ පාර අවුරුදු 14 කින් 15 කින් විතර කිසිම ප්‍රතිසංස්කරණයක් කර නැති පාරක්. දේවගැතිවරයා විසින් ඉදිරිපත් කරලා තියෙනවා ඒගොල්ලන්ගේ අදාළ පල්ලියක් තිබෙනවා ඒ පාරේ. එයට වාහන 50 ක්

විතර නැති සතියකට එනවා. ඊට පස්සෙ ඒ පාරේ ත්‍රීවීල් එකක්වත් යන්න බැරි මට්ටමට අබලන් වෙලා තියෙන්නේ. තාවකාලිකව තමයි මේ පාස්ටර්වරයා ඉදිරිපත් කරන්නේ, ඉල්ලා සිටින්නේ. නමුත් තාවකාලිකව ඉදිකිරීමක් කරලා වැඩක් නෑ. සම්පූර්ණයෙන්ම කාපට් කරන්න ඕන තත්ත්වයක් තියෙන්නේ. ඔබගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(22)** මහා නගර සභා <u>මන්ත්‍රී - එම්. ස්වර්ණා විජේවර්ධන මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම්, පැමිණිලි යෝජනා යටතේ මගේ වාචිකව ඉදිරිපත් කිරීමක් කරන්න කැමතියි. ආනන්දාරාම පාර කියලා කියන්නේ කොල්ලුපිටිය ප්‍රධාන මාවත් වලින් එකක්. ඒ මාවතේ අපිට දකින්න ලැබෙනවා නැති කානු පද්ධතිය සම්පූර්ණයෙන්ම වගේ බිඳ වැටිලා. මේ බිඳ වැටිලා තියෙන හේතුව නිසා සමහර ස්ථානවල ජලය බැසයාමක් සිදු වෙන්නෙත් නැහැ. ඒ විතරක් නෙමෙයි මාර්ගය හරහාත් ජලය බැස යනවා. ඒ නිසා මෙම මාර්ගයේ ගමනාගමනය සිදු කරන ජනතාවට මෙය ඉතාමත් බරපතල කාරණයක්. ඒ නිසා ඉතාමත් ඉක්මනින් මේ මාර්ගයේ තියෙන දෙපස කානු පද්ධතිය සකස් කරලා දෙන්න කියලා මම සභාවට ඉදිරිපත් කරනවා.

**03(23)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. මැක්සි ඉඩ්. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඉදිරිපත් කරනවා ජෙයිසාපුර ප්‍රජාශාලාවේ විදුලි පංකා වැඩ කරන්නේ නැහැ. ඒ ගැන ඔබගේ අවධානය යොමු කරනවා. ඒ වගේම අපේ මහා නගර සභාවේ ප්‍රධාන ගේට්ටුව ඉදිරිපිට තියෙන ආරක්ෂක මුර කුටියේ තියෙන විදුලි පංකාව ඉතාම අඩු මට්ටමකින් තමයි ක්‍රියාකාරීත්වය වෙන්නේ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. කල්දෙමුල්ල ඊබට් මාවත ඔබතුමා දන්නවා එහි භූගත ජලනළ වලින් පාර කැඩී තියෙනවා ස්ථාන කිහිපයක් සාදා ගෙන යනවා එහි ඉතිරි කොටසත් සාදා දෙන්න කියලා ඔබතුමාගෙන් මේ මොහොතේදී ඉල්ලා සිටිනවා. ඒ වගේම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මහා නගර සභාවේ අපිට ලැබෙන මහා නගර සභා ආඥා පනත අඩංගු පොත හා ආචාර ධර්ම පද්ධතිය අඩංගු පොත් සිංහලෙන් අපිට ලබාදීමට කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම අපේ නවක මන්ත්‍රීවරුන් සඳහා.

ගරු නගරාධිපතිතුමනි, කොමරට්ටුව මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු අංශයේ සැලසුම් අංශයේදී වීථිරේඛා ලබා ගැනීමේදී ජනතාව ඉමහත් අපහසුතාවයකට පත් වෙනවා. වීථිරේඛා සහතික නිකුත් කිරීමේදී, මෙය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ඔබතුමාගේ මැදිහත්වීම ඉතාමත්ම අත්‍යවශ්‍ය වෙනවා. මම මීට කලින් පූර්ව ඉන්දික මන්ත්‍රීතුමා සඳහන් කළා සමහර අය එනවා පර්චස් දෙක තුන අරගෙන වීථිරේඛා සහතික ලබා ගැනීමට. ලංකාවේ තවත් නගරසභාවක මහා නගර සභාවක නොමැති දෙයක් තමයි අපේ මහා නගර සභාවේ වෙන්නේ. වීථිරේඛා සහතිකය ලබා දෙන්නේ නැහැ. පර්චස් එක දෙකට කොහොමත් දෙන්නේ නැහැ. අනුමත වෙලාවත් දෙන්නෙත් නැහැ. නමුත්, පසුගිය කාලයේදී ඉතාමත් කාර්යක්ෂමව සිදුවුණු ස්ථානයක් වීථිරේඛා සහතික නිකුත් කිරීම. මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ඉදිබැද්ද එඩ්වඩ් පටුමගේ නිවාස 20 පළමුවනි පාරේ 1 සිට 5 දක්වා තියෙන ඒ නිවාසවල කානුව සම්පූර්ණයෙන් වැහිලා ගිහිල්ලා තියෙන්නේ එය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**03 (24)** <u>මහා</u> නගර සභා මන්ත්‍රී <u>- පූ. සුදත් ශ්‍රීකාන්ත පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිණිලි යටතේ මට සිදු වෙච්ච දෙයක් ගැන මම කියන්නෙ, ඒක කොමරට්ටුවේ ජනතාවට සිද්ධ වෙන්න තියෙන එකා. ඊයේ මම ප්ලෑන් එකක් අනුමත කරන්න ගියා. මේ මුල් ප්ලෑන් අනුමත කරලා තියෙන්නෙත. ඒ ප්ලෑන් කොටසක්. ඒකට තමයි මේ අනුමත කරන්න

තියෙන්නෙ. මොකද මගේ ඉඩමේ ඔබතුමා දන්නවා පර්චස් 65 ක් තියෙනවා. ප්‍රධාන පාරට තියෙන්නෙ. එතකොට මට සයිඩ් එකෙකත් පාරක් තියෙනවා අඩි 10ක. ඒක මෙතන පෙන්නුම් කරනවා. අඩි 10 පාර තිබ්බට මට ඒ පාර අයිති නෑ. නමුත් අයිතිය ගත්තා මම එතන තියෙන පාර පර්චස් 15 ක්. ඒ පර්චස් 15 මම ගත්තා. ඒ පාරෙ ඉන්නෙ දෙන්නයි. අපේ මල්ලි ඉන්නවා, පර්චස් 06 ක. ඒ 15 මම ගත්තා. ඊට පස්සෙ තමයි මේ ප්ලෑන අනුමත කාලේ. ඒ අයිතිය මට තියෙනවා. ඊට මම මේ කොටස් දෙකකට කඩලා, ඒ පාරේ අයිතිය මෙන්න තියෙනවාගෙන, ප්ලෑන අනුමත කරලා, නව ප්ලෑනක් දැම්මා අනුමත කරන්න. නමුත් නගරාධිපතිතුමනි, ඒ ප්ලෑන ප්‍රතික්ෂේප කලා ඒ පාරේ අයිතිය පෙන්නන්න කියලා. මම කිව්වා පාරේ අයිතිය තියෙන නිසානෙ මේ ප්ලෑන අනුමත කරලා තියෙන්නෙ. ඊට පස්සෙ මම, ඉදිරිපත් කලා සිප්පු ගෙයයි. ඊට පස්සෙ ඉදිරිපත් කරන්න කිව්වා මෙතෙක් සර්කල් එක තියෙනවා පර්චස් 03 ක්. ඒක වර්තීන් සර්කල් කියලා ගහලා නෑ කිව්වා. ඒක ගහන්න ඕන නෑ මිනින්දෝරු හෝනා කියනවා ඊට්ගෙට එයා ගහලා නෑලු. ඒක හොඳට පේන්න තියෙනවානෙ. පර්චස් 03 ක් තියෙනවා. එතකොට ආය ඒක කැන්සල් කරලා නව එකක් ගන්නා සර්කල් කියලා ඇලා. ඒක දුන්නා. එතකොට ඊකට අමතරව බිල්ඩින් ප්ලෑන් එක ඉල්ලුවා. මම කිව්වා කෝටි 7ක් විතර වියදම් කරලා බිල්ඩින් එකක් ප්ලෑනක් අනුමත කරන්නෙ නැතුව බිල්ඩින් හදන්නෙ නෑනෙ කියලා. ඊට පස්සෙ කරපු දේ ඊක් බිල්ඩින් ප්ලෑන් එක ඉල්ලුවා. බිල්ඩින් ප්ලෑන්එක දුන්නා. ඊට පස්සෙ ආයි ප්‍රතික්ෂේප කලා. මේක කරන්නෙ කවුද යුඩී එකේ නිලධාරියා, තියෙන හැදෙන් මනුෂ්‍යයෙක්ට කියන්න ඕන එකපාර. මේ ටික මේ ටික මේ ටික කරගෙන එන්න. මොකද මේක පාර ප්ලෑනක් නෙමෙයිනෙ මෙක නගර සභාවෙ අනුමත කරපු ප්ලෑනක් ආයි අනුමත කරන්නෙ. ඒකමයි තමයි මේ. දෙතුන් පාරම. ඒක තේරෙන්නෙ නැති අයද මේ ඉන්නෙ. මෙතෙක් ඉංජිනියර්ස් හිටියා. එයාට තේරෙන්නෙත් නෑ. මේ ප්ලෑනක් අනුමත කරලා තියෙන එකක්ම තමයි මේ. නැතුව වෙන එකක් නෙමෙයි. ඊට පස්සේ අපෙත් කැන්සල් කලා. ආය අනුමත කරන්න බිල්ඩින් එකේ අඩි තුන තියලා නෑලු. මම කිව්වා බිල්ඩින් ප්ලෑන් එකේ අඩි තුන තියෙනවානෙ, මම කිව්වා මහත්තයා එන්න යන්න.මම ගියා ප්ලෑනින් කාමරයට මම කිව්වා ඔයාට කොහෙටද ගහලා පෙනෙන් දෙන්නද. නෑ, ඒ වුනාට මේ ප්ලෑනෙන් නෑනෑලු. එයා සාක්ෂෙට දාලා තියෙන අඩි තුන පෙන්නලා නෑලු. ඒක ඇත්ත. ඒක මිනින්දෝරුවට වැරදීමක් කියලා මිනින්දෝරුවා ලියුමක් දුන්නා. නමුත් යුඩී එකේ එක්කෙනාට ඒක තිබුනා කලින් කියන්න. කලින් කිව්වානම් එකපාර වැරැද්ද නිවැරදි කරගෙන එනවා. මාව පහරපාරක් හරවලා ඇරියා. ඊට පස්සෙ තමයි ප්ලෑන අනුමත කලේ. නගරාධිපතිතුමාට කියලා රටේ පස්සෙන් කර ගත්තෙ. මොකද ඒ වගේ දේවල් වෙන්න එපා. තවද යුඩී එකේ එක මහත්තුරුන්ට අපි චෝදනාක් කරනවා. නමුත් ට්‍රාන්ස්පෝට් දෙන්න අවස්ථාවක් නැහැ. මොකද අපේ සමින්ලාල් නගරාධිපතිතුමා ඉන්න කාලේ ට්‍රාන්ස්පෝට් දුන්නෙත් නැහැ. ට්‍රාන්ස්පෝට් දීලා තියෙන්නෙත් කොමිසාරිස්ගේ පාලනයේ. මෙතරවුමේ ජනතාවගේ බදු මුදල්වලින් ගෙවන පල්ලි,අපරාධෙ විනාශ කරනවා. තියෙන්නෙ කොළඹ හිතින් යන්නයි, ගෙදරට හිඟින් කිස්සන්නයි. එහෙම තීරණයක් මම දන්නෙ නෑ. නමුත් කොමිසාරිස්ගේ පාලනයේ කරලා තියෙනවා, මම දන්නෙ නෑ නගරාධිපතිතුමාගේ කාලයෙත් කරනවාද කියලා. ඒ වගේම මේ නගර සභාවෙ ඉඩමේ ගහක් කපන මෙතන් තියෙනවා ඔබතුමා ඒක දන්නවා. ගහ කපන්න රුපියල් 35000 යි ඉල්ලලා තියෙන්නෙ. ගෙන් අනු සාකිත්ත විතරක් 35000 ක් ඉල්ලලා තියෙනවා ගහ කපන කෙනා. කොන්ත්‍රාත්කාරයාට දීලා එකයි තිබිලනාට. අනු ගනිත්ත 35000 යි ඉල්ලලා තියෙන්නෙ. මේ නගර සභාවේ වන්නෙ. එන්ලක්ෂ නිෂ්පාදනයකට කොන්ත්‍රාත්කාරයාට දීලා. නමුත් නගරාධිපතිතුමා ඒක අත්සන් කරලා නැහැ. ඒ වගේ ගොඩක් ඇති අත්සන් කරන්න ඔබතුමාට. කල්පනා කරලා අත්සන් කරන්න බුදු අම්මෝ කොහෙ යන්න වෙයිද දන්නෑ. පසුගිය අවුරුද්දක කාලයේ හොඳට කරලා තියෙනවා. ඒ වගේ දේවල් නොවෙන්න නගරාධිපතිතුමනි ඔබතුමා

ප්ලෑනින් කමිටිය වාඩිවෙලා ඉන්න තැනකින් බලන්න. ජනතාවට සේවයක් කරන්න ප්ලෑන්වලට හරවලා ඇරලා මට මෙමගෙමනාම, මම නගරපාලකනාම, මිනිස්සුන්ට දහපාරක්වත් වෙන්න ඇති. ඒ වගේ දේවල් සිද්ද නොවෙන්න වැඩ බලාගන්න කියලා නිහඬවෙනවා.

03 (25) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්දජිත් ප්‍රනාන්දු මහතා.</u>

ගරු නාගරාධිපතිතුමනි, කොරළවැල්ල සටසිර කොට්ඨාශයේ මහාවිද්‍යාල. පෙළින් එතැනින් පටන් ගත්තම එම්. ජේ. පෙරේරා මාවත දක්වා හැම පාරක්ම වැඩි දිනයේ ගමන් කරන්නට බොහොම අපහසුයි. පාසල් දරුවන්, ඒ වගේම රැකියාවේ නියුතු ජනතාවට එකාට ගමනට යන්න කොහොත්ම බැරි තත්වයක් උදාවෙලා තියෙනවා වැසි කාලයට. ඒ නිසා හැම පාරක්ම සෑදිය යුතු පාරවල්. නමුත් ඊට පෙර වැසි ජලය රොන් වෙන ස්ථාන අඩු කරන්න නගර සභාවේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - අන්ද්‍රු. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සෑහෙන වෙලාවක් අපි අරගෙන තියෙනවා යෝජනා හා පෙත්සම් අයිතමයට. අපට බොහෝ කාරණා ගත්තොත් එතනම ඔබ හැමදෙනාම ජනතාවගේ ප්‍රශ්න තමයි ඉදිරිපත් කළේ. මිනිස්සුන්ගේ ගැටළු. ඔබ මහජන නියෝජිතකම අත්පත් කරගෙන තියෙන්නෙ, ඔබට මහජන නියෝජිතකම දීලා තියෙන්නෙ, ඒවා විසඳන්න. ඒ නිසා ඒවා අත්දැකීම තියෙන මන්ත්‍රීවරු දන්නවා සැලකිය යුතු ප්‍රමාණයක් පෙත්සම් හා පැමිණිලි අයිතමය අවස්ථාවේ ඉදිරිපත් වෙනවා. ඒ ඉදිරිපත් වෙන ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉෂ්ට කර ගන්න හම්බවෙන්නෙ නෑ. ඒක තමයි අත්දැකීම. දැන් මගේ අවශ්‍යතාවය, මගේ උවමනාව පක්ෂ භේදයකින් තොරව, අපි ඉදිරිපත් වෙන කාරණා හැම කාරණාවක්ම ඉෂ්ඨ කර ගන්න බැරි වෙයි. හැබැයි ඉෂ්ට කරගන්න බැරි වුනාත්, ඒ ඉෂ්ට කරන්න බැරි හේතුව හරි අදාල මන්ත්‍රීවරයා දැනගන්න ඕන. ඒ නිසා මම ඉතාම ඕනෑකමින් නිලධාරීන්ට කියනවා මීය දෙවනිදා දිවුරුම් දුන්නේ අද අපි ඉන්නේ ජුලි 15 වෙනිදා මට අදාළ වුනත් අපිගේ අපි යාන්ත්‍රණය හරියට සකස් කර ගන්න. ඒ යාන්ත්‍රණය සකස් කර ගැනීමේදී අද මම හිතනවා යම් ප්‍රමාණයකින් සතුටුවෙනවා අද අපේ සේවකයො මහන්සි වෙලා වැඩ කරලා, ඉතාම මහන්සිවෙලා වැඩ කරලා ඒ අතර තව කිසිපෙදෙනෙක් ඉඳී, නමුත් බොහෝ තත්වය තමයි අපේ සේවකයො අද මහන්සි වෙලා වැඩ කරනවා. හැබැයි තව දුරටත් තියෙනවා අපි මැද ලෙජර් එක, මේ පරිපාලනමය පැත්තෙන් සැලකිය යුතු ගැටළු ප්‍රමාණයක් තියෙනවා. ඒ නිසා කොමසාරිස්තුමියගෙන් මම ඉතාම ඕනෑකමින් ඉල්ලනවා, අද මහා සභා රැස්වීම් මියයකට එකයි. මන්ත්‍රීවරු සෑහෙන ප්‍රශ්න ප්‍රමාණයක් ජනතාවගේ අරගෙන එනවා. හැබැයි ප්‍රධාන තලය මම දන්නෙ නෑ ඉංජිනේරුතුමා නෑ. දිස්ත්‍රික් කමිටුවට යනවා කිව්වා. හැබැයි මම කියන්නේ මම නම් කරන්න යන්නේ නැහැ මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලනවා මේ මහා සභාව දවසට කොහොමහරි වැඩ දාගන්න එපා. කොහොමද මේ ස්ථානයට සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් හිටියොත් තමයි මේ ඉදිරිපත් කරන ප්‍රශ්න ඔවුන්ගේ මතකට ගන්න පුළුවන්. ඒ නිසා පළමුවෙනි ඉල්ලීම තමයි කරුණාකරලා ඉන් අනතුරුව හැම මහා සභාවකම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට තමන්ට ඉන්න කියන්න. නීති නිලධාරිනියට වුනත් නවලාගන පුළුවන් විකල්පයක් හදාගන්න. ඒ නිසා ඒක ප්‍රධානයි. ඒ නිසා මම බලාපොරොත්තුවෙනවා දැන් මට දැනෙනවා තියෙනවා සෑහෙනතුරට මේ දෙපාර්තමේන්තු ඇතුළුව වැඩවල සෑහෙන ගැටළු ප්‍රමාණයක් තියෙනවා. ඒ නිසා මම ඉතාම තදින් අපේක්ෂා කරනවා මේ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඒ වගේම මහා නගර සභා මන්ත්‍රීවරුනි, පෙත්සම්, පැමිණිලි හා යෝජනා අයිතමයෙන් ඒ කියන්නේ ඔබ පැරණි පක්ෂය මන්ත්‍රීවරුන් නවක මන්ත්‍රීවරුන් ඔබ දිහා බලාගෙන තමයි අපට තමන්ගේ

ගැටළු ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අපිට මේ ඉතාම පැහැදිලිව දීලා තිබෙන අණපනත්වල කියනවා, මැතිසි මන්ත්‍රීතුමිට ස්තූතිවන්ත වෙනවා පෙරමුදින් පෙන්වාදීමට කටයුතු කිරීමේ කියන්නේ අප එය ඉදිරිපත් කල යුත්තේ ලිඛිතව. වාචිකව යම් පණිඩයකින් අදහසක් කියන්න පුළුවන් සංක්ෂිප්ත විශයෙන්. නැතිනම් නැවත නැවත නැගිට නැගිට මහත් කාලයක් ගතකරමින් සැකිරී ඉදිරිපත් කිරීම බැහැ. දැන් එය කරන්න හඳුනුවෙලෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්මයි ඒක වැරැද්දුවේ. ඒක තමුසෙලාම ගොඩ කන්වරුකේ. ඒනිසා අපට ලිඛිතව පමණ් ඉදිරිපත් කලාම පෙරලා ප්‍රශ්න කිරීම කරන්න පහසුයි. එයට හේතුකන්ද වුණේ කියන කාරණයට. විළඹට ඊට ඊතු කරපු සමහර නිලධාරීන් දුරකතනවලට පිළිතුරු නොදෙන එක. ඇත්ත ඒ නිසා මම ඒ හැම නිලධාරියෙකුටම කියනවා මන්ත්‍රීවරයෙක් කතා කරනවා නම් දුරකතනයට විගසම පිළිතුරු දෙන්න. කියන වැඩේ කරන්න බැරිවෙයි, නැතිනම් ඒ කටයුත්ත මගහරින්න එපා. එවගේ සමහර අවස්ථාවල මහානුභාවට අවස්ථා තිබෙනවා. වැඩවලට පසුව යන්න ගිටියට අභියෝගවෙච්ච අවස්ථා තියෙනවා ඒ නිසා එහෙම හිතාමතාවීන් කලා නොවෙයි. නොදැනුවත්ව හරි වුනානම් ඒකට කණගාටුව පළකර සිටිනවා. ඒනිසා අපේ ඉදිරි කටයුතු කරගෙන යද්දී මහා සභාවක් විදියට මම හැමතිස්සෙම කියන්නේ ඒකයි මහා සභාවක් විදියට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මම හැම වෙලාවම ගෞරවයෙන් ස්තූතිවන්ත වෙනවා මේ සභාව මිනිස්සු බලාපොරොත්තු වෙන විදියට පවත්වගෙන යන්න බැහැ අපි දේශපාලන වශයෙන් බෙදිලා කටයුතු කළොත්. ඒ නිසා මම උපරිම උත්සාහ කරනවා ඒකන්වයෙන් තුල කෙනෙක් හෝ මේ කාරණාව කරගන්න. අවසාන වශයෙන් මම ඔබෙන් ඉල්ලා සිටිනවා ඒ සඳහා උදව් කරන්න.

## 04. <u>ප්‍රශ්න -</u>

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීපකාන්ත මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි අංක 04 (01) යටතේ මහා නගර සභා මන්ත්‍රී ඩී. සමින්ත ද සිල්වා මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ලබාදීමට මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**04(01) 2025.07.15 දින මාසික මහා සභා රැස්වීමේදී කල් තබන ලද මහා නගර සභා මන්ත්‍රී ඩී. සමින්ත ද සිල්වා මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න.**

1. මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය යටතට ගැනෙන ග්‍රාම සේවා වසම් අංක හා නාමයන් මොනවාද?
2. ඉහත කී ග්‍රාම සේවා වසම් සියල්ලම ඉරම් හිමිකම් නිරවුල් කිරීමේ "බිම් සවිය" ව්‍යාපෘතියට යටත් කර තිබේද?
   එසේ නම් ඉන් බැහැරව යටත් නොවී ඇති ග්‍රාම සේවා වසම් මොනවා ද,
3. ඉහත කී බිම් සවිය ව්‍යාපෘතිය යටතේ ඒ ඒ ග්‍රාම සේවා වසම් වලට අයත් වන බිම් කට්ටි ප්‍රමාණයන් කොපමණද?
4. ඉහත කී බිම් කට්ටි ප්‍රමාණයන්ගෙන් මොරටුව මහා නගර සභාව සතු බිම් කට්ටි කොපමණ ප්‍රමාණයක් තිබේද?
5. මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය යටතේ ඇති රජයේ හෝ නිවාස යෝජනා ක්‍රම හෝ නිවාසපුරයන් ලෙස හැඳින්වෙන ස්ථාන තිබේද?

1) එලෙස ඇති ස්ථාන සඳහා භාවිතා කරන නම් හා එම ස්ථාන පිහිටි ග්‍රාම සේවා වසම් මොනවාද?
2) එලෙස එම ජනාවාස හෝ නිවාස යෝජනා ක්‍රම හෝ නිවාසපුරයන් ස්ථාපිත කරනු ලැබ ඇත්තේ කුමන වර්ෂවල ද? හා කවුරුන් හෝ ආයතන විසින් ද?
3) එම ස්ථාන සඳහා බිම් සවිය යටතේ සලකුණු කොට ඇති බිම් කට්ටි කොපමණ ප්‍රමාණයක් තිබේද?
4) එම බිම් කට්ටි අතුරින්,
    a) රජයට අයත්
    b) මොරටුව මහා නගර සභාවට අයත්
    c) පෞද්ගලික අයිතිය ඇති හා
    d) මෙතෙක් හිමිකම් හඳුනාගැනීමට නොහැකි බිම් කට්ටි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණ තිබේද?

6. මොරටුව මහා නගර සභාවට අයත් බිම් කට්ටි සඳහා වන ප්‍රථම පන්තියේ හිමිකම් සහතික මේ වන විට මොරටුව මහා නගර සභාව සතුව තිබේද?
    1) එසේ තිබේ නම් ඒ කොපමණ ප්‍රමාණයක් ද?
    2) එසේ සතුව නොමැති නම් ඒවා මෙතෙක් ලබා ගැනීමට නොහැකිව ඇති හේතු කවරේද?

7 වසර 2019 පෙබරවාරි මස 07 වන දින පවත්වා පැවති මොරටුව මහා නගර සභා මාසික රැස්වීමේදී සභාව සතු ඉඩම් වල වසර ගණනාවක සිට පදිංචිව සිටින පදිංචිකරුවන් වෙත ඔප්පු ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර, එම කාර්යය ක්‍රියාත්මක කිරීමේ වගකීම නාගරික කොමසාරිස්තුමා හට පවරා ඇති බව වාර්තාවල සටහන්ව ඇත. ඒ අනුව,
    1) එලෙස පවරා දීමට අදාළ බිම් කට්ටි පිහිටා ඇති ග්‍රාම සේවා වසම් මොනවාද?
    2) එලෙස පවරා දීම සඳහා හඳුනාගෙන ඇති බිම් කට්ටි ප්‍රමාණයන් කොපමණ ද?
    3) එම තීරණය ගෙන දැනට වසර 06 කට වඩා කාලයක් ගතව ගොස් ඇතත්, තවමත් අදාළ පදිංචිකරුවන් හට පවරා දීමට නොහැකිව ඇති බිම් කට්ටි විස්තර වශයෙන් මොනවාද?
    4) එසේ පවරා දීමට නොහැකිව ඇත්තේ කුමන කාරණා හේතුකොට ගෙනද?

## 05. <u>යෝජනා -</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"කොරළවැල්ල පළමු වන පටුමගේ දකුණට පිහිටා ඇති අඩි 20 ක් පමණ පළල මාර්ගය දෙපස කාණු දමා සංවර්ධනය කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. සුමේද් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - එස්. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (01) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කාර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(02) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"කොරළවැල්ල සමාජවාදී නිවාසත් පෙදෙස හා ධම්මතිලක මාවත මැදින් තියෙන ගල් අල්ලපු පාර ලෙස හඳුන්වන මාර්ගය "නෙළුම් පෙදෙස" ලෙස නම් කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරන්නේය."

මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. ප්‍රදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි පෙරාඩ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නම් ලැයිස්තුව ඉදිරිපත් කරලා තියෙනවද ප්‍රදේශවාසීන්ගේ?

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා.</u>**

ඉදිරිපත් කරලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි, අදහස් දැක්වීමට අවස්ථාව ඉල්ලා සිටිනවා. 5(2) කොරළවැල්ල සමාජවාදී නිවාසත් පෙදෙස හා ධම්මතිලක මාවත ප්‍රදේශවාසීන් විසින් ඒ මාවතට නමක් දාන්න කියලා ඉල්ලා සිටින්නේ. ඒකට ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මම කලින් ලබා දුන්නා. ඒකට සභාවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා.</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (02) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කාර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"කොරළවැල්ල කොන්ස්ටන්ටයින් මාවත දීර්ඝ කාලයක සිට නිසි ලෙස වැසි ජලය බැස නොයාම හේතුවෙන් ප්‍රදේශවාසීන් හා පාසල් යන දරුවන් මහත් පීඩාවට පත්වන බව මා මීට පෙර 2018 වර්ෂයේ සිට පාලකයන් හට අවස්ථා ගණනාවකදී ප්‍රකාශ කලද එය ඉටු කිරීමට කිසිවෙක් මැදිහත් නොවීම හේතුවෙන් අද දින වන විට ප්‍රදේශවාසීන් මහත් පීඩාවට පත්වන බැවින් වැසි ජලය බැස යාම සඳහා නිසි වැඩපිළිවෙලක් යොදා ප්‍රදේශවාසීන්ගේ පීඩාවට සහනයක් සැලසීමට කටයුතු සලසන මෙන් යෝජනා කර සිටින්නේය"

මහා නගර සභා මන්ත්‍රී ඒ. එච්. ප්‍රදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි, දීර්ඝ කාලයක් සිට කොරළවැල්ල කොන්ස්ටන්ටයින් මාවතේ ප්‍රදේශවාසීන් මහත් පීඩාවට පත්වෙලා දරුවන්ට පාසල් යන්න හැකියාවක් නැහැ, ප්‍රදේශවාසීන්ට එම මාර්ගය භාවිතා කිරීමට හැකියාවක් නැහැ, මහත් පීඩාවට පත්වෙලා තියෙන්නේ. මීට පෙර මා සභාවට 2018, 2019 වර්ෂවලදී අවස්ථා ගණනාවකදී මේ ගැන සභාවට අවධානය යොමු කලත් අපිහට කිසිදු පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ නිසා අපි මේ මොහොතේ මම ඉල්ලා සිටිනවා හැකිතාක් ඉක්මණින් මෙයට ස්ථාන පරීක්ෂාවක් කරලා මේ මිනිස්සුන්ගේ ප්‍රශ්නය හැකිතාක් ඉක්මණින් අපි සභාවක් හැටියට ඔවුන්ගේ ප්‍රශ්නය නිරාකරණය කිරීමට සභාව මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ ප්‍රශ්නයටම අදාළව ඒ යෝජනාවට අදාළව විශේෂයෙන් මේක මේ කොන්ස්ටන්ටයින් ලේන් එකට විතරක් බලපාන ප්‍රශ්නයක් නොවෙයි, මම දකුණු තීරුව පත්වෙනකන් වගේම මේ සුපර් ඇවනිව් එකේ ඉඳලා ඊත් එක්කම උස්වෙන්න බුරවන්න ඒක එක්කම කොරළවැල්ල එගොඩඋයන ඊත් එක්කාම මොරටු දක්වා මේ ප්‍රදේශය ඇත්තටම වැස්ස දවසට එකම ජල තටාකයක් බවට පත්වෙනවා. ඒ නිසා ඒ ජල තටාකයෙන් මිදුවගන්න ජනතාව අපේ නගර සභා සතු යුතුකමක් හා වගකීමක් තියෙනවා. ඒකෙදි විශේෂයෙන් මම විශ්වාසව හොඳම මේ ප්‍රශ්නය යම්තරම් අපි අවබෝධ කරගෙන සමස්තයට අපි උත්තර සැපයිය යුතු වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් ක්‍රමවේදයක් මධ්‍යම ආණ්ඩුවෙන් ඒ වගේම අනිත් පැත්තෙන් ගන්නට පස්සෙ උපමාන පාදක යටතේ පළාත් සභාවත් මේ සියල්ලක්ම ඒකාබද්ධ වෙලා ගතයුතු ක්‍රියාමාර්ගයක්. ඒ වගේම තමයි ධර්මවන්ත මාවත ගත්තොත් එහෙම ධර්මවන්ත මාවත වැස්ස දවසට අර බංගමන්ද ක්‍රීඩාංගනයේ බැට් ගහන්න බෑ වගේ තමයි පිරිලා තියෙන්නේ ඒ නිසා තමයි ඉස්කෝලෙ යන්නෙ සපත්තු දෙක ගලවගෙන මේස් දෙක ගලවාගෙන කමනතන් එළියට යනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ සියල්ලටම ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දෙන්න ඕන කියලා. අනිත් පැත්තෙන් ගත්තට පස්සෙ අපි විශේෂයෙන්ම මේ වෙලාවේ ඒගැන දෙපෝදා කිවුවා ලෝකයේ තම වැඩි කානු සම්බන්ධව අපේ ලංකාවේ හිටපු ආචාර්ය නාදිකා චන්ද්‍රසේනට ලෝක සම්මානය හම්බවුනා. ඒ තමයි ඉන්වර්ලෙක්ස්වලින් අපුරට තියන අමෝඩර්ඩ් එක ඇත්තටම අපේ නැවතී වෙන්නෙ යම් කාරණාවලට විතරයි. ඒ නිසා ඇය ඉදිරිපත් කලා කොහොමද මේ කානු සම්බන්ධව වැඩි ජලය නිසියාකාරව බැස්මට අනුකූලව කරන්නෙ ඊත් එක්කම කොහොමද ප්ලාස්ටික් එකතුවෙන්නෙ නැත්තෙ කියලා. ස්මාට් කානු කන්සෙප්ට් එකත් රටවල් 126 කින් ඇය ඒ සම්මානය ලැබුවා. ලංකාවේ අපිත් එක්ක ගමනගැමී ගිනවෙ ආචාර්ය නාදිකා චන්ද්‍රසේන මහත්මිය. ඒක ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්වල ඇය අන්තඩා බැලීමක් කලා. අනිත් එක කොළඹ පරමානුක බලශක්ති අධිකාරිය ළඟ ඒ තරඟ අන්තඩා බැලීමට සැයට ලෝක සම්මානය හම්බවුනා. ඒ නිසා මම හිතන්නෙ ඒ වගේ පිරිස් අපි එකතු කරගෙන නිශ්චිතවම මේකට උත්තර සපයන්න ඕන අවස්ථාවක අපි ඉන්නෙ. ඒ නිසා දරුවො පාසල් යන්න බැරුව ගෙදර ඉන්නවා වැස්ස දවසට මොකද මේ මහා සමුල්ලොඩි ගඟ වගේ, එහෙම නැත්නම් මේ ක්ෂීර සාගරය වගේ මේගොඩන් එගොඩ වෙන්න බැරුව ඉන්න දරුවො ඉන්නවා. ඒ නිසා මම හිතන්නෙ මේකට සමස්ත විසඳුමක් අවශ්‍යයි. ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නෙ හිටපු නගරාධිපතිතුමා ඉන්නකොට මේ වෙනකොට ප්‍රධාන බෝක්කු හතරක් එදා අපිට මතකයි කඩුරු කලත් කාලෙක් නොවෙයි. ඒ වගේ ම අපි ඒක ඉදිරියට ගෙන යාම අවුරුදුවක් තියෙනවානම් ඒක සත්‍යක්ෂර හැතිමි අපේ යුතුකමක් හා වගකීමක් තියෙනවා. ඒ නිසා ඒ අවතනකොට ගරු නගරාධිපතිතුමනි, ඔබතුමත් දන්නවා අපේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කෝට්ටි උදැපන යම් කාල පරිච්ඡේදයක තමන්නලා ය ඉඳලා පාන්දර වෙනකල් මම දන්නවා බෝක්කු අලා තියෙනවා. ඒ නිසා ඒ බෝක්කු ටික යථාපාලිත වෙන්න ඕන. අනිත් පැත්තෙන් ගත්තට පස්සෙ අපේ සුපර් ඇවනිව් එකේ ඉඳලා පරණ ගාලු පාර දිගේ කානු පද්ධතිය සැලසුම් කරලා තිබුණේ. ඒ කානු පද්ධතිය සැලසුම් කරලා තිබුණෙ ගරු නගරාධිපතිතුමනි, ජලය කොහොමම බැස්මට අනුකූලව. ඒකේ මූලික වශයෙන් තියෙන සැලැස්ම තියෙනවා. ඒ සැලැස්මට අමතරව ඒකේ තියෙන කොටසක් කරලා තියෙනවා. ඇස්තමේන්තු තියෙනවා. ඒ වගේ යම් වෙට්ටියක් එකක් වෙනසක් තියෙනවානම් පලුගීය අවුරුදුවල කරපු එකට සාපේක්ෂව ඒ වෙට්ටියක් එක බලලා අපිට ඇස්තමේන්තු සකස් කරලා අපිට ඒ ප්ලෑන් එක හදාගන්න විතරයි තියෙන්නෙ. අද ඒක තියෙනවා විශේෂයෙන් ගන්නට

පස්සෙ මාර්ග සංවර්ධන අධිකාරියෙ ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මූලික වශයෙන් මේ වැසි ජල කළමනාකරණයට, අවධානම් කළමනාකරණයට, ආපදා කළමනාකරණයට විසඳුම් නැතුව අපිට මේ මොරටුව නගර සභාව තුල සහ කිසිම කොන්ඩුවක් තුල, කිසිම ප්‍රාදේශීය සභාවක් තුල, නගර සභාවක් තුල ක්‍රියාත්මක නොකළොත් ජනතාවගේ මූලික අවශ්‍යතාවය ඉෂ්ට වෙන්නෙ නෑ. ඉතින් ඊර සංවර්ධනයේ මිම්මක් තියෙනවා යම් විදියකට අපි ආපදා කළමනාකරණයට, අවධානම් කළමනාකරණයට බර තියන්නෙ යම්සේ ද, ඒ රටක, ඒ ගමක, ඒ මොරටුවේ නම් ඒ මොරටුව නගර සභාවේ සංවර්ධනය එලෙසමය කියලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒක එක්කම බුදුන්වහන්සේත් දේශනා කරනවා වජ්ජි සූත්‍රයේදී දරුවන්ට සලකන්නේ යම් සේ ද, ඒ රටේ සංවර්ධනය එලෙසම ය කියලා. ඒ නිසා දරුවෝ වින ඉස්කෝලෙ යන්න බැරුව ගෙදර වෙලා ඉන්නවා නම් ඒ වගේම අපිට නාදිය තරණය කරන්න බැරුව කාණුව තරණය කරන්න බැරුව පාර තරණය කරන්න බැරුව ඉන්නවා නම් අන්න ඒ රටේ සංවර්ධනය එලෙසමයිද කියලා අපට හිතන්න වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට අපි හඳුනාගත යුතු ප්‍රශ්න අතර ප්‍රධාන ප්‍රශ්නයක් තියෙන්නෙ ගරු නගරාධිපතිතුමනි, ඉතින් මෙන්න මේ වැසි ජල ආපදා කළමනාකරණයට විසඳුම් ලබා දීමමයි ඒ නිසා අපේ පුළුල් සංවර්ධන කාර්යභාරයක් විධියට එක කොට්ඨාශයකට අපි සීමා නොවී අභියෝග ප්‍රශ්නයට විසඳුම් දෙන්න ඔබතුමාගේ අවධානය යොමු කරනවා. කිසිම ප්‍රශ්නයකින් තොරව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි එක සැලසුම් කරමු, ඒක එක්කම මම හිතන්නෙ අපට මේ වෙලාවේ රජය පෙරේදා අපට ලැබිච්ච ජාමාර්ථ කාණු සංකල්පයත් එක්ක නාදීක වන්ගේන්ඩේ මැතිණිය අද ලෝකයේ ප්‍රමුඛතම සම්මානයෙන් පිදුම් ලද කාන්තාවන් බවට පත්වෙනවා එකත් මේ අපේ මොරටුවට වගේම රටට බලපාන කාණු සම්බන්ධ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් දීලා. ඒ නිසා ඇයවත් අපි සම්බන්ධ කරගෙන මේ කාර්යභාරය ඉටු කරමු කියන ඉල්ලීම මම ඔබට කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මෙරීයන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය.</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ ඉල්ලීමට යමක් එකතු කරනවා නම්, දැන් අපි රටේ දකින එක ප්‍රශ්නයක් තමයි මේ රට තුල සංවර්ධන සිදුවන විට දකුණු ප්‍රදේශයේ යම්කිසි පාරවල් නඩත්තු කිරීමට බලාපොරොත්තු වෙනවා නම්, ඒවා යන පාර දැමීමට බලාපොරොත්තු වෙනවා නම්. ඒවා කිරීමට පෙර දැන් මේ සභික මන්ත්‍රීතුමා කිව්වා වගේ වැසි ජලය බැස නොයාම සහ දකුණු කලාපය ගංවතුරෙන් යටවීම කියන ප්‍රශ්නයට පළමුවෙනිම විසඳුම් දීලා එතනින් එහාට ඕය කියන සංවර්ධන කටයුතු කිරීමට මම ඔබතුමාට යෝජනා කරනවා. ලංකාවේ හැම වෙලේම වෙන්නේ පාරවල් කාපට් දානවා ඊට පස්සේ ඇවිල්ලා සිරීම් එකකත් කඩනවා. ඊට පස්සෙ කාණු හදන්න ඕන කියලා පාරවල් කපනවා. ඉතින් මේ කිසිම සංවර්ධනයක් එකිනෙකට බද්ධවෙලා නැහැ. ඒ නිසා ජනතාවගේ බදු මුදල් කාලයක් තිස්සේ මේ රටේ නාස්ති වෙනවා අපි දකිනවා. හේතුව මේ කිසිම ඉන්ටිග්‍රේෂන් එකක් ලින්ක් නෑ, සිවිල් පැත්තෙන් කරන සංවර්ධනය. ජලාපවහන අංශයෙන් කරන සංවර්ධනය ඒ අනෙකුත් නගර සභාවෙන් කරන සංවර්ධනය මේවා ලංකාවේ ඉන්ටර්කනෙක්ට් කරන්න සිස්ටම් එකක් දැන් වෙනතුරු හැදිලා නැහැ. ඉතින් ඔබතුමාගෙන් මම කාරුණිකව ඉල්ලා සිටින්න කැමතියි මේ අපගේ යන්නේ ජනතාවගේ මුදල් ඔබතුමාට දකුණු ප්‍රදේශයේ සංවර්ධනය කිරීමට එන්නෙත් පාරක් කාපට් දැමීමට එක්කෝ කාණුවක් නඩත්තු කිරීමට ඔබතුමාට යෝජනාවක් එනවා නම් ඔබතුමා ඒ යෝජනාව අනුමත කිරීමට පෙර මෙන්න මේ කියපු ගැටළුවට අපි ඉස්සෙල්ලා විසඳුමක් හොයමු විසඳුමක් හොයලා එතනින් එහාට ඉන් අනතුරුව ඕය සංවර්ධනය කරන්න කියලා මම ඔබතුමාට ඉල්ලා සිටිනවා. හේතුව අපි කරන සැලැස්ම ක්‍රමවත් විදියට පිළිවෙලකට කරන්න ඕන කියන යෝජනාව මම කිරීමට කැමතියි.

<u>ගරු නගරාධිපති - එන්. ඩී. නිශාන්ත ප්‍රදීපකාන්ත මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඇත්තටම වැදගත් ඔබ ඉදිරිපත් කරපු කාරණාව. ඔබ දන්නවා අපි කවුරුත් දීර්ඝ කාලයක් මේ සභාවේ මේ යෝජනාව පවත්වාගෙන ගියා. නමුත් අවසන් ප්‍රතිඵලය තාමත් තියෙන්නේ අර ජනතාව පීඩාවට පත්වෙන එක නැවැත්වීමට වැඩිපුර මොකුත් අඩුවෙලා නෑ. ඒ නිසා ස්ථිරසාර විසඳුමක් ඕනා. දැන් ඒ ස්ථිරසාර විසඳුම සඳහා අපි හැමටම එක තැනකට ඇවිල්ලා අපි සම්බන්ධවෙලා ලොකු සාකච්ඡාවක් කරගන්න වෙයි. එතකල් මම හිතනවා කෙටිකාලීන අපි ගත්තොතින් එහෙම ජන්වැලි මාවත වගේ තැනක සුද්දාගේ මෝල ඉදිරිපිට විශාල ප්‍රශ්නයක් තියෙනවා අර ස්ථිරසාර විසඳුමක් එනකල් බලන් ඉන්න බෑ. පම්පයක් දැම්මා. එතකොට දැනට අපි කෙටිකාලීන විසඳුමක් ලෙස පම්පර් සිස්ටම් එකකින් වතුර අදිනවා ප්‍රධාන කාණුවට, ඒක අසාර්ථකයි. ඉතින් ඒ නිසා. නමුත් හැබැයි කෙටි කාලීනව කරන්න වෙයි. නැත්නම් ධර්මේන්ද්‍ර ලේන් එකත් එහෙමයි. ඒ නිසා අපි කෙටි කාලීන විසඳුම් හොයාගෙන යන්න වෙනවා. ජනතාව විතරක් තියන්න බැහැ. ඇත්තටම ස්ථිරසාර විසඳුමකට අපි යා යුතුව තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. සචිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේකට වැදගත් නිසා මම මේ කියන්නෙ. එතන අපේ කාණු පද්ධතිය අපි ඩිසයින් කරද්දී මාර්ග සංවර්ධන අධිකාරියෙන් කොටස් හතරකට තමයි ඩිසයින් කරලා තිබුණේ. එතකොට ඒකේ එක කොටසක් තිබුණා පිටිපාරේ තියෙන්නේ දැන් ඔය සුද්දාගේ මෝල් වැස්සම වැද්දගෙ මෝල ළඟනාවනෙ යන්න එතන ඉඳලා ඒ ලුන්කරනා ඉඳලා ඒ කොටස අපිට ගත්තොත් එහෙම මුලින අදියරේදී ඔය මාර්ග සංවර්ධන අධිකාරියේ තියෙනවානෙ මුදල් ප්‍රතිපාදනයක්. ඒ ප්‍රතිපාදනයෙන් ඒ කොටස පටන් ගත්තොත් ඒකෙ ඩිසයින් එකත් කරලා ඉවරයි. ඒ විතරයි සාධාරණ විසඳුමක් ඒ පළවෙනි අදියරේදී ලැබෙනවා. එතකොට මූලික වශයෙන් එතනට ඉලක්ක කරලා ඒ කොටස් පහෙන් මූලික වශයෙන් තිබ්බ ඩිසයින් එකේ ඒ කොටස කරන්න පටන් ගත්තොත් ඒ වතුර ටික බැහැල යන්නෙ ගරු නගරාධිපතිතුමා උඩ තියෙන අළුත් පාලම ළඟින් තමයි බහින්නෙ. එතකොට ඒකට සාධාරණ විසඳුමක් වෙනවා. ඒ වගේම නැත්නම් කාණුවල් කඩලා ඔය ඇතුලෙන් බට බස්සලා දාන්න ගියොත් එහෙම ඒක අවිධිමත් සංවර්ධනයක් උනොත් අර අපි කරන යෝජිත පුනරාවර්තන විසඳුම්වල නම් දෙයක් වෙන්න පුළුවන්. ඒකත් සාකච්ඡා කරලා ඔබතුමා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන්න ඒ ඩිසයින් එකේ කොටස් පහකට කඩලා තියෙන එකේ පළවෙනි කොටස විධිමත්ව අර ටික කරන්න කියලා.

<u>ගරු නගරාධිපති - එන්. ඩී. නිශාන්ත ප්‍රදීපකාන්ත මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (03) දරන යෝජනාව ඉදිරි කටයුතු සඳහා කාර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(04) මහා නගර සභා මන්ත්‍රී, එම්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

"කොරළවැල්ල පොදු සුසාන භූමිය පිටුපස පිහිටි වත්තේ විශාල නිවාස ප්‍රමාණයක් ඇති බැවින් වැසි දිනවල ජලය බැස නොයාම හේතුවෙන් එම ජනතාව මහත් පීඩාවට පත්වී ඇත. මෙයට පිළියමක් ලෙස ජලය බැස යාමට අවම භූමියේ භූගත නල මාර්ගයක් ඉදිකරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරන්නීය"

නියෝජ්‍ය නගරාධිපති, එම්. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි අදහසක් ඉදිරිපත් කරන්න ඕන. කොරළවැල්ල හුණුපිටිය පිටුපස තිබෙන ඒ වත්තෙ ගරු නගරාධිපතිතුමා කාලයක් තිස්සෙ මේ මිනිස්සුන්ගෙ ප්‍රශ්නෙ වැසි ජලය බැස නොයාම නිසා මහත් පීඩාවට පත්වෙලා. ඔබතුමාත් මම හිතන්නෙ ගිය සතියෙ හම්බවුණා. හම්බවෙලා ඔබතුමාට කිව්වා මේක ලොකු පීඩාවක් වෙලා තියෙන්නෙ. මේ දරුවෝ පාසල් වෙලාවට යන්න බෑ. වැසි ජලය විතරක් නොවෙ ඔවුන්ගේ වැසිකිළිවල වතුර උතුරා ගිහිල්ලා ගිහිල්ලා උතුරලා යනවා. මේක කරන්න පුළුවන් මොකද මේක ලොකු වියදමක් යන්නේ නැහැ. මේ භූමියේ ඉක්මණින් කෙටියෙන් පොඩි මුදලකින් කරන්න පුළුවන්. මොකද එතන කාණු පද්ධතියක් තියෙනවා. අපේ කානුව ඇතුලෙන් ඇලා තියෙනවා. කාණු පද්ධතියක් ඒ විශේෂ එතන තියෙන මාර්ගයේ මීටර් 25ක් 30ක් විතර ඇත්තෙ භූගත කාණු කාර්යක් ඇලා එම ස්ථානයේ වැසි ජලය බැසයාම සඳහා අපිට අන්තිමට ඉක්මණින් කරන්න පුළුවන්. ඉතින් ඒ විශේෂ නගරාධිපතිතුමනි, සජිත් මන්ත්‍රීතුමා කියපු ආකාරයට කොහොමද නිසිලෙස ඒ වැසි ජලය බැස යාමට කරන්න පුළුවන් ස්ථානවලත් අපිට කරගන්න තිබුණු කාර්යයන් අන්තිමට පසුගිය කාලෙනය වෙලාවේදී අපි ඉදිරිපත්කල කොරළවැල්ල සමාජවාදී නිවාසත් වගෙදගේ තිබුණ කාරණාව ගත්තත් ලක්ෂ 12 ක් වැනි මුදලක් වියදම් කරලා ඒක කරන්න තිබුණා. නමුත් ඒ අවස්ථාවේ ඒ මුදල සභාව විසින් ලබා දුන්නේ නැහැ. ඒ ප්‍රදේශවාසීන් විශාල ලෙස පීඩාවට පත්වෙලා මේ වෙනකොට ඒකට මං හිතන්නේ ලක්ෂ 20 කට වඩා වැඩි මුදලක් යනවා. ඒ නිසා ඉතින් සභාවේ අවධානය යොමු කරලා දකුණු කාලයක විතරක් නොවේ මොරටුවෙම ඉන්න ජනතාවගේ වැසි ජලයට නිසි පිළිතුරක් ලබා දීම සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - ඉංජි. ඩී. තිලකාන්ත ප්‍රනාන්දු</u> මහතා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, න්‍යාය අංක 05 (04) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කාර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(05) මහා නගර සභා මන්ත්‍රී, ජී. එච්. ප්‍රදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව,**

"මොරටුව බල ප්‍රදේශය තුළ ඇති මහල් නිවාස සංකීර්ණ වල කසල එකතු කිරීම දැනට ක්‍රියාත්මක වන ආකාරය ප්‍රමාණවත් නොවන බැවින් දිරන කසල (ඉඳුල්) සතියට දින 3 ක් සහ නොදිරන කසල (පොලිතින්,ප්ලාස්ටික්,කඩදාසි) සතියට දින දෙකක් එකතු කරන ලෙසත්, අනෙකුත් ප්‍රදේශ වල කසල එකතු කිරීම විධිමත් සහ ක්‍රමවත් ලෙස කසල එකතු කිරීමට කැලැන්ඩරයක් සකස් කර සැපිනාමින් ක්‍රියාත්මක කරන ලෙසත් මෙම සභාවට යෝජනා කර සිටින්නේය."

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

මහා නග<u>ර සභා මන්ත්‍රී - පී. ස</u>මන්ත සිල්<u>වා මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, මහා නගර සභා මන්ත්‍රී, ප්‍රදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරල තියෙන යෝජනාව මම හිතන්නෙ තැළි කසල ප්‍රශ්නය සම්බන්ධවයෙන් තියෙන්නෙ. අපි අන්තිමට යෝජනාවක් විශයෙන් න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්නෙ නැතුව මේ වගේ දේවල් කරන්න පුළුවන්. සෞඛ්‍ය කමිටුව තියෙනවානෙ. සෞඛ්‍ය කමිටු තීන්දුවක අරන් මේවා කරන්න පුළුවන් දෙයක්. මම හිතන්නෙ ඔබතුමා පොඩිපිට් සෞඛ්‍ය කමිටුවට සාකච්ඡා කරලා ඔබතුමාලා වැඩපිළිවෙලක් කරන්න. ඔබතුමාලට බලය ලැබිලා තියෙනවා. අවශ්‍යකරන නිලධාරී බලය, සභාවේ බලය සියළු දේවල් තියෙන නිසා සෞඛ්‍ය කමිටුවෙත් බලය තිබෙන නිසා ඔබතුමාලට මේක සෞඛ්‍ය කමිටුව

හරහා ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩක්. මේක යෝජනාවක් විධියෙන් දාන්න ඕන නෑ කියලා මම විශ්වාස කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා.**

ගරු නගරාධිපතිතුමනි, අපි හැමවෙලාවෙම උත්සාහ කරනවා සභාවට වැදගත්, මොරටුවට වැදගත් යම් යම් යෝජනා ඉදිරිපත් කරද්දී සභාවත් අවබෝධයෙන් ඉදිරිපත් කරන්න. ඔබේ යෝජනාවට මම එකඟයි. නමුත් මේ වෙලාවේ මේ යෝජනාව අපි ඉදිරිපත් කරන්නෙ දැන් දීර්ඝ කාලයක් තිස්සෙ මොරටුවේ ජනතාව විධියට විශේෂයෙන් අපි මහල් නිවාස නියෝජනය කරන මන්ත්‍රීවරු විශාල ගැටළුවක් තියෙනවා අපි විවිධ අවස්ථාවල ඉල්ලීම් කළා පුද්ගලික මට්ටමින් කමිටු මට්ටමින් මේ ඉල්ලීම අපි කළා. පසුගිය සභාවෙත් අපි මේ ඉල්ලීම් කළා. හැබැයි මේ කිසි දෙයක් මේ වන තෙක් ඉටුවෙලා නෑ. අපි පාලන බලය අරගෙන නම් මාසයයි, ඒක ඇත්ත. ඒ නිසාම තමයි මා කල්පනා කළේ මේය සභා යෝජනාවක් විධියට ඉදිරිපත් කරලා සභාවෙන් අනුමැතිය සහිතව කඩිනමින් ක්‍රියාත්මක කරන්න. මොකද මොරටුවේ ජනතාව මේවන විට මුහුණදෙන බරපතල ගැටළුවක් මේ කසළ ප්‍රශ්නය. දීර්ඝ කාලයක් තිස්සෙ එක එකක්, විසඳුමක් වුණේ නෑ. විවිධ අවස්ථාවල අපි විවිධ ක්‍රියාමාර්ග ගන්නා. විශේෂයෙන් ගත්තොත් අපේ බිල්පත ගත්තොත් ඉතාම හොඳ ව්‍යාපෘතියක් හැබැයි ඒක අවධිමත් ඒ අවධිමත්භාවය ඇතුලේ සභාවට ආදායම ලැබෙන්නේ නෑ. මේ වගේ ගැටලු ගණනාවක් තියෙනවා. විශේෂයෙන් මම මේ යෝජනාව සඳහන් කරන්නේ මහල් නිවාස පද්ධති සම්බන්ධයෙන්. ඔබ කාටවුරුත් දන්නවා අපේ මහල් නිවාසවල ජනතාවට ලැබෙන දීප දෙකකට වඩා විශේෂයෙන් ඉහළ වගේ බද්දිල් ගෙවාගන්න බෑ. මේක දිගින් දිගටම මම පසුගිය සභාවලත් කතා කරලා තියෙනවා. සභා සීසනයකදීත් කතා කළා. පෞද්ගලිකව ප්‍රධාන ගණකාධිකාරී පරීක්ෂකතුමාටත් විවිධ අවස්ථාවල කතා කළා. නමුත් ඒවා ඉටුවුණේ නෑ. ඒ ඉටු නොවීම නිසා තමයි මම මේ තීරණය කළේ මේක සභාවට දාන්න, ඒ හේතුව තමයි. නැතුව මේක ඇත්තටම කමිටුවෙන් කරන්න තිබුණා. ඉටු නොවීම නිසා තමයි සභාවට දැම්මෙ. ඒ නිසා අපි විශ්වාස කරනවා ඊළඟ සෞඛ්‍ය කමිටුව ඇතුලේදී අපි මේක සාකච්ඡාවට අරගෙන කඩිනමින් මේක ක්‍රියාත්මක කරන්න විශේෂයෙන් මොරටුව පුරාම අපිට සිස්ටම් එකක් අපිට ඕන වෙනවා. පරණ ක්‍රමවේදය ගැටළු සහගතයි. කසළ එකතු එක පිළිබඳව. ඉතින් අපි ඉක්මණින් මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ගෙත් අදහස් අරගෙන සෞඛ්‍ය කමිටුව විධියට මැදිහත්වෙලා අදාල නිලධාරීන් එක්ක සම්බන්ධවෙලා අනුගාමී ඊළඟ මාසය සිටවත් මේ කටයුත්ත ආරම්භ කරන්න කියන යෝජනාව තමයි මගේ පැත්තෙන් කරන්නෙ.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඉතාමත් කෙටියෙන් අදහසක් දක්වන්න ඕන මොකද මහල් නිවාස සංකීර්ණයක ජීවත්වෙන කෙනෙක් මමත්. ඇත්තටම ඒ අදහස හා යෝජනාව ඉතාමත් කාලෝචිතයි. ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ මහල් නිවාස සංකීර්ණ කිහිපයක් මේ වන විට තියෙනවා. ලංකාවේ තියෙන විශාලතම මහල් නිවාස සංකීර්ණය තියෙන්නෙත් මොරටුවේ සොයිසාපුර. නිවාස 2000 කට ආසන්න මහල් නිවාස සංකීර්ණයක්. විශේෂයෙන්ම අපේ මොරටුවේ තියෙන මහල් නිවාස ගත්තොත් කොහේ මහල් නිවාස අති බහුතරයක් වර්ග අඩි 450 ත් 500 ත් අතර ප්‍රමාණයක් ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කුඩා ගෙවල්. එතකොට දැන් මේකේ තියෙන ගැටළුව තමයි ගරු නගරාධිපතිතුමනි, සමහර මහල් නිවාස විශේෂයෙන්ම ගත්තොත් දැන් මම නියෝජනය කරන සී ඩී රෙසිඩන්ස් අපේ මහල් නිවාසය එහෙම නැත්නම් රාජ්‍ය මුදල් වලින් හැදූ නිවාස ව්‍යාපෘතියක් නමුත් මේ නිවාස ව්‍යාපෘතියේ කැළිකසල වර්ගීකරණය ඉතාමත් හොඳ

මැදිහත්වීමක් කරනවා. එමෙන්ම කූට් 3 ක් හදලා ඒකත් පොලිතින් වගේම ඉඳුල් වගේම හැමදෙයක්ම කාඩ්බෝඩ් වගේම එහෙම එහෙම අපි වර්ගීකරණ කරනවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, මේ මෑතකදී ඉඳලා සී.වී.පී රෙසිඩන්ස් අපේ නිවාස සංකීර්ණයේ අපේ කසළ ඉවත්කිරීමේ යම්කිසි මන්දගාමීභාවයක් සිදුවෙමින් පවතිනවා. මොකද එතන ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම ඉඳුල් අපි බාස්කට් දාලා එක්කොම කරලා තියෙන්නේ. නගර සභාවට ඇවිල්ලා මේවා අරගන්න විතරයි තියෙන්නේ. දැන් දින දෙකක් හෝ එක දිනයක් හෝ ප්‍රමාද වුණොත් මොකද ගෙවල් 356 ක් තියෙනවා. මේ ගෙවල් 356 ඉඳුල්වලින් ඔතන එකතුවුණාහම සම්පූර්ණයෙන්ම ඒවා එක්කොම ඒ බාස්කට්වලින් වැටිලා ටිටිපත්තේ ඒවා අර මුහුදේ ගලලා සම්පූර්ණයෙන් අපායක් වෙලා තියෙන්නේ. දවසක් දෙකක් මෙහෙම ප්‍රමාද වුණොත් මම ඇත්තටම අවස්ථාවක් අපේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාටත් ඊයෙ පෙරේදා කතාකළා. එතුමා එකෙනෙටම ඇවිල්ලා තිබුනා එතුමා ක්‍රියාත්මක වුණා ඒ ගැන ප්‍රශංසාවත් එතුමාට පලකරනවා. මම ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි, මෙන්න සී.වී.පී රෙසිඩන්ස් කොහොමයි නැති නිවාස සංකීර්ණයකටම විශේෂයෙනම විශේෂයෙන්ම නිවාස සංකීර්ණයක් සහ ඒ නිවාස සංකීර්ණය තුළ තියෙන විශේෂතාවය සලකලා දවස් දෙකකට සැරයක්වත් විශේෂයෙන් ඉඳුල් ඉවත් කරන්න. මෙම නිවාස සංකීර්ණ ගොඩාමත් හොඳින් නගර සභාවේ කසළ කළමනාකරණයට සහාය දක්වන නිවාස ව්‍යාපෘතියක් වුණත් ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපේ අයට යම්කිසි දිරියක් එන විධියට කරන්න ඕන එක නැවත් මේක මන්දගාමී විධියට කරන්න ගියොත් ගරු නගරාධිපතිතුමනි, අපේ නිවාස සංකීර්ණයේ අයත් පුරුදු වෙනවා විළයට මිට නැත්වලට ගිහිල්ලා කසළ දාන්න. ඉතින් ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය විශේෂයෙන්ම මම නියෝජනය කරන නිවාස සංකීර්ණය ගැනත් අවධානයට ලක්කරන්න කියලා ඉල්ලමින් මේ යෝජනාව මෙතුමා ඉදිරිපත්කරපු යෝජනාව ගොඩාමත් කාලෝචිත බව මම සඳහන් කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී - එල්. මයුර හර්ෂණ අබේසේකර මහතා.

ගරු නගරාධිපතිතුමනි, යෝජනාවක් දාලා තියෙනවා බොහොම හොඳයි. මේක අපි බොහෝ කාලයක සිට බලාපොරොත්තු වුන දෙයක් අපි ක්‍රියාත්මක කරපු දෙයක්. ඔබතුමා සභාවට මේක දාන්න අදහසුත් නැහැ. ආණ්ඩු පක්ෂයේ ඔබතුමාලා ඉන්නේ. අනිවාර්යයෙන්ම මේකෙ කැලෑවක්ම ඔබතුමාලාගේ දැන් අතේ තියෙන්න ඕන කොහොමද කරන්න ඕන කියලා. මම හිතන්නේ ඔබතුමා මේක මෙහෙම කරන්න ඇත්තෙ කොටියාපුර මහල් නිවාසයට ගිහින් ඕන. නමුත් ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට මුළු මොරටුවෙම ප්‍රශ්නෙ මෙහෙම තමයි. මම හැමදාම පන්සලේ උගන්නන්න යනවා ලොරි ගණන් ලොරි නවත්තනවා අර දෙමළ කඩේට පොලිතීන් ටික ප්ලාස්ටික් ටික හැම එකම එතන බාලා යනවා. මම හිතුවා ඔබතුමාලා වැඩ පටන්ගත්තට පස්සෙ අමුතුවෙන් දෙයක් කරලා මේක නවත්තලා පයි මෙසිල් එකට ගෙනල්ලා අපේ දැන් තැටිඅල්ලෙනක් වැඩ කරනවා ඒකට ගෙනල්ලා මොනාහරි දෙයක් කරලා ඒකෙන් ආදායමක් උත්පාදනය කරයි කියලා මම හිතුවා. කොහොමත් අපි ආණ්ඩුකරන කාලෙ පටන් මෙසිල් එක පටන්ගත්තා පටන් අරගෙන ලක්ෂ හතලිස්හතරක් අරන් නගර සභාවට මුදල් සංස්පත් කලා. ඔබතුමා ඒ කාලෙ අර පූද්දැලෙ ඇඳන් හිටියා මුදල් හොරකම් කලා කිව්වා නගරාධිපති සල්ලි ගැහුවා කිව්වා සී.පී.එච්.එයි. හොරකම් කලා කිව්වා දැන් අනුරිය අවුරුදු දෙකහමාරෙ ඔප්පු වුනේ නැහැනෙ. දැන් ඒ සල්ලි කොහෙටද යන්නෙ. ඒ මින්නොම යන්නෙ ගරු නගරාධිපතිතුමනි, කළකවාතපරයින්ගෙ ඩැංකුවලට මම හිතුවා ඔබතුමාලා මෙනාවා හරි ඇක්ෂන් එකක් ගනී, පරිපාලකවරු ඉන්නවා ට්‍රැක්ටර් පස්සෙන් යන කට්ටිය ඉන්නවා ඒ මිනුත්ම නෑ. හැමදාම මම උදේ අටට දහම්පාසල් යනවා මට පේනවා ලොරි නවත්තනවා බානවා බානවා බානවා යනවා. ඔබතුමාලා ගන්න ඇක්ෂන් එකක් නෑ. මම කියන්නේ

මේ සංවර්ධන සැලැස්ම ඔබතුමාලා හදන්න ඕනා. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, දැන් මේ බෙල් එකේ වැඩේ වෙන්නෙ නැ හරියට එතකොට ආදායම් මාර්ගය අපිට නැතිවෙලා තියෙනවා. ආදායම් උත්පාදනය කරන්න උත්සාහ කරනවා නමුත් ඒ ආදායම් ටික එළියට යනවා. දැන් නගරාධිපති තුමන්ලාගේ නැහැ ගෙවන්නේ කරන්නෑ. දැන් ඒ සල්ලි ටික යන්න එපැයි නගර සභාවට. දැන් එසෙම්මෙන ඔබතුමා කිව්වේ, මගේ වාහනේ ලීසිං එක ගෙවන්නෙත් කුණු සල්ලිවලින් කිව්වා. ලීසිං මන්ත්‍රීතුමියත් ඒ කාලේ මට ඒ කාලෙ ඔහොම කතන්දර කිව්වා. චෝදනා නවත්තලා ජනාධිපති කුමාර සභාපති රවීන්ද්‍ර රංගන මන්ත්‍රීතුමා ඔබතුමන්ලා වැඩපිළිවෙලක් ගේන්න අපි සහයෝගය දෙනවා. වැඩ පිළිවෙලක් ගෙනල්ලා දැන් බෙල් එකේ දැන් හැටදෙනෙක් වැඩ කරනවා එක මෑන් පවර් වලින්. ඒ මෑන් පවර් ළමයින්ට දෛනික වැටුප ලැබෙන්නෙ රු. 1400.00යි. අපේ කොමසාරිස්තුමිය ඇහුවොත් කියයි. වැඩ බලද්දි ඒ මෑන් පවර් ආයතනයට රු.2700.00 ක මුදලක් ගෙවනවා. නමුත් එහෙත් ඉන්නෙ සේවා නියුක්තිකයින්.මෙතනත් ඉන්නෙ එහෙම. මේ අයට රු.1400.00 ගෙවනවා. මේ රු.1400.00 න් වැඩ කරන්න බෑ නගරාධිපතිතුමනි. ඒකත් පොඩ්ඩක් බලන්න. මිනිස්සුන්ට එපාවෙලා තියෙන්නෙ. ඒනිසා සේවකයො සතුටු කරන්න ඕනෙ. ඒකත් බලලා මේ වැඩ පිළිවෙලට අපි අනිවාර්යයෙන් සහයෝගය දෙනවා. එතනින් වැඩේ පටන්ගමු සුදේෂ් මන්ත්‍රීතුමා. පොඩ්ඩක් කැත්වෙලා තියෙනවා. අපේ ගෙවල්වලත් එහෙමයි කුණු ටික ඇදෙන්නෙ නැහැ. දැන් ඔය ගිය සුමානෙ ඉරිදා හොඳ වැඩපිළිවෙලක් කලා පාන්දර 1.30 වෙනකල් වැඩකරලා කටුවිය ඔක්කොම පාරවල් ටික ක්ලීන් කලා. ඒක ගොඩාක් හොඳයි. ඒ නිසා පොලිසියටත් අවස්ථාවක් දෙන්න ආය ඔය ලොරි ටික ආය කාණු වලට හලන එක නවත්තලා ඒ වැඩ ටික කරගෙන යන්න ඔබලාට අපි සහයෝගය දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් කතා කරන්න ගොඩක් වෙලාවල් නැ. මං හිතන්නෙ කතා කරන්න ඕන දේවල් ටික කතා කලා. හැබැයි පොඩි ගැටළුවක් තියෙනවා මේ යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවක් මොකද හේතුව නිවාස සංකීර්ණවල ඉන්න මිනිස්සු දැඩි අපහසුතාවයකින් තමයි ඉන්නෙ මේ කුඩුල් ටික තියාගෙන ඉන්නකොට. හැබැයි මෙතෙන තියෙනවා පසුගිය විපක්ෂ දෙනක කාල සීමාව තුල කවුරු හරි කිව්වොත් එහෙම ඊට කලින් කුණු ප්‍රශ්න තිබුනා කියලා මේ වෙලාවෙදි අපි ඒක පිළිගන්නේ නැහැ මොකද හේතුව අමන්ලාල් ප්‍රනාන්දු නගරාධිපතිවරයාට විරුද්ධව වැඩිම චෝදනා එල්ල කරපු පුද්ගලයෙක් මම. හැබැයි අපිට චෝදනා එල්ලකරන්න බැහැ කසල ඉවත්කිරීම සම්බන්ධයෙන් මෙවරවුනේ. මොකද හේතුව දිවයිනේ මීගමුව නගර සභාව තමයි කසල ඉවත් කිරීම සම්බන්ධයෙන් ඉදිරියෙන්ම සිටියේ. අපි ඒක පිළිගන්න ඕනෙ කවුරු නැහැයි කිව්වත්. හැබැයි පසුගිය අවුරුදු දෙක තුල අපි දැක්කා සැම තැනම කසල ගොඩවල් පිරිලා මීගමුව කුණුවෙලා තිබ්බෙ. ඔබතුමාට අභියෝගයක් ඇවිල්ලා තියෙනවා දැන් අපි අර මට මතකයි 2006 අවුරුද්දේ අපි බලයට පත්වෙනකොට මුළු මීගමුවම එකම කුණු කන්දක් තිබ්බෙ. මීගමුවේ සම්පූර්ණ පාරවල් කුණුවලින් වහලා. ජෝලී ප්‍රනාන්දු මාවත කුණුවලින් වහලා තිබ්බෙ. කපුබැද්ද හන්දියෙන් හරිය එක පාරින් යනකොට මිනිස්සු නහය වහගෙන ගියේ. අන්ධ මනුස්සයෙක් හරියට ඒක පාරින් යනකොට ඒ මනුස්සයාට කියන්න පුළුවන් මේ යන්නෙ හරිය එක පාරින් කියලා ඒ තරම් ගඳක් තිබ්බා. කටුබැද්ද වෙල්ලවීදිය පාරින් යනකොට මිනිස්සු නහය වහගෙන ගියේ. එහෙම තත්වෙක තමයි අපි 2006 බලයට ආවේ. ඉතින් එහෙම තත්වයක බලයට ඇවිල්ලා අපි කුණු ටික නිවැරදිව ඒ කාලසීමාවෙදි නැතිකලා. හැබැයි ඒක දිගටම කරගෙන ගියා හිටපු නගරාධිපතිවරයා. හැබැයි පසුගිය අවුරුදු දෙකක කාලසීමාව තුල කුණු කුණුවෙච්ච ඒවා කාම තියෙනවා. අපේ රංගන මන්ත්‍රීතුමාට සෞඛ්‍ය කමිටු සභාපතිවරයා හැටියට මම දකිනවා එතුමා යම්

කාර්යභාරයක් කරන්න ලොකු උත්සාහයක් ගන්නවා. අපි ඒක ප්‍රශංසාත්මකව දකිනවා. ඉතින් කරන්න යමක් වැඩි තියෙයි. මොකද හේතුව පසුගිය කාලසීමාව තුළ මේකෙ සම්මතය ගන්න වීතරයි දැකලුවෙ. මේක නිකං අන්දරු වාර්තා හද හද අවංගුවිල්ලට හදනවා ඇමැරු වාර්තාවල් ඒවිය සටහාවා, කනිකර ගෙවැරුමෙන් තමයි මේ නගර සභාව අගතිවීමට, කල්ලරුමට කියනවා නම් නැහැයි කියලා ඔප්පු කරන්න පුළුවන් සාධක අපියාව තියෙනවා. ඒ නිසා මේ කතා කරන හැම වචනයක්ම විශේෂම අපි භාරගන්නවා. ඒ නිසා කනිකර මෙරගෙවන් තමයි මේක ගියෙ. මේක නිලධාරීන්ට පළාත් පාලන කොමසාරිස්වරියට ආදී නිලධාරීන්ට මේක මහා පුරප්පුරයක් කියලා පෙන්නලා මේක ඇතුළ මිනිස්සු විශාල වශයෙන් අපහසුතාවයට පත්කරපු පිළිවෙතයට ලක්කරපු පාලනයක් තමයි පසුගිය කාල සීමාව තුළ කොමසාරිස් පාලනයේ තිබ්බේ. ඒ නිසා අපි පැහැදිලිව ඔබතුමාට කියනවා සුදේශ් මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව හොඳයි. මේ යෝජනාවෙන් එන්නෙම දැන් ප්‍රශ්නෙ තියෙන්නෙ දැන් පහල් නිවාසවල විතරක් නෙවේ මේ ප්‍රශ්නෙ තියෙන්නෙ. දැන් අපේ පැතිවලත් තියෙනවා ප්‍රශ්නෙ. ඉඳුල් ගෙනියනකොට අපේ පැතිවලත් ප්‍රශ්නෙ තියෙනවා, ඒනිසා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න. පුළුවන් නම් මේ එක දවස දැන් ඉඳුල් ගෙනියන්නෙ අපේ හාමිනානයෙන් පැත්තකට සතියකට එක දවසයි. ඉතින් සතියකට එක දවසක් වෙනකොට සතියක් කුණුවීම අපේ ඇතුළෙ තියාගෙන මොකද මිනා ලොකු ඉඩම් නෑ මේ මොරටුවෙ මිනිස්සුන්ට පර්චස් තුනයි, හතරයි, දෙකයි, පහයි, හයයි ඒකමයින් මිනිස්සුන්ට තමයි නගතට වැඩිය තියෙන්නෙ. ඉතින් ඒ නිසා කුණු කුණුවෙනවා. පසුවෙනකලා තමයි හැමදාම කුණු එක උළියෙන් තියෙන්නෙ. අපි ඒක අත්දකිනවා. ඒ නිසා අපි ගොඩක් ගෞරවයෙන් ඉල්ලනවා පුළුවන් නම් මේ ඉඳුල් විශේෂයෙන් ඉඳුල් ගෙනියන්න පතියකට එන දවසක් නම් මේ සතියකට අවුම කරමින් මිහැද් නිවාසවලනම් දවස් හතම ගෙනිච්චත් කමක් නෑ. ඒ තරම් මිනිස්සු අපහසුතාවයට පත්වෙනවා ඒකෙන්. නැතිනම් පුළුවන් නම් සාමාන්‍ය පැතිවල දවස් දෙකක්වත් කරගන්න පුළුවන් නම් ඉඳුල් ගෙනියන එක මම හිතන්නෙ ඒක වඩා වැදගත් වෙනවා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. කසීප් දුමින්ද පීරිස් මහතා

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ අපි කසල ගැන කතා කරන්නෙ කසල කන්ද ගිනිගන්න වෙලාවක. ඒ කසල කන්ද පසුගිය දවසක ගිනිගත්තා අපේ කරදියානා. ඒ වෙලාවේ අපේ ගිනි නිවන අංශයේ දුල්සිරි මහත්මයා ඇතුළු පිරිස සුවිශේෂී කටයුතු කරලා ඒ ගින්න ව්‍යාප්ත වෙන එක මැඩපවත්වගත්තා. අපි එතුමා ඇතුළු ගිනි නිවන අංශයට ස්තූති කරනවා. ගරු නගරාධිපතිතුමනි, මේ වගේ අන්තරායක් අපි මුහුණදුන් කළඹු කාරණයක්. ඒ නිසා ඔබතුමාට මතකයි පසුගිය කාලය තුළ මේ ප්‍රශ්නය මිතුමෙවලා එනාකොට යම් ප්‍රශ්නයක් එන්න තමයි උත්තර නම්බවෙන්නෙ. ඒ නිසා ඒ ප්‍රශ්නෙ තමයි යම් ප්‍රශ්නයක් මතුවුනා අපේ සමන්ලාල් මහත්මයා ඉන්නකොට හිටපු නගරාධිපතිතුමා ඒ තමයි මේ නගර සභාවේ කසල කළමනාකරණය යන කටයුත්තේදී මම හිතන්නේ සරෝජිනී පෝල්රාජ් මන්ත්‍රීතුමියත් අනිත් පැත්තෙනුත් ගත්තට පස්සෙ අපේ උප නගරාධිපතිතුමියත් ගිහිල්ලා මම හිතන්නේ මේක නිසියාකාරව ඉටු කරන්න බැරි බවට ඔබතුමියට මතක ඇති කසල නිසියාකාරව වෙන් වෙනකොට දුනාව මිනල් නිවාසවල ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතුවුනා. ඒක සම්බන්ධ වාර්තා තියෙනවා. අපිට පෙන්නන්න පුළුවන්. කමක් නෑ කොහොමම වුනත් අද ප්‍රශ්න එනකොට තමයි උත්තර නම්බවෙන්නෙ. ඒ නිසා මේ සභාව තුළ ගරු නගරාධිපතිතුමනි, හිටපු නගරාධිපතිතුමා මේකට විසඳුමක් නොයමින් ඉන්නකොට අපි යෝජනා

කාලා මේ අපේ තියෙන කසල කළමනාකරණ මධ්‍යස්ථානය අපි ජපානෙ තියෙන ශිනකොසු දූපතේ කම්කාට්සු නගරයේ ආදර්ශයට අනුව වර්ග 41 කට වර්ග කරන්න පුළුවන් කියලා යෝජනාවක් මම ගෙනාවා. ඒ වෙලාවේ හිටපු නගරාධිපතිතුමා මේ සභාව නවත්තලා ගිහිල්ලා අපි කොහොමද ඒකේ කිසුවිකල් ගෙන්වන කියලා කතාකරා මම කිව්වා මෙන්න මේ වගේ මේ ස්ථානයේ තමයි අපිට ගන්න පුළුවන් කියලා. ඒ අනුව ඒ කාර්යය ආරම්භවුනා. ඒනත් එක්ක අද වෙනකොට ගරු නගරාධිපතිතුමනි, අපි මේ කසල කළමනාකරණ මධ්‍යස්ථානයත් එක්ක මේක සංවර්ධනය කරනකොටත් තමයි මිහිල් නිවාස සහ අනෙකුත් ස්ථාන ග්‍රාම සේවා වසම් 42 කොට්ඨාශ 29 ක කසළ කළමනාකරණය විධිමත් කරන්නේ කොහොමද කියන එක කතා කළ යුත්තේ. ඒක නැත්නම් ගරු නගරාධිපතිතුමනි, කුණු තමයි ප්‍රධාන සාධකය නගර සභාව හොඳට කරනවාද නොකරනවද කියන මිණුම් මනින්නේ. මේ කිව්ව විධියට ඒ නගරාධිපතිතුමා අපි සියලුදෙනාගෙම අදහස් අරගෙන අපේ අදහස් අරගෙන ඒවට කන්දීලා ඒ වෙලාවේ සභාව නවත්තලා ගිය නිසා අපිට පුළුවන් වුනා ජපානයේ ශිනකොසු දූපතේ කම්කාට්සු නගරයේ තියෙන ආදර්ශය ගේන්න. ඒ නිසා අපේ කොමසාරිස්තුමියටත් අනුගිය කාලේ පුළුවන් වුනා ඉන්දුනීසියාවේ තිබ්බ කසල කළමනාකරණය පිළිබඳ කුසලතා සම්මානය ගිහිල්ලා ගන්න. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මේක මීට වඩා දියුණු කරන්න බැරිද පුළුවන්. මේක දියුණු කරන ගමන් මේක අපිට යම් ආදර්ශයක් බවට මේ අග්නිදිග ආසියාවේ හොඳ වෙනස් තැනක පත්කරන්න පුළුවන් යම් මට්ටමක තියෙන කසල කළමනාකරණ මධ්‍යස්ථානයක්. ඒ නිසා අනුගිය කාලයේ අපි දන්නා විධියට මාසෙට ලක්ෂ පහ ආදායම ලැබුණා. ඒක අනුව අවුරුද්දට ලක්ෂ හැටක් විතර ලබන්න පුළුවන්. හැබැයි ගරු නගරාධිපතිතුමනි, මේක ලක්ෂ හැටකට වඩා ආදායමක් ගේන්න පුළුවන් අද තියෙනවා එක්ස්ටෙන්ඩඩ් ප්‍රොඩියුසර් රෙස්පොන්සිබිලිටි කියලා. නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම යටතේ අද මේ කසල කළමනාකරණය ඕන තරම් මුදල් ආයෝජනය කරනවා. ඒගොල්ලෝ අපි බෝතල් ටික ලබා දෙනවා බෝතල් ඒකට වෙනම සල්ලි හම්බවෙනවා ඒත් එක්කම කසල කළමනාකරණයට වෙනම මධ්‍යස්ථානයට හම්බවෙනවා. ඒ නිසා මම හිතන්නෙ අපිට කුඩා ආදර්ශ එකක පහකට වුණ හිතන්නෙ අපිට මේ අවස්ථාවේදී ලැබිලා තියෙනවා. ඒ අවස්ථා පහ අපිට උපකාර ගන්නොත් ඊන්න ඕය කියන මහල් නිවාස සංකීර්ණයෙත් ඒක ස්ථාපිත කරන්න පුළුවන්. ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, ඊට පස්සෙත් අපිට පුළුවන් මේ එල්.ඩී.පී , එස්.ඩී.පී, පී.ඊ.ටී. පොලිවිනයිල් ක්ලෝරයිඩ්, ලෝ ඩෙන්සිටි පොලිප්‍රොපිලීන්, හයිඩෙන්සිටි පොලිප්‍රොපිලීන් කියලා වර්ගවලට වෙන් වෙනවා. ඒ වගේම පී.පී කියලා තියෙනවා, පොලි ප්‍රොපිලීන් කියලා, ඒත් එක්කම පෙට් කියලා තියෙනවා ඒ පෙට් වලින් අද හදනවා නූලක් ඒ නූලෙන් තමයි ෂර්ට් හදන්නෙ අපේ ශ්‍රී ලංකා ටීම් එකට. ඒ නිසා අද වෙනකොට ඒක දියුණුවෙලා තියෙනවා. ඒ තැනට තමයි අපේ මේ බඩු ටික යන්නෙ. එනකොට අපිට පුළුවන් නම් මේක යම් විධියකින් අමුද්‍රව්‍යයක් විධියට නිෂ්පාදනය කරන්න මේක නිෂ්පාදන ක්ෂේත්‍රයක් බවට පත් කරන්න ඒ දැනුම හැකියාව සහ අපිට වගේම එතින් තරම්වියටත් තියෙනවා. ඒ සම්බන්ධව ඒ අතරවාරයේදී ඔබතුමාගේ අවධානය යොමු කරනවා අද වෙනකොට කොරවලපිටිය කසල බිලාගාරය යම් අවභාවිතයක් තියෙනවද කියලා හොයා බලන්න. ඒ කසල බිලාගාරයට තමයි අපිට මේ කසල නැවත ප්‍රතිචක්‍රීකරණය කරන්න බැරි කසල ටිකක් ටෙට්‍රාපැක් ටික යන්නෙ. හැබැයි ඒක අවසාන වුණොත් අපේ මේ ටෙට්‍රාපැක් ටික සහ ඒ වගේම එන ඇඳුම් වගේම අනිත් පැත්තෙන් යන්නට පස්සෙ විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයාවත් මේක නොතියන් නෑ විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් මේ කාමරේ මාතෘකාව පාරන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කරගෙන ඒක බැහැර කරන්න බැරි තත්වයකට පත්වෙලා ඉන්නවා. මම හිතනවා ඒ පිළිබඳවත් අපේ අවධානය යොමු කරන්න ඕන. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මෙවැනි නියමාකාර විසඳුම් ලබා දෙන්න පුළුවන් තැන තමයි කොරවලපිටිය. ඒ කොරවලපිටිය අපි පමණින් ප්‍රයිවට් පාට්නර්ෂිප් එකකින් අද ආරම්භ කරලා

තියෙනවා සකල විදුලි බලාගාරයක්, ඒ සකල විදුලි බලාගාරයට අනුව දැයකාට ගමනාගමනට දහය ගානෙ දවසට දෙසිය හතලිහක් හදන්න පුළුවන්. ඊට පස්සෙ ඊළඟ එක අපි ආවා ඊළඟ වැඩපිළිවෙළ තමී කරදියාන වත්තෙ සකල බලාගාරය ඒකෙ සියට 40 ක් වැඩ ඉවරයි.මන්ත්‍රීතුමාගෙ සාකච්ඡාවට කියලා අපි ඒ සියට 40 වැඩ අවසන් කරපු තැන ඒ කටයුත්ත ඉස්සරහට ගෙනියන්න පුළුවන් වුණොත් අපිට කොළඹ නගර සභාවට ආදායමක් එන විදියට යම් ව්‍යාපාරයක් එකක් හදා ගන්නොත් පුළුවන් වෙනවා. ඒ නිසා ඒකාට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අනිත් පැත්තෙන් මීතිරිගල පොහොර ක්‍රමය එනනා යනවා. අනිත් පැත්තෙන් අපේ ගත්තට පස්සෙ කිරිබත්ගොඩ මැනිං මාර්කට් එකේ තියෙන මාළු කෙළවල්ලා එලව ගම් එක්කොම ඇවිල්ලා එයාන් හදනවා බිජ බෝග් එකක් වොෂින් එකක් හදනවා ඒකෙන් තමයි ඔය කාබනිකාර්මයට මීන කාපන ගොඩ පොහොරන් හැදෙන්නෙ. ඒ නිසා මේවත් එක්ක අපිට ඒකාබද්ධ වුණොත් තමී සියලු ප්‍රශ්නවලට විසඳුම් තියෙනවා. ඒ නිසා මම හිතන්නෙ අපේ අර මීගි සෙන්වර්ස් ටිකා සී. පී. එච්. අයි. මහත්තයා අපිට ඉල්ලීමක් කරන්න පුළුවන් නම් එක්ස්පෙන්ඩිට් අනුපිළිවෙළට පරශ්ෂයෝසිබිලිටි යටතේ විස්තීරණ ආපදා තත්ත්වය යටතේ අපිට පුළුවන් නගර සභාවට ඒ පෙනෙ කරන කටයුත්ත කරන්න. ඒ නිසා ගරු නගරාධිපතිතුමිනි, එදා මම නගරාධිපතිතුමාටත් ඔය පිළිබඳ මිතක් කළා. ඒ ප්‍රශ්නය මතුවෙච්ච වෙලාවේදී, ඒනිසා ඒ ප්‍රශ්නෙට අපිට විසඳුම් හොයන්න පුළුවන් නගර සභාවක් විධියට මම එදා කියපු ප්‍රශ්නෙ තමයි මේ ප්‍රශ්නෙ අපේ රටට විතරක් නෙමෙයි විශේෂයෙන් අනිකුත් රටවල්වලටත් මහා දැවැන්ත විධියට බලපාපු කාලයක් තිබුනා. ඒනිසා වැන්කුවර්, රුවන්ඩා, උගන්ඩා, බුරුන්ඩි, කින්ෂාසා ඒ වගේම එරිත්‍රියා ඔය නායිල් ගඟ පටන් ගන්න ඒරියා එකේ ඉඳලා මහ විනාශයක් වෙලා තිබුණේ. නැමැයි ඒකටත් ලංකාවේ කට්ටිය තමයි ගිහිල්ලා උපදෙස් දීලා ඒක හැදුවේ. ඒ නිසා මම හිතන්නෙ එහෙම ශක්තියක් අපිට තියෙන පිරිසක් මෙතන ඉන්නවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මේක කටයුතු කරන්න අපි මේ කළමනාකරණ ඒකකය වගා වේගමින් කරන්න වඩා මුළුල් කරන්න ඒ සඳහා නිෂ්පාදන ඒකකයක් හැටට පත් කරන අතරවාරයේදී මේකට ඒනි කන්සෙප්ට් එක ගෙනල්ලා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - ඉංජි. වී. කිශෝන්ත ප්‍රදීපාන්ද මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉතාම කෙටියෙන් අදහසක් කිව්වොත් එහෙම මේ ප්‍රශ්නය ජනතාව සහ සභාව අතර තිබෙන පොදු ප්‍රතිරෝධයක් තියෙනවා කම් එන්න තිබෙන ගැටළුවක් ඒ නිසා විශාල වෙහෙසක් මහන්සියක් ගනිමින් තියෙනවා මේය ජනතාව පීඩාකාරී නොවන මට්ටමකට මිනුන්ගේ කසළ ටික ඉවත් කර ගැනීම සඳහා දැනට අපට තියෙන සම්පත් හොඳින් කළමණාකරණය කර ගන්න. සැලකිය යුතු අපහසුතා ටිකක් තියෙනවා. වාහනවල තිබෙන දුෂ්කරතා, සේවකයින්ගේ තිබෙන ගැටළු ජනතාවගේ තිබෙන යම්කර සිද්ධිගේ ව්‍යාපෘති මධ්‍යන් පවත්වගෙන යන තත්වයක් තමයි මම හිතනවා මේ වෙනකොට සාමාන්‍ය ලෙස ගන්නොත් යම් බලෙකින් එකක් නැතුව පවත්වගෙන යනවා. සමහර පැතිවල බොහෝවිට දින දෙක තුනක අඩුව අවස්ථා තිබෙනවා. හැබැයි අනෙක් ලෝ පොරබදමින් ඉන්නවා හරියට කසල ටික එකතු කර ගන්න. ඒකෙන් කියන්නෙ අඩුපාඩුකම් නැතුව නෙමෙයි. වාහන කැඩෙනවා, වාහන කැඩෙනවද කවුනාවද කියලත් හොයන්න ඕන සම්හර ඒවා. අවශ්‍ය වාහන ප්‍රමාණය නැහැ. වාහනවල ඉතාම අබලන් ස්වභාවය මහන්සි වෙනවා. ඒ නිසා අපි ඔබ කතා කරපු අදහස් වටිනවා මේ යෝජනාව සංශෝධනවත් කමිටුවකට යොමු කරන්න තියෙන යෝජනාවක් නොවෙයි. අප විසින් කළයුතු එකක්. ඒ නිසා අපි අදහස් කරනවා අලුත් වාහන පදක තුනක් ඉක්මණින්ම ගන්න. එතකොට අපට හැකෙන ප්‍රමාණයකට මේ තත්ත්වය වෙනස් කරගන්න පුළුවන් වෙයි. අපේ ඔයද මන්ත්‍රීතුමා හැදියත් කතාවක් කතා කලා එය සතයක් ඒ කියන්නෙ මෙල් එකේ ආදායම හිටපු නගරාධිපතිතුමා ඉන්න

කාලෙ මීට වඩා ඉහළ මට්ටමක තිබුනා. එතකොට සැලකිය යුතු ලෙස අපේ බුයිවස්ලා අර ජීගොල්මලා පීට්ට් අඳන වඩින දේවල් මේ ස්ථානයට ගෙනත් දුන්නා නගරාධිපතිතුමා මතක්සි වුනා. ඒක පිළිගන්න ඕන. හැබැයි දැන් යම් මට්ටමක මේක පහළට ගෙනත්තාරලා තියෙනවා. මේකට කරුණු කාරණා සැලකිය යුතු ප්‍රමාණයක් හොයාගෙන තියෙනවා. ඉතා ඉක්මණින් මේ තත්වය වෙනස් කර ගන්න මැදිහත් වෙනවා. ඒක කරගත යුතුයි. අපි ඉතාම හොඳ කසළ කළමනාකරණ ව්‍යාපෘති කිහිපයක් හඳුනාගත්තෙ නැත්නම් අපිට විශාල ප්‍රශ්නයකට අනාගතේදී මුහුණ දෙන්න වෙනවා බව තමයි දැනට මහාමොළ කසළවත්තේ ඉතින් පහළ කරමින් තියෙන්නේ. ඉතින් ඒ නිසා අපි කවුරුත් මේ පිළිබඳව වැඩි අවධානයක් යොදාගෙන කතා කරමු. ජීවය පැත්වල යම් එහෙම අදින්නෙ නැති තත්වයක් තියෙනවා නම් දින දෙක තුන යනකොට ඉක්මණින්ම පාසා කරන්න. මම හිතන්නෙ යසන්ත මහත්තයා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාත් දැන් වෙනකොට වඩා අපේ පී.එච්.අයි. මහත්තුරුත් මහන්සි ගනිමින් ඉන්නවා. සෞඛ්‍ය පරිපාලකවරු වගේම ඕවර්සියර් මහත්තුරුත් දැන් යම් පමණකින් කටයුතු කරමින් ඉන්නවා.

<u>ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (05) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා පරිසර සෞඛ්‍ය කමිටුවට යොමු කරනවා.

**05(06) මහා නගර සභා මන්ත්‍රී, ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව,**

"මීගමුව මහා නගර සභාව තුල දැනට පවතින උග්‍ර සේවක හිඟය නිසා සේවාවන් සැපයීමේදී විශාල අසීරුවකට පත්ව ඇති බැවින් කඩිනමින් සභාවේ පවතින සේවක පුරප්පාඩු පුරවාගැනීමට කටයුතු කරන ලෙස මෙම සභාවට යෝජනා කර සිටින්නිය."

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවීන්ද්‍ර රංජන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. දිනූෂි ඉමාෂලා ප්‍රනාන්දු මහත්මිය.</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි යෝජනාවක් තියෙනවා ඉදිරිපත් කරන්න. 05(6) යෝජනාව සම්බන්ධයෙන් අමතරව මීගමුව මහා නගර සභාවේ උග්‍ර සේවක හිඟය සඳහා සේවක පුරප්පාඩු පිරවීමේදී මම යෝජනා කරනවා දැනට නගර සභාව තුල ඉන්න සේවකයන්ගෙන් අදාල සුදුසුකම් මත ඒ පුරප්පාඩු පුරවලා ඒ වගේම මැන් පවර් ඒවාවල වැඩ කරන මිනිස්සුන්ගෙනුත් ඒ පුරප්පාඩු පුරවලා තවත් පුරප්පාඩු තිබුනොත් ඒ සඳහා පිටතින් බඳවා ගැනීම පහලොත් සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මොකද මම එහෙම යෝජනා කරන්නේ ඒකෙන් අපිට ලොකු මුදලක් ඉතුරු කරගන්න පුළුවන් වගේම දැනට සේවය කරන සේවකයන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය අපිට ඒකෙන් වැඩිකරගන්න පුළුවන් කියන කාරණාව මත මම ඒ යෝජනාව කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - වී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර ගරු මන්ත්‍රීතුමා 05(6) යෝජනාව සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒකට අදාලව මම කතා කරන්නේ ඔබතුමා පත්වුනාට පස්සෙ නගරාධිපති ධුරයට ඔබතුමාලාගේ පක්ෂය ආණ්ඩු පක්ෂය හැටියට එක වර දැක්වුනාට පස්සෙ සහ ඔබතුමාලාගේ අනුර කුමාර දිසානායක මහත්තයා රටේ ජනාධිපති වුනාට පස්සෙ නගර සභාවේ මුල් පුටු ටික මම දැක්

තිර්වා අමරුන් පාට රෝස පාට වුනා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ඔබතුමාලා පාලන විධියකට යන්නට පත්වෙන ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ එන්.පී.පී එක ඔබතුමාලා

ගරු නගරාධිපති - එස්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා.

ගරු මන්ත්‍රීතුමා යෝජනාව අදාළ විෂය සම්බන්ධව

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.

ගරු නගරාධිපතිතුමනි, ඔව් ඔව් ඒ ගැන කතා කරන්නෙ. මගේ හිතේ තියෙන දේ ඔබතුමා දන්නැහැනෙ. ඔබතුමා කාලවේල යවන්න එපා.

ගරු නගරාධිපති - එස්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කතා කරන්න දෙන්න

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට අයිතියක් නැහැ මම කතා කරන එක නවත්වන්න.

ගරු නගරාධිපති - එස්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා.

ගරු මන්ත්‍රීතුමනි, මට පාලනයක් කර ගන්න ඕන නගරාධිපතිවරයා විධියට මේක පාලනය කරන්න ඕන.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.

ගරු නගරාධිපතිතුමනි, පාලනය කරන්නෙ මොකක්ද?

ගරු නගරාධිපති - එස්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබ ජනාධිපති ගැනයි එතැනට ඔබ ගේන්න විෂය ගැන කතා කරන්නෙ

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන්නේ කොහොමද මම කියන දේ ඔබතුමා දන්නෙ කොහොමද?

සභා ඝෝෂා

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාලා බලයට පත්වුනාට පස්සෙ ඔබතුමාට අවශ්‍ය වුනා නියෝජ්‍ය නගරාධිපතිවරියට ට්‍රයිවර් කෙනෙක් ගන්න. ඔබතුමාලා ඒක හොරෙන්ම සූක්ෂමව කළා. නාගරික කොමසාරිස්වරිය 2022/12/30 කාර්ය මණ්ඩලය ඔහින් ඉදිරියට නොහැකි අදාළ සියලු ඇවරගෙන තියලා තියෙනවා. එතනෙ ඒක උපයෝගී කරගෙන මේ පත්වෙච්ච මාසෙ ඔබතුමා පත්වුනාට පස්සෙ ට්‍රයිවර් කෙනෙක් බඳවාගත්තා. ට්‍රයිවර්ලා දෙන්නෙක්. පත්වුණාම මේකේ ලස්සනම වැඩේ කියන්නෙ ඉන්ටර්වීව් බෝඩ් එකෙන් වසර 30 ක් අවුරුදු 30ක් මොරටුව මහා නගර සභාවේ වැඩ කරපු ට්‍රයිවර් කෙනෙක් මේ ඉන්ටර්වීව් බෝඩ් එකේ ෆේල්. මේ ඉන්ටර්වීව් බෝඩ් එකෙන් පාස් වුනේ තමන්ට අවශ්‍ය පුද්ගලයො දෙන්නා විතරයි. එක පුද්ගලයෙක් අවුරුදු 65 යි. එක පුද්ගලයෙක් බඳවාගත්තා නියෝජ්‍ය නගරාධිපතිගේ වාහනයේ ට්‍රයිවර් හැටියට. මොරටුව නගර

සභා ඉතිහාසයේ නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට ඩ්‍රයිවර් කෙනෙක් දුන්නා නම් දුන්නේ සංවිධායකයන් අරගෙන. කවදාවත් ඔය විදියේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම් මත අරගෙන ඩ්‍රයිවර්ස්ලා දීලා නෑ. ඉතිහාසයේ කවදාවත් නියෝජ්‍ය නගරාධිපතිලාට. දැන් මේ සැරේ තමයි ඔබතුමාලා ඒ ගෙනෙමයි, අපි වැරදි කරනවනෙ, අපි වැරදියි කියලනෙ ඔබතුමාලව පත්කලේ මිනිස්සු. ඒ නිසා අපි වැරදියි කියලා පත්කරපු නිශාන්ත ප්‍රදීපානන්දගේ පාලන කාලයේ එන්නත් ඉස්සර අවලා නිශාන්තලා ඉමන්ට තිතාදේ මේ නගර සභාව හරහා නිලධාරින් හරහා කරගෙන සිදයනවා. ඒක තමයි අපි කියන්නෙ මේ රියදුරු බඳවගන්න ක්‍රමවේදය ඔබතුමාලා ගෙනපු අන්මන්. මේක වැරදියි. ඒ වැරද්ද නැවත වරක් කරන්න එපා මොකද හේතුව ඔබතුමාලට ඡන්දෙ දුන්න මිනිස්සු ඔබතුමාලා ගැන විශ්වාස කරලා 43% ක් ඔබතුමාට ඡන්දෙ දුන්නා. ඒනිසා මේ පුෂ්පදේශ් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාවට අපේ විරුද්ධත්වයක් නෑ. අපි කැමතියි. ඒකේ කිසි ගැටළුවක් නැහැ. මේ වැඩේ හරියට කරන්න අපි දෙන්න ඕන සහයෝගය දෙනවා හැබැයි එකක් මතක තියාගන්න මේ විදියේ තමන්ගෙ මිනිස්සු ටික ගන්න නම් මේවා කරන්නෙ, තමන්ගේ ගම්වල ඡන්ද පොරොන්දු ටික ඉෂ්ට කරන්න නම් මේක කරන්නෙ කරුණාකරලා ඒ වැඩේට සුදානම් වෙන්න එපා මොකද මේ පත්කරලා තියෙන්නෙ වෙන පක්ෂ නෙමෙයි. මේ පත්කරලා ඉන්නෙ එන්. පී. පී. එක. ඒ නිසා මිනිස්සු බලාපොරොත්තු වෙන්නෙ මේක හරි දේ හරියට කරයි කියලා. ඒ නිසා හරි දේ හරියට කරනවාද කියලා අපි අවබෝධයෙන් අවධානයෙන් ඉන්නවා කියන එක අවධාරණය කරනවා

<u>මහා නගර සභා මන්ත්‍රී - කුසිත් ද සිල්වා මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, 05(6) අපේ පුෂ්පදේශ් මන්ත්‍රීතුමාගේ යෝජනාව යටතේ අපේ නිත්‍ය කම්කරුවන් වැඩිකර ගැනීම සඳහා මම යෝජනාවක් ඉදිරිපත් කරලත් තියෙනවා. අපි මේක කතා කලා අපේ කමිටු අවස්ථාවක මීට ඉස්සෙල්ලා රියදුරන් 31 දෙනෙක්ගෙන් 24 දෙනෙක් ඉන්නෙ ආවරණ පත්වීම් යටතේ. ඒ මිනිස්සුන්ට වෙනුව කරන රියදුරු බලපත්‍රය තියෙනවා නමුත් නිත්‍ය රියදුරු සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නැහැ. ඒ කියන්නෙ ඕලෙවල් වල 6යි 2 ක් ඉල්ලන ප්‍රශ්නය නැහැ. මේක නිසා අපි එගොල්ලන්ව ආවරණ පත්වීම් යටතේ පත්කරගෙන තියෙනවා මගේ යෝජනාව ඇවිල්ලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්නයක් තියෙනවා මෙතන මේ ඉන්න මන්ත්‍රීවරු මෙතන අපි පාවිච්චි කරන්නෙ සිංහල භාෂාව. එහෙම වෙන භාෂාවක් පාවිච්චි කරනවා නම් ඔබතුමාට සපයන්න වෙනවා අපිට ට්‍රාන්ස්ලේටර් කෙනෙක්. ඒ නිසා කරුණාකරලා එක්කො ඔබතුමා අපට ට්‍රාන්ස්ලේටර් කෙනෙක් ගෙනල්ලා තියන්න නැත්නම් සිංහල භාෂාවට ඔබතුමා ට්‍රාන්ස්ලේට් කරලා දෙන්න අපිට. අපි දන්නෑ ඉංග්‍රීසි. ඒ නිසා ඔබතුමා ඒක අපිට කියලා දෙන්න ඕනෙ මොකක්ද එතුමා කිව්වෙ කියලා පැහැදිලි නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කුසිත් ද සිල්වා මහතා.</u>

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන්න මම යම්කිසි අවබෝධයකට කතාකලේ. ඒ ප්‍රධාන යෝජනාව මේකයි. අපි එතනින් 24 දෙනෙක්ව නිත්‍ය රියදුරු කාණ්ඩයට එකට බඳවගන්න පුළුවන් නම් අපිට සේවකයන්ගෙන් 24 දෙනෙක් බඳවගන්න පුළුවන් වෙනවා. එතකොට මම හිතන්නේ කම්කරු සේවය ප්‍රශ්නෙ විසඳෙනවා 24 දෙනෙක්ම මේක ඇතුලට එන නිසා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - හර්ෂ චන්දන පිලාපිටියගේ මහතා.</u>**

ගරු නගරාධිපතිතුමනි, සේවක පුරප්පාඩු පිරවීම සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත්කරලා තියෙන අවස්ථාවක මම අදහස් දක්වන්න කැමතියි මේ ගරු සභාවට දැන් සේවක පුරප්පාඩු පුරවා ගැනීම සම්බන්ධයෙන්දී අපි දැනගන්න ඕනා මේ මහා නගර සභාවේ පවතින සම්පූර්ණ සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද, ඒ කවර කවර සේවාවන් සම්බන්ධයෙන් පවතින පුරප්පාඩුද, ඒ පුරප්පාඩු පිරවිය යුත්තේ කවර පදනමින් මතද, ඒ පුරප්පාඩු කවර දෙපාර්තමේන්තුවට අනුයුක්ත ද, ඒ පුරප්පාඩු පිරවීම සඳහා අපි සලකා බැලිය යුතු නිර්ණායක තුමක්ද, දැන් සුජීත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරපු ආකාරයට නිසි ක්‍රියාදාමය හා විධිමත් ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම නිසා ඇතිවෙච්ච තත්වයක් තමයි එතුමා පෙන්නලා දුන්නේ. එහෙනම් බදු ගෙවන ජනතාවගේ ඒ බදු මුදල්වලට වගකියන සභාවක් හැටියට අපේ වගකීමක් තියෙනවා මේ සභාවට අවශ්‍ය වෙලා තියෙනවා නම් මේ සභාවට කටයුතු පවත්වාගෙන යන්න සේවක පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවයක් ඇතිවෙලා තියෙනවා නම් ඒ අවශ්‍යතාවය පිරවීම සඳහා අපි නිසි ක්‍රමවේදය හා ඒ සඳහා කරන අවශ්‍ය ක්‍රියාමාර්ගය අනුගමනය කිරීම සහතික කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ යෝජනාව සම්බන්ධයෙන් මම ඉල්ලීමක් කරන්න කැමතියි ඊළඟ සභාවට, මෙම නගර සභාවේ තියෙන සම්පූර්ණ සේවකයන්ගේ ආයතන සම්බන්ධයෙන් ඉන්න ගණ වාර්තාවක් හැටියට ඉදිරිපත් කරන්න කියලා. එවගේ එක් එක් ආයතන වල ඉන්න සේවකයන්ගේ සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යා වාර්තාවක් හැටියට ඊළඟ සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සී. අජිත් දමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට මේ වෙලාවේ අයි.එම්.එෆ්. යෝජනාවකුත් තියෙනවා. පලමුවෙන් මේ කාර්යය විධිමත් කරන්න බැහැ කියලා. එතකොට මේ සම්බන්ධව රජයත් එක්ක තියෙන ප්‍රශ්න ටික බේරගන්න ඕන පළවෙනි කාරණාව. ඊළඟ එක තමයි අපිට මේ සේවක පුරප්පාඩු සඳහා නීත්‍යානුකූල ඉල්ලන්න අයිතියක් තියෙනවා ද? ඉරාන අයිතියක් තියෙනවා ද? ඔව්. ඒ තමයි සාපේක්ෂව ගත්තොත් පසුගිය කාලේ අපි කාඩර් කමිෂන් එකට නැතිනම් සේවා සේවකයන් සම්බන්ධ අපි කොහොමද මේ බඳවා ගැනීමේ තියෙන කමිෂන් එකට ඉදිරිපත් කළා යම් උපමාවක්. ඒ තමයි අපේ නගර සභාව වර්ග කිලෝමීටර් ප්‍රමාණය අනුව අපටත් කොට්ඨාස මට්ටමින් ගත්තොත් කොට්ඨාස 29කුත්, අපට වඩාම තමයි දෙහිවල ගල්කිස්ස නගර සභාවටත් තියෙන්නේ. එතකොට අපිට ඉන්නත් සේවක කාඩර් එක 999යි. දෙහිවල ගල්කිස්සට ඉන්නවා 1776 ක්. එතකොට ජනගහනය ගත්තොත් 15750ක විතර වෙනසක් තමා මට මතක විදියට. අපිට වඩා සේවක සංඛ්‍යාව 700ක් විතර වැඩියුර ඉන්නවා. ඔවුන් සුද්ධ කරන මාර්ග ප්‍රමාණය 90km ක් තමා අපට වඩා වැඩි. එතකොට නගරාධිපතිතුමනි, අපිට ඉල්ලීමක් කරනවානම් මේ සේවකයෝ නීත්‍යානුකූලව නිසියාකාර ක්‍රමවේදයකට අනුව පුරවාගන්න ඔබතුමා කළ යුත්තේ ඒ පිළිබඳ වාර්තාවක් සකස් කරලා ඒ කාඩර් කමිෂන් එකටත් මුදල් අමාත්‍යාංශයටත් මේ කටයුත්ත යොමු කරන එක. නමුත් ඊළඟට තියෙන ප්‍රශ්නය තමයි අපිට එතැනින් අනුමැතිය ලැබුණත් මම ඉස්සෙල්ලා කියපු මූල්‍ය අරමුදලේ තියෙන යෝජනා වලට අනුව, මේ වනවිට අපිට වැටුප් ප්‍රතිපූර්ණය කරන්නේ 60%ක් විතරයි. ඒ කියන්නේ අපිට ලක්ෂ 500ක් යනවා අනියම් සේවකයො

නැතුව. අනික් කට්ටියට වැටුප් ගෙවන්න. ලබන ජනවාරි 01 වෙනිදා ඉඳන් ගරු නගරාධිපතිතුමනි, ඒකෙ 40% යි එගොල්ලෝ ගෙවන්නේ. එතකොට අපි 60%ක් හොයාගන්න ඕන. ඒ කියන්නේ ලක්ෂ 200ක් ඔවුන් එවනවා අපි ලක්ෂ 300ක් හොයාගන්න ඕන. අපිට මේකත් එක්ක අලුත් සේවක සංඛ්‍යාවක් බඳවා ගත්තොත් එහෙම අපි හරියට ඉවලුමක් එකක් ගන්න ඕන වෙනවා මේ පිරිස බඳවා ගැනීම තුලින් අපිට යහාවෙන්. අනික් පැත්තෙන් අපිට ඇස්තමේන්තුගත වරිපනම් ආදායම මිලියන 274 යි. මුද්දර ගාස්තු මිලියන 260 යි. දඩ ගාස්තු මිලියන 30 යි. හැබැයි මේ වෙනකොට අපි වරිපනම් ගාස්තු වලින් ලබාගෙන තියෙන්නේ ඒකෙන් 40%ක් විතරයි. ඒ කියන්නේ අපිට උපරිම වශයෙන් ඒව කරන්න ළඟා කරගන්න පුළුවන් වෙන්නේ ගරු නගරාධිපතිතුමනි මිලියන 155 ක් විතරයි හොයාගන්න උපරිම මට්ටමට ගියා. ඒ කියන්නේ 40% නොවෙයි 60% කරවමට. එහෙම නැත්නම් අපිට අනික් පැත්තකින් කියනවානම් මේ අවුරුද්ද අන්තිම වෙනකොට තව මාස 07 ක් තියෙනවා. ඒ මාස 07 ට අපි නගර සභාව හොයන්න ඕන කෝටි 14 ක් සේවකයන්ට අර ප්‍රතිපූර්ණය කරන මුදලට වඩා මුදලක් හොයාගන්න. එතකොට ගරු නගරාධිපතිතුමනි, අපි මේකට සූදානම් ද? එහෙම නැතිනම් ලබන පාර ගත්තොත් අපි කෝටි 30ක් හොයන්න ඕන. එතකොට මේකට සූදානම් වෙලා මේ සම්බන්ධයෙන් අපි කොහොමද අපේ තියෙන තක්සේරුව එක පැත්තකින් අපේ ආදායම් තක්සේරුව. අනික් පැත්තෙන් සේවක තක්සේරුව කොහොමද අපි මේ මූල කළමනාකරණය, මානව කළමනාකරණය කරන්නේ කියන විශේෂ කාරණාවක් අපේ තියෙන මානව සම්පත් කළමනාකරණයේ විශේෂ කාරණාවක් විදියට දක්වනවා. දැන් වෙනස කළමනාකරණයෙන් අනික් පැත්තෙන් සේවකයන්ට අභිප්‍රේරණය කරන්න බැරි වුණොත් සාපේක්ෂ වැටුප්, සාපේක්ෂ දීමනා, ඊටී එහෙමකොට මේ අය අභිප්‍රේරණය වෙන්නේ නැහැ. එය හේතු කොටගෙන සේවකයන්ගේ අභිප්‍රේරණය නැති වීම හේතුවෙන් සේවා සැපයීම අඩාල වෙනවා. ඒ නිසා මේ සියල්ලක්ම ඇනලයිස් කරලා අපි රිපෝට් එකක් අරගෙන ගරු නගරාධිපතිතුමනි කාඩර් කමිටුව එකත් එක්ක කතා කරමු. අනික් පැත්තෙන් අපිට මේ නගර සභා වලට තියෙන සේවා සැපයීමක්. මිටතුමා මේ වෙලාවේ මුදල් ඇමතිතුමත් ඔබතුමාලාගේ ගරු ජනාධිපතිතුමා, පළාත් පාලන ඇමතිතුමත් ඉන්නවා. මේ සියලු පදනම් එක්කම කතා කරලා අයිඑම්එෆ් එකත් එක්කත් කතා කරලා යම් විදියකින් ඉස්සර තිබුණ් තිබුණා වගේ සස්ටේනබිලිටි එකක් කරනවා කියලා. ඒ නිසා මේ නගර සභාව පදනම විශේෂ අවස්ථාවක් ගන්න පුළුවන්ද කියලා සාකච්ඡා කරන්න තියන්න මේ වැටුප් ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන්. එහෙම නැතිවුනොත් මම කියන්නේ මට ඒක දැනෙනවා අපිට කවදාවත් කොහෙවු විරු විදියට ඒ ප්‍රශ්ණයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා වැටුප් ප්‍රතිපූර්ණයත් එක්ක ඒක කොහොමද කරන්නේ කියලා සාකච්ඡා කරන්න. කාඩර් කමිටුව එකත් එක්ක නගර සභාවටත් දෙහිවල ගල්කිස්සටත් සාපේක්ෂව අපි කාඩර් එක කොහොමද එකතු කරගන්නේ කියලා. මේ විතරක් එක්ක තමයි යන්නේ. එහෙම නැත්නම් අර තිබුණ වගේ සිහිල සිහිනයක් කියන විශ්‍රාමික කොමසාරිස්තුමියටත් එකවුන්ටන්ට් මහත්තයාටත් එනට රජකරන්න සිද්ද වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්දුජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරපු යෝජක මන්ත්‍රීවරයා විදියට කෙටි අදහසක් දක්වන්න කැමතියි. ඔබ හැමෝරුත් දන්නවා අපේ සභාවේ දීර්ඝ කාලයක් තිස්සේ මේ සේවක පුරප්පාඩු පිළිබඳ විශාල ගැටලුවක් තියෙනවා. විශේෂයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, අපේ මූලික පරිපාලන සේවය ගත්තොත් හිඩැස් විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක් පුරප්පාඩු වෙලා තියෙනවා. මන්ත්‍රීවරු ගණනාවක් විශාල යෝජනා ප්‍රමාණයක් දැක්වූවා අපි පිළිගන්නවා පාලනය අපේ. නමුත් ඒ සියල්ලට අපි සූදානමින් තමයි අපි මේ වැඩේට බැස්සේ. මම යෝජනාව ඉදිරිපත් කරන්න ප්‍රධාන හේතුව තමයි අපි ඡන්දපොල ලෙස සභාවේ නැතිකරු පත්වීම වලට විශාල ප්‍රමාණයක් බඳවාගෙන අද

විවිධ ස්ථාන වල මේ අය රාජකාරී කටයුතු කරනවා. ඔබ අප කවුරුත් දන්නවා විවිධ දේශපාලන හිතවතුන් මත දේශපාලන බලවතුන් මත ඒ බඳවා ගැනීම් සිද්ධ වෙලා පසුගිය කාලේ. අපිට දැන් ඒ සේවකයෝ අතහරින්න බැහැ. ඒ අය විශාල ප්‍රමාණයක් විවිධ ස්ථාන වල වැඩ කරනවා රියදුරන් විදියට විශේෂයෙන් ගත්තොත් පුස්තකාල වල එතකොට ඒ අය යම් රාජකාරී කටයුත්තක් කරනවා නමුත් අපි සභාවක් විදියට අපි අර්බුධයකට පත්වෙලා තියෙනවා විශේෂයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරුවෝ ඉල්ලන වැඩ කරන්න අපිට සේවකයෝ නැහැ. අපි මෑන් පවර් සිස්ටම් එකෙනුත් අපි සේවකයෝ 60 ක් පමණයි අපි අරං තියෙන්නේ. ඒ 60 න් ඒ ආයතනයක් එක්ක ගත්තොත් අපිට හැට්ටු තියෙනවා 60 ක් අපිට ස්ථිරත්වයෙන් එන්නේ නැහැ. එතකොට අපි කාරුණු සියල්ල සලකා බලලා තමයි අපි ලබන සතිය වෙනකොට අපි දැන් නිලධාරී මහත්වරුන් එක්ක සාකච්ඡා කරලා ඒ නාම ලේඛනය අපිට අවශ්‍ය පුරප්පාඩු කාඩර් එකේ තියෙන පුරප්පාඩු සියල්ල ලේඛනගත කරලා අපි ඉතාම ඉක්මනින් ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡාවක් ප්‍රදානම් කරලා තියෙනවා. ඒ විතරක් නොවෙයි ජනාධිපති ලේකම් කාර්යාලයේ නගරාධිපතිතුමා යම් පැහැදිලි කිරීමක් කරයි ඒ පිළිබඳව. එතකොට මුදල් අමාත්‍යාංශය එක්කත් අපි ඉක්මනින් රජය සමඟ සම්බන්ධ වෙලා ඒ සාකච්ඡාව කරගෙන සජිත් මන්ත්‍රීතුමා කියපු වැටුප් ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් [illegible] යෝජනාව යම් ප්‍රමාණයකට අපිට වාසි සහගත තැනකට හරවගන්න පුළුවන්ද කියලා සාකච්ඡාවක් අපි හදාගන්න ප්‍රදානමින් ඉන්නවා. ඉදිරි සතිය දෙක ඇතුළත අපි ඒ කටයුතු වලට සම්බන්ධ වෙනවා. ඒ තෙනෙත් වෙනත් අපි කණ්ඩායමක් දෙනවා සිසිල ගිනියන්න අපි ඉඩ තියන්නේ නැහැ. අපි මේක හදනවා. අමාරුයි ඒ වගේම අසීරුයි. මේක හොයාගන්න තමයි අපි පාලන බලය ගත්තේ. කාරුණු අඩුපාඩු තියෙන්න පුළුවන්. විශේෂිත රන්න පුළුවන්. ඒ සියල්ලට අපි මුහුණ දෙන්න ප්‍රදානම්. සිසිල ගිනිගත්තත් අයිස් වතුර ටිකක් දාලා නිවලා අපි මේ වැඩේ කරගෙනයනවා. ඒ නිසා මට කියන්න තිබුණේ මේ යෝජනාව සභාවට ගෙනාවේම සභාවේ අනුමැතිය අදහස් යෝජනා අරගෙන අපි කවුරුත් එකතු වෙලා ඉතාම කෙටි කාලයක් ඇතුළත සභාවේ තියෙන පුරප්පාඩු ටික පුරවාගෙන අපි අපේ සභාවේ තියෙන මේ සේවාවන් ටික ජනතාවට වඩාත් පහසු නගගන විදියට ඉටු කරන්න පුළුවන් විධිමත් පාලනයක් ඇති කර ගන්න අදිටනින් තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒ යෝජනාව වෙනුවෙන් අදහස් දැක්වූ සියලු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය නැවතත් පුද කරනවා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා

ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම ඔබ අපි හැමෝම දන්නවා මේ ආයතනයේ සේවකයින්ගේ තියෙන හිඟය. නවක මන්ත්‍රීවරුන්ට අවබෝධය මදි ඇති. ඒ නිසා ඔබට පුළුවන් සභාවෙන් ප්‍රශ්න කරන්න. ප්‍රශ්නාවලියක් දාන්න ඒක ඔබ කළ යුතුයි. දැන් මේ සාකච්ඡාව ඇතුලේ අපි යම් වංචාවක් කරපු බවට අදහස් පළ වුණා ඩ්‍රයිවර්ස්ලා නැත. ඔබට ඉතාම හොඳින් පුළුවන් ගිහිල්ලා අදාළ ෆයිල් අරගෙන එය සිද්ධ වුණ විදිය ගැන සිහින් හොයන්න. ඔබට බලය තියෙනවා. සද්දේ දාලා මීට ශෝභාවක් දාලාට වඩා හොඳයි ඔබ ගිහිල්ලා මේ රියදුරන් ගත්තු විදිය පිළිබඳව සම්පූර්ණ වාර්තාව ඒ ෆයිල් වලින් ගන්න. අරගෙන තියෙන එකේ වරද සභාවට ඉදිරිපත් කරන්න. මම කියන්නේ ඒක. ඒ කටයුත්ත කළේ කොහොමද? කළේ ඇයි? අපේ සභාවේ අපිට රියදුරෝ කොච්චර ඉන්නවා ද? වාහන කොච්චර තියෙනවා ද? මොනතරම් ඩ්‍රයිවර්ස්ලාගේ අවශ්‍යතාවයක් තියෙනවා ද? ඉන්ටර්විව් එකට ඉදිරිපත් වුණේ කවුද? ඒ අයව තෝරාගත්තේ කවුද? ගත්ත ඩ්‍රයිවර්ස්ලා දෙන්නා කවුද? ඒ ඔක්කොම අහන්න. හොයන්න. කිසි බාධාවක් නැහැ. ඒ නිසා මම කියන්නේ හරි කාරුණු කාරණා සහිතව ඒ සොයා ගැනීම කරන්න. මේ සභාවේ ඒවා හොයන්න. ඒවායේ යම්කිසි චෝදනා තියෙනවා නම් ඒ ඉදිරිපත් කරන එක තමුන්ට සතුටු කරගන්න, මම හරි එකඟයි. අපිට ඩ්‍රයිවර්ස්ලා දෙන්නෙක් අපේ

වාහන වලට දුන්නාම දැන් ඉන්නේ 36 යි. ඒ 36 න් තුනක් අදින වාහන වලට 31 ක් යනවා. කොහොමත් ඩ්‍රයිවර්ස්ලා හිටපු නගරාධිපතිතුමා පාවිච්චි කරලා තියෙන්නේ, මම එතුමාට දොස් කියන්නේ නැහැ. ලයිසන් නැතුව වාහන අනෙක් පදින්න පුළුවන් ළමයි වාහන අරගෙන යනවා. ඒ නිසා එකපාරට විශාල රියදුරන්ගේ හිඟයක් සම්පූර්ණ කර ගන්න උත්තර නැහැ. බඳවා ගැනීම් වලට අවසරයකුත් නැහැ. ඒ නිසා මේ නුවරඑළිය ආණ්ඩුවේ රියදුරන් පස්දෙනෙක් ගන්න දැම්මා නවදෙනෙක් ද කොහොමද දයකුමිලත් දාලා ඒ ඉන්ටර්විව් එකට. 08 දෙනෙක් සම්බන්ධ වුණා. අර කිව්වා වගේ අපේ පරණ අවුරුදු 30 ක් විතර ඩ්‍රයිවින් කරපු අර් එම් බී ඒකනායක ලයිසන් දීපු රියදුරෝ. ලේල් කළා. එතුමා කියනවා වගේ ඒක අපූරුකෝලිකාවක්. ඉතින් ඒවා කමක් නැහැ ඒවා ඇත්තටම. මොකද අපි අබමල් රේණුවක්වත් ඊකට සම්බන්ධ වෙලා නැහැ. නමුත් ඒ ඉදිරිපත් වුණ 08 දෙනාගෙන් එක සහෝදරයෙක් අපේ සහෝදරයෙක්. ඔහු තේරෙනවා. අනික් කෙනා මට දන්නවා දීර්ඝ කාලයක් මේ ආයතනයේම රියදුරු රැකියාවක් කරපු කෙනෙක්. ඔහු තේරෙනවා. ඒ නිසා ඒකේ කිසිම දේශපාලනික පක්ෂපාතී වලින කටයුතු අනාගත බව ඉතා ම වගකීමෙන් කියනවා. ඒ නිසා මම ඒව වැඩිය කියන්න යන්නේ නැහැ.

මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. එල්. ජනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. ආණ්ඩුකාරතුමා 2024 මුදල් ප්‍රකාශයේ තියෙනවා විගණන පෙනෙන ඇවිල්ලා තියෙනවා 3.2, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අනුව ස්ථිර පත්වීම් ලබාදුන් සේවකයන් 112 දෙනෙක් 2024 දෙසැම්බර් 31 වන දින වනවිටත් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ මෙම සේවකයින් සඳහා වැටුප් හා දීමනා වශයෙන් මිලියන 5.7 ක් ගෙවා තිබිණි. මෙම සේවකයන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි විය. මේක බරපතල ප්‍රශ්නයක්. දැනටත් මොකද වෙලා තියෙන්නේ. මම හිතන්නේ මේ විෂයේ යම් දූෂණයක් සිදු වෙලා තියෙන්නටත් ඉඩ. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. නැත්නම් මේ සභාවේ සල්ලි, වාර්ෂිකව අපිට ප්‍රතිපූර්ණය කරන්න ප්‍රදේශීය ප්‍රමාණය අපිට එන්නේ නැහැ සභාවේ සල්ලි වලින් මේ යන්නේ. ඉතින් අපිට වැඩක් කරන්න තියෙන සල්ලි නිකන්ම හිරවෙලා වෙලා තියෙනවා. මේ ගැන පරීක්ෂණයක් පවත්වලා මේ ගැන වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත පුදීනාන්ද මහතා

ගරු මන්ත්‍රීතුමා, ඉතිහාසයේ වෙච්ච කාරණා. ඔය ඉදිරියේ දී පරීක්ෂණ කටයුතු සිද්ධ වෙනවා. සේවකයෝ විශාල සංඛ්‍යාවක් මෙහි පුරෝලා කාඩර් එකට ඇතුලත් නොකරපු අපේ ජනතාවගේ බදු මුදල් වලින් විශාල වශයෙන් වැටුප් ගෙවනවා. නමුත් මේ නිශ්චිත මොහොතේ ඔවුන් කාර්යය භාර්යයක් කරනවා. අපිට එකපාරට ඔවුන්ව අයින් කරන්න බැහැ. වැරදිකාරයෝ ඉස්සරහට ගොඩාක් අනුමෙටයි. බොහෝ පරීක්ෂණ තියෙනවා. අපි කාලමල නැතුව යමු. කවුරු වැරදි කළත් වැරදිකරුවන්ට අදාළ කරන පරීක්ෂණ කරන එක සිද්ධ වෙයි. වැරදිකරුවෝ කවුද කියලා හෙළිදරව් වෙයි. ඒ පිළිබඳව කාලමල වෙන්නේ නැතුව අපි ඉස්සරහට යමු.

ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත පුදීනාන්ද මහතා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (06) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා ආයතන කමිටුවට යොමු කරනවා.

**05(07) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

බටහිර මොරටුමුල්ල ගල්පිටිහාමට පාරේ වරිපනම් අංක 67/4 දරන නිවසේ සිට ජලය බැහැරයාම සඳහා නල පද්ධතියක් ඉදිකර තිබේ. එම නල පද්ධතිය මඟින් ඇති වන අවහිරතාවයන් මඟහරවා ගැනීමට වරිපනම් අංක 67/6 සිට වරිපනම් අංක 67/26 නිවසට යාබදව ඇති කාණුව දක්වාත් වරිපනම් අංක 67 B සිට ප්‍රධාන පාරේ ඉදිකර ඇති කාණු පද්ධතිය දක්වා ද කාණු පද්ධති කොටස් දෙකක් ඉදිකිරීම සඳහා මා මෙයින් යෝජනා කර සිටින්නේය.

මහා නගර සභා මන්ත්‍රී, එම්. ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - ඉංජි. ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (07) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

**05(08) මහා නගර සභා මන්ත්‍රී, ශෙමරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

රාජ්‍ය අංශයේ සේවා ඩිජිටල්කරණය කිරීම සඳහා ද, රජයේ සේවාවන් සඳහා ඩිජිටල් ගෙවීම් පහසුකම් සැලසීම සඳහා ද, නිර්මාණය කරන ලද Gov Pay Platform හරහා මොරටුව මහා නගර සභාව තුළ සිදුවන සියලුම ගෙවීම් අදාල Gov Pay හරහා ක්‍රියාත්මක කිරීමට, මොරටුව මහා නගර සභාව Gov Pay Platform හරහා සම්බන්ධ කළ යුතු බවට යෝජනා කර සිටින්නේය.

Gov Pay යනු රජයේ සේවා සඳහා ඩිජිටල් ගනුදෙනු පහසු කිරීමට නිර්මාණය කරන ලද මාර්ගගත වේදිකාවකි. එය පුරවැසියාට / ව්‍යාපාරිකයාට වරිපනම් බදු, දඩ උපයෝගිතා, බිල්පත් සහ අනෙකුත් සේවා ගාස්තු වැනි රජයට කරනු ලබන විවිධ ගෙවීම් බැංකු සහ ඩිජිටල් පසුම්බි (Digital Wallets) හරහා ආරක්ෂිතව සහ පහසුවෙන් ගෙවීමේ හැකියාව ලබා දේ. Gov Pay යනු Lanka Pay, ICTA, CBSL (ශ්‍රී ලංකා මහ බැංකුව) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ජාතික ගෙවීම් වේදිකාවකි. මේ හරහා දැනට රජයේ ආයතන ගණනාවක් සම්බන්ධ වී ඇති අතර, මහා නගර සභා ද මේ හරහා ක්‍රියාත්මක වීම ආරම්භ කොට ඇත.

මහා නගර සභා මන්ත්‍රී, එල්. සියඳ හර්ෂණ අබේකෝන් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ශෙමරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මට යම් කරුණු දැක්වීමක් කරන්නට අවශ්‍යයි. පරිපාලනය විධිමත් වීමටනම් අපි ඒ පරිපාලනය තුළට අපි නොපමා ලෙසට තාක්ෂණය ගේනවද කියන එක ඇත්තටම වැදගත් කාරණයක්. මම හිතනවා ශ්‍රී ලංකාව ගත්තොත් 1989 මහා නගර සභා ආඥා පනත ගෙනාවට අපි සහ මේ රටේ පරිපාලනය අවුරුදු ගණනාවක් පැවතුණට අපේ පරිපාලනය තාක්ෂණය මත පදනම් වෙච්ච පරිපාලනයක් නොවෙයි අද රටේ තියෙන්නේ. ඒ නිසා හැමයි වංචාව දූෂණය මේ හැම දෙයකටම යොමු වෙලා තියෙන්නේ. එතකොට මම පුද්ගලික වශයෙන් ඇත්තටම මේ ඩිජිටල් ලෝකයේ ජීවත් වන ස්මාර්ට් ෆෝන් සමඟ ගනුදෙනු කරනු ලබන පුද්ගලයෝ හැටියට අපි නාගරික මන්ත්‍රීවරුන් හැටියට අපි කැමති අඩුම ගාණේ මේ මොරටුව මහා නගර සභාවේ ඉන්න කාලය ඇතුලත අපේ දැනුම හරහා මේ නගර සභාවේ පරිපාලනයට යම්කිසි තාක්ෂණික දායකත්වයක්

ලබාදීමට හැකිවෙයි. මම හිතනවා මෙහි සිටින මන්ත්‍රීවරුන්වත් ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් නැහැ කියලා. මොකද මේක ඇත්තටම රටේ සිද්ධ විය යුතු දෙයක් පරිපාලනයේ සිද්ධ විය යුතු දෙයක්. ඒ අරමුණ සාක්ෂාත් කරගැනීමට සහ ඒ අරමුණ පෙරදැරිව තමයි මම විසින් මේ යෝජනා 05 (8) හා 05 (9) යෝජනා දෙකක් ඉදිරිපත් කරලා තියෙනවා. මම මුලින්ම 05 (8) යෝජනාව පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නම්. 05 (8) "ගව් පේ" ඇප් එක. මේ ඇප් එක වර්තමාන රජය විසින් ඉම්ප්ලිමෙන්ට් කළා හැබැයි මේ ගව් පේ රාජ්‍යකරණය ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන් වර්ෂ 2017 හා 2003 සිට ලංකාව තුළ සිද්ධ වෙච්ච සාකච්ඡාවක්. එතකොට 2017 සිස්ටම් එක ඩිවලප් කරන්න පටන් ගත්තා. එතකොට 2025 වර්ෂයේ දී මෙය ක්‍රියාත්මක කළා. ඉතින් මෙය ලංකාවේ දීර්ඝ කාලීනව සිදුවුණ කාර්යයක්. ගව් පේ ඇප් එක කියන්නේ මොකක්ද? ගව් පේ ප්ලැට්ෆෝර්ම් එක කියන්නේ මොකක්ද? ශ්‍රී ලංකාවේ රජයේ සේවා සඳහා ඩිජිටල් ගෙවීම් පහසු කිරීමට නිර්මාණය කරන ලද මාර්ගගත ගෙවීම් පද්ධතියක්. එතකොට ඒකේ පුරවැසියන්ට, ව්‍යාපාරිකයන්ට රජය හරහා කරනු ලබන සියලුම ගෙවීම් කිරීමට හැකියාවක් තියෙනවා. උදාහරණයක් විදියට වරිපනම්, දඩ, උපයෝගිතා බිල්, අධ්‍යාපන ගාස්තු, ඩ්‍රයිවින් ලයිසන්ස් මේ සියලු දෙයක්ම මේ ගව් පේ සිස්ටම් එක හරහා සිදු කිරීමේ හැකියාවක් තියෙනවා. දැන් මේ ගව් පේ සිස්ටම් එක ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, අයිසීටීඒ එක, ලංකා පේ සහ මේ සියලු දෙනාගේම අධීක්ෂණය යටතේ විශාල වූ අධ්‍යයන කටයුතු ගණනාවක් කරලා, ටෙස්ට් කරලා තමයි මෙය ඉම්ප්ලිමෙන්ට් කරලා තියෙන්නේ. වර්තමානයේ දී මෙම පද්ධතියේ අරමුණු හැටියට ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීම, වැඩිදියුණු කළ පාලනය නිරවද්‍යතාවය ආරක්ෂා සහ රජයේ ගනුදෙනු මූල්‍ය ගනුදෙනු වල විනිවිදභාවය සහතික කිරීමට දැක්විය හැකිය. මේ සිස්ටම් හරහා පුද්ගලයන් අතින් මුදල් මාරුවීම වගේ දේවල් නවතිනවා. අතරට ගනුදෙනු නවතිනවා. සිස්ටම් එකක් හරහා ගෙවීමට හැකියාව තියෙනවා. අපි රිසිට් එකක් දෙනවා. නමුත් මේ ක්‍රමවේදය හරහා සෑම සියලු දෙයක්ම ක්‍රමවේදයක් ඇතිව විධිමත්ව සිද්ධවෙනවා. මම හිතනවා මේක තමයි රටකට අවශ්‍ය. එතකොට මේ ගව් පේ ඇප් එක හරහා ලංකාවේ බැංකු සියල්ලක්ම රාජ්‍ය බැංකු, පුද්ගලික බැංකු සියලු දෙයක්ම ඉන්ටිග්‍රේට් වෙලා තියෙනවා. මේ වෙනකොට වර්තමානයේ දී මේ ගව් පේ සිස්ටම් එකට රජයේ ආයතන 16 ක් මුල් අදියරයේ දී ඒකාබද්ධ වුණා. දෙවන හා තෙවන අදියරයේ දී ආයතන 30 ක් සම්බන්ධ වෙලා තියෙනවා. මහා නගර සභාවල් විදියට ගත්තොත් ගම්පහ මහා නගර සභාව දැන් වෙනකොට ගව් පේ ප්ලැට්ෆෝර්ම් එක හරහා කටයුතු කරනවා. ඉතින් මේ සම්බන්ධයෙන් නගර සභාවට කිසිදු ගෙවීමක් සිදු කිරීමක් නැහැ. අපිට තියෙන්නේ මේ ගව් පේ සිස්ටම් එකට ලින්ක් කරන්න කියලා. මෙතන ෆෝර්ම් එක තියෙනවා මේක පුරවලා මෙතන ගිවිසුමක් තියෙනවා ඒ ගිවිසුම සෑම සියලු දෙයක්ම මම දැන් සකස් කරනවා. නමුත් මම යෝජනාව කරන අවස්ථාවේ දී ලේකම් අංශයට මේ ඇමුණුමත් භාර දුන්නා. එතකොට ඒවා දැනටමත් තියෙනවා. මේ සයිබර්ලින්ක්ස් ඉම්ප්ලිමෙන්ට් කරන්න මගේ පූර්ණ සහයෝගය මම ලබා දෙනවා. මේකේ අග්‍රිමන්ට් එකක් තියෙනවා, ෆෝර්ම් එකක් තියෙනවා ඒක ෆිල් කරලා ඒ අදාළ පුද්ගලයන්ට කිවුවොත් ඒ අය මේක කරනවා. මම ඒ සම්බන්ධයෙන් ලිවුවා. ගව් පේ ඇප් එක අයිසීටීඒ එකට ලිවුවා. අයිසීටීඒ එකේ උදය කස්තූරි කියන නැනැත්තියට මම ලියලා ඒක කෝඩිනේට් කරන්න මිස්ටර් තුෂාර ගුණසේකර කියන පුද්ගලයින්ගේ කොන්ටැක්ට් නම්බර් එකත් මෙහි තියෙනවා. ඊමේල් එකක් මේකට ඇටෑච් කරලා තියෙනවා. එතකොට මේක ඊළඟ සභාවට ඉස්සෙල්ලා මෙය කිරීමේ හැකියාවක් තියෙනවා. එතකොට මේ හරහා සියලුම මොරටුව මහා නගර සභාවේ වරිපනම් ගෙවීම් මේ ප්ලැට්ෆෝර්ම් එක හරහා කරන්න පුළුවන්. මම තව දෙයක් කියනවා මේක අපි ඉම්ප්ලිමෙන්ට් කරපුවායින් පස්සේ මේකේ ප්‍රමෝෂනල් මටීරියල් තියෙනවා. එතකොට අපිට අලුවින් නගර සභාව හරහා මෙතන සජින් මෝඩ්ස් මාර්කටින් මෙටීරියල් අපිට ලබා දෙනවා

එතකොට අපිට ඩිජිටල් කරන්න පුළුවන් මේක යූ. ජේ එක සම්බන්ධයෙන් කෙනෙක්ටයි ද්‍රුත නගර සභාවක් තමයි මහරගම මහා නගර සභාව. එතකොට යූ. ජේ එක හරහා ඉදිරියට ඔයගොල්ලන්ගේ ගෙවීම් කරන්න පුළුවන් කියලා. තව එක ගැටලුවක් දැනට මහරගම මහා නගර සභාවේ වෙබ් සයිට් එක හරහා පේමන්ට්ස් කරන්න පුළුවන්. හැබැයි ඒකටත් කිසිදු බාධාවක් සිද්ධ වෙන්නේ නැහැ මේ හරහා අදක ඉන්ටිග්‍රේට් වෙනවා මම ඒ සම්බන්ධයෙනුත් සාකච්ඡා කළා. මේ ඉල්ලීමත් කරන්න නැමිති අපි පුරවැසියන් සහ ව්‍යාපාර වල ජීවනය ගනුදෙනු පහසු කිරීමටත්, රජයේ ආදායම් එකතු කිරීමේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමටත් ඩිජිටල් පරිවර්තනය සහ විද්‍යුත් රාජ්‍ය පාලනය ප්‍රවර්ධනය කිරීමටත්, කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ පරිපාලන වියදම් අඩු කිරීමටත්, ආරක්ෂිත සහ විශ්වාසනීයත්වය සහතික කිරීමටත් කියන්න මේ අරමුණු පෙරදැරි කරගෙන මේ යූ ජේ ඇප් සිස්ටම් එකට මහරගම මහා නගර සභාවේ ගෙවීම් සම්බන්ධ කරන්න කියලා මම සභාවට යෝජනා කරන්න කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මලකාන්ත මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ කරුණ සම්බන්ධයෙන්මටත් යම් කරුණු දැක්වීමක් කරන්න තියෙනවා. මම මගේ පළමුවෙනි කතාව දවසෙම කිව්වා ගරු සභාවට මතක ඇති. ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය කිවුව කාරණාව ඉතාම නිවැරදි. ඒකට මම 100%ක් එකඟයි. කුමන පක්ෂ ආණ්ඩුවකට කුමන හෝ පක්ෂයකට ඇන්දවුම මේ රට කරන්න ඕනනම් අපි කරන්න එපා නිවැරදීම ක්‍රමය තමයි අපි දන්න පද්ධතියක් සකස් කළ යුතුයි. එහෙම නැත්නම් මගේ විශ්වාසය තමයි හොරු මේකට ආණ්ඩු වලත් ඉන්න පුළුවන්. ඔබතුමාගේ ආණ්ඩුවෙත් ඉන්න පුළුවන් පෙර ආණ්ඩු වලත් ඉන්න පුළුවන්. අපි කාටවත් ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. ඔබතුමාට මේ මහරගමේ ජනතාවට යහපතක් උදා කරන්නනම් අනිවාර්යයෙන් ම මේ දන්න පද්ධතිය සකස් කරන්න ඕන. එහෙම නැතිනම් මේ හොරු ඔබතුමාගේ ආණ්ඩුවටත් අල්ලනවා. ඒ නිසා මම කියන්නේ පළමුවෙනියටම මම කිවුවේ ඒකයි කලින් දවසෙම අඩුම තරමේ අපි ජාතික හැඳුනුම්පතක් හදන්න සියලුම පුද්ගලයන්ට එක් දින වර්ක්ෂොප් එකක් පටන් ගන්න ඕන. ඒක තමයි අංක එක. ඉන් පස්සේ මේ යෝජනාව ඉදිරිපත් කළ ආකාරයට සියලුම කාරණා අපිට විනිවිදභාවයකින් තියෙනවා. එතකොට මේ හොරකම් කරනවා, මංකොල්ල කනවා, දූෂණය කරනවා කිවුවාට ඒ කාරණා අපිට අල්ලගන්න ක්‍රමවේදයක් නැහැ. අල්ලගන්න තමා වැන්පිමල් අපිට හැකියාවක් නැත්තේ ඔබතුමා දන්නවා මේ කිවුව ආකාරයට විශාල ප්‍රමාණයේ හොරකම් වංචා දූෂණ තියෙනවා. නමුත් අපිට මේවා ඔප්පු කරගන්න බැහැ. ඒ අල්ලගන්න බැරි ඔප්පු කරගන්න බැරි මේ දන්න පද්ධතියක් නැති නිසා. ඒ නිසා මේ කලින් කාරණාවටත් සියලුම කාරණාවලට මෙය සම්බන්ධ වෙනවා ගරු නගරාධිපතිතුමනි. ඒ නිසා තමයි මම මේ සම්බන්ධයෙන් කරුණු දක්වන්නේ. මොකද දැන් ඔබතුමා පෙර කිවුව ආකාරයට සේවකයෝ සංඛ්‍යාව කියලා උදාහරණයක් ගත්තොත් අපි දන්නේ නැහැ මේ නගර සභාවේ කොපමණ සේවක සංඛ්‍යාවක් ඉන්නවාද? මේ සේවකයෝ උදේ වැඩට එනවාද? වැඩට ඇවිත් වැඩ කරනවාද? ඇඟිලි සලකුණ තියන එකත් නොවෙයි මම මේ කියන්නේ. මම දන්නේ නැහැ අපි නැගෙම්ම උත්තරට හොරු මෙහෙත් බොහොමයි වෙන්න පුළුවන්. එහෙම වුණා, මේ යථාර්ථය තේරුම් අරගෙන මේ යථාර්ථය උත්තරයක් හොයන්න. මේ එක පුද්ගලයෝ ඇඟිලි සලකුණු තියලා ගිහිල්ලා ආයේ හවසට ඇඟිලි සලකුණු තියලා යනවාද කියන්න අපි දන්නේ නැහැ. ඒ නිසා මේ පුද්ගලයෝ රජයෙන් පඩිය දාන්න කියනවා නොවෙයි මේ කියන්නේ. අපි කියන්නේ මේ එක පුද්ගලයන්ගෙන් සක්‍රියව ඔවුන්ගේ සේවය මේ නගර සභාවට මේ ජනතාවට සිදුවෙන්න ඕන. අපි ඒ කවුරුත් ගෙදර යවන්නේ නැහැ. නමුත් මේක මොනිටර් වෙන සිස්ටම් එකක් තියෙනවා. ඒ නිසා ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය කිවුවා වගේ මේ එකතු වෙන නගර

සභාවේ සියලුම ආදායම් නිවැරදිව එකතු වෙනවාද යන්න. එතකොට මේ මුදල නිවැරදිව එකතු වෙනවාද? දිය ඇත්තටම අවශ්‍ය තැනට යොමු වෙනවාද කියලා. නැත්නම් අපි දන්නේ නැහැ මේය අත යටින් ගනුදෙනු වෙන්නත් පුළුවන්. ඒ නිසා අපිට වෙන්දේසි කරන්න හැකියාවක් තියෙනවා. නමුත් ඔප්පු කරගන්න හැකියාවක් නැහැ. අවසානයේ මේ සභාවේ කාලය මහජනතාවගේ මුදල් නාස්ති කරලා මේ මොරටුවට වෙන ගෙයක් නැහැ. ඒ නිසා මම කියන්නේ මේ දත්ත පද්ධතිය යාවත්කාලීන කරලා ඔබතුමාට හැකියාවක් තියෙනවා මේ නගර සභාවේ සියලුම ආයතන වලට මේ දත්ත පද්ධතිය හැකි ඉක්මනින් සක්‍රීය කරන්න. එහෙම වුණොත් ඔතුමාට හැකියාවක් තියෙනවා මේ සියලුම දේවල් මනා ලෙස පාලනය කරන්න. එතකොට නිලධාරීන් ද එසේ සේවකයන් ද නැත්නම් මේ අනිකුත් සේවකයන්ද කවුද කියන කාරණය සියලු දෙනාගේ පැහැදිලිව අපිට අල්ලගන්න හැකියාව තියෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා පළමුවෙන්ම මේ හැඳුනුම්පත සඳහා කාරණයෙන් පටන් ගන්න. එතැනින් පස්සේ මේ දත්ත පද්ධතිය යාවත්කාලීන කරන්න අපිට මිනුම අවස්ථාවක මේ දත්ත පද්ධතිය ඇතුළත් වෙලා ඉතා පැහැදිලිව නිරීක්ෂණය කරන්න හැකියාව තියෙනවා. මිනුම හොරෙන් අල්ල ගන්න හැකියාවක් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු ඒ යෝජනා අදකම 09 ක් සමයට අදාලයි. නමුත් මම 09 කතා කරන්නේ නැහැ. ඒ නිසා මේ දෙකටම අදාලව කතා කරනවා. මේ යෝජනා වලට එකඟතාවය පළ කරන අතර මම මේ සම්බන්ධයෙන් අන්තර්ගතය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න යන්නේ නැහැ. මොකද ගරු නිහිඳු මධුරංග මන්ත්‍රීතුමා සැකවින් මෙම යෝජනාව දීඝ නැරීයා සභාවට. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් අන්තර්ගතය පිළිබඳ පැහැදිලි කරන්න යන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමනි, දැන් මේ නාගය ගමුය ගත්තාම අපි දන්නවා මේ නාගය සතු ගොඩක් ඉදිරිපත් කරලා තියෙනවා කාණු හදන්න, පබෝක්කු හදන්න, කාණු ගන්න ඒ වගේ යෝජනා. මම කියන්නේ ඒ වගේ යෝජනා කරපු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට අපහසුයක් හෝ උපහාසයක් කරන්න නොවෙයි. ඒ මිනුම කොහොමටත් මේ සභාවේ යෝජනා ඉදිරිපත් කරන්න අයිතියක් තියෙනවා. නමුත් ගරු නාගරාධිපතිතුමනි, මමත් මගේ සභාවේ පළවෙනි කතාවේ මංගල කතාව මගේ කතාව කළා ඒ කතාවේ කොටසක් මම කිව්වා මහජන නියෝජිතයෝ නැතිව අවුරුදු 02ක් දෙකහමාරක් විතර මේ සභාව ගියා. අපේ නාගරික කොමසාරිස්තුමියගේ මෙහෙයවීම නායකත්වය මත දෙපාර්තමේන්තු නිලධාරීන් සියලු දෙනා අවුරුදු 02 ½ ක් මේ සභාව දරගෙන ගියා. එතකොට ඒ සභාව යම් ප්‍රමාණයකින් වැටෙන්නේ නැතුව අඩුපාඩු තියෙන්න පුළුවන් නමුත් මේ සභාව දරගෙන ගියා. නමුත් දැන් මහජන නියෝජිතයෝ 52 ක් මේ සභාවට පත්වෙලා ඉන්නවා. එතකොට මහජන නියෝජිතයෝ 52ක් එන්න විළඟ සභාව මේ සභාව පරණ සභාව විය යුතු නැහැ කියන එක මම පැහැදිලි කළා මගේ මංගල කතාවේදී. මම එම වචනයක් පැහැදිලි කළා අපි මේ අවුරුදු 04 ඇවර වෙනකොට මේ සභාව ස්මාර්ට් සභාවක් බවට ඉහළට මසවන්න සමත් වුණොත් තමයි අපි මොරටුවේ ජනතාව පක්ෂ වලින් එවුවාට මහජන නියෝජිතයෝ විදියට අපි අපේ කාර්යය භාර්යය ඉටුකළා කියලා අපේ විශ්වාසය තියෙනවා. ඉතින් ඒ අනින් ගත්තාම ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ මේ යෝජනා 02 ම ස්මාර්ට් යෝජනා දෙකක්. ඒ නිසා ගරු නාගරාධිපතිතුමනි, අපි හැමෝම දන්නවා වෙනවානම් අපේ සභාවට වඩාත් නිර්මාණාත්මකව මේ සභාවේ කටයුතු කිට වඩා හොඳට ජනතාවක් එක්ක බද්ධ වන විදියට අලුත් තාක්ෂණය, අලුත් දේවල් එකතු කරගෙන අපේ දේවල් රැකගෙන දෙරණ කියනවා වගේ අලුත් දේවල් එකතු කරගෙන අලුත් සභාවක් විදියට අපිට ඉදිරියට යන්න පුළුවන්නම් ගරු නගරාධිපතිතුමනි ඒ ගෞරවය ඔබතුමාටත් හිමයයි අපි හැමෝටම හිමියය. ඒ නිසා මම ඉල්ලා සිටිනවා අපිට දත්ත පද්ධතියක් මින නැඹුයි මම විශ්වාස කරනවා මොරටුවේ

දත්ත පද්ධතියනම් ඉන්දියාවට දෙන එකක් නැහැ කියලා රජට දත්ත පද්ධතිය දුන්නට. අවසානෙට මේ කලින් යෝජනාවේ මතුවුණ කාරණාවක් ගැන විශේෂයෙන්ම කසල සම්බන්ධයෙන් මතු වුණ සාකච්ඡාවේදී විශේෂයෙන්ම අනිල් එක ගැන කියවුණා. මට පොඩි සිත්තුවක කැල්ලක් මතක් වුණා මම ඒක කියලාම නතර වෙන්නම් මේ අලුත් සිත්තුවක කියනවා සමඟක් කළා චිත්‍ර කළා කියලා හැබැයි දැන් ඔක්කොම කරන්නෙත් නැහැ විකි කරන්නෙත් නැහැ. ඒක අපි හොඳින්ම දන්නවා. ස්තූතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - තරිඳු චන්දන මිලානවිතාන මහතා</u>

ගරු නගරාධිපතිතුමිනි, ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය ඉතා කාලෝචිත යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කළා කියලයි මම හිතන්නේ. ප්‍රවේශය අහිමි කුඩු දුරෙන් පවතින්න ඕන කාලයක් අවශ්‍යයන් එක්ක සටන් කරන්නේ. අද පවතින අවශ්‍යයට වඩා වේගවත් ජාලයක් හෙට දිනයේ දී ලෝකයට ඉදිරිපත් වෙනවා. ඒ වේගය කියන එකත් සමඟ පෙරමුණ දීන යුගයක මේ මොරටුව මහා නගර සභාවේ දත්ත මේ ආකාරයෙන් ජාලගත කරලා ඒ ජලගත කරන දත්ත ගරුතු සියලු දෙනාට ඒ වෙත ප්‍රවේශවීමේ හැකියාව අහිමි කුඩු දුරෙන් පවත්වාගෙන යාම අපි සැමගේ වගකීමක්. මම හිතන්නේ මේක ප්‍රයෝගිකත්වයේ නාගරයේ මහා නගර සභාව මේ මහා නගර සභාවේ කාර්යක්ෂමතාවය, විනිවිදභාවය වගේම විශ්වාසවන්තභාවය ආරක්ෂා කිරීම සඳහා ඉතාම වැදගත් වන කාලෝචිත යෝජනාවක් හැටියටයි මම මේ යෝජනාව දකින්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්දජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමිනි, ඉතාම කෙටියෙන් පාලක කණ්ඩායම විදියට අදහසක් දක්වන්න හිතුනා. මේ යෝජනාව සම්බන්ධව කිසි වාදයක්, විවාදයක්, තර්කයක් නැහැ. මේ යෝජනාවේ අන්තර්ගතය ගරු නගරාධිපතිතුමන් ප්‍රායෝගිකව මේ මොහොතෙත් මේ සභාවට ක්‍රියාත්මක කරන අදහාළු ව්‍යාපාරය ජාතික ජන බලවේගය. ඒ නිසා අපි දීර්ඝ කාලයක් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් මේ කාරණය ගැන කතා කළා. විශේෂයෙන් පළාත් පාලන ආයතන වලට ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව ඒ කරුණු සියල්ල පළාත් පාලන ආයතන තුළ ක්‍රියාත්මක කළ යුතුයි කියන ස්ථාවරයේ අපි දැඩිව සිටිය කණ්ඩායමක්. ඒ නිසා අපි දැනටමත් නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් ඒ දත්ත පද්ධතිය සම්පූර්ණ මොරටුව මහා නගර සභාවෙන් තියෙන දත්ත පද්ධතීන් එකතු කරමින් සිටිනවා. ඒ අයව දැනුවත් කරමින් සිටිනවා. තරමක් මන්දගාමී ස්වභාවයක් තියෙනවා. එය නිලධාරීන්ගේ පැත්තෙන් ඉක්මන් කළයි කියන විශ්වාසය අප තුළ තියෙනවා. විශේෂයෙන් අපේ සේවකයන් පිළිබඳ, කසළ පිළිබඳව කසල වලට මුදල් ගෙවන ආකාරය  පිළිබඳව විවිධ කරුණු සම්බන්ධයෙන් අපි මුලින්ම දත්ත එකතු කරමින් සිටින්නේ ගරු මන්ත්‍රීතුමිය, අපේ මධුරංග මන්ත්‍රීතුමා මතු කළ පරිදි. ඒ නිසා අපි ආරම්භක ප්‍රවේශය තියලා තියෙනවා. ඉතාම කෙටි කාලයක් ඇතුළත අපි මොරටුව මහා නගර සභාව ඩිජිටල්කරණය පිළිබඳව ඉදිරියෙන්ම ඉන්න මහා නගර සභාවක් බවට පත්කරන්න කොළඹ දිස්ත්‍රික්කයේ අප උත්සහ දරනවා. ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු මූලික සාකච්ඡා, මූලික අවශ්‍ය දත්ත පද්ධතීන් අපි එකතු කරමින් පවතිනවා. ඒ නිසා අපි ලිහිණි මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙනවා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. අපිට අවශ්‍ය වන්නේ මෙයයි. අපි කවුරුත් එකතු වෙලා මේ සභාවේ අනාගතය මීට වඩා යහපත් කරගන්න අපේ ධනාත්මක ලෙස යෝජනා ඉදිරිපත් කරනවානම් අපි ඒවාට ඇහුම්කන් දෙන්න සූදානම් කණ්ඩායමක්. ඉතින් ඉදිරියේ දී අපි මේක කමිටුව තුළ සක්‍රීයව සාකච්ඡා කරලා කඩිනමින් ක්‍රියාත්මක කරන්න අදාළ මැදිහත්වීම කරනවා කියන ඉල්ලීම දැනුම්දීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඩී. සෙව්වන්දි නිලංකිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ ගව් පේ ඇප් එක ගැන පළ කරන්න තිබිය යෝජනාවක් අදහස් අපේ මන්ත්‍රීවරිය හා අනෙකුත් සහෝදර මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළා. මම කියන්න කැමතියි ජාතික ජන බලවේගයේ රජය විශේෂයෙන් අපේ ප්‍රතිපත්ති වල ඉදිරිපත් කරලා තියෙනා දැවැන්තම ව්‍යාපෘතිය තමයි ශ්‍රී ලංකාව ඩිජිටල්කරණය කිරීම. ඒ පියවර මොරටුව මහා නගර සභාව තුළ ක්‍රියාත්මක කිරීමට ඒ සාධනීය යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමියට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම තමයි මේ ඇප් එක භාවිතා කිරීමෙන් තියෙන ලොකුම වාසිය තමයි ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් නැවත නැවත දැරිය යුතු නොවීම. මේ ඇප් එකෙන් මුදල් එකතු කර ගැනීම, විනිවිදභාවය මේ සියල්ල පවත්වාගෙන යන්න පුලුවන්. ස්මාර්ට් ලෝකයක් එක්ක ඉදිරියට යන අපි මොරටුව මහා නගර සභාවත් ඒ ලෝකයට එකතු කරවමින් ඉස්සරහට යමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සෙව්වන්දි මන්ත්‍රීතුමියත් ලිහිණි මන්ත්‍රීතුමියත් කතා කරපු මේ ඩිජිටල්කරණය හරි තාක්ෂණයත් එක්ක තියන කාරණයත් එක්ක මට යමක් කියන්න තියෙනවා. සමහරවිට මම මේ කියන කතාව මහා නගර සභාවේ වැඩ කටයුතු පිළිබඳ ලොකු අවබෝධයක් නැතිකමට කරන කතාවක් වෙන්න පුලුවන්ද දන්නේ නැහැ නමුත් මම මේ හිතට ආව අදහසක් කියන්නේ. නගරාධිපතිතුමනි, මේ වාර්තාවල් පෙරට එක අපි හැමෝගෙම ගෙවල් වලට ලැබුණා. මම හිතන්නේ මෙතන මේ පොත 50 ක් විතර තියෙනවා. මම හිතන්නේ අපේ මන්ත්‍රීවරු 51 දෙනාටම මේ වාර්තා ටික යන්න ඇති. මගේ පොඩි යෝජනාවක් අදහසක් තියෙනවා ස්මාර්ට් කියන කතාවත් එක්ක තාක්ෂණය කියන එකත් එක්ක මුදල් වියදම් වීම සම්බන්ධයෙන් මේ කඩදාසි වලට වැයෙන ප්‍රමාණයක් දැන් මේ අදින් පස්සේ මේක ගැන මෙතනින් ඉවරයි. අපිට මම දන්නේ නැහැ ඊළඟට අපිට මේ වගේම පෙරට එනවාද කියලා. අපි ඉතින් මේ තාක්ෂණයත් එක්ක යනවා කියනවානම් අපිට ඊමේල් හරහා මේවා ලැබෙන්න තිබුණොත් හොඳයි කියලා. මම දන්නේ නැහැ ඒක කොතරම් දුරකට ප්‍රායෝගිකද කියලා මම කරන ඉල්ලීම. නැතිනම් දැන් අපේ ගෙවල්වලත් මේ ඉතුරු අවුරුදු 04, 05 ක් පස්සේ ලොකු කන්දක් එකක් වෙයයි කියලා මට හිතෙනවා මේවා හැන්ඩිගෙන වෙලා තියෙනවා. කාටහරි අවශ්‍ය වුණොත් පරිශීලනය කරන්න. එම ඒ ක්‍රමයට මේවා තියන්න පුලුවන්ද අපිට දැනුවත් කරනවානම් නගර සභාව කරන වියදම පොඩ්ඩක් අඩුවෙයි කියලා මම හිතනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මේ ලිහිණි මන්ත්‍රීතුමිය යෝජනාවත් එක්ක වර්තමාන කතාබහට ලක්වෙච්ච අවස්ථාවක් බවට පත්වුණේ පසුගිය කාලයේ තිබුණ ආණ්ඩුවෙත් ක්‍රම සහ විධි කාරක සභාව පත්කරනවා. එම ක්‍රම සහ විධි කාරක සභාව ඔස්සේ මේ ගවර්න්මන්ට් ඇප් එක ඩිජිටල්කරණය කොහොමද ලංකාවේ ප්‍රධාන ආයතන 03කට යෙදවන්නේ කියලා සාකච්ඡා වුණා. මේ වැදගත් වැඩසටහන ගේන එකේදී මූලික ව්‍යවස්ථාව සාදන වුණේ ගරු නගරාධිපතිතුමනි ක්‍රම සහ විධි කාරක සභාව මූලික සදහම් බවට පත්වුණේ මූලික ආයතන ඉන්දියාවේ මේ වෙනුවෙන් ආදායම තුන් ගුණයක් බවට පත්කරගෙන තියෙනවා. තමන්ගේ ආදායම කොහොමද තුන් ගුණයක් බවට පත්කරගෙන තියෙන්නේ. ඒ මේ ඩිජිටල්කරණ වේදිකාව තුළ. ඒ තමයි නරේන්ද්‍ර මෝදි කියන අගමැතිවරයා, නිර්මලා සීතාරාම් කියන මුදල් ඇමතිවරියට භාර දෙනවා මේ කටයුත්ත කරන්න. ඒ අනුව ලංකාවේ මූලික වශයෙන් මුදල් විශ්ලේෂණය නැතිනම් මුදල් නැවත පනාවක් ලබාදීලා අලුත්

මුදල් ලබාදීම එන්. එම්. නගරාධිපති මහත්තයා කළාට පස්සේ මේ ඩිජිටල් වේදිකාව හරහා සිද්ධ වෙනවා. අද වෙනකොට අපිට එතැනට යන්න බැරි වුණත් මුලත්විටක් පවා විකිණෙන්නේ මේ ඩිජිටල් වෝට් එක ඇතුළේ. ඒ අනුව ඔබතුමා විශ්වාස කරන්න ඒ රටේ ආදායම් දෙගුණයක් බලාපොරොත්තු වුණාට තුන්ගුණයක් බවට පත්වෙලා තියෙනවා. ඒ අනුව විශේෂයෙන් මේ ඩිජිටල්කරණ වේදිකාව පිළිබඳ සාකච්ඡා වෙනකොට හිටපු ජනාධිපතිතුමා වන රනිල් වික්‍රමසිංහ මහත්තයා සහ ඊට පෙර හිටපු පාණ්ඩුව ක්‍රම සහ විධි කාරක සභාව පත්කළා, එහි සභාපතිවරයා බවට පත්වුණේ පාඨලී චම්පික මැතිතුමා. මම ඒ වැඩසටහන් වලට ස්වේච්ඡාවෙන් ගිහිල්ලා සම්බන්ධ වෙලා තියෙනවා. ඔබතුමා විශ්වාස කරනවාද ලංකාවට ඒ අනුව ආයතන 03 ක් මේ වෙනකොට ඩිජිටල් වේදිකාවේ මූලික අවස්ථාවට ගිහිල්ලා තියෙනවා. ඒ ක්‍රම සහ විධි කාරක සභාවේ නිර්දේශ මත. එකක් තමයි ඔබතුමා දන්නවා මෝටර් දෙපාර්තමේන්තුව අනික සුරාබදු දෙපාර්තමේන්තුව සහ ආදායම් දෙපාර්තමේන්තුව. ඒකේ තියෙන ප්‍රධාන වශයෙන් අර මෙතුමිය සඳහන් කරපු විදියට අපේ ඉන්න නිලධාරීන්ට අතයට ගනුදෙනු සිද්ධ වෙන්න පුළුවන්. තමන් ලබන ආදායම කොච්චර ප්‍රමාණයක් ප්‍රතිශතයකින් ආදායම් ගෙවන්න ඕනද කියන එක ලබා දෙන්නේ අදාළ ආදායම් බදු ගෙවන්නාත්. මේ ආදායම් බදු ගෙවන්නාගේ වැඩිද්ද ඊන්ගෙන් නව අවුරුදු ගානකයටකට පස්සේ. හැබැයි මේ කොපි වේබල් වල ඉන්න නිලධාරීනුයි මේ කට්ටියයි සාකච්ඡා වෙලා යටින් නිශේෂියේට කරගන්නවා කොච්චර ප්‍රමාණයක් ගන්නවාද? මට කීයක් දෙනවාද? කියලා. ඒ අනුව ඔබතුමා අද ක්‍රම සහ විධි කාරක සභාවේ නිර්දේශය මත අද ඔබතුමා බලන්න මෝටර් දෙපාර්තමේන්තුව ට්‍රිලියනයක ආදායමකට ගිහිල්ලා තියෙනවා. ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළ. ඒ වගේම ආදායම් බදු දෙපාර්තමේන්තුව යම් ප්‍රගතියකට ඇවිල්ලා තියෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවේ ඒ සුරාබදු ගන්න අපේ මේ අරක්කු ගබඩාගල්ට තිබුණේ ගරු නාගරාධිපතිතුමනි ඒ නිසා හොර බඩුත් මේ අතර විකිණෙනවා. ඒ නිසා ආදායම් මඩුන් අතට ආවේ නැහැ. මම කියන්නේ ගිය ගරු නාගරාධිපතිතුමනි, මේ යෝජනාව තුළ අපිට අපේ ආදායම ස්ථාවර කරගන්න පුළුවන් නම් අපි ඇප් එක හරහා. අපිත් පැත්තෙන් මේ ප්ලෑන් පාස් කිරීම සම්බන්ධයෙන් අපි විශේෂ යෝජනාවක් කළා අපේ කොමසාරිස්තුමියත් ඒකට උනන්දු වුණා අපේ නිලධාරීන් එක්ක. අපි හෙල්පින් ඩෙස්ක් එකක් හැදුවා. ඒ තමයි නගර සභාවට ප්ලෑන් භාර දෙනකොට ප්ලෑන් එක භාර දෙනකොට අපේ තියෙනවා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි පිටිපස්සේ තියෙනවා රෙගසෙට් ෆේස් එක 7.6 ක් කියන්න ඕන වාහනාශ්‍රය මෙච්චරයි. හැබැයි මේ ප්ලෑන් එක අපි භාර දුන්නට පස්සේ ඒ භාර දෙන කොට අවස්ථා කීපයක එන්න ඕන අඩුපාඩු බලන්න. මාස 03, 04 ක් යනවා අපේ කමිටු වලට. හැබැයි ඒ මනුෂ්‍යයාගේ බලාපොරොත්තුව ලෝන් එකක් අරගෙන මේ බෝඩ්වල ජනතාව බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ කාර්යය කරගන්න හැකියි ඒක කරගන්න බැහැ මහා ගානක් පරක්කු වෙනවා. එතකොට අලුතින් කොමසාරිස්තුමියන්ට දෙන්න වෙනවා. ඒ නිසා අපි හෙල්පින් ඩෙස්ක් එකක් විකල්පයක් හැදුවා ඒත් එක්කම අපි ලොතාකලානීන් අරගෙන ඒ ගන්නකොට අපේ තියෙන නාගරික සංවර්ධන අධිකාරි පහළේ තියෙන රෙගුලාසි වලට අරගෙන භාර ගන්නවා. මික්කොම ඊන අනාගලානී සීමාවය දෙන්නෙක් අරගන්නවා. ඒ ගන්නාට පස්සේ ඔවුන් සියලුදෙනාම ජන්ලෝක මොරටුව විශ්ව විද්‍යාලයෙන් ආර්කිටෙක්චරල් සෙක්ෂන් එකෙන් එහෙම නැතිනම් එන්ට්ට් කරපු කෙනෙක් අරගත්තාට පස්සේ ගෙවීමේ පදනම් රුපියල් 1000/- ක ගෙවීමේ පදනම මත මේ ප්‍රශ්න ටික සියල්ලක්ම විසඳෙනවා මේ හෙල්පින් ඩෙස්ක් එක යටතේ, ඒ අනුව තමතුමිය කියපු මේ කාරණාවත් එක්ක අපිට සමස්තයක් විදියට ගත්තොත් නාගරාධිපතිතුමනි සමස්ත මේ දූෂණය වංචාව යම් විදියකින් නවත්තන්න පුළුවන්. එතකොට ඊළඟට ගත්තාට පස්සේ රාජ්‍යතන්ත්‍රය දක්වා යන්නට ඕන. විශේෂයෙන් මේ මිතා ... කරන්නට ක්‍රම සහ විධි කාරක සභාවේ යම් විදියකින් දායකත්වය දුන්න අමාත්‍යවරයෙක් හැටියට මාත් කටයුතු කරපු නිසා

ඒ පිළිබඳව යම් අත්දැකීමක් අපිට තියෙනවා. ඊළඟට මෙයට අදාළයි ලේකම් කාර්යාලයේ අදාළයි සංකල්පවලින් අරගෙන ඒක යථාර්ථ කොළඹ මහා නගර සභාවක් විදිට පත්කර ගන්න පුළුවන්. ඒ නිසා ඒක මේ ආණ්ඩුව නිර්මාණය කළේ දැන් සංකල්පයක් ගෙනාවොත් අපි කොළඹට ජනතාවට එකාවට සේවාවන්ට නම් අරමුණු ඉටු කරලා යහපත් සේවයක් වගේම ඩිජිටල් සේවයක් ලබා දෙන්න මේ ඇප් එක එහෙම නැතිනම් මේ ඩිජිටල් පෝටල් එක අයි.සී.ටී. හා ඊ.සී.එස්.එල්. කියන මේ සංකල්ප ඉතාමත් වැදගත්. ඒ නිසා එය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න, ක්‍රියාත්මක කිරීමේ ආරම්භය ගන්න ක්‍රම සහ විධි කාරක සභාවේ සභාපතිතුමා එක්කත් මට ඒකට සම්බන්ධ වෙන්න ස්වේච්ඡාවෙන් පයිසිකලයට ටෙල් ටික ගහගෙන මගේ වියදමින් ගිහිල්ලා දායකත්වය ලබා දීමට හැකියාව ලැබීම පිළිබඳ මා සතුටු වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරන්නට කැමති "govpay.lk" කියන වෙබ්සයිට් එකට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර තියෙනවා. පොඩ්ඩක් ඒකේ වීඩියෝස් තියෙනවා ඒක බලන්න කියලා ඉල්ලීම් කරන්න කැමති.

<u>ගරු නගරාධිපති - ජේ.වී.නිශාන්ත ප්‍රදීපානන්ද මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (08) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා ආයතන කමිටුවට යොමු කරනවා.

**05(09) මහා නගර සභා මන්ත්‍රී, මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව,**

"පුරවැසියන් හා රාජ්‍ය අතර පරතරය පියවීම සඳහා නිර්මාණය කර ඇති ඩිජිටල් විසඳුමකි. 'මං කිව්වා mankiwwa.lk' - ශ්‍රී ලංකාවේ ස්මාර්ට් මහජන ගැටළු කළමනාකරණ මෘදුකාංගය. එය පුරවැසියන්ට එදිනෙදා දකින මහජන ගැටළු, කඩත්තු අඩුපාඩු, නීති විරෝධී ක්‍රියාකාරකම්, හදිසි අවස්ථා, පාරිසරික අභියෝග, පොඩ්ඩ ගැටළු ඔවුන් සතු ජංගම දුරකථනය හරහා සෘජුවම වාර්තා කිරීම නිර්මාණය කරන ලද සේවාලම්බී. දැනට මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රාදේශීය සභා 13 ක (කුලියාපිටිය / උකුවෙල නැගෙනහිර ප්‍රදේශ) ක්‍රියාත්මක වේ.

ජනතාව තම එදිනෙදා ජීවිතයේ සිදුවන ගැටළු වලට ඉතා කඩිනමින් විසඳුම් ලබා ගැනීම සඳහා ද, මහා නගර සභාවක් ලෙස ඉතා ගුණාත්මක භාවයෙන් යුතු සේවාවක් ජනතාවට වෙත ලබාදීම සඳහා, කාර්යක්ෂමතාවය පදනම් කොට කොළඹ මහා නගර සභාව විසින් ඉටු කළ යුතු අත්‍යවශ්‍ය කාර්යක්ෂමව කිරීම සඳහා මෙම ඩිජිටල් විසඳුම් උපකාර වේ යැයි විශ්වාස කරමු ලබන අතර ඒ පිළිබඳව අධ්‍යයනයක් කොට එය ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කර සිටින්නේය."

මහා නගර සභා මන්ත්‍රී, සී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙනුත් ඉතා කෙටියෙන් විස්තරයක් කරන්න කැමතියි. මම ඉස්සෙල්ලා කතා කළේ ටෙම්ප්ලේට් ඇප් එකක් ගැන. මෙතන පුරවැසියන් හා රාජ්‍ය අතර පරතරය පියවීම සඳහා නිර්මාණය කර ඇති ඩිජිටල් විසඳුමක්. වෙබ්සයිට් එකත් තියෙනවා "mankiwwa.lk" කියලා. ශ්‍රී ලංකාවේ ස්මාර්ට් මහජන ගැටලු කළමනාකරණය කිරීමේ මෘදුකාංගය කියලා. එය පුරවැසියන්ට එදිනෙදා දකින මහජන ගැටලු කඩත්තු, අඩුපාඩු, නීති විරෝධී ක්‍රියාකාරකම්, හදිසි අවස්ථා, පාරිසරික අභියෝග, පොඩ්ඩ ගැටලු ඔවුන් සතු ජංගම දුරකථනය හරහා සෘජුවම

වාර්තාකරණය කිරීමට නිර්මාණය කරන ලද මෘදුකාංගයක්. දැන් මෙහෙ වෙබ් පෝර්ට් එකක්, ඇප් එකක් සොෆ්ට්වෙයාර් එකක්. ඒ සොෆ්ට්වෙයාර් එක අපි ඉම්ප්ලිමෙන්ට් කළොත් මේ ඇප් එක ඩවුන්ලෝඩ් කරලා මේ ඇප් එක හරහා නගරයේ යම් ප්‍රශ්නයක් තියෙනවානම් අපි කියමු කඩ කුණු කසළ ශුද්ධ කරලා නැහැ යම්කිසි ප්‍රදේශයක මහජනතාවට හැකියාව තියෙනවා ඒ සම්බන්ධයෙන් පින්තූරයක් අරගෙන්නාම මේ සිස්ටම් 01 ට ලින්ක් වෙනවා. එහෙම ලින්ක් වුණාම කොමසාරිස් මහා නගර සභාවේ මේ සිස්ටම් එක බලලා කොහොම මේ සම්බන්ධයෙන් ක්ෂණිකව කටයුතු කරන්න කියලා ආයතනයන්ට හා පුද්ගලයන්ට දැනුම් දෙන්න පුලුවන්. මේ සම්බන්ධයෙන් මම වැඩිදුර විස්තර කරනවාට වැඩිය මේ අදාළ පුද්ගලයන් සභා ගොරුවමින් පස්සේ ඒ අය ඇවිල්ලා මේ සම්බන්ධයෙන් නගර සභාවට ප්‍රසන්ටේශන් එකක් කරන්නාම මේ සොෆ්ට්වෙයාර් එක කොහොමද ක්‍රියාත්මක වෙන්නේ ඒ සම්බන්ධයෙන් ප්‍රසන්ටේශන් එකක් කරන්නාම කියලා. ඉතින් මම යෝජනා කරන්නාම මම මේ ප්‍රසන්ටේශන් එක අරේන්ජ් කරලා මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන්නාම ඒක බලලා මේක සභාවට අවශ්‍යද කියලා තීරණය කිරීම සභාව සතු යුතුකමක්. මේක සභාවට අවශ්‍යනම් හැබැයි මම විශ්වාස කරනවා මේක ආන්ඩුවට මහජනයා හා ජනතාව අතර තියෙන පරතරය අඩු කිරීමටත් රියල් ටයිම් ප්‍රශ්න ජනතාවට දැනුම් දීමටත් හැකියාව තියෙනවා. හැබැයි මේ ගැටලු සම්බන්ධව නගර සභාව විධිමත්ව කටයුතු කරන්න ඕන. එතකොට ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුම් දුන්නාම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ වගකීම නගර සභාවට තියෙනවා. එතකොට මේක චෙක් ඇන්ඩ් බැලන්ස් සිස්ටම් එකක් වෙනවා. නිලධාරීනුත් එර අපි කියනවා කාර්යක්ෂමතාවය වැඩි කිරීමට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕන. මේ ජනතාවටත් කවුන්සිල් ගැටලු ඉදිරිපත් කිරීමට මෙය ප්ලැට්ෆෝර්ම් එකක් වෙනවා. මම හිතනවා අපි ඉස්සරහට යනවානම් මේ දේවල් වලට අලුත් තාක්ෂණයට බිය වියයුතු නැහැ කියලා. සාමාන්‍යයෙන් මේ වගේ දෙයක් කිව්වාම හිතනවා හරි අපි මේ සිස්ටම් තුළ කොහොමද අපි වැඩ කරන්නේ, අපි මේවා වල වැඩ කරලා නැහැ, අපිට පුරුදු යෝජනාවක් කොළේක දාලා ඒ යෝජනාව සාකච්ඡා කරලා මෙම්බට ඇස්සෙන් ගේන්න. එතකොට මේවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? මේවා ආන්ඩුවම සාකච්ඡා කළ යුතුයි. කොහොමද අපි අලුත් විදියට පරිපාලනය මෙහෙයවන්නේ. ඒවා අපි රාජ්‍ය පරිපාලනයේ මෙච්චර කල් අවුරුදු ගාණක් කරපු විදියට වෙනස් ක්‍රමයක් වෙන්න පුලුවන්. නමුත් මම හිතනවා රටක් හැටියට අපි ඉස්සරහට යන්නනම් අපි වෙනස් වීම චේන්ජ් ඊස් ද ඔන්ලි තින් දැට් ඊස් කොන්ස්ටන්ට් කියලා තියෙනවා. වෙනස් වීම තමයි තියෙන එකම දේ. එතකොට වෙනස්වීමට අපි කොතරම් දුරට අපි ඒ වෙනස භාර ගැනීමට අපි පුද්ගලයන් හැටියට නිලධාරීන් හැටියට සහ අපි මහජන නියෝජිතයන් හැටියට අපි ජනතාව දැනුවත් කරවාද? අපි කොච්චර බලන්ද? මම හිතනවා අපි ඒ විදියට හිතුවොත් විතරයි රටක් හැටියට ඉස්සරහට යන්න පුලුවන් කියලා. මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා. මේ සම්බන්ධයෙන් දැනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවෙත්, උතුරු නැගෙනහිර ප්‍රදේශවලත් මේක ක්‍රියාත්මක වෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් මම ඒ අයට කතා කළා, ලිව්වා. ඒ අදාළ විස්තරත් මම ලේකම් අංශයට භාර දුන්නා. ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් ප්‍රසන්ටේශන් එකක් ඉදිරිපත් කරලා ඒ අයට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් කරුණු දැක්වීමේ අවස්ථාව මම සලසා දෙන්නාම. ඒකට සම්බන්ධවෙලා ඉන් අනතුරුව නගර සභාව තීරණය කරන්න පුලුවන් මේ මෘදුකාංගය පාවිච්චි කරනවාද.

ගරු නගරාධිපති - ජේ.ඩී.ශ්‍රියාන්ත ප්‍රනාන්දු මහතා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (09) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා ආයතන කමිටුවට යොමු කරනවා

05(10) මහා නගර සභා මන්ත්‍රී, ලෙවරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

"මොරටුව මහා නගර සභාව තුළ දැනට පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන, නවීකරණය කොට එය මොරටුව නගරය තුළ ජීවත් වන පුරවැසියන්ට (දරුවන්ට / මවවරුන්ට) භාවිතා කළ හැකි මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරන ලෙස යෝජනා කරන්නීය. දැනට මොරටුව සොයිසාපුර ප්‍රදේශයේ ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථානය මේ සඳහා යොදා ගත හැකි බවට යෝජනා කර සිටින්නීය.

ප්‍රථමයෙන් ඒ සඳහා සුදුසු ස්ථානීය පරීක්ෂාවක් කොට අදාල වියදම්, අවශ්‍ය සම්පත් පිළිබඳව අධ්‍යයනයක් කොට සුදුසු Project Proposal එකක් සිදු කළ යුතු බවට යෝජනා කර සිටින්නීය.

තවද, මේ හරහා මොරටුව මහා නගර සභාවට ලැබිය හැකි ආදායම ද අධ්‍යයනය කොට මෙය ව්‍යාපෘතියක් ලෙස සලකා ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා කරන්නීය."

මහා නගර සභා මන්ත්‍රී, ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ලෙවරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කාන්තා මන්ත්‍රීවරියන් හැටියට හා ඉන් එහාට ගිහිල්ලා මවක් හැටියට සහ එදිනෙදා රැකියාවක නිරතවෙන කාන්තාවක් හැටියට අපිට තියෙන විශාල ප්‍රශ්නයක්, චැලේන්ජ් එකක් තමයි අපේ දරුවන්ට අපි යන අවස්ථාවන්දී තියලා යන්න ආරක්ෂිත සුරක්ෂිත තැනක් තියෙනවාද කියන එක. එතකොට අපි දන්නවා ලංකාවේ මේ ඩේ කෙයාර් සෙන්ටර්ස් තියෙනවා, නමුත් මේ ඩේ කෙයාර් සෙන්ටර්ස් එක එක ප්‍රමාණයෙන්, එක එක ක්‍රමයෙන් සිද්ධ වෙන දේවල් තියෙනවා. ඩේ කෙයාර් සෙන්ටර්ස් සම්බන්ධයෙන් මගේ අවධානය යොමු කරනවානම් මම කියන්න කැමති මේක නගර සභාවට ආදායම් උපයා ගැනීම දක්වා දියුණු කර ගැනීමට කළ හැකි ක්‍රමවේදයක් කියලා. මොකද දිවා සුරැකුම් මධ්‍යස්ථාන කියන්නේ අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක්. ඒ අවශ්‍යතාවය අපි නිසියට හඳුනාගත්තානම් ඒ අවශ්‍යතාවයට අපි ලෑස්ති කළානම් ඒ සර්විස් එක අපි මේ නගර සභාව හරහා විධිමත්ව සුරක්ෂිතව සහ හොඳ පරිසරයක් තුළ ඒ සේවාව ලබා දෙන්න පුලුවන්නම් ඒ හරහා එකක් නගර සභාවට ආදායමක් ලබා ගන්න පුලුවන්; අපිට රැකියා ලබා දෙන්න හැකියාවකුත් තියෙනවා. දැන් අපි දන්න දෙයක් තමයි පිටරට වල චයිල්ඩ් කෙයාර් කියන එක ෆුල් ටයිම් එම්ප්ලොයිමන්ට් එකක් හැටියට විතරක් නෙවෙයි පාර්ට් ටයිම් එම්ප්ලොයිමන්ට් එකක් විදියට කරන කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ස්කූල් චිල්ඩ්‍රන්ලත් ඒ කියන්නෙ ස්කූල් එකෙන් අයින්වෙලා යුනිවර්සිටි ස්ටුඩන්ට්ස්ලත් මේ චයිල්ඩ් කෙයා කියන එක ස්පෙශලයිස් කරලා එක ප්‍රවර්ධන කරන තත්ත්වයක් තියෙනවා. ඉතින් අපි මේ සම්බන්ධයෙන් විශේෂ සාධනීයව බැලුවොත් අපිට මොරටුව මහා නගර සභාව සතු දිවා සුරැකුම් මධ්‍යස්ථාන අපිට හැකියාවක් තියෙනවානම් හොඳ කොලිටි සෙන්ටර්ස් හැටියට ඩිවලප් කරන්න අපිට ඒ සේවාව ලබා දෙන්න පුලුවන්. දැන් ගිය මාසේ ප්‍රභාෂිනී වික්‍රමසිංහ ගරු උප නගරාධිපතිතුමිය සහ මහජන උපදේශක කමිටුවේ සභාපතිතුමිය සෙව්වන්දි මන්ත්‍රීතුමිය සහ සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා ඇතුළු අපි මන්ත්‍රීවරු තුන් මොරටුව මහා නගර සභාවේ තියෙන පෙර පාසල් සහ ඩේ කෙයාර් සෙන්ටර්ස් අපි පරීක්ෂා කළා. අපි ඒ ගිය අවස්ථාවකදී අපි හඳුනාගත්තා සමහර සෙන්ටර්ස් සමහර ස්ථාන මේ ඩේ කෙයාර් සෙන්ටර් බවට පරිවර්තනය කිරීමේ හැකියාවක් තියෙනවා. එතන කැපෑසිටි එකක් තියෙනවා උදාහරණයකට සොයිසාපුර ගත්තොත් එතන ඒ මහල් නිවාස සංකීර්ණයේ ගොඩක් පුද්ගලයො රැකියා වලට යනවා. එතන අපිට හොඳ කොලිටි ඩේ කෙයාර් සෙන්ටර් එකක් දාන්න පුලුවන්නම් අනිත් එක රජයෙන් ප්‍රවර්ධනය කරන දෙයක් නම් මිනිස්සු ඒ විශ්වාසයක් ඇති කරනවා. එතකොට අපි හොඳට සෙන්ටර් කරලා යම් මුදලක් එයට ඉන්වෙස්ට් කරලා අපිට සභාවෙන් මුදල්

නැත්නම් ප්‍රයිවට් ඉන්වෙස්ටර් පබ්ලික් ඉන්වෙස්ටර් නොහොත් හරි ප්‍රයිවට් පාර්ට්නර්ශිප් එක් නම් අපිට පුද්ගලික අංශය එක්ක සම්බන්ධ කරලා අපිට කොළඹ මහා නගර සභාවේ අධීක්ෂණ යටතේ ඒක හොඳ සොලිට් ඩේ කෙයාර් සෙන්ටර් එකක් හැටියට පත් කරන්න පුළුවන්නම් ඒක නගර සභාවේ සේවකයන්ගේ දරුවන්ට විතරක් නෙවෙයි කොළඹපුර විශාල නිවාස සංකීර්ණයේ ඉන්න දරුවන්ටත් ඉන්න පුළුවන් විදියට. හැබැයි ඒක අපි සාමාන්‍ය ඩේ කෙයාර් සෙන්ටර් වලට දෙන මුදලට වැඩිය සහනදායී අඩු මුදලකට සහනදායී මුදලකට දෙන්න හැකියාව තියෙනවා නම් මම හිතනවා ඒ සර්විස් එක ලබාදීම ඇත්තටම වැදගත් කියලා. අපි ඒ අවස්ථාවේ දී කොළඹපුර දිවා සුරැකුම් මධ්‍යස්ථානය හඳුනාගන්න. හැබැයි මම එතැනින් ඔබ්බට ගිහිල්ලා කියන්න කැමති අපි අර කරපු අධ්‍යයනයේදී අපිට හැකියාව තියෙනවානම් කොළඹ කලාප 03ට හොඳ ඩේ කෙයාර් සෙන්ටර්ස් 03ක් දාන්න. ඒ සඳහා කරන්න පුළුවන්නම් අපිට මම හිතනවා ඒ හරහා අපිට නගර සභාවට ආදායමක් සහ එම්ප්ලෝයිමන්ට් දීමේ හැකියාවකුත් තියෙනවා. එතකොට මේ සම්බන්ධයෙන් මම යෝජනාවක් කරන්න කැමති ප්‍රොජෙක්ට් ප්‍රොපෝසල් එකක් සිද්ධ කරලා මේ සම්බන්ධයෙන් අපිට වැඩිදුර අධ්‍යයනයක් කරලා මෙක ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කර සිටිනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රභාෂනී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන 05 (10) යෝජනාව සම්බන්ධයෙන් ඇත්තටම ස්තූතිවන්ත වෙනවා මන්ත්‍රීතුමියට මොකද අපි මේ කාරණාව මහජන උපයෝගිතා කමිටුවෙත් යනවා. එහි නිරීක්ෂණ චාරිකාවක් විදියට අපි පසුගිය දෙවෙනිදා සහ හයවෙනිදා ගියපු ඒ නිරීක්ෂණ චාරිකාවේදීත් අපි මේ කාරණය සම්බන්ධයෙන් සාකච්ඡාවකට ලක් කළා. එහිදී ඇත්තටම අපි හිතනවා අපේ හිටපු ගරු නගරාධිපතිතුමිය මේ කියන මොන්ටිසෝරියේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඇත්තටම ඒ ප්‍රදේශයට අත්‍යවශ්‍ය එකක් වගේම තඹුබැද්ද පුංචි පාර්ක් එකේ අපේ හොඳ ගොඩනැගිල්ලක් තියෙනවා. දෙමහල් ගොඩනැගිල්ලක් එකේ ඉතා හොඳ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් කරගෙන යන්න පුළුවන් විදියට හොඳ වටපිටාවක් හොඳ පරිසරයක් තියෙනවා. ඒ නිසා අපි මේ යෝජනාව ඉතා සාධනීය පැත්තෙන් අරගෙන කොළඹ දෙමාපියන්ට මෙක විශාල සහනයක් බවට පත්වෙයි. ඒ නිසා ඒකට අවශ්‍ය කටයුතු කරන්න මැදිහත් වෙමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඩී. ශෙවන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන උපයෝගිතාව, කාන්තා හා ළමා සංවර්ධනය පිළිබඳ කමිටුවේ තීරණය මත අපි පසුගිය 04 වෙනිදා සහ 09 වෙනිදා කොළඹ පෙර පාසල් 17 ක් නිරීක්ෂණය සඳහා එකතු වුණා. එහිදී කොළඹපුර මුතුහර පෙර පාසල දැනට ළමයි 08 දෙනෙක් පමණයි ඉගෙනුම ලබන්නේ. ඒ වගේම සිහිනි පෙරමඟ පෙර පාසල තඹුබැද්ද දැනට ළමයි ඉගෙනුම ලබන්නේ නැහැ. මෙම මොන්ටිසෝරි 02 පිළිබඳව අපි කරපු නිරීක්ෂණ චාරිකාවේදී අපිට පැහැදිලි වෙච්ච කාරණයක් තමයි මේ මොන්ටිසෝරි 02 පිහිටලා තියෙන ස්ථානය අනුව ඉතාම හොඳ ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථාන 02ක් අපිට පවත්වාගෙන යන්න පුළුවන් කියන කාරණය. එහිදී අපි එක පැත්තකින් සාකච්ඡා කළා සභාවට ඉරක් කරනවාට වැඩිය ව්‍යාපෘති වාර්තා හදලා. ඒ ව්‍යාපෘති වාර්තා මගින් ස්වේච්ඡා සංවිධාන, ආයතන, පුද්ගලයන් හරහා අරමුදල් ප්‍රතිපාදන ලබාගෙන ඉතා හොඳ දිවා සුරැකුම් මධ්‍යස්ථාන 02ක් බවට කොළඹ තුළ ස්ථාපනය කරන්නට ඒ ගැන ඉදිරියේදී සියලුම වාර්තාවක් අපි මහජන උපයෝගිතා කමිටුවට ඉදිරිපත් කිරීමට සූදානම් කරලා තියෙනවා. ඒ වගේම ඉතා හොඳ සාධනීය යෝජනාවක් කාන්තාවක් විශයෙන් රැකියාවක් කරන කාන්තාවක් විශයෙන් අපි හැම දෙනාටම හොඳ ඉතාම යථාර්ථ පිළිතුර රජයේ මැදිහත් වීමෙන් සේවාවක් සපයන්න පුළුවන් මෙවැනි ආයතනයක් ස්ථාපනය කිරීමෙන්.

මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

ගරු නාගරාධිපතිතුමනි, ඉතාමත් කෙටියෙන් ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ කාරණාව ගැන අදහසක් පළ කරන්න සූදානමින් නැඟිටියේ. ඇත්තටම දිවා සුරැකුම් මධ්‍යස්ථාන කියන මේ සංකල්පය අපේ රටට යම්කිසි ආධුනිකභාවයක් තියෙනවා. මොකද අපේ රටේ ඉතිහාසයේ පැවති පවුල් පසුබිම ඇතුලේ අම්මා, තාත්තා, සහෝදර සහෝදරියන්, ආච්චි, සීයා මේ ඔක්කොම නිකන් පවුලක් විදියට ජීවත් වෙච්ච නිසා දරුවො බලාගන්න අමාරුවක් තිබුණේ නැහැ කියලා හිතුවා. නමුත් 77න් පස්සේ ඇතිවෙච්ච මේ විවෘත ආර්ථිකයත් එක්ක මේ පවුල් ඒකක සී සීකඩ ගිහිල්ලා අවසානයේදී තමන්ගේ ස්වාමි පුරුෂයාට විතරක් ආර්ථික ශක්තියට සම්බන්ධ වෙන්න විතරක් ප්‍රමාණවත් නොවන නිසා නෝනයි මහත්තයයි දෙන්නම රැකියා කරන තත්ත්වයට පත්වුණා. එතකොට මේකත් එක්ක තමයි මේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන කියන එක විශේෂයෙන්ම නගර වල නම් ලොකු වර්ධිත අවශ්‍යතාවයක් තහවුරු වෙන්නේ අලුතින් ග්‍රාමීය ප්‍රදේශ වල. නමුත් නාගරික ප්‍රදේශ වල මේ අවශ්‍යතාවය තියෙනවා. විශේෂයෙන්ම ගරු නාගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමිය යෝජනා කරපු කොටියාගාපුර ප්‍රදේශය කියන්නේ කොටියාපුර දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්. කොහෙද දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් තිබුණා. එතකොට මේ කාරණය ගත්තාම මම ඉල්ලා සිටිනවා ලිහිණි මන්ත්‍රීතුමිය ඉතාම කාලෝචිත අදහසක් ඉදිරිපත් කළා අපේ කලාප 03වන. නියෝජ්‍ය නාගරාධිපතිතුමිය පදනම් කළා පුංචි පාර්ක් එක කට්ටිබැද්දේ. මොකද එතන පෙර පාසලකට අවශ්‍ය කරන වටපිටාව සියල්ල තිබුණත් ළමයි දෙන්නෙක්ද කොහෙද එතන ඉන්නේ. එතකොට ඒක වහන්න නියමිත තැනක්. නමුත් ඒ ඉඩම ඒ ප්‍රමාණය ඒ අලංකාරත්වයත් එක ගත්තාම පෙර පාසලක් සමඟ මේ කොටසත් එකක් හැටියට පටන් ගන්නවානම් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් කියන්නේ නිකම්ම නිකන් අම්මලා ළමයිව ගෙනත් දෙනවා වේලකට එතන බලාගෙන ඉඳලා දෙනවා කියන එක නොවෙයි. එය අතිශය වගකීම් සහගත කටයුත්තක්. පුංචි දරුවෝ. එතකොට වෙනා රටවලනම් බර කිරලා අරගෙන එවනකොට දෙන්නෙත් බර කිරලා තමයි එවන්නේ. ඒ වගේ අතිශයින්ම වගකීම් සහගත රැකියාවක්. එතකොට ඒක රැකියාවකට වඩා සේවයක්. ඉතින් මම ඉල්ලා සිටිනවා ඉතා ඕනෑකමින් මේ කාරණය සම්බන්ධයෙන් අධ්‍යාපනේ මේ අවුරුද්දට ආදර්ශයක් විදියට කොටියාපුරවත් මේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය ආරම්භ කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නාගරාධිපතිතුමා - කේ. ටී. නිශාන්ත ප්‍රදීප්කාන්ත මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම ස්තූතිවන්ත වෙනවා මන්ත්‍රීතුමියට ඇත්තටම ඉතාම යහපත් යෝජනා කිහිපයක්ම එතුමිය ඉදිරිපත් කළා. කාලය පිළිබඳ තියෙන ගැටලුව නිසා මම මේ සම්බන්ධව කතා කරන්න යන්නේ නැහැ. කිසි බාධාවක් නැතුව ඔබට මේවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන්න සූදානම්. අපේ සම්පත්, අපේ ඉඩකඩම්, අපේ දේපළ ඒවාට වෙලා තියෙන ආරක්ෂාව මඟ හොඳින් ඒ ස්ථානයට ගිහිල්ලා බලලා මේ යෝජනා කරන්න. එතකොට එකඟතාවයක් තියෙනවා අපි මේවා කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරලා ක්‍රියාමාර්ග වලට යමු.

ගරු නාගරාධිපති - කේ.ටී.නිශාන්ත ප්‍රදීප්කාන්ත මහතා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, න්‍යාය අංක 05 (10) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගිතා කමිටුවට යොමු කරනවා

**05(11)** **මහා නගර සභා මන්ත්‍රී, නමිරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා පවතින අතුරු නීතිය යාවත්කාලීන කළ යුතු බැවින්ද, ඒ හරහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආදායම් උපයාගත හැකි ක්‍රමයක් ලෙස සලකා ද, දිවා සුරැකුම් මධ්‍යස්ථාන තුළ ප්‍රදේශයේ ඇති කාන්තාවන් කෙටි / තාවකාලීන රැකියා සොයාගෙන ලබාදිය හැකි මධ්‍යස්ථාන ලෙස ද, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලනය විය යුතු ආකාරය පිළිබඳ රජයේ සහ ජාතික ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දැනට පවතින ක්‍රමවේදය / Guideline සලකා බලා අදාල අතුරු නීතිය සංශෝධනය විය යුතු බවට ද මෙයින් යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එස්. ඇන්සි ජේ. ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - නමිරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඉතාම කෙටියෙන් කියනවානම් දැනට අතුරු නීති මම දකින විදියට මීට තිහත්තෙත් අතුරු නීති අපිට ලබාදීලා නැහැ නගර සභාවෙ. ඒ අතුරු නීති යාවත්කාලීන කිරීමේ ඇත්තටම අවශ්‍යතාවයක් තියෙනවා. මේක මම දන්නවා අපිට මෙතනින් කළ හැකි දෙයක් නොවෙයි. පළාත් සභාව දැනටම ගැසට් වෙන්නේ නැහැ. එතකොට අපි අතුරු නීතියක් මෙන් ඩ්‍රාෆ්ට් කරත් පළාත් සභාවෙන් මේක අනුමත කිරීමට ඒ ප්‍රොසෙස් එක ඇත්තටම හරියට ගැසට් වෙන්නේ නැහැ. නමුත් එහෙම කියලා අපිට අතුරු නීතියක් නැවත ඩ්‍රාෆ්ට් කිරීමේ කිසිදු බාධාවක් නැහැ. දැන් මේ මන්ත්‍රීවරු සියලුදෙනාම අතුරු නීති ගැන කියෙව්වානම් ඇත්තටම ඒවා යල්පැනගිය අතුරු නීති තියෙන්නේ. ඉතින් ඒවා සම්පූර්ණයෙන්ම මම හිතනවා වෙනස් වියයුතුයි කියලා. හැබැයි මේ අවස්ථාවේදී මම යෝජනා කරනවා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් තියෙනවානම් ඒ අතුරු නීතියක් අපි ඒවා යාවත්කාලීන කරලා අපි කොහොමද දිවා සුරැකුම් මධ්‍යස්ථාන නගර සභාවකට ඒ සේවය කොහොමද ඒ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පාලනය වියයුතුයි. ඒකෙ ගයිඩ් ලයින්ස් එක. ඒවා වල කොහොමද සිස්ටම්, ප්‍රොසීඩියස් මේ සෑම සියලු දෙයක්ම සාකච්ඡා කරලා මේ අතුරු නීතියක් නිර්මාණය කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. මේ යෝජනාව ගැන දෙනකොට මම ලබාදුන්නා ලේඛනයක්. ඒ ලේඛණය මෙතනට අමුණලා නැහැ. ඒකේ තියෙනවා නැෂනල් ගයිඩ්ලයින් ෆෝ චයිල්ඩ් ඩේ කෙයාර් සෙන්ටර්ස් ශ්‍රී ලංකා. මේක මිනිස්ට්‍රි ඔෆ් විමන් ඇන්ඩ් චයිල්ඩ් අෆෙයාර්ස් වලින් තමයි මේ ගයිඩ්ලයින් එක හදලා තියෙන්නේ. එතකොට මෙහෙම මොඩල් ගයිඩ් ලයින් එකක් තියෙනවා කාන්තා අමාත්‍යාංශය විසින් නිර්මාණය කරපු හැබැයි මේ රටේ තියෙන ප්‍රශ්නයක් තමයි මිනිස්ට්‍රීස් වලින් කරන දේවල් පල්ලෙහාට එන්නේ නැහැ. එතකොට අපිට මේ නගර සභාවට මේවා අඩොප්ට් කරගන්නනම් ඇත්තටම මේවා අතුරු නීතියක් විදියට තිබිය යුතුයි. මම යෝජනා කරනවා මේ ගයිඩ් ලයින් එකත් බලලා අපි අතුරු නීතියක් මේ සම්බන්ධයෙන් මේ සභාවේ මේ පාර නීතිඥවරු ගණනාවක් ඉන්නවා. අපි එකතුවෙලා අපි දිවා සුරැකුම් මධ්‍යස්ථාන වලට අදාළව ඒ අතුරු නීතිය ඩ්‍රාෆ්ට් කරමු කියලා. එතකොට අපිට මේක මොරටුව මහා නගර සභාවට පමණක් නොවෙයි රටේ අනික් නගර සභාවලටත් ප්‍රයෝජනයට ගන්න හැකියාවක් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතුවා මේ යෝජනාව කොච්චරක් වැදගත් වෙනවාද කියලා. මට දැනුණේ මීට දවස් කිහිපයකට ඉස්සෙල්ලා මිහි ලේකම් අංශයට යනකොට නිලධාරීන් විසින් තමන්ගේ කාල සීමාවෙන් පස්සේ, මම 4ට පස්සේ ගියේ නමුත් මම හිතන්නේ ඒ වෙලාවේ 5 විතර වෙනකන් වගේ ඇති. ඒ වෙනකොට අපේ මෙතුමිය තමන්ගේ දරුවන් දෙදෙනා ඉස්කෝලේ ඇරිලා ඇවිල්ලා එක්කෙනෙක් තුරුළු කරගෙන අනික් දරුවත් වාඩිවෙලා ඉන්නවා හැබැයි ඒ තමන්ගේ

කාර්යය භාර්යය නිසියාකාරව ඉෂ්ට කරනවා. ඒ නිසා මම කිවුවා ඇත්තටම මේ ලිහිණි මන්ත්‍රීතුමිය කරපු මේ යෝජනාව අපිට වැදගත් වෙන්නේ මේ නගර සභාවේ වැඩ කරන නිලධාරීන්ටත් ඉන්නවා පුංචි දරුවෝ. ඒ දරුවන්ට අපි සුරක්ෂිතභාවය දෙන්න ඕන. එහෙම නැතිවුණොත් ඒ දරුවන් පිළිබඳව අවධානය යොමු කරලා ඒ වැඩේ එතුමිය හොඳට කරනවා. ඒ වගේම අපේ නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමාටත් ඉන්නේ ශේට්කනයෝ තුන් හතර දෙනායි. හැබැයි එතුමා එය හොඳින් මෙහෙයවනවා. හැබැයි ඒ දරුවෝ ඉන්නේ මම දැක්කා. ඒ අම්මා කෙනෙක්ගේ තියෙන දරු සෙනෙහස එහෙමත් තියාගෙන ඒ කාර්යය ඉෂ්ට කරන නිලධාරිනියක්. ඒ නිසා මෙතන අද වැව වඩාත් අගෙප්ගරු නගරාධිපතිතුමනි, මේ අමාරුවුව මහා නගර සභාවටත් වැදගත්. ඒ වගේම අමාරුවුණේ අනාතුන් ක්ෂේත්‍ර වලටත් වැදගත්. අද තමන්ගේ වැඩ රාජකාරි වලට යන අම්මා ඉන්නර මෙතුමා කිවුව විදියට අපිට තිබුණේ විශ්වාස පවුලක්. ආච්චි අම්මා, සීයා නාන්නා හිටියා, ඒ වගේම නැන්දර කියලා නැන්දර වලට පුම්වී තියන්නෙන් නැතිනම් සීයා නැනන්දර නවන්වනවා. ඒ නිසා අපිට ඒ වගේ සම්ප්‍රදායක් අපිට තිබුණා. ඒ සම්ප්‍රදායෙන් විධිමත් අධ්‍යාපනයම් විධිමත් හා නොවිධිමත් කියන අධ්‍යාපනය තුලින් අපි ඉගෙන ගත්තා. පරිසරයෙන් අපි ඉගෙන ගත්තා, කොහොමද සමාජ ඒක නිසියාකාරව හැසිරෙන්නේ කියලා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මෙතන යුතුකමක් සහ වගකීමක් විශේම අනිත් පැත්තෙන් ධර්මයට ප්‍රත්‍යිය ඉෂ්ට කරන එකක්. ගරු නගරාධිපතිතුමනි, අපේ ගිනේ තියෙන රඳ යෙදර ගිහිල්ලා තියන්න බැහැනේ තෝනාට. ඒ වගේම මේතුමිය කියන නීති සංශෝධනය ඇත්තෙනුත් වැදගත් වෙනවා විශේම මට මේ කතාවත් මතකවුණා. ඒ තමයි දවසක් දෙවි කෙනෙක් ඇවිල්ලා බුද්ධජාණන් වහන්සේගෙන් අහනවා බුදු හාමුදුරුවනේ මේ ලෝකයේ තියෙන වටිනාම වස්තුව මොකක්ද කියලා. බුදු හාමුදුරුවෝ ඒ අනුව දේශනා කරනවා වත්තු සූත්‍රයේ. බුද්ධදත්තෙන් අහන්නේ මෙහෙමයි බුද්ධජාණන් වහන්සේ කිං'මිත්තු මනුස්සානං - මනුෂ්‍යයන්ට තියෙන උතුම්ම වස්තුව මොකක්ද කියලා. බුද්ධජාණන් වහන්සේ කියනවා පුත්තා වත්තු මනුස්සානං - දරුවන් තමයි මිනිස්සුන්ට ඉන්න උතුම්ම වස්තුව. ඒ නිසා මේ රටේ දරුවන්ට රාජ්‍ය පාලනයක් රාජ්‍ය තන්ත්‍රයක් ප්‍රාදේශීය පාලනයක් යම් මේ ද හොඳින් සලකන්නේ රකවරණය දෙන්නේ ආරක්ෂාව දෙන්නේ මෙහෙයවීම කරන්නේ ඒ අනුව තමයි රටේ සංවර්ධනය අනාගතය රැඳෙන්නේ කියලා වත්තු සූත්‍රයේ දී දේශනා කරනවා. ඒ නිසා අපිටත් ඒ වගකීම ගරු නගරාධිපතිතුමනි තියෙනවා. ඒ නිසා මේතුමිය කිවුව විදියට අද අපේ ඇත්තටම මේ පෙර පාසල් ගත්තත් ඒ විශේම දිවා සුරැකුම් මධ්‍යස්ථානවලත් අපි මේ තියෙන අඩු තීති වෙනස් කළ යුතු නැද්ද? අද ගත්තොත් ෆින්ලන්තය හෝ ස්කැන්ඩිනේවියන් වැනි රටවල් වල මේ තියෙන ක්‍රමය වෙනස් වීට වෙනා. ඔබතුමා දන්නවා අවධානය යොමු කරනවා අද ලෝකයේ වර්ධනය අපි විශේෂයෙන් චයිල්ඩ් සයිකොලොජි ගැන අපි ඉගෙනගෙන තියෙන ස්ටේජ් ගැන කැම්පස් එකේ. ඒ නිසා ඒකේ තියෙනවා දරුවන්ගේ මුලික අවධිය, ළමා අවධියේදී අපි කොහොමද ක්‍රියාත්මක වෙන්න ඕන කියලා. හැබැයි අද ඒක ලොකු බැර ඇතිමක් කරලා නැහැ. විලනට ගරු නගරාධිපතිතුමනි, හොවඩ් ගාර්ඩිනර්ගේ තියෙනවා බහුවිධ බුද්ධි න්‍යාය කියලා සංකල්පයක්. ඒ අනුව අපි දරුවන්ගේ සංගීත හැකියාව සංගීතයේදී බුද්ධිය ගණිතමය බුද්ධිය භාෂිතමය බුද්ධිය ආදී කාලේ ඉඳලාම ගුරුතුමිය අවබෝධ කරගන්නවා. ඒ කරන්න ඕන පෙර පාසලේදී හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දී. ඇත්තටම අද අපේ රටේ තියෙන පෙර පාසල් වල එහෙම අපි හොවඩ් ගාර්ඩිනර් කියන විදියට එහෙම බුද්ධිය අවබෝධ කරගෙන තියෙනවාද? නගරාධිපතිතුමනි, මීට පෙර සභාවක දී මම මේ මහජන උපයෝගිතා කමිටුව නියෝජනයේ කළේ. පෙර පාසල් දරුවෝ කතා කරගෙන හිටියේ රන්දේ පැය ගැන. පුළුණු විත්ති කොහොමද යාන්ත්‍රිකව මොකද වුණේ කියලා. එහෙමනම් අපේ රට කොයි දැන්නකටද ගමන් කරන්නේ. අමාරුවුණේ දරුවන්ගේ අනාගතය කොහටද ගමන් කරන්නනේ. ඉන් පස්සේ හොඳ අධ්‍යාපනයක් නොලැබුණොත්, හොඳ දිවා සුරැකුමක් නොලැබුණොත්, හොඳ

සම්බන්ධතාවයක් නොලැබුණොත්, විධිමත් විදියට අධ්‍යාපනයක් නොලැබුණොත්, අර මනුස්ස බුද්ධි නාශය හොරට සාර්ථකරගේ ඉන්ම්බු නොවුණොත් දරුවන්ට මොකද වෙන්නේ. අපේ මන්ත්‍රීතුමිය සඳහන්කළා ගර්භණීයට සුබ නැගෙන් ගම්බඩවෙනවා වගේ අසුබ නැගෙන් ගම්බඩවෙයි. ඒ තරමයි මෙරටේ අද වින්ත් ප්‍රෙග්නන්සිස් වලින් වැඩිම, අවුරුදු 16 ට අඩු දරුවෝ තමන්ගේ දරුවෝ බිහි කරන්න ඒ වගේම රැකවරණය දෙන්න බැරි මට්ටමට පත්වෙලා තියෙනවා අද මෙන්න මේ ප්‍රශ්නය නිසා. ඒ නිසා මෙතනට අනිවාර්යයෙන්ම දැන තියන්න ඕන ප්‍රශ්නයක්. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අද වෙනකොට අපි අපේ මේ මහරගම නගර සභාව ඔබතුමා ආදායම් උත්පාදනය කරන මාර්ගයක් බවට පත්කර ගන්න කටයුතු කරමින් පවතිනවා. ඒ නිසා ආදායම් උපයනවා වගේම සදාචාරය අහිමිවූ මේ දරුවන්ට අවශ්‍ය කරන රැකවරණය දෙන්න මේ කටයුත්ත අපි ප්‍රමුඛව කරමු.

**මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලියගුරුගේ මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඉතා වෙහෙසකර දවසක්, නමුත් මේ තරම් සම්භාවනීය සභාවක් මම හිතන්නේ මෑත අතීතයේ මේ ස්ථානයේ නොතිබෙන්නට ඇති. ඒ තරමටම මේ යකින් දුමින්ද මන්ත්‍රීතුමා, ලිහිණි මන්ත්‍රීතුමිය තමන්ගේ හෘදයාංගම පිළිදීමක් සතුටක් සමග ඇති වුණ මහා ප්‍රබෝධයෙකින් ජීවගැල්ලන්ගේ හිත් තුළ කැකෑරෙමින් අවුරුදු ගණනාවක තිබුණු දැනුම, මීගෙනාම, අනාගතය සම්බන්ධයෙන් ඒ තිබෙන විශ්වාසය පොඩිනැඩිලා තියෙන මෙම්බොහාතා ඔබතුමාගේ නායකත්වයට කරන ගෞරවයක් සහ මඟපෙන්වීමක් ඔස්සේ අනාගතය කරා ගමන් කරන මේ ගමනේ එක්තරා තීරණාත්මක වැදගත්ම සන්ධිස්ථානයක් අද දවසේ මේ සභාව නියෝජනය කරනවා කියලා මට හිතෙන්නේ. අපි නවක මන්ත්‍රීවරු උදෑසන සිට ඔබතුමාගේ ඉද් ඉගෙන ගනිමින් සිටිනවා. මම ගුරුවරයෙකු ලෙස දීර්ඝ කාලයක් ඉන්නකොට ඒ ඒ නම් පන්ති කාමරයේදී ආසන නැගී ගුරුවරයා වැඩ කටයුතු කරන මොහොතේ අනෙකුත් කාර්යය විවිධ සහභාගිත්ව වල, සාකච්ඡා වල ඉන්නකොට මම ඇත්තටම පෞද්ගලිකව ආසන නැහැ. මම සභාවක් තුළ ගුරුවරයාට තියෙන ගෞරවයට වඩා ඊට වඩා වැඩි ගෞරවයක් මා බලාපොරොත්තු වෙනවා. නගරාධිපතිතුමා ගෞරවනීය චරිතයක්, මේ මුළු නගරයේම සම්භාවනීය පුද්ගලයා. පොලිස් බලතල, සිවිල් බලතල එතුමන්ට තියෙන්නේ අසීමිත බලයක්. නමුත් එතුමා එක වචනයක් පාවිච්චි කරන්නේ නැහැ සභාවට සන්සුන් වෙන්න, විනයානුකූල වෙන්න, සදාචාරවත් වෙන්න. ඔබතුමන්ලා අසීමිත පාඩම් අපට උගන්වනවා, අවුරුදු ගණනාවක් මෙහි හිටියට වඩා යම් යම් දේ ඉගෙන ගන්නවා, අපි අතීතයේ ගැන අහලා තිබුණ සම්භර දේවල් වෙනුවෙන් කියලත් තිබෙනවා. මෙවා සම්භාවනීය සභා. ඉතා උසස් දේවල්නේ කතා කරන්නේ. සමීක් මන්ත්‍රීතුමාගේ මනෝවිද්‍යා දැනුම, සමාජ විද්‍යා දැනුම මම ඇත්තටම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පන්ති කාමරයේ මගේ මහාචාර්යවරයාගෙන් ඉගෙන ගත්ත දේවල් මට නැවත මතක් වෙමින් තියෙනවා. ලිහිණි මන්ත්‍රීතුමිය දක්ෂ කාන්තාවක්, බුද්ධිමත් කාන්තාවක්. අද නූතන ලෝකයට කාන්තාවට අද පවතින ප්‍රවණතාවයන් තෝරාගෙන අරගෙන ඔබතුමා ඉදිරිපත් කරමින් සිටිනවා. ඉගෙන ගනිමින් ඉන්න ඕන අනෙකුත් ශිෂ්‍යයෙක්. අපි ඔබතුමන්ලාගෙන් ඉතා ඉක්මනින් ඔය දේවල් ඉගෙන ගනිමි කියලා හොඳ ශිෂ්‍යයෝ විදිහට, නවක මන්ත්‍රීවරු විදිහට බොහෝ ආදර්ශ සහ දැනුම ලබාගනිමින් සිටිනවා. ඒ සම්බන්ධයෙන් නගරාධිපතිතුමා ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයට සහ මේ මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. මේ කාරණය මම කියන්නට ඕනෙ.

ගරු නගරාධිපතිතුමනි, මම කාරුණිකව ලෙස ආයාචනා කරනවා මේ සභාව තුළ අපි කිසිදු අවස්ථාවක මේ සභාවේ බර දරාගෙන යන නිලධාරීන්ට අසීමිත ලෙස, ඇඟෑළුම්ව නරක ලෙස, හිත් රිදෙන ආකාරයට, ඔවුන්ට කිසිදු චෝදනාවක් ප්‍රසිද්ධ ස්ථාන වල, මේ වගේ සභාවක කරන්න එපා කියලා. ඒකට හේතුව තමයි මේ ආයතන පවත්වාගෙන යන්නට බැහැ නිලධාරී මණ්ඩලය අපට ප්‍රතිවිරෝධී ලෙස කටයුතු කරන්න ගත්තොත්. අපිට මේ උඩුමහලේ බලා සිටීම කරන්න බැහැ. ඒ නිසා ඔවුන්ගේ දුක්ගැනවිලි, ප්‍රශ්න, ඔවුන්ට තියෙන කරදර, වියසන, අතීතයේ දේශපාලනය විසින් ඔවුන් වෙත ඇති කළා වූ හෙම්බත්වීම, මානසික අසහනය, ඔවුන්ට දුන්න වදය අපි අහලා තියෙන දේ. ඒ නිසා අද නගරාධිපතිතුමා, අද දේශපාලන නායකත්වය ඒ වදය දෙන්නේ නැහැ. මෙමෙහෙවීමම කාරුණිකව

යහපත් ආකාරයට නිලධාරීන් සේවකයින් මෙහෙයවා ගැනීමට උත්සාහ කරනවා. ඒ නිසා කරුණාකරලා අපි ඒ විනය පවත්වාගෙන යමු. මින් මතුවටවත් නිලධාරීන්ට ප්‍රසිද්ධියේ චෝදනා කරන්න එපා, ඒක ඉතා නරක දෙයක්. එය සදාචාරාත්මක නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිලියනී ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා මේ යෝජනාව සම්බන්ධයෙන් සියලු දෙනාම ප්‍රකාශ කරපු අදහස් වලට සහ මා ඔබතුමාටත් ස්තූතිවන්ත වෙනවා මේ සම්බන්ධයෙන් ඔබතුමා ප්‍රගතිශීලී ලෙස මෙය භාරගැනීම සම්බන්ධයෙන්, ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රගතිශීලී නගරාධිපතිවරයෙක් විශයෙන් මේ දේවල් දැනීම සම්බන්ධයෙන් මගේ ස්තූතිය පුදකර සිටිනවා.

<u>ගරු නගරාධිපති - ජේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්ද මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඇත්තටම අපි කාටත් සතුටුයිනේ. අපි කාටත් දේශපාලන විශයෙන් තියෙන, වෙන කළකිරීමක් නැහැ. මේවා ක්‍රියාත්මක කරන්න එපී කවුරුත් එකතු වුණොත් අනාගමනය සතුටුයිද? අපිට වෙන අවු දේශපාලන වාසි මගක් නැහැ. ගරු නිශාන්තමාතිනි. විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටි කරපු ගුරුවරයෙක්. මහු කියනවා පාට ඇරලා මම ඉගෙන ගන්නවා සජින් මන්ත්‍රීතුමාගෙන් කියලා. අපිට මීගත වගේම සභාවක්. අවසාන විශයෙන් අපේ කතාව ගෙනෙමයි වයාන් වැදගත් වෙන්නේ. කතා හොඳයි නමුත් අපි ජනතාවට ගමනානකරම දුරට මේවා ඉෂ්ට කරන්න සමත් වෙනවද? ඒ නිසා මම මොගොම වගකීමෙන් කියන්නේ මගේ කිසි බාධාවක් නැහැ අපි මින්ලොකාම එකතු වෙලා මේ කටයුතු කරමු

<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්ද මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (11) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගිතා කමිටුවට යොමු කරනවා

## 06. <u>2025 ජූනි මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.</u>

**06(1) 2025.06.26 ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.06.26 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවේ සියලුම නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06(2) 2025.06.26 දින පැවති මහජන උපයෝගිතා, සෞඛ්‍ය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන උපයෝගිතා කමිටුව මගින් අපේ නගර සභාවේ සියලුම පෙර පාසල් පාලනය වෙන්නේ. පසුගිය කමිටු වාරයේදී කමිටුවේ සභාපතිතුමිය ඇතුළු සියලුම සාමාජික සාමාජිකාවන් සියලු පෙර පාසල් සම්බන්ධයෙන් නිරීක්ෂණයක් සිදු කළා. නමුත්, මට අවධාරණය කරන්න තිබෙන ප්‍රධාන කාරණාව විල්ලෝරාවත්ත ජීවත්වන මන්ත්‍රීතුමා අවධාරණය කළා. ඒක විධිමත් ගැඹුරින් අවධාරණය කරන්න ඕන කාරණාව තමයි විල්ලෝරාවත්ත පිහිටා තිබෙන පෙර පාසල ගැන. එම පෙර පාසල කලින් තිබුණේ මහා ළමා සංසදයේ උඩ තට්ටුවේ. පසුව අරගෙන ගියා විල්ලෝරාවත්ත නම්වුව ක්‍රීඩාංගනයේ කොළුවගේ බොල්ලේගොඩ ඇළට මායිමව ඇති ස්ථානයේ

තිබෙන නම් පෙර පාසල් ඇති ප්‍රමාණය නිරීක්ෂණය කළා. ඉතාමත් කණගාටුයි කියන්න, ඒවායේම අවධානම් සහගතයි, භයානකයි. ඒ පෙර පාසල් දරුවන්ගේ ජීවිත අවධානමක් තියනවා. ගරු නගරාධිපතිතුමනි, වැසි කාලයේදී ඒ පෙර පාසල ආශ්‍රිත ප්‍රදේශයට බොල්ගොඩ ගඟේ සිටින කබරයන් සහ කිඹුලන් ගොඩට පැමිණෙනවා. ඒ නිසා දරුවන්ට හානියක් වීමේ අවධානම ඉතා වැඩියි. ඒ වගේම බොල්ගොඩ ගඟේ පෙර පාසලට යාබදව ගඟ ලඟ තියෙන වැවෙන් එහා පැත්තේ ගඟේ තියෙන සියලුම අපද්‍රව්‍ය එකතැනකට එකතු වෙලා තියනවා. ඔබතුමා පෙර පාසලට යාබදව තිබෙන ඒක කොටසක සම්පූර්ණයෙන් ජලය බහින්නෙ නැහැ. සම්පූර්ණයෙන් තියෙන්නෙ අපද්‍රව්‍ය. එතන ඉන්න දරුවන්ට ඩෙංගු හෝ වෙනත් ආසාදනය වලින් හානියක් වෙන්න පුළුවන්. නැත්නම් කිඹුලන්ගෙන් හානියක් වෙන්න පුළුවන්. දරුවන්ට කරදරයක් සිද්ද වෙන්න කලින් ඔබතුමා හැකි ඉක්මණින් පියවර ගන්න එම ප්‍රමාණයන් පිහිටන නැතුව පෙර පාසල ඉවත් කරන්න. අපේ පෙර පාසල් කුනාත් වෙන්න නිර්දේශ කරලා තිබ්බනා, ඒ පෙර පාසල තිබෙන ප්‍රදේශවල ඉන්න දෙමව්පියන්ට යම්කිසි ප්‍රවර්ධනාත්මක වැඩසටහනක් කරන්න සහභාගී පෙර පාසලක තිබෙන වැදගත්කම, අපි මොනවද දරුවන්ට ලබාදෙන්නෙ, ඒ දරුවන්ව කොයිවගේ තැනකටද අපි ගෙනයන්නෙ කියලා දැනගන්න. දන්දෙනියවත්තට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි එහි සැලකිය යුතු ප්‍රමාණයක් සිටිනවා ද්‍රවිඩ සංස්කෘතිය තුළ ජීවත්වන භාෂාව කතා කරන පිරිසක්. එම නිසා දන්දෙනියවත්ත පෙර පාසලට ද්‍රවිඩ සංස්කෘතියත් සමඟ ජීවත්වුණ ද්‍රවිඩ භාෂාව හැකියාව තියන සහාය පාලිකාවක් බඳවා ගන්න කියලා මම යෝජනා කරනවා.

ශ්‍රී විජය පෙර පාසලයි පුංචි පාන් එකයි ඒකාබද්ධව කරනවාද කියන එකයි තීරණය කරන්න ඕන. පහසුකම්වලින් වැඩි හා හොඳ ගුරුවරියන් සිටින පෙර පාසල් වල දරුවන් වැඩිපුර සිටිනවා. පහසුකම් අඩු පෙර පාසල් වල දරුවන් පැමිණීම අඩු ප්‍රවණතාවයක් තියෙනවා. සහායක පාලිකාවන් හා ප්‍රමුඛවෙන දරුවන් හෝ නයදවා මෙය සම්බන්ධ කරන්න. පෙර පාසල් වල පුහුණු වෙන දරුවන් සිටිනවා. ඒ අයට දීමනාවක් ගෙවලා කාලය දීර්ඝ කර ගත් කිහිපදෙනෙකු පළාතෙන් බඳවාගන්න කියලා ඉල්ලීමක් කරනවා. ගුරුවරියන්ට සමාන මට්ටමකට ගේන්න ඕන. ඒවගේම පෙර පාසල් ගුරුවරියන්ට අවශ්‍ය කරන්න අපි නම්බුවක් කරලා යම් වැඩසටහනක් හදුවා. එම වැඩසටහනට ඔබතුමා උදව් කරන්න කියලා මම අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී – එම්. ශිරෝමි ප්‍රන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යම් අදහසක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මහා නගර සභා ආඥා පනත යටතේ ජනතාවගේ පොදු උපයෝගිතා සම්බන්ධව විශාල කාර්යයක් කරන කමිටුවක්. මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු අන්දමින් සිදුකරන ආහාරපාන සම්බන්ධව කටයුතු වලට අදාළව ගතයුතු ප්‍රතිකර්ම සම්බන්ධව නියාමනය කිරීමක් මෙම කමිටුව හරහා සිදුකළ හැකියි. මහා නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය යටතේ, වීදි වෙළඳාම් සම්බන්ධව කටයුතු සහ අනවසර වීදි වෙළදාමට එරෙහි විය හැකියි මේ කමිටුව යටතේ ඒක මහා නගර සභා ආඥා පනතේ 159 වන වගන්තිය යටතේ තියෙනවා. මහා නගර සභා ආඥා පනතේ 158 වන වගන්තියේ තියෙනවා, වෙළඳ පොළ තුළ අනවසරයෙන් වෙළඳාම කිරීම වැළැක්වීම සහ ප්‍රතිකර්ම යෙදීම සම්බන්ධයෙන් අපිට කටයුතු කළ හැකියි.වෙළඳ පොළවල විකුණීම, 157 වන වගන්තිය යටතේ තිදුරීම සහ විසා දැමීමට ඇති බලය තියනවා. වෙළඳසැලවල් සම්බන්ධයෙන් පතුරු ව්‍යවස්ථා සාධනාරාම නැතහොත් නීති සඳහා බදු ගිවිසුම් අවලංගු කිරීම, පිරිසිදු ඇති බලය තියනවා 156 වන වගන්තියේ, වෙළඳසැලවල්වල අවකාශය සැපයීම හා කුලී ගාස්තු අයකරගැනීමේ බලය 155 වගන්තියේ. මෙම කරුණුද අන්තර්ගතව මහා නගර සභාවෙන් සිදුවන සේවාවන් සඳහා ඔබතුමාගේ අවධානය විශේෂ යොමු කරනවා. විශේෂයෙන් උපයෝගිතා කමිටුව සඳහා මෙවැනි මාතෘකාවන් යටතේ අපිට ඉදිරියට ක්‍රියාත්මක විය හැකි බව මතක් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමිනි, මහජන උපයෝගිතාව, කාන්තා හා ළමා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව විදියට අපි පසුගිය මාසයේ විසිහයවෙනිදා රැස්වෙලා සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ සාකච්ඡාව අනුව අපේ කමිටුවෙන් විශාල විෂය පථයක් තියෙනවා. ඒවා කොටස් කිහිපයකට වෙන්කර ගනිමින් මූලික අවශ්‍යතාවයන් සහ කමිටුවට ඉදිරිපත්ව තිබූ යම් යම් යෝජනා අනුව ඒ විෂය කොටස් කිහිපයකට තබාගෙන එක් එක් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින්, නිරීක්ෂණ කරමින් ඒවායේ දැන් තියෙන තත්ත්වය පැහැදිලි අවබෝධයක් ගනිමින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත්, ඒ අනුව පළමුවන විෂය විදියට කොළඹ මහා නගර සභාව යටතේ පවතින පෙර පාසල් දැනගැනීම අධ්‍යයනයක යෙදුනා. පක්ෂ විපක්ෂ කමිටුවේ සාමාජිකයන් හයදෙනා හා නියෝජ්‍ය නගරාධිපතිතුමියත් මැදිහත්වෙලා පෙර පාසල් පිළිබඳව හොඳ අධ්‍යයනයක නියැලුනා. අපි පැහැදිලිවම දැකපු කරුණු කීපයක් තිබුනා. කොළඹුවේ පෙර පාසල් දහයේම දැනට ළමුන් තුන්සිය දහනමයක් ඉගෙනුම් ලබනවා. ගුරුවරියන් දොළොස් දෙනෙක් හා සහාය පාලිකාවන් දහනව දෙනෙකු සිටිනවා. සමහරක් පෙර පාසල් වල ළමුන් විශාල ප්‍රමාණයක් සිටිනවා. සමහර පෙර පාසල් වල හොඳ සම්පත් ප්‍රමාණයක් තියනවා. නමුත් දරුවන්ගේ පැමිණීම අවම මට්ටමේ තියෙනවා. ගරු නගරාධිපතිතුමිනි, ඊට පැහැදිලි හේතුවක් වෙච්ච ප්‍රධාන කාරණයක් තියනවා. පූර්ව මන්ත්‍රීතුමා කරුණු කිහිපයක්ම කතා කළා. කොළඹුවේ දෙමාපියන්ගේ යම් අදහසක් තියනවා. මහා නගර සභාව මඟින් පාලනය වන පෙර පාසල් වලට එවීම සුදුසු අඩු ආදායම්ලාභී ළමුන් පමණක් බව. එම තත්ත්වය අපි නැති කළ යුතුයි. කොළඹ මහා නගර සභාව මඟින් ක්‍රියාත්මක වන පෙර පාසල් රජය මඟින් ක්‍රියාත්මක වන මහා නගර සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ඉහළ ගුණාත්මක සේවයක් සපයන හොඳ පෙර පාසල් බවට පත්කිරීමේ වගකීම අපේ කමිටුවට අපි සියලුදෙනා ලබාදී තියනවා. පෙර පාසල් බහුතරයකගේ ප්‍රධානතම සාධක දෙකයි දැක්කේ, ගුරුවරු සහ සහායිකාවන්ගේ හැසිරීම. ඒ වගේම පෙර පාසලේ ඉදිරි ගමන තීරණය කරන්නේ, ඒ වගේම සම්පූර්ණ පෙර පාසලේ දෙමාපියන්. දරුවන් සහ ගුරුවරුන් අතර මිතුරු සම්බන්ධතාවයක් ඇති පෙර පාසල් හොඳ මට්ටමේ ගුණාත්මක වර්ධනයක් අත්පත් කරගෙන තිබුනා. නමුත් අපි සම්බන්ධතාවය අඩු පවුල්වල කලාපයට සහභාගී, අලුත්ගම පෙර පාසල, බණ්ඩාරනායක පෙර පාසල වැනි පෙර පාසල් වල දෙමාපියන් සහ ගුරුවරුන් අතර සම්බන්ධතාවය දුර්වල වීම නිසයි මේ සේවය හොඳ ගුණාත්මක මට්ටමට පවත්වාගෙන යාමට අපහසු වෙලා තියෙන කරුණ විදියට වැඩිපුරම දකින්නේ. නියෝජ්‍ය නගරාධිපතිතුමිය උදෑසනම ප්‍රකාශ කළා විශේෂම වෙරළබඩ කලාපයේ පෙර පාසල් තුළ කණගාටුදායක තත්ත්වයක් දැක්කා. මේ සමාජයේ ජීවත්වන දරුවන්ගේ සාමාජීය ගැටලු අපිට හොඳින් නිරීක්ෂණය වුනා. දෙමාපියන් බහුතරයක් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා තියනවා. ඒ වගේම අඩු වයස් විවාහ, විවාහ නොවීම හේතුවෙන් උප්පැන්න සහතිකයක්වත් නොමැති ළමුන් සිටිනවා. මේ විෂය පථයට අදාළ එකොස් කරුණක් අධ්‍යයනයෙන් පසු ඉහළ තත්ත්වයකට ගෙන එන්න අපි බලාපොරොත්තු වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. මයුර හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමිනි, සභාපතිතුමියගෙන් අහන්න ඕනා ජනසෙත පරිගණක පාඨමාලාව අගෝස්තු තිස්එක්වෙනිදායින් ඉවර වෙනවා. ඊට පසු ඔබතුමිය තීන්දුවක් අරන් තියෙනවා තව මාස හතරකට දීර්ඝ කරන්න. එතනින් පස්සේ මොකක්ද කරන්න යන්නේ කියලා මට දැනගන්න පුළුවන්ද?

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමිනි, තමනි අපේ කමිටු වාර්තාවක් අමුණලා තියෙනවා. මූලික වශයෙන් මාස හතරකට පාඨමාලාව දීර්ඝ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊට පසුව කමිටුව මැදිහත් වෙලා මේ සම්බන්ධයෙන් විධිමත් අධ්‍යයනයක් කරලා. එයින් පසුව මේ පාඨමාලාව සංශෝධනය විය යුතුයි කියලා කාරණාව මතුවෙලා තියෙනවා. ඒ වගේම පාඨමාලාවට සම්බන්ධ වන පිරිස අඩුකම නිසා පළමුවන පාඨමාලාව විතරයි කරන්නේ දෙවන, තුන්වන පාඨමාලා දැනට පවත්වන්නේ නැහැ. එකකොට අපි බලාපොරොත්තු වෙනවා ජනසෙත පරිගණක මධ්‍යස්ථානය මීට වඩා ගුණාත්මක

විෂය නිර්දේශයක් යටතේ ඉදිරියට ගෙනැල්ලා. මේ පාඨමාලාව විධිමත් කරලා. පාඨමාලාවට සම්බන්ධ වන දරුවන්ට අඩු බව අපි අධ්‍යයනය කරලා ඒ අය මේකට යොමු කරන විදියේ උත්තේජනයක් අපේ පැත්තෙන් සපයලා මේ පාඨමාලාව ඉදිරියට දියත් කරන්න කමිටුවේ නිර්දේශ කරලා තියෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රසාදිනී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටු මන්ත්‍රීවරු සමඟ මාත් සහභාගී වුණා. පරිගණක පාඨමාලාව ඩිප්ලෝමා එකක් විදියට දෙනවා කියලා තමයි සභා කලේ.කමිටුවට යෝජනාවක් ආවා සහතික පත්‍රයක් විදියට දෙමු කියලා. අපේ පැත්තෙන් කිව්වා ඩිප්ලෝමා එකක් විදියටම කියලා සහතිකපත්‍ර පාඨමාලාවකින් පටන් ගමු කියලා.

**2025.06.26 දිනැති මහජන උපයෝගිතාව, සෞඛ්‍ය හා භූමි සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06(3) 2025.06.26** දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්. පී. ප්‍රසාදිනී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ කමිටු වාර්තාව නැවත සම්මාලෝචනයකට යටත්ව නැවත ඉදිරිපත් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුසිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා නීතිය පිළිබඳව ස්ථාවර කාරක කමිටුවේ ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අංක 04 සහ අංක 05 කරුණු සඳහා, අංක 04 ප්‍රාදේශීය ලේකම්තුමා එවලා තියෙනවා ග්‍රාම නිලධාරී කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් ඉල්ලුම් කරලා ලිපියක්. ඒකට ඊයේ දවසේ ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වුවා. උදේ මට කතා කලා.මම දෙකට ඇවිල්ලා හිටියා. මට ඊට පස්සේ කතා කලේ නැහැ. අංක 05 කරුණේ කඩුවැද්දෙ ග්‍රාම නිලධාරීතුමිය ලිපියක් එවනවා. ග්‍රාම නිලධාරී මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන්න පුරා මධ්‍යස්ථානයේ කෑල්ලක් ඉල්ලලා. කමිටුවේ මහා නගර සභාවේ දේපල පැවරීමේදී කුලියට පිළිබඳ අවධානය යොමු කරන්න වෙනවා. ඔබතුමා දන්නවා අලුත්ගමේ පොලිස් ස්ථානයට අපේ ගොඩනැගිල්ලක් දීලා අපිට ඒ ගොඩනැගිල්ල ලබාගැනීමට නොහැකි වෙලා තියෙනවා. ඒකෙ කිසි මුදලක් ලැබෙන්නේ නැහැ. ග්‍රාම නිලධාරී කාර්යාලයකට දෙනකොට තර්කයක් ගොඩනගන්න පුලුවන් නිකන් දියත දෙන්නම් අමාතද කියලා. නාගරික අනාම්පාරික්ෂයට සහ අපේ නැමෝගෙම වරදින් තමයි ඒක නිකන් තියෙන්නේ. ඒක ඊට වඩා ප්‍රයෝජනවත් දෙයකට ඒක යොමු කරන්න තිබුනා. වෙන කෙනෙකුට දෙනවට වඩා ඵලදායි සේවයක් නගර සභාව තරහා කරගැනීමට මේ ගොඩනැගිල්ල යොදා ගන්න කියලා ගරු ණ අපි අවධාරණය කරනවා. ග්‍රාම නිලධාරීට නීත්‍යානුකූල හැකියාවක් නැහැ කෙලින්ම මහා නගර සභාවට ලියුම් ලියන්න. මෙය එන්න ඕනා ප්‍රාදේශීය ලේකම් හරහා. මේ ලිපිය කමිටුවට දාපු එකත් වැරදියි. ග්‍රාම නිලධාරී කෙනෙකුට හෝ වෙනත් ක්ෂේත්‍ර නිලධාරියෙකුට වෙනත් ආයතනයකට ලිපි ලිවීමේ බලයක් හැකියාවක් නැහැ. ආයතන ප්‍රධානියා හරහා එන්න ඕනා.

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ අංක 06, නීති නිලධාරී විසින් 2025.06.26 දිනැතිව ඉදිරිපත් කරන ලද නඩු වාර්තාව සලකා බැලීම.2025 අප්‍රේල්, මැයි මාසවලට අදාලව නඩු සම්බන්ධ වාර්තාව. ගරු නගරාධිපතිතුමනි, නීති නිලධාරී මේ වාර්තාව කමිටුවට ඉදිරිපත් කරේ නැහැ.අපි නඩු ගැන කමිටුවේදී කතා කරලා තිබුනා. නඩු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න ඕනා. ගරු නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නඩු සම්බන්ධ කමිටුවක් දාන්න ඕනා කියලා යෝජනාවක් ගෙනාවත් මම. මෙය තමයි ආයතන කමිටුවේ තිබෙන වැදගත්ම අයිතමය.

නඩු සම්බන්ධ වාර්තාව කමිටුවට දාලා තියෙන්නෙ පනිතිකව. මේ වාර්තාව තියෙන නිසා ඒ සම්බන්ධයෙන් මම කෙටියෙන් කතා කරනවා. පළමුවෙනි නඩුව 2022 අභියාචනා අධිකරණය, මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ නිශ්චල දේපළ සම්බන්ධ මුද්දර ගාස්තු සහ සභා අරමුදල ලැබිය යුතු බව, ඒ නඩුවට නීතිඥ ගාස්තු රුපියල් අසූහත්ලක්ෂයක් ගෙවලා තියෙනවා. ඔබතුමා නගරාධිපති, ඔබතුමා සියල්ල දන්න කෙනෙක් නෙමෙයි. ඒ නිසා තමයි නාගරික කොමසාරිස්, නියෝජ්‍ය නාගරික කොමසාරිස්, නාගරික ලේකම්, නාගරික ගණකාධිකාරී, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරීන් ඔබතුමාට දීලා තියෙන්නේ ඔබතුමාගේ පාලනය පහසු කරන්න. ඔබතුමාට අවශ්‍ය උපදෙස් දෙන්න. මෙතන සහතික නීතිඥ නිලධාරීන් හතරදෙනෙකු සහ නීති නිලධාරීතුමිය සිටිනවා. හැබැයි ඉහල නිලධාරියෙක් අණ දුන්නා කියලා යම් කිසි අකටයුත්තක් යම් නිලධාරියෙක් කළොත් වැරදි ක්‍රියාත්මක කරන නිලධාරියා තමයි ඒකට වගකියන්න ඕනෑ. නීති නිලධාරී නීතිය සම්බන්ධයෙන් නගරාධිපතිවරයාට සභාවට උපදෙස් දෙන නිලධාරියා. නීති නිලධාරියා තමන්ගේ වගකීම පැහැර හැරලා තියෙනවා. විශාල නීතිඥ ගාස්තු ප්‍රමාණයක් ගෙවන්නට වෙලා තියෙන්නේ නීති නිලධාරීගේ ක්‍රියා කලාපය නිසා. අපි චෝදනා කරන්නේ මේ සම්බන්ධයෙන් ගෙවපු හැම රුපියලකටම නීති නිලධාරී වගකියන්න ඕනෑ. මොරටුව මහා නගර සභාවේ නිශ්චල දේපළ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු සහ අරමුදලට ලැබීමට අසූහත්ලක්ෂයයි. 2022.05.09 දින මොරටුව මහා නගර සභා භූමිය තුළ ගිනි තැබීම සම්බන්ධව කළ පැමිණිල්ලට එක්ලක්ෂ අනූහතරදහස් පන්සියයයි. වාගේ වර්ධන ගොඩනැගිල්ල සිංහ කොඩිය ඉවත් කිරීම පවරා ඇති නඩුවට හාරලක්ෂ හතලිස්හයදහස් පන්සීයයි. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පවරා ඇති නඩුවට හැත්තෑදාහක් ගෙවලා තියෙනවා. ඒ නඩුව ගැන අපි විස්තරයක් දන්නෙ නැහැ. මේ සම්බන්ධයෙන් අපි දැනගන්න කැමතියි. මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 97684 නඩුවේ නියෝජ්‍ය සිවිල් නඩුවකින් මොරටුව ක්‍රීඩා සමාජය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සම්බන්ධ නැවත විසඳා ගැනීමට පවරා ඇති නඩුවේ පන්ලක්ෂ හැත්තෑපන්දාහයි. මොරටුව මහා නගර සභාවට විරුද්ධව පවරා ඇති නඩුව, බිම් කට්ටි අයදුම්පත්‍රයක් අනුමත නොකිරීම මත පවරා ඇති නඩුවට සභාවෙන් රුපියල් ලක්ෂ පන්සියයක් ඉල්ලා ඇත. මුදල් කමිටුවේ ඩිලිවර් කියන මහතාට නගර සභාව ගෙවපු එක්කෝටි පහළොස් ලක්ෂයක ඒ මුදල් ගෙවපු එකට විගණන වාර්තාවේ තියෙනවා ඒ සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ගෙන් ගෙවන්න අත්තු වුණේ නගර සභාවේ වරදකින්, වරද කරපු නිලධාරීන්ට එරෙහිව අධිකරණය කියනවා එක්කෝටි පහළොස් ලක්ෂයක, ඒක අයකර ගැනීම සම්බන්ධයෙන්ව විගණනයේදී විශේෂ සඳහනක් කරලා තියෙනවා නිලධාරීන් දන්නවා ඇති. එහෙමත් අපි පැරදුනොත් ලක්ෂ පන්සියයක් අපිට ගෙවන්න වෙනවා නඩු ගාස්තු එක්ක. එවනාට හිටපු නීති නිලධාරීගේ ක්‍රියා කලාපය නිසා තමයි එහෙම වුණේ. අධිකරණයෙන් ආපු ලියුම ලාච්චුවේ දාගෙන නීති නිලධාරී රට හැරී ගියා.ගිහිල්ලා එකකොට දිනය පැනලා. අභියාචනා අධිකරණයේ පෙන්වමින් දාලා එක්කෝටි පහළොස් ලක්ෂයක් ගෙවන්න කිව්වා.අධිකරණයේ නියෝග පැහැර හැරීම ඒ විශේෂම මොරටුවට දීපු අධිකරණයේ පවරා තිබූ 227 විශේෂ නඩුවේ තීන්දුවට එරෙහිව අභියාචනය කියලා මොරටුව මහා නගර සභාට දෙවන විශාලතම පාඩුව කරලා තියෙනවා. ඒකටත් අපි නීතිඥ ගාස්තු ගෙවලා තියෙනවා පන්ලක්ෂ තිස්දෙදාහක්. අනෙක් එක මහපොළක නඩු තෙනවයි. අන්තිම කැමති පත්‍රයකින් ඉඩමේ අයිතිය ලබා ගැනීම සඳහා පවරා ඇති නඩුව. මොරටුව මහා නගර සභාව ගෙවන විශාලතම කරු නීතිඥ ගාස්තුව තුන්ලක්ෂ අසූහාරදහයි. කොළඹ දිස්ත්‍රික්කයේ ස්වාධීනතා ගොඩනැගිලි ඉදිකිරීමේ දී පලාත් පාලන ආයතන අවන නියෝජිත වලවල පිළිබඳ නඩුවට ලක්ෂ අනූපන්දහයි. මොරටුව මහා නගර සභාව විසින් වැසි ජලය බැස යාම සඳහා සිදුකළ සංවර්ධනයට පාර්ශ්වකරුවන් එරෙහිව පවරා ඇති නඩුව විශාලතමකරු. මොරටුව මහා නගර සභාව නාගරික කොමසාරිස් නීතිඥ ගාස්තුව හාරලක්ෂ දහදාහයි. මොරටුව මහා නගර සභාවේ නගරාධිපති සම්බන්ධයෙන් වූ එන්තරන්කාරණය වැඩසටහන පිළිබඳ නඩුව නීතිඥ ගාස්තුව එක්ලක්ෂ පනස්දහයි. නගරාධිපති ගිහිල්ලා අවුරුද්දක් වෙනවා. අපේ නීතිඥතුමාට බැරිවුනා කතා කරලා විසඳුමකට එන්න.මමත් බැලුවා නීතිඥ ගාස්තු ගෙවන ඒගේ නගරාධිපතිවරයාට විරුද්ධව යන්න පුළුවන්ද කියලා. මහා නගර සභා ආඥා පනතේ තියෙනවා, නගරාධිපතිවරයාට හා සභිකයන්ට පෞද්ගලික නඩුවක් පැවරුනොත් ඒ නඩුවට සභාවෙන් ගෙවන්න පුළුවන් කියලා. අපි අල්ලස් කොමිසමට යන්න හදලා හිටියෙ නැහැ ඒ වගන්තිය නිසා. මොරටුව මහා නගර සභාවේ අනුමැතිය

රහිත ප්‍රවේශය අවහිර කිරීම පැමිණිලිකරු ඉඳුරුවගේ හසාන් මුද්ධික ප්‍රනාන්දු නඩුවට තුන්ලක්ෂ හතළිස්පන්දාහයි. නාගරික කොමසාරිස්වරයාට අපි ගිහිල්ලා කිව්වා මේ නඩුව කතා කරලා විසඳගන්න කියලා. මේක නගර සභාව කරපු පුද්ගලයන් එක්ක තියෙන ප්‍රශ්නය නිසා දැන් මේ නඩුව කරගෙන යනවා. තමන්ගේ ප්‍රවේශය තිබුණ පේවිටුව අවහිර කරලා නගර සභාවේ සේවකයන් යොදවා තාප්පයක් ගැහුවා. ඒ මිනිස්සු වාරණ නියෝග කරලා තාප්පය කැඩුවා. ආයේ නඩුව යනවා. ඒ මිනිස්සු කැමතියි නඩුව විසඳගන්න. නගර සභාව බැහැ කියනවා. නඩු සම්බන්ධ වෙනම කමිටුවක් දාලා කතා කරමු කියලා මම කිව්වේ මොරටුව ජනතාවගෙ සල්ලි නාස්තිවෙන නිසා. නිලධාරීන් මොරටුවේ නොවන නිසා නිලධාරීන්ට දැනෙන්නෙ නැහැ අපේ සල්ලි වියදම් වෙනවා කියලා. අපි මොරටුවේ මන්ත්‍රීවරු නිසා අපිට දැනෙනවා සල්ලි අපරාදේ කියලා. මොරටුව පිටිපන වෙළඳපොළ කඩ හිමියන්ගේ සංගමය, පෙත්සම්කරුවන් දහතුන්දෙනෙකු ඉදිරිපත් කරලා තියෙනවා. නීතිඥ ගාස්තුව ලක්ෂ හමාරයි. මොරටුව මධ්‍යම වෙළඳපොළ කඩ කාමරයක් සම්බන්ධව තියෙන නඩුව පන්ලක්ෂ පනස්දාහයි. ශෙල්ටන් සන්රයිස් සමාගම අපිව හයවෙනි විත්තිකරු කරලා තියෙනවා දෙලක්ෂ තුන්දාහයි. මොරටුව දිසා අධිකරණය 704 අංක නඩුවේ නියෝගයට එරෙහිව සිවිල් අභියාචන අධිකරණයේ නඩුවේ පන්ලක්ෂ පනස්දාහයි. ගරු නගරාධිපතිතුමනි, මම නඩු ගැන කිව්වේ ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේ ගෙවලා තියෙන අතිවිශාල මුදල් සම්භාරය මෙයින් මොරටුවට විශාල වැඩ කරන්න තිබුණ සල්ලි නැතුයි මේවා පහත්ට නීතිඥ ගාස්තු ගෙවලා තියෙනවා. ඒ නිසා නැවත කතා කරලා ඉවර කරන්න පුළුවන් නඩු ඉවරකරගන්න. මොරටුව එස්.සී එකේ නඩුව අපිව කතා කරලා සමථයකට ආවා. නමුත් ඒක සමථ කරගන්න කැමතිවුණේ නැහැ. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඊළඟ එක තමයි අපි සභාවේදී කිව්වා සභාවේ විනයක් තියෙන්න ඕනෑ කියලා. ඔබතුමා අවුරුදු විසිනමයක් නගර සභාවේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ඔබතුමාට මේ හැසිරීමක්ම නවතාවිනේ, අපිට තියෙන ප්‍රශ්නය තිසාන් ප්‍රනාන්දු නගරාධිපති ප්‍රථමවරට ආවිවුනාට පස්සේ මේ සමහර නිලධාරීන් නගරාධිපතිවරයාට දෙන ගෞරවය අතහැරලා තියෙන ස්වභාවයක් අපට පේනවා. උදාහරණයක් තමයි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකට මම එදත් මතක් කළා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක සභාවට එන්න ඕන තමන්ගේ නිල ඇඳුමෙන්. නමුත් ඔහු නිල ඇඳුම අඳින්නේ නැහැ. ඒකත් අගෞරවයක් මහා සභාවට. සභාවට අගෞරව කරන්න දෙනවා කියලා කියන්නේ ඒක ඔබතුමාගේ වරදක්. සභාවේ ගෞරවය රැකීම එක ඔබතුමාගේ යුතුකමක්. ඔබතුමා නියෝගයක් නිකුත් කරනවා මම දැක්කා. ඒක ඉල්ලීමක් නොවෙයි නියෝගයක් විය යුතුයි, හැම නිලධාරියෙක්ම වාඩිවෙලා ඉන්න ඕනා සභාව පටන්ගන්නකොට. සමහර නිලධාරීන් සභාවට එන්නෙ උදේ දහයට. එහෙම බැහැ. සභාවේ දිනය වෙන්කරගන්නේ අවුරුද්දකට කලින්. මන්ත්‍රීවරුන්ටත් වැඩ තියෙනවා. මන්ත්‍රීවරුන්ට දිනය වෙන්කරගන්න පුළුවන්නම්, නිලධාරීන්ටත් පුළුවන් වෙන්න ඕනා. නිලධාරීන්ගේ වගකීම ඒක. නගරාධිපතිවරයා මුලසුනට එනකොට නිලධාරීන් වාඩිවෙලා ඉන්න ඕනා. ඒවා සිදුවෙනවා කියන්නෙ ගරු නගරාධිපතිතුමනි, සභාව අයාලේ යන්න පටන් ගන්නවා. ඔබතුමාට කෙසේහෝම ගෞරවයෙන් මතක් කරනවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා.

ගරු නගරාධිපතිතුමනි, ප්‍රධාන ලේකම් බස්නාහිර පළාත chs/ad/18/38(3)/2016 මේ චක්‍රලේඛයට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. බස්නාහිර පළාත් සභාවට අයත් වාහන වල භාවිතය විධිමත් කිරීම සම්බන්ධයෙන්. 2(13) පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන්, සභාපතිවරුන් නිල වාහනයක් ලෙස නිශ්චිත වාහනයක් භාවිතා කරන්නේ නම් හා උපරිම ඉන්ධන සීමාව තීරණය කිරීම සඳහා සභාව විසින් සම්මත කරන ලද යෝජනා සම්මුතියක් තිබිය යුතුය. අනෙකුත් සීමාවන් ප්‍රධාන අමාත්‍යතුමාගේ 2012.03.12 දිනැති LGD/05/19 දරණ ලිපිය පරිදි වේ. ඔබතුමා සභා අනුමැතියක් අරගෙන නොමැති නිසා කරුණාවේ ඔබතුමාට වාහන පාවිච්චි කරන්න බැහැ. නිලධාරීන් ඔබතුමාට මේ ගැන කියලා නැහැ. නීතිඥකමින් ඔබතුමාව අමාරුවේ දාලා තියෙන්නේ. කවුරුහරි අධිකරණයට ගියොත් වාහන අවභාවිතා කරනවා කියලා. ඔබතුමාට උත්තර බඳින්න වෙනවා. කලින්ම මේ දේ කරන්න ඕනා තමන් සහ නියෝජ්‍ය නගරාධිපතිවරිය. තමන් පාවිච්චි කරන වාහනයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයේ අනුමැතිය ලබාගත යුතුයි කියලා මම මතක් කර සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, පාලිත වාහන සම්බන්ධයෙන් 1(3)2 තියෙනවා වාහන සඳහා ඇති රාජකාරි ප්‍රමාණය හා වාර්ෂික ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන එක් එක් මාසය සඳහා නිශ්චිත මාසයේ ඉන්ධන සීමාවන් පැනවිය යුතුය. නොවැළැක්විය හැකි රාජකාරි හේතුවක් නම් ආයතන ප්‍රධානියාගේ අනුමැතිය මත එම අමතර ඉන්ධන ලබාදිය හැකිය.කියලා තියෙනවා. 1(3)3 ට කියලා තියෙනවා කිසිදු වාහනයක් නිලධාරියකුගේ නමට වෙන් නොකල යුතුය. නිල වාහන හිමි නොවන දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට අන් නිල වාහන හිමි තනතුරක රාජකාරි ඉටුකරන නිලධාරියෙකුට හෝ නිවසේ සිට රාජකාරියට වාර්තා කිරීමටත් රාජකාරි කටයුතු සඳහා සංචිත වාහනයක් භාවිතා කල හැකිය. එමෙන්ම රාජකාරි ස්ථානය හා නිවස අතර වාහනය යාම් ඒම් සඳහා දිනකට ගමන් කල හැකි උපරිම දුර කිලෝමීටර් පනහක් වේ. පනහට වැඩිය ගිය කට්ටියට අධිභාර එනවා. ගරු නගරාධිපතිතුමනි, මෙහෙම දැන දැනත් ඔබතුමත් එහෙම කළොත් ඔබතුමාත් තමන්ගේ බලය හරියට ක්‍රියාත්මක නොකරපු නගරාධිපතිවරයෙක් හැටියට චෝදනා එනවා. මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගත යුතුය. 1(3)6 නියෝජ්‍ය මට්ටමේ තනතුරු දරණ හෝ දිස්ත්‍රික් ලේකම් ශ්‍රේණියේ 01 හෝ 02 ශ්‍රේණියේ නිලධාරීන් කිහිපදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකම මඟ ගමන් කරනවිට හා ඒ පිළිබඳ ඉල්ලීමක් කල විට නිවසට හෝ ආසන්න ස්ථානයකට යන විට දිනකට යාම් ඒම් සඳහා උපරිම දුර කිලෝමීටර පනහක සීමාව යටතේ කාණ්ඩයේ ප්‍රවාහන පහසුකම් සැපයීමට ආයතන ප්‍රධානියාට අවසර දිය හැකිය. මෙවැනි කටයුතු කල යුත්තේ ප්‍රමාණවත් වාහන සහ ඉන්ධන ප්‍රතිපාදන තිබෙනවා නම් පමණි. හැබැයි එක වාහනයක තනි නිලධාරියෙකුට ගමන් කිරීමට නොහැක නිලධාරීන් කිහිපදෙනෙකු ගමන් කල යුතුය. වෙනත් ආයතන වලින් අනුයුක්ත කරලා තියෙන කොමසාරිස් වුනත් මහා නගර සභාවෙන් වැටුප් ලබා නොගන්න නිලධාරීන් පිරිසක් මෙතන ඉන්නවා. සමහර වෙලාවට ගමන් වියදම් ගන්නවාද කියලා අපි දන්නෙ නැහැ. ඒ ගැන සොයලා බලලා අවශ්‍ය කටයුතු කරන්න. මොකද මේ කොමසාරිස් මිනිසුන්ගේ මුදල්. තැනින් තැන නොතෙන්න වාහනයක් අයිති නැති නිලධාරීන් අනිසි වාහන පාවිච්චි කරනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා කාරුණික ඉල්ලීමක් කරනවා. මේ හේතුව නිසා අපි ආයතන කමිටුවට පක්ෂපාතීත්වය නොවන බව කියමින් මා නිහඬ වෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - එම්. ජී. ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පූර්ව මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු නඩු වාර්තාව සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරන්න තියෙනවා. මේ නඩු වාර්තාව කමිටුවට ආවා. මේ නියෝජනයේ අත්සන් කරලා එම කමිටුවට ඉදිරිපත් කරපු එක. නඩු වාර්තාව පිළිබඳ නැවත සොයාබැලීමක් කරගන්න නැවත කමිටුවකුත් පත්කරගන්නා. ඒක තවම කැඳවන්න බැරිවුනා. නඩු වාර්තාව කමිටුවට ආවා කියන එක මම සනාථ කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - <u>ඩී. එම්. සුජීන් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම විවාදයකට සූදානම් නැහැ. මම නම්වූ සාමාජිකයෙක්. ඒ වගේම විපක්ෂයේ නම්වූ සාමාජිකවරු තුන්දෙනෙක් ඉන්නවා. අපි ඉන්නකොට නඩු වාර්තාව කමිටුවට ආවේ නැහැ. මාත් සමහර විට නිලධාරී එළියට ආවේ. අපිත් නම්වූ සභාපතිවෙලා හිටියෙත්. ඒක නිසා මිනිට් ගත විදියත් අපි දන්නවා, අනවශ්‍ය දේකට යන්න අවශ්‍ය නැහැ. ඔබතුමාලාගේ පාලනය හොඳටම නිවැරදිව යන පාලනයක් කියලා බලාපොරොත්තු වෙන මිනිස්සු එක නිසා නිවැරදිව ගමන් කරන්න කියලා ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - එස්. වී. නිශාන්ත පුද්ගානන්ද මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, කාලය ගැන සැලකිලිමත් වෙන්න.මට ඒ එළියෙන්නකම් ඉන්න පුළුවන්. නිවැරදි කිරීම කරන්න ඕනෙ. විවාදයක් නැහැ. හැබැයි එක මන්ත්‍රීවරයෙක් ආයතන කමිටුව පිළිබඳ විග්‍රහ කරන්න ගත්ත කාලය එම පිළිගත යුතු කරුණු තියෙනවා. නැතුව නෙවෙයි. හැබැයි මේ මට්ටමෙන්ම අපි අනෙක් මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව. දුන්නොත් ඔබ ඉන්නවානම් මට ගැටලුවක්

නැහැ. මෙතන නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් අපි උපරිමයෙන් උත්සාහ කරනවා යම් නිශ්චිත කාල සීමාවක් ඇතුළත ඉවර කරගන්න ගමන් එතුමා මතු කරපු කේස්වල නිශේධනය කරන්නෙ නැහැ. ගතයුතු කාරණා ඒක යට ගිහිල්ලා අනවශ්‍ය ලෙස ඝෝෂාකාරී ලෙස උඩ එනවා. එතුමා මතු කරපු කාරණා ඇතුළෙ ගතයුතු කාරණා තියෙනවා. අපි ඒක අත්හැරලා වෙන සංවාදයකට ගියොත් අවශ්‍ය එක අපට මඟ හැරෙනවා. ඉතිහාසයක් මේ නඩු වලට තියෙනවා. අනිකුත් ඔහේ වෙච්ච ඒවා නොවෙයි. මේවා දීර්ඝ කාලයක සිට එන නඩු. කතා කරපු මන්ත්‍රීතුමා දන්නවා නඩු සම්බන්ධව. එක නඩුවයි මගේ අවබෝධය නැත්තෙ. අනෙක් සියලු නඩු ගැන හොඳ අවබෝධයක් තියෙනවා. මම ඉතා මිත්‍රශීලීව ඉල්ලනවා. මේ සම්බන්ධයෙන් කතා කරන්න ඕන කියන අදහසින් තමයි මම හිටියෙ. මේ නඩුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් මහජනතාවගෙ මුදල් අනවශ්‍ය ලෙස කෙටවෙනවා. මේ සභාවේ නීතිඥවරු නීතිඥවරියන් ගණනාවක් ඉන්නවා. කරුණාකරලා අනවශ්‍ය කාරණාවක් ලෙස සලකනවා. විශාල කමිටුවක් මේ සභාව පත්කරන්න මේ නඩු හැම දෙයක්ම හොඳින් අධ්‍යනය කරලා අපට තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යුත්තෙ කුමන නඩුවද? එකඟතාවයකට ඇවිල්ලා ඉවත් කරගන්න යුත්තෙ කුමන නඩුවද? මෙහෙත් නීතිඥවරුන් සම්බන්ධ කරලා සභාව පත්කරගන්න විශේෂ කමිටුවක්. මාස තුනක් ඇතුළත සභාවට එකඟතාවයේ වාර්තාවක් දෙන්න. මම හිතනවා විශාල ධනයක් නිෂ්කාරණේ නාස්ති කරනවා. සමහර නඩු පවත්වාගන්න ඕනෙ නැහැ, එතුමා කියපු ක්‍රීඩාංගණයේ නඩුව වගේ. සමහර ඒවා අපි මැදිහත්වුණොත් අපිට බේරගන්න පුළුවන් වෙයි. කිව්වා වගේ එක්කෝටි විසිලක්ෂයක් විතර වන්දි ගෙව්වා වගේ තේරුමක් නැතුව නිලධාරීන්ගෙ සමහර කටයුතු නිසා තවත් විශාල මුදලක් ගෙවන්න වෙයි. සභාවෙන් විශේෂ කමිටුවක් පත්කර ගත්තොත් ඉතා ලිහිල් සාකච්ඡාවක් යන්න පුළුවන්.

**මහා නගර සභා මන්ත්‍රී - හරින් චන්දන පිලානාවිතානගේ මහතා**

ගරු නගරාධිපතිතුමිය, ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් නඩුවල ප්‍රගතිය පිළිබඳ සලකා බලන්න කමිටුවක් පත්කරගන්න යෝජනා කළා. ඒ කමිටුවට පත්කළ යුතු සාමාජිකයන් පිළිබඳ සඳහන් කරලා තියෙනවා. සුජීව පුෂ්පකුමාර මන්ත්‍රීතුමා ගෙනහැර දැක්වූ ආකාරයට ආයතන කමිටුවේ මේ ආකාරයෙන් ඇමුණුමක් ඉදිරිපත් වුණේ නැහැ. මේ නඩු සම්බන්ධයෙන් මට මතකයෙන් කියන්න තියෙන්නෙත් මේ නඩු දහඅට ඇතුළෙ මහා නගර සභාව විසින් පවරනු ලද නඩු, මහා නගර සභාවට විරුද්ධව පවරනු ලද නඩු සහ මහා නගර සභාව විසින් මැනකමින් මැදිහත් වෙච්ච නඩු තුනක් මේ නඩු දහඅට ඇතුළෙ තියෙනවා. මොරටුව මහා නගර සභා ප්‍රදේශය තුළ නිවෙස්වල දේපල බැහැර කිරීමේ දී අයවිය යුතු මුද්දර ගාස්තු නගර සභාවට සෘජුවම ලබාගැනීම සඳහා පවරපු නඩුව, මේ නඩුව පවරන්න ඉස්සර ඇත්තටම කාට විරුද්ධවද මේ නඩුව පවරන්නෙ; බස්නාහිර පළාත් සභාවට විරුද්ධව මේ නඩුව පවරනවා. පළාත් සභාවට තමයි සියලුම මුද්දර ගාස්තු යන්නෙ. ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන වල මුද්දර ගාස්තු කෙලින්ම බස්නාහිර පළාත් සභාවට ගිහිල්ලා පළාත් පාලන ආයතනයට බෙදෙනවා. එවැනි පසුබිමක මොරටුව මහා නගර සභාව විතරක් නඩු කටයුත්තක් පැවරීමට කටයුතු කළේ ඇයිද කියන එක ප්‍රශ්න සහගතයි. මේ සම්බන්ධව අන්තිම වශයෙන්ම පාර්ශ්වකාරවරයා යම්කිසි පූර්ව සාකච්ඡාවක් කළාද උපරිම උත්සාහය මේ සඳහා දැරුවද එවැනි උපරිම උත්සාහයකින් තොරව මේ ආකාරයක නඩුවකට ගිහිල්ලා අසීමිත වූ මුදලක් මේ ආකාරයට මොරටුව ජනතාවගේ මුදල් වියදම් කළාද කියලා ප්‍රශ්නය පැන නගිනවා. ඒ වගේම මොරටුව ක්‍රීඩා සමාජයේ බිම් කුලිය සම්බන්ධයෙන් ඇති වෙලා තියෙන නඩුව. මේ නඩුවට සමථයක් ඇතිවෙලා තියෙනවා පානදුර මහ අධිකරණයේදී ඒ සමථයේ ප්‍රකාරව දැන් මහා නගර සභාව සහ මොරටුව ක්‍රීඩා සමාජය ඒ අවශ්‍ය එකඟතාවයට නොපැමිණීම නිසා මොරටුව ක්‍රීඩා සමාජය කියන්නෙ මොරටුවට විතරක් නෙමෙයි මුළු ලංකාවටම කීර්තියක් ගෙනාපු වසර සියයකට වඩා අතීතයක් තියන ක්‍රීඩා සමාජයක්, කීර්තිමත් ක්‍රිකට් ක්‍රීඩකයෝ සියගණනක් බිහි කරපු තැනක්. මොරටුව මහා නගර සභාව ක්‍රීඩා සමාජය කෙරෙහි දක්වපු ආකල්පය නැවත සලකා බැලිය යුතුයි. ඒ නිසා මේ ආකාරයේ තියෙන නඩු ගණනාවක ගැටලුකාරී තත්ත්වයක් අපිට පැහැදිලිව

දකින්න ලැබෙනවා. ඒ නිසා එක් එක් නඩුවට ප්‍රගතිය සලකා බැලීමේ දී කොමසාරිස්තුමාට නඩු අවශ්‍යතාවය මත කවර පදනමකින් පවරලා තියනවාද මේ නඩු ඉදිරියේදී පවත්වාගෙන යාමෙන් මෙම නගරයේ වාසියක් මොරටුව මහා නගර සභාවට අත්වෙනවාද සමතයකට පැමිණෙමින් හෝ වෙනත් ආකාරයක පියවරක් අනුගමනය කිරීමෙන් නඩු කටයුතු අවසන්වීමේ අවශ්‍යතාවය වැදගත්ද කියන කාරණාව සලකා බලන්න අවශ්‍යයි. ඒ නිසා මේ සියලු කරුණු පුළුවන් සලකා බලන්න පුළුවන් ආකාරයට මේ නඩු දැනට පවතින අදාළ නඩු වාර්තා විශේෂයෙන් ලැබීම අවශ්‍ය වෙනවා. ඒ අනුව ඉදිරිපත් කර ඇති කමිටුවේදී හෝ ඔබතුමා යෝජනා කරන වෙනත් කමිටුවක් තියනවානම් මේ සභාව හරහා ස්ථාපිත කරන ඒ කමිටුවේදී හෝ මේ සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡා කරලා මේ මහා නගර සභාව යම් තීරණයකට එළඹීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීපකාන්ත මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මීට පෙර ඉතිහාසයේ දිගටම මෙවැනි කමිටු පත්වුනා. මෙවැනි කමිටු හරහා සාකච්ඡා වෙමින් සභාවට වාර්තා සිද්ද වුනා. හැබැයි අපි දන්නවා පත්වෙන අවසානයේ අයට නීතිය පිළිබඳ දැනුමක් අවබෝධයක් ලොකුවට නැහැ. නීතිඥයෙක් දෙන්නෙක් ඉන්න ඇති නමුත් ගැඹුරු සංවාදයක් සාකච්ඡාවක් සිද්ධ වෙච්ච නැති බව තමයි මගේ අවබෝධය දැන් මේක සීරියස් ගමු. දැන් මේ පත්වුණොත් අර වැනි කමිටුවක් නීති විශාරදයෙක් නොවෙයි මම. මුල හේතුවෙනවා මේකෙ ඇතුලෙ විශාල ගැටලුවක් තියෙනවා. මම සභාවෙන් ඉල්ලන්නෙ විශේෂ කමිටුවක් නීතිඥවරු සංඛ්‍යාවක් ඉන්නවා. මේ පිළිබඳ මෙහෙයවීම ප්‍රවීනතාවෙන් කටයුතු කරන නිර්වින සංවාදවලින් පත්කරලා මාස තුනක් ඇතුලත සභාවට වාර්තාවක් දෙන්න අපි පවත්වාගෙන යන්න ඕන මොනා නඩුද? අයින් කරගන්න ඕන මොනා නඩුද? නඩු කියන ඒවා අපේ කැමැත්තටම අයින් කරගන්න බැහැ. නමුත් අපි අධ්‍යයනය කරන්න ඕන.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා

ගරු නගරාධිපතිතුමනි, අදහස් දක්වපු සියලු මන්ත්‍රීවරුන්ගේ යහපත්කමක් තියෙනවා. ඔබතුමා කිව්වා වගේ අපි පෙරුම් ගන්න ඕනා. සමහර නඩු තියෙනවා අපි හැඩිරෙන්නෙත් යන නඩු නොවෙයි. මට විරුද්ධව නඩුවක් දැම්මොත් හරි හෝ වැරදි අධිකරණයේ නමුත් කරුණු කියලා අපි ඒක ජය කරන්න ඕනා. අපිට තියෙන ශක්තියට නඩු ඉවර වෙන්නෙත් නැහැ ඔබතුමා දන්නවා නඩු කල්යාමේ විශාල ගණන් ගණනාවක් තියෙනවා. සමහර නඩු තියෙනවා සාකච්ඡා මාර්ගයෙන් මුල් අවස්ථාවේ ඉවරයක් කරන්න හැකියාව තියෙනවා. නඩුවක පාර්ශව දෙකක් ඉන්නවා. නඩුවේ අවසාන තීන්දුවෙන් එක පාර්ශවයයි දිනන්නෙ හැබැයි අපිට මුල් අවස්ථාවේ සාකච්ඡා කරලා සමථයකට එන්න හැකියාවක් තියෙනවානම්, අපේ කාලය මුදල් ඉතුරු කරගන්න පුළුවන්. සභාවේ සියලු මෙදහෙක කාලේ නඩුවලට කතා කරන එක අපරාධයක්. පාලන කමිටුවේ නීතිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන නිසා මේ විෂය සම්බන්ධයෙන් දැනුම තියෙන අය තමන්ගේ දායකත්වය ලබාදෙයි. අපිට හැකියාව තියනවා මේ සියලු නඩු වාර්තා සම්පූර්ණයෙන්ම අධ්‍යනය කිරීමෙන් පසුව අපිට කඩිනමින් අවසන් කරගන්න පුළුවන් නඩු සමථයකට එන්න පුළුවන් නඩු මොනවාද අපිට වැරැද්දට සහනයක් ඉල්ලලා නැත්නම් අධිකරණය නඩුවලින් ඉවත් වෙනත් හැකියාවක් තියනවා. හැබැයි ඒ සම්බන්ධයෙන් නඩුව අධ්‍යනය කිරීමෙන් පමණයි කරුණු දක්වන්න පුළුවන්.

ගරු නගරාධිපතිතුමනි, නඩුවල වියදම් සම්බන්ධයෙන් සුජීව මන්ත්‍රීතුමා කරුණු කිව්වා නිසා මම විශාල කරුණු දැක්වීමක් කරන්නේ නැහැ. සමහර නඩු තියෙන්න පුළුවන් සාධාරණ මුදලකට වඩා ගෙවලා තියෙන නඩු. මුදල් ගෙවීමේදී විශාල මුදල් ප්‍රමාණයක් සදහන් වෙලා තියෙනවා. මුදල් ගෙවලා තියෙන කාර්යයන් කුමන කාර්යයක්ද කියලා මම දන්නෙ නැහැ. අපේ නීතිඥවරු හතරදෙනෙක් ඉන්නවා. නීති නිලධාරිතුමිය ඉන්නවා අපිට ඒ සේවය ලබා ගැනීමේ දී එකම ගාස්තුවකට සියලුම නීතිඥවරු පෙනී ඉන්නෙ නැහැ. ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක්, ජනාධිපති නීතිඥවරයෙක්, සාමාන්‍ය නීතිඥවරු, කනිෂ්ඨ නීතිඥවරු ඉන්නවා. ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීමේ ගාස්තු ඉහල පහල යනවා. නමුත් අපි බලන්න ඕන අපිට තියෙන වැදගත්කමත් එක්ක

තමයි නීතිඥවරයාට තෝරාගන්නේ. තෝරාගැනීමේ දී ඒ කාර්යයට අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල මුදලක් ගෙවන නීතිඥවරයෙක් තෝරාගෙන තිබෙනවානම් ඒ සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා. ඒ සේවාව ඊට වඩා අඩු මුදලකින් ලබාගන්න හැකියාවක් තියෙනවාදනම් ඒක වැදගත්. සම්පූර්ණ කාල වාර්තා අධ්‍යයනය කරලා මේ කිවුව ආකාරයට එක එක කාර්යයන්ට යන්න පුලුවන් බර ප්‍රමාණය මොකක්ද කියලා ඒකට වියදම් කරන්න මුදල් ප්‍රමාණය මොකක්ද කියලා මොරටුවේ ජනතාවගේ මුදල් ඉතුරු කරන්න. ඇත්තටම මෙය කරන්න ඕන. හදිසියේ අපිට තීරණයක් ගන්න හැකියාවක් නැහැ. කමිටුව සක්‍රීයව ක්‍රියාත්මක වෙලා මෙය කරන්න ඕන. හැබැයි මෙහි මාසයකට හෝ දෙකකට කාලයක් අනුමතියකින් තියෙන්න ඕන. මේ සම්බන්ධයෙන් නිවැරදි තීන්දුවකට එන්න කටයුතු කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සුජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරගන්න ඕන. ආයතන කමිටුවේ 02 අපි එදා සාකච්ඡා කළා. 175(1) වගන්තියට අනුව විධායක බලතල පැවරීමක් සහ 175(2) කාර්යය කර්තව්‍යයන් සම්බන්ධව. ඊට පස්සේ මෙය ආයතන කමිටුවට දැම්මට පස්සේ නියෝජ්‍ය කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කිරීමක් කරලා තියෙනවා. 14(4) අනුව ඔබතුමාට තියෙන බලතලත් 32ට අනුව තියෙන එකත් 171(1) අනුව කොමසාරිස්තුමියට තිබෙන බලතලත් සම්බන්ධව. මුලින්ම කතා කළේ 171(1) වගන්තියට අනුව ඊට පස්සේ දෙවැනි එකක් නියෝජ්‍ය කොමසාරිස්තුමා ඒ කාරණාව ඉදිරිපත් කරලා තියෙනවා. පැහැදිලි කිරීමක් නියෝජ්‍ය කොමසාරිස්තුමාගෙන් කරගන්න කැමතියි මේ සභාව වෙනුවෙන්. අපි ගියපාර සභාව තුළ කතා කළා 175(1) වගන්තිය අනුව විධායක තනතුරු පැවරීම සහ 175(2) අනුව කාර්යය කර්තව්‍යයන් පැවරීම, ඊට පස්සෙ ඔබතුමා ආයතන කමිටුවේ තුන්වෙනි රැස්වීමේ තුන්වෙනි යෝජනාව යටතේ ඉදිරිපත් කරලා තියෙනවා නියෝජ්‍ය කොමසාරිස්තුමා විසින් නගර සභාව සතු බලතල පැවරීම සම්බන්ධව කියන ඒක එතකොට මේ කාරණා දෙකම එකක් විදියටද ගන්නේ පොඩි පැහැදිලි කිරීමක් කරගන්න පුලුවන්නම් හොඳයි කියලා මම හිතනවා.

<u>ගරු නගරාධිපති - එස්. සී. නිශාන්ත ප්‍රදීප්කුමාර මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට නාගරික ලේකම්තුමාට අවස්ථාව ලබා දෙනවා.

<u>නාගරික ලේකම් - එම්. කේ. ඩී. සාරංග මුණසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ දෙවන යෝජනාවය තියෙන්නේ විධායක තනතුරු නම් කිරීම. ඇත්තටම අපි මෙය පළමුවෙනි මාසික සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් කළේ 1997 වර්ෂයේ ඉඳලම සම්ප්‍රදායක් වශයෙන් අපේ ආරම්භක සභා රැස්වීම් වල න්‍යාය පත්‍රයට ඇතුලත් වී තිබූ කාරණයක් නිසා 175 (1) වගන්තිය අනුව සභාවේ යම් තනතුරු විධායක තනතුරු ලෙස නම් කිරීම. ඒ තුලින් ඒ තනතුරු වලට විශේෂ බලයක් තිබෙන බව වගන්තියේ සඳහන්ව නැහැ. ඒ වගන්තියේ තියෙන්නේත් විධායක තනතුරු නම් කිරීම. සභාවේ සහ නගරාධිපතිතුමාගේ සහ කොමසාරිස්ගේ බලතල පවරාදීම සම්බන්ධව තමයි මම දෙවැනි කාරණාව වශයෙන් ආයතන කමිටුවට ඉදිරිපත් කරපු කරුණේ තියෙන්නේ. 14(4) වගන්තියේ තියෙන්නේ නගරාධිපතිතුමාගේ බලතල පැවරීම ගැන, 32 වගන්තියේ තියෙන්නේ සභාවේ බලතල පැවරීම ගැන, 171(1) වගන්තියේ තියෙන්නේ කොමසාරිස්වරයාගේ බලතල පැවරීම ගැන. දැනට තියෙන බලතල පැවරීමේ ලේඛනය දෙස බැලුවම ඒ බලතල පැවරීමට අදාළ ක්‍රියාපටිපාටි ඒ විදියටම අනුගමනය වෙලා තිබුණේ නැහැ. එවගේ ගැටලු සහගත තත්ත්වයක් මට ආපු නිසා තමයි මම ඒ කරුණ ඉදිරිපත් කළේ. ඇත්තටම තවදුරටත් නීති උපදෙස් ලබාගෙන ඒ බලතල පැවරීම හොඳයි කියන එක. එතකොට කමිටුවත් නිර්දේශ කරලා තියෙන්නේ එහෙම තමයි නීති උපදෙස් ලබාගෙන බලය පැවරීම කරමු.

<u>ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රදීන්නාද මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඊට සම්බන්ධව අනු කමිටුවට 2025.06.26 දිනැති ආයතන කමිටුවේ අංක 06 නිර්දේශයේ සඳහන් කමිටු සාමාජිකයන්ට අමතරව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන්ද පත් කරනවා.

01. මහා නගර සභා මන්ත්‍රී - ජේ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
03. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එල්. මිසඳ එච් අබේකෝන් මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සජිත් දුමින්ද පීරිස් මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුජීව් ඉන්දික මහතා

**2025.06.26** දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ හා ඉහත සඳහන් අනු කමිටුව පත්කිරීම ඇතුළු සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - ජේ.ටී. නිශාන්ත ප්‍රදීනාන්ද මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.ඩී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ජේ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. යශ්මන් සුජිව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඩී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සන්තෝෂ් ප්‍රියදර්ශණ ජේම්පාටිය මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එච්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. නිලන්ත විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හෙට්ටිආරච්චි මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිගුරුවේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.ජේ. ෂර්මින් පිලිපියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.එෆ්. ප්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ජේ.ඩබ්. සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ටී.එෆ්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - සී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.06.26 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ හා ඉහත සඳහන් අනු කමිටුව පත්කිරීම ඇතුළු සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි අල්. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුරත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. මිසඳ හර්ෂණ අලවිකෝන් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - සී.සජිත් දුමින්ද පීරිස් මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. ප්‍රදීප් ඉන්දික මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. අජන්ත දමයන්ත ද සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - අමරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - සිත්මි මයිකා ඩික්කාර් මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
14. මහා නගර සභා මන්ත්‍රී - එස්. වරුන් අරාමෙල් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් තරංගාත් කුමාර පෙරේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේම් කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. මොහාන් දුලිප් තිසේරා මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. මොහාන්ධන් තිළිණ ක්‍රිස්ටල් කාන්ත මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනවිය
21. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලාතාවිතානගේ මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - ජී. දිනුෂි සෙහෙමල්ලා පෙරේරා මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. නිලිනි සෙන්සරණී මෙනවිය

**2025.06.26 දිනැති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ හා ඉහත සඳහන් අනු කමිටුව පත්කිරීම ඇතුළු සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**06(4) 2025.06.27 දින පැවති පරිසර, සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද ප්‍රදේශයේ තියෙන්නේ පටු මාර්ග, ගලි බටවල දිග තියෙන්නේ අඩි හැටපහක් පමණ. අස්විය ලබාගන්න ගියාම අපහසු තත්ත්වයකට පත්වෙනවා. සමහරක් පාරවල් වලට අඩි දහසුවක් අනූපහක් පමණ බටයේ දිග අවශ්‍යයයි. ගලි රථ දෙකත් හොඳ තත්ත්වයක නොමෙයි තියෙන්නේ ඒක නිසා අස්විය ලබාදෙන්න අපහසුතාවයක් තියෙනවා. අසාද්ගලික

ගලියකට රුපියල් දහතුන්දහස් පහළොස්දහස් පමණ ගෙවන්න වෙනවා. අසරණ මිනිසුන් ඉන්නේ. ඒ මිනිස්සුන්ට සිලින්ඩර් දෙකක ප්‍රමාණයේ වලක් සුද්ද කරගන්න රුපියල් පහළොස් දහසක් විතර වියදම් කරන්න සිද්ද වෙනවා. මිනිස්සු ලොකු අපහසුතාවයකට පත්වෙනවා. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ රථ වලට දිග බට දෙකක් සවිකරලා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලෝකය කමිටුවේ 04 වෙනි කරුණට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ස්කෑනිවර් වලට මුදල් අයකිරීම සම්බන්ධයෙන් තියෙනවා. මෙය අලුතෙන් නාගරික කොමසාරිස්තුමා ගත්ත තීරණයක්. අපිට දැනුවත් කරන්න අයකරන මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමාට මතක ඇති පසුගිය පාලනවල දිගින් දිගටම අපි කථා කරපු නගර සභාවේ තියෙන ස්ථානයක් තමයි ගෙවල් එක සහ අපද්‍රව්‍ය ඒකකය. ගරු නගරාධිපතිතුමනි, පසුගිය කාලයේ විශාල වංචාවන් ගණනාවක් සිද්ධවෙච්ච ස්ථානයක් තමයි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය. හැබැයි දැන් මොරටුව මහා නගර සභාවේ තියෙන අපාය කොහෙද තියෙන්නේ කියලා ඇහුවොත් එහෙම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය තමයි මොරටුව මහා නගර සභාවේ තියෙන අපාය. එතැන් හැදිච්ච මිනිස්සු, එතෙන් සෙනෙහසක් ලැබිච්ච මිනිස්සු දැන් ඒ තත්වයෙන් බලන්නේ නැහැ. එතන් ඉන්නවා මෑන් පවර් ආයතනයෙන් සේවකයෝ දෙදෙනෙක් අරගෙන රු.1000යි ගෙවන්නේ එක සේවකයෙකුට. මම දන්නේ නැහැ අපිටත් එන්කම් මොනා මොනාහරි වෙනවා මේ සම්බන්ධයෙන් කවුරුත් කතා කළේ නැතිනම්, ඒ ගණිකාරම් අයයන්, කන්න තැනක් නැහැ ඒ සේවකයන්ට, වැසිකිලි යන්න හරිහැටි තැනක් නැහැ, නාගන්න හරියට තැනක් නැහැ. නිතිකරම් අයයන්. අපායට යන්න මිනිසුන් ගෙවල් ඒක බලුපිටකාම් හරි. ඒ නිසා සේවකයෝ ප්‍රදූෂිතකාර දුක්ඛිත තත්වයකට පත්වෙලා තියෙනවා එතන ඉන්න සේවකයෝ ඒ නිසාම මම දන්නේ නැහැ එතන වෙනවාද කියලා තවත තවත ගෙදවල් වලට අපේ සේවකයෝ යොමු වෙන්න තියෙන ඉඩකඩ වැඩි. මොකද හේතුව මිනියෙන් ඉන්න බැහැ එතන. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, එළඹෙනිම ගෙද් ඔබතුමා, ඔබතුමත් මනුස්සයෙක් මේ අපි ඉන්න පනය් දෙදෙනාවම එකතුමක් තියෙනවා මම ආරාධනා කරනවා මාලිමාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට ගිහිල්ලා බලන්න ඉඩපටක් එතන. බලලා ඉගෙන ගන්න දුස්වීදිනා හැටි මිනිස්සු. ප්‍රදූෂිතකාර දුකක් විදිනවා ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒ ගෙවල් එකේ අඩුපාඩු ටික සම්පූර්ණ කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒත් එක්කම මෙහෙත් රුපියල් පන්දහසේ මිටි ආදී ඒවා සාම තියෙනවා. රුපියල් පන්දාහේ මිටි පසුගිය කාලේ ගාවා. හැබැයි දැන් ගෙවල් එකට තියෙන බඩු ටික විකුණ ගන්න විදියක් නැහැ. සැපයුම්කරුවෝ නැහැ. මම දැක්කා මුදල් කමිටුවේ සැපයුම් කරුවන්ට කතා කරනවා. සත්වලාමම පසුගිය කාලේ තරඟ්ලිපමේ ආවේ. ඒ නිසා මම දන්නේ නැහැ මොකක් වෙලාද කියලා හැබැයි පසුගිය කාලෙට වඩා මෙහෙත් අයිතම් ප්‍රමාණයක් වැඩිවෙලා තියෙනවා. පසුගිය කාලේ 04 සිලු තිබුණේ. මම කොච්චර කෑගැහුවත්, මම කොච්චර කිවුවත් මේ ගෙවල් එකෙන් ආවේ 04යි නැත්නම් 05 යි මේ අයිතමයන්. හැබැයි දැන් ඒත් කිහිපයක් අඩුයි හැබැයි දැන් වෙනුවට තව ගෙවල් එකෙන් එක අයිතමයන් ටික මෙහෙත් දාලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපිට සතුටුයි. ඒ නිසා දැන් අපේ ආදායම රුපියල් 150,000යි. වැට් එකත් එක්ක 170,000 යි. ඉතින් ගරු නගරාධිපතිතුමනි, මෙහෙත් අපි වියදම් කරනවා මීට වඩා ලොකු ප්‍රමාණයක් එතනට. දැන් බඩු ටික විකුණෙන් නැහැ දැන් ට්‍රැක්ටර් වල උඩම ඉන්න සේවකයෝ ඒ බඩු තැන් තැන්වල මානවා. හේතුව තමයි ඒ මිනිස්සුන්ට මේතාන ඉස්සරනම් ආර්ථික වටිනාකමක් තිබුණා. ආර්ථිකමය වාසියක් තිබුණා. හැබැයි දැන් මෙතනට ගෙනාවට ආර්ථික වටිනාකමක් නැහැ. ආර්ථික වාසියක් නැහැ. මොකද හේතුව මේ බඩු ටික විකිණෙන්නේ නැහැ. මේ බඩු ටික ගොඩගැහිලා යොඩගැහිලා තියෙනවා. ඒනිසා තව ටික විකිණෙන්නේ නැති ඒ අදාළ බඩු ගේන සේවකයන්ට කිසිදු ගාණක් ගෙවන්නේ නැති නිසා ඒ කොල්ලෝ දැන් ගමේගෙදර බඩු අරගන ඒව තට්ටනලා තියෙන්නේ. ඒ නිසා මම කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න. මෙවා නගර සභාවට මුදල් උත්පාදනය වෙන ඒවා එක පැත්තකින්. අනික් පැත්තෙන් මෙතන අනාථයකු සේවාවක්, මම හිතන්නේ මෙතනට නගර සභාවේ තිබුණ පුවිලේජ්ම ස්ථානය මෙතන. මම දැක්කා

විවිධ නගර සභා වලින් මෙච්චර බලන්න ආවා. විවිධ නගර සභා වලින් ඉස්සෙල්ලා ළමයි එක්කගෙන ආවා අපේ මේ කණු එපදුවා ඒකකය බලන්න. හැබැයි අද වෙනකොට බලන්න තෙනෙවයි පාරේ යන්න බැහැ ගඳ. ඒ නිසා ඔබ ඒක දැන් අමතක කරන්න එපා. මේක දැන් නිශාන්ත ප්‍රදීපාන්දුගේ පාලන සමය. කවුරුහරි සංසන්දනය කරන්නේ නිශාන්ත ප්‍රදීපාන්දු මේ වැඩේ දී ෆේල් කියලා. පසුගිය අවුරුදු දෙකේ තමා මේක විනාශ වුණේ. හැබැයි කොමසාරිස්වරියගේ පාලනය පවතිත් තමයි මේක විනාශ වුණේ. හැබැයි කොමසාරිස්වරියගේ පාලය පවතින් මේක විනාශ වුණාට දැන් නිශාන්ත ප්‍රදීපාන්දු පාලනය කරන්නේ ඒ නිසා මම ගොඩාක්ම ගෞරවයෙන් ඔබතුමාට මතක් කරනවා කරුණාකරලා හැකි ඉක්මනින් මේ අහිංසක සේවකයෝ ටික අපේ දරුවෝ වගේ, අපේ දරුවෝ වගේ සේවකයන්ට ඒ අවකාශ එන්නත් දීලා, ඒ මිනිස්සුන්ට කන්න නැතුව අර වහගෙන ඉන්නවා එක ෂෙල් එකක්. ඒක ඉස්සරහා හදලා තියෙනවා. ඒක වහගෙන ඉන්නවා. මොනාහරිද ජේවීපී එක භයිකරන්න තියෙන්නේ කියලා ඒක වහගෙන ඉන්නවා. අනේ අප කොල්ලෝ ගිහිල්ලා කන හැන බලන්නකෝ ඔබතුමා පොඩ්ඩක් අර උඩ අහයක කන්න ගිහිල්ලා. හිටගෙන කන්නේ මම ළඟ ගෑනෙට් තියෙනවා හිටගෙන කන්නේ. වාඩිවෙන්න පුටුවක් නැහැ. ඒ මිනිස්සුන්ට ඉන්න විදියක් නැහැ. ඒ මෙතනට එනවා කියන්නේ අසයාට යනවා උඳේ ඇවිල්ලා කවක යනවා කියන්නේ ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒක හැකිතාක් බෙල් එක සහ මේ නගර සභාවේ බලන්න තැන් 02 ක් තියෙනවා පිටින් එන කෙවිසයට. එකක් බෙල් එක. බෙල් එක පෙන්නුවාම අපාය සිහිවෙනවා. කොමසාරිස්ගේ ඔෆිස් එක ඉස්සරහාව ගියාම දිව්‍ය ලෝකේ සිහිවෙනවා. කොමසාරිස්ගේ ඔෆිස් එක තියාන් දිව්‍ය ලෝකයක් වගේ. කොමසාරිස්වරියක් ඉන්න ඕනා මිනිස්සුන්ට අස්කන. හක්වලා ගමි ලේනවද? යන්න ඕන අස්සෙන් අස්සෙන්, මාර ගාඩ් එකක්. නගරාධිපතිවරයාටනම් තියෙනවා ජීවිත තර්ජනයක් නගරාධිපති කිවුවාම. සද්ගපාලකයෙක්. ඒ නිසා නගරාධිපතිවරයාට ආරක්ෂාවක් ගේන්න ඕන. මේ කොමසාරිස් ඉන්නේ. මේ කාගේ සල්ලිද? කාගේ සල්ලිද මේ නගර සභාවේ වියදම් කරලා තියෙන්නේ. ගිහිල්ලා බලන්නකෝ හත්වලාමේ මේ කොහේවත් නැති විදියට ඔෆිස් එක හදලා තියෙන්නේ. සේනාවද මිනිස්සුන්ට, සේවකයන්ට ලෝක්තේන් නැහැ. කොමසාරිස්වරියට හම්බවෙන්න යන්න කාටවත් බැහැ. කොමසාරිස්වරිය ජීවත් වෙන්නේ එවනම ලෝකෙක. ඒ නිසා එතන දිව්‍ය ලෝකේ ඊට අඩි කීපයක් එහායින් අපාය. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුව සම්බන්ධයෙන් අපිට වෙන ප්‍රශ්න නැහැ. කරුණාකරලා අපේ සේවකයන්ගේ ජීවිත ටික බේරලා දෙන්න. නැතිනම් ඔය මිනිස්සුන්ට ලෙඩක් හැදිලා මැරිලා ගියොත් එහෙම ඒ වගකීම ගන්න වෙන්නේ ඔබතුමාට

ගරු නගර සභා මන්ත්‍රී - ඒ. එම්. සුදේශ් ඉන්දුජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න සෞඛ්‍ය කමිටුව නියෝජනය කරන සාමාජිකයෙක් නිසා. මෙතුමා මතුකරපු කාරණාව සම්බන්ධයෙන් එතනට පොඩ්ඩක් ගිහිල්ලා බලන්න කියන ඉල්ලීමකුත් තිබුණානේ. මම පුද්ගලිකව ඒ ස්ථානයට අපි කණ්ඩායම දවස් 03 කට පස්සේ ගියා. එතුමා කියන බොහෝ කාරණා සත්‍යය. මේ ආයතනයේ ඉතාම නරක තැනක මේ බෙල් එක පවතින්නේ. ඒක අපි කවුරුත් පිළිගන්නවා. හැබැයි කවුරුහරි මාසයක් වගේ කෙටි කාලයක් තුළ සංසන්දනය කරනවානම් නිශාන්ත ප්‍රදීපාන්දුගේ පාලනය ෆේල් කියලා අපි ඒකට කණගාටුව පළ කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා වැරදියට තේරුම් අරන් තියෙනවා මන්ත්‍රීතුමා. මම කිවුවේ පසුගිය අවුරුදු දෙකේ තමයි මේ විනාශ වුණේ. හැබැයි දැන් පාලනය කරන්නේ නිශාන්ත ප්‍රදීපාන්දුයි. ඒ නිසා දැන් මේක හදන්න කියලා කිවුවේ. නැත්නම් මම කිවුවේ ඊළඟට ප්‍රශ්නය වෙන්නේ නිශාන්ත ප්‍රදීපාන්දුට කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එච්. සුසද් ඉන්දුජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමිය, හරි පැහැදිලියි. ඔබතුමියගේ අදහස් එක්ක අපිට විරුද්ධ නැහැ. මේ ආයතනයේ මොකක් දේවල් වෙනස් කරන්න ඕන. අපි කියන්නේ දැන් මේ සමහර මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශයන් හැටියට යන්නාම පසුගිය අවුරුදු 02 තමයි මේ කාලයට මහා නගර සභාව විනාශ වෙලාම තියෙන්නේ. ඊට කලින් සුරපුරයක්. අපිත් ගත්වලාමේ වෙලාවේ හිටියනේ, අවුරුදු 29 ක්. එහෙනම් මේක සුරපුරයක්. එහෙම කියන්න බැහැ. මේ කාලගේ කාලගත් කුණු තියෙනවා. ඒ නිසා අපි දැන් උත්සාහ කරනවා මේක නිවැරදි කරන්න අපිට යම් කාලයක් අවශ්‍යයි ඉතාම ඉක්මනින් බෙල් එකේ ප්‍රතිසංස්කරණ කටයුතු අපි ආරම්භ කරනවා. පළාත් සභා උපමුදලින් ලක්ෂ 50ක් වෙන් වෙලා තියෙනවා. ඒක අපේ පාලනයේදීත් නෙමෙයි ආපු එකක්. ඉක්මනින් කොමසාරිස්තුමිය එක්කත් අපි මැදිහත් වෙලා සේවකයන්ගේ සුභ සාධන කටයුතු, ඒ තියෙන පඩිපල ප්‍රශ්නත් ටික ඉක්මනින් හදලා අපිට අවශ්‍යයි මේක මීට වඩා සුන්දර කරන්න. අපි එකත් ඉතාම ඉක්මනින් කරන්නත් සූදානම්. අපිට පොඩි කාලයක් දෙන්න. විපක්ෂය ගැන සන්තෝෂ වෙනවා. ඇත්ත කතාන්දර ගොඩක් තියෙනවා. හැබැයි ඒක අපි මහා විරුද්ධ හැටියට, පක්ෂයක් හැටියට මතු කරනවාට වඩා අපි කවුරුත් උත්සාහ කරමු අපි එකතු වෙලා මේක විපක්ෂයන්ගේ කොහොමටද කියලා තොරතුරු කියලා ඉල්ලමින් මේ කටයුත්ත ඉක්මනින්ම අවසන් කරනවා කියන එක පැහැදිලි කරමින් මිය ෆයිල් එකට අදාළ සියලු තොරතුරු අපි ඉල්ලලා තියෙනවා කොමිය කමිටුවෙනි. ඒවත් අපි විමර්ශනයට ලක් කරනවා. විශේෂයෙන්ම අපි මන්ත්‍රීවරු කණ්ඩායමක් පත්කරන්නට බලාපොරොත්තු වෙනවා අපේ කණ්ඩායමෙන් මේ පිළිබඳව විශේෂ අධීක්ෂණයට. ඒ කිසිදෙයක් යට යන්න දෙන්නේ නැහැ. කිසි කෙනෙකුට මේ පාලනය තුළ අපි හොරකම් කරන්න ඉඩ තියන්නේ නැහැ. එහෙම කෙනෙක් හිටියොත් මේ පාලනය ඇතුළේ කවුරු වුනත් නීතිය ක්‍රියාත්මක කරනවා කවුරු වුනත්. ඒක අපිටත් පොදුයි සහ අපි උත්සාහ කරනවා සූදානමින් ඉන්නවා ඒවාට අදාළ ක්‍රියාමාර්ග ගන්න. කොමිය කමිටුව වෙනුවෙන් මට ඒ පැහැදිලි කිරීම කරන්න අවශ්‍යයි.

<u>ගරු නගරාධිපතිනී - ජේ. පී. නිශාන්තා පුද්ගානන්ද මහත්මිය</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කොමිය කමිටුව සම්බන්ධයෙන් ඉතාම කෙටි අදහසක් කියන්න ඕන. ඒ කියන්නේ මේක නිශාන්තගේ පාලනයනේ, මේක ජාතික ජන බලවේගයේ පාලනය. මේක සමන්ලාල්ගේ සුජීත්ගේ පාලනය නොවෙයි. මේක සමන්ලාල්ගේ සම්පත්ගේ පාලනය නොවෙයි. මේක නිශාන්තගේ පාලනය. දැන් නිශාන්තගේ ජාතික ජන බලවේගයේ පාලනය වැඩ කරන විදිය වෙනස්. ඒ කියන්නේ කාටවත් බාහිර උපදෙස් හෝ පැරණි ප්‍රකාශන ඒවා මම ගිහාපේන් කවදාවත් සමිට වඩාත් ප්‍රතිපත්ති කටයුත්තක් කරයි කියලා. වැරදි අඩුපාඩු පෙන්නලා දෙන එක වෙනයි. හැබැයි ඒක නිවැරදි කරන ස්ථිරය ඒගොල්ලන් මතු වෙන්නෙනම් මහා දෙවියනේ. ඇත්තටම මේක මේ ප්‍රධානියෙක් වශයෙන් රටට ඒකක් දාලා මෙතැනට ඇවිල්ලා ඇදුම් ප්‍රශ්න කරනවානම් ටයි එක දාගෙන ඉන්නේ. ඇඳුමේ මොකක්ද විෂය පිළිබඳ තියෙන ප්‍රශ්නය. ආයතනයේ ප්‍රධානියා. එයාට ඒ ගෞරවනීයව ඉන්න සහපුරුවම වෙච්ච තැනක්, ස්ථානයක්. මොකක්ද ප්‍රශ්නය. ඒ කියන්නේ අපි නිලධාරීන් මන්ත්‍රීවරුන් සේවකයින් සම සමාන තැනකට බොහොම සහෝදරාත්මකව බොහොම හොඳ තැනකට ගේන්න විශාල කැපවීමක් දරනවා. හැබැයි ඒක අසාධාරණ ලෙස කවුරුහරි නමින් දන්න පරණ පුරුදු ප්‍රහාරාත්මක ඒක ඉතාම පහත් අදහසක් පාලනයක්. ඒක කරන්න එපා. නීතියෙන් මට බලය පැවරිලා තියෙනවා කියන්න බැහැ. මන්ත්‍රීවරයෙකුට නිදහසේ කතා කරන්න අයිතිය තියෙනවා. හැබැයි අනවශ්‍ය ලෙස අර සන්ධිය වුනොත් ඒකත් වෙන්නේ නමන්ටම්, අර මේක හදන්න වගේ ඉදිරිත් කරගෙන යන්න බාධා කරනවා වාගේ මට හැඟෙන්නේ. ඒ නිසා එහෙම කරන්න එපා. ඉතිහාසය පුරාම පුරුත් පුස්තකාමාරයවත් මම දන්නවා බොහෝ කාලයක ඉඳන් මේකේ හිටිය උප නගරාධිපති, සමන්ලාල් එක්ක එකට කරට අත දාගෙනත් හිටිය ගමන්න එක ඇතුළෙත් හිටියා. ඒ කාලෙත් මේ සභාව මිය නැත්, විවිධ ගැටලු, ප්‍රශ්න තැන්පාඩ කියෝ යන්නාම ඊගේ කථා ගාන්නාම පුළුවන් මතු කරගන්න. මම කියන්නේ අපි අත්දැකීම් ලබපු යම් පරිපාලනයක් සහිත අය දැන් අපිට ඕන මේ ගැටලුම ඒ ඉතිහාසයේ සිද්ධ වෙච්ච වැරදි වලින් නිවැරදි කරගෙන මහජනතාවට යහපත් ආයතනයක්, ඉතාමත් හොඳ සේවයක්. අපි ඒ වෙනුවෙන්

ඕනෑ හැදෑරීමක් කරන්න සූදානම්. ඒ නිසා ඒකට සාධාරණ ලෙස සැලකිලිමත් නැතිව අපි කොහොමද ඒ කටයුත්ත කරන්නේ කියලා විමසලා ඉමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී – ශෙවියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙතනට අමුණලා තියෙන වාර්තා සම්බන්ධයෙන් මගේ විවේචනයක් සහ මගේ විරෝධතාවයක් තියෙනවා. මේ වාර්තා ඇත්තටම මන්ත්‍රීවරු හැටියට පිළිගන්න බැහැ. මේ වාර්තා කිසිම දෙයක් කියනවා වගේ මේ දත්ත සහ මේවා වල තියෙන කරුණු මෙන්න මේ වගේ වාර්තා දීලා තමයි ඇත්තටම මේ නගර සභාවල් දූෂිත ආයතන බවට පත්වෙලා තියෙන්නේ. උදාහරණ මට මතකයි මම ගිය සභාවේ මේ ගලි රථ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවක සාකච්ඡා කළා. මේ ගලි රථයේ ඉන්ධන ප්‍රමාණය සහ ලැබෙන ආදායම ඒ ආදායම මේ සංඛ්‍යා වලින් තමයි ඇත්තටම ඒ ලැබෙන ගණන් එකකට එකක් පිළිගන්න බැහැ නගරාධිපතිතුමනි. මෙතැන දැන් ඉන්ධන සඳහා රුපියල් 99,000 ක් වියදම් කරනවා. ලැබෙන්නේ රුපියල් 303,000 යි. මේවා සම්බන්ධයෙන් මේ වාර්තා මීට වැඩිය කොම්ප්‍රිහෙන්සිව් වෙන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, මේ සභා අසුනට විශේෂ ව්‍යාපෘති ප්‍රනීර් ප්‍රයිසර්ජ් මේ දාලා තියෙනවා මේ වාර්තා සංක්ෂිප්ත වැඩියි. මේවා මීට වැඩිය විස්තරවල් දාන්න ඕන. කොහේ හරි සේවා ලබා දුන්නානම් කීදෙනෙකුට මේ සේවාව ලබා දුන්නාද? එක්කෙනෙක්ට කොහේට එක කීයද? ඒක ඒකක්. එතකොට මෙතන ඇමුණුම් අංක 06 ආරක්ෂණ බලපත්‍ර 03යි දීලා තියෙන්නේ. ඒ 03 දීලා තියෙන්නේ කාටද? මොකක්ද මේ සම්බන්ධයෙන් පිළිගන්න පුළුවන්ද දැන් මේ මැයි මාසයේ පරිසර ආදායම් බලපත්‍ර මෙච්චර සංඛ්‍යාවක් අවසරයි දීලා තියෙන්නේ කියලා. හේතුව එක සඳහා බැලුවාම ජූනි මාසේ බැලුවාම පරිසර බලපත්‍ර 13 ක් ලබා දීලා තියෙනවා. එතකොට ඒ සම්බන්ධයෙන් මෙතනම දැනගන්නම් කාටද මේවා දීලා තියෙන්නේ පරිසර බලපත්‍ර. මම ඉල්ලීමක් කරන්න කැමතියි කමිටුවේ සභාපතිතුමියගෙන් ඔබතුමා කරුණාකරලා මේ වාර්තාවන් නිලධාරීන් විසින් හදන මේ වාර්තාවන් පිළිබඳ මීට වැඩිය මම හිතනවා මේ ෆෝමැට් එක වෙනස් කරන්න ඕන කියලා. මම හිතන්නේ ඔයගොල්ලන්ගේ පැත්තේ එකවුන්ට්ස් දන්න අය ඉන්නවා. දැනුම තියෙන පුද්ගලයෝ ඉන්නවා. අපිත් අපේ දැනුම ලබාදෙන්නම්. මේ වාර්තා සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් කරලා මේ වාර්තා මීට වැඩිය කොම්ප්‍රිහෙන්සිව් විදියට ඉදිරිපත් කරන්න ඕන. මොකද මේවා වල තියෙන ගණන් සම්බන්ධයෙන් මෙන්න මේවා තමයි වංචාව දූෂණයට මුලික වෙලා තියෙන්නේ. අපි මේක සම්බන්ධයෙන් ගිය සභාවෙත් කතා කළා. මේවා මම දැඩි ලෙස අපේ විරෝධය ප්‍රකාශ කරනවා

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මට මේ වාර්තාවක් සම්බන්ධවුණ 2022.05.05 නිශාන්ත ප්‍රදීප්නාන්ද කියලා මන්ත්‍රීවරයෙක් කතා කරනවා. මම මේ එක හැල්ලුවක් කියවන්නේ නැතිනම් අවලාව යනවනේ. අපිට කතා කරනවා. මූලික ප්‍රශ්නය මේ වාර්තාවට අදාළව මගේ අදහස වන්නේ මේ වාර්තාවේ ප්‍රමුඛ ප්‍රදීපය, වැරදිකරුවා කිසි දිනක විරුද්ධ නොකරපු කෙනා නාගරික කොමසාරිස්වරයා, නාගරික ඉංජිනේරුවරයා කියනවා මහා හැල්ලුවක් කියවලා තියෙනවා. ඒ කියන්නේ මේ නිශාන්ත ප්‍රදීප්නාන්ද කියන මන්ත්‍රීවරයෙක් හිටියා. එයා හොඳට දුන්නා නිලධාරීන්ට බනින්න ඒ කාලේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔයාට ඒක අමතක වුණාට අපිට මතකයි.

**<u>ගරු නගරාධිපති - ජේ. ඩී. නිශාන්ත ප්‍රදීප්නාන්ද මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි,ඔයගොල්ලන්ගේ අවශ්‍යතාවය දැන් හරි පැහැදිලියි. ඉතින් ඇයි දැන් නැගිටින්නේ. ඔයා වාර්තා අරගෙන ඔය කතා කියන්න. මේ සභාව කරගෙන යන්න ඉඩ දෙන්න.

සභා ඝෝෂා

<u>ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ඉතාම වැදගත් කාරණයක් කිව්වා. දැන් මේ වාර්තාවේ සංඛ්‍යාත්මක තොරතුරු පිළිබඳ ඇත්ත ප්‍රශ්නයක් තියෙනවා. ඉතින් ඒක අපි නිලධාරීන්ට ඉදිරිපත් කරන්න ඕන. මොකක්ද මේ කරන්නේ අතීතයේ කීනතරම් භාර අවුරුදු ගත්තොත් ඒවා මින්නොයි හොඳයි කුණු නේ. නිශාන්තගේ අතීතයේ නම් කුණු කම්පැනියක්නේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක අපි හොඳටම ප්‍රජාතන්ත්‍රවාදී විදියට කරන්න ඕන වැඩක්. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයට අනුව, අපිට එක එක්කෙනා අනුව තුලනා සටහන අනුව වෙන් ඇන්ඩ් බැලන්ස් ඔබතුමාගේ යම් උදාහරණයක් ගත්තොත් පක්ෂ ඔබතුමාට පිළිගන්නට පුළුවන් කොටස ඔබතුමා කරන්න. එතකොට අපිට කාටවත් කියන්න බැහැ මෙන්න මේක කරන්න එපා, අරක කරන්නෙපා කියලා. අපි දැන් කරන්නේ තුලනා සටහන් වලට අනුවනෙ මේ චෙක් ඇන්ඩ් බැලන්ස්. එතකොට ඒකට කාටවත් අභියෝග කරන්න බැහැ. ඒ නිසා විළුන කාරණාව තමයි ගරු නගරාධිපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයට යනවා අපි හැමෝදාමත් නියෝජනය වෙලා ඉන්නවා. ඒක හැටයි ගතලිගේ ක්‍රමයට අනුව සමානුපාතික වෙන්නත් පුළුවන් සාමානුපාතික නොවෙන්නත් පුළුවන්. එතකොට එකෙනදී කාටවත් කියන්න බැහැ මෙයා නියෝජනය වුණේ මෙයා නිසා ඒ නිසා මෙයාට කතා කරන්න බැහැ කියලා. ඒක ගරු නගරාධිපතිතුමනි, මය කතාව දිගට ගියොත් ඔබතුමා අපිත් එක්ක සුහදව කතා කරලා අපිත් හොඳටම ගෞරවාන්විත විදියට මේක ගොඩනගන්න සහභාගියෙන් කටයුතු කරනවා. එතකොට පැවිච්ච කරන ක්‍රමයේද වෙනස් වෙන්න පුළුවන්. ඒකට උරණ වෙන්න එපා. එතකොට අපි ඒ කාලෙත් පෙන්වා දීමක් කළා නගරාධිපති ඔබතුමාට එළියට දාන්න ගියාම අපි ඒකට විරුද්ධව ඡන්දය දීලා තියෙනවා, ඒ නිසා ගරු නගරාධිපතිතුමනි. ඉතින් ඉදිරියට යන්න ඔබතුමා මේ මෙරටවුමේ නගරාධිපති. ඒ නිසා ඔබතුමා ඇත්තටම කියනවානම් මේ නගරාධිපති ධුරය තියන්නේ හැම එකතුගෙම පියෙක් වගේ කියලා. ඒ නිසා මම හිතන්නේ එහෙම කියනකොට ඔබතුමා ඒ වැරදි උදාහරණ ගත්තත්, ඒ නිසා පියා යකා වෙලා බැහැ. අපි ඔබතුමාට හොඳටම ඒකවත්. අපි කැමති ඔබතුමා අවුරුදු 29 ක් තුළ ගත්ත එක අපි හැමෝම කැමති වුණා. ඒ නිසා වෙන් ඇන්ඩ් බැලන්ස් වලදී ඒක අධිකරණය, විධායකය, ව්‍යවස්ථාදායකයත් චෙක් ඇන්ඩ් බැලන්ස් තියෙනවා. මේකටත් චෙක් ඇන්ඩ් බැලන්ස් තියෙනවා. ඒ නිසා වැරදි අර්ථකථන කරලා, එහෙම කරන්න එපා කියලා තමයි අපේ ඉල්ලීම.

<u>ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි දීර්ඝ කාලයක් මෙතැන ඇඟිල්ල ඉඳලා ඡන්දයකීම ලබලා අපි උත්සාහ කරනවා හරි පැත්තට ගමන් කරන්න. හැමෝම හොඳගොඩ ඉවසීමෙන් ඉන්න උත්සාහ කරමු. හැබැයි අපි නාම දීපුණු කරගත්තත් නැති අපේ සමහර චරිත ස්වභාවයන් තියෙනවා. ඉතින් ඒ නිසා එකිනෙකා අතර තියෙන අවබෝධයෙන් මේ කටයුතු යන්න ඕන. කියනකොටනම් මේ ගැන්නේ බාධා කරන්න මේ ස්වභාවය මේ කණ්ඩායම එන්නේ මේක හදන්න නොවෙයි. එතකොට නගරාධිපතිවරයා හැටියට මම ඉතාම සීනාතාවීන් දැන් ඔය දන්නවා මම කැලෑව ගහද්දි නාවන්නන්ගේ නෑකම කැලෑව ගහද්දි මාව උස්සගෙන පිහිල්ලා එළියට දැම්මේ. ඊට පහුවත් කැඩෙනම කළා. ඉතින් මම එහෙම කරන්න කැමති නැහැ. ඇත්තටම මේ සභාවත් නොවෙයි මේ ප්‍රකාශය කරගත්තේ. මේ සභාවේ මොනකක්හරි එහෙම ප්‍රශ්නයක් ආවානම් එතුමයි මායි අතර තමයි ඒ සංවාදය ගියේ. ඉතින් මම කියන්නේ හෙට්ස් මම හිතන් තියාගෙන කියලා එහෙම එකක් මට නැහැ. මම කියන්නේ මේ සභාව අපි කාටුරුත් එකතු වෙලා කරගෙන යන්න උදව් කරන්න. දැන් අර මම කිව්වේ මන්ත්‍රීතුමිය මතු කරපු ප්‍රශ්නය මටත් හොඳටම කම්පුතේව සංඛ්‍යා දත්ත ඇතුලේ ප්‍රශ්න තියෙනවා. ඉතින් මැයි මාසේ තොරතුරුමද මේ සභාව වගකීයන්නේ. මේ ප්‍රති මාසයේ තමුන් මේ පාලනය පවත්වාගෙන යද්දී සමහර ඒවා අකමැත්තෙන් වුණත් භාරගන්න වෙනවා. හැබැයි ඒවා භාරගන්නේ හෙට ඒකම කරගෙන යන්න නොවෙයි. ඉතින් ඒක වෙනස් වෙන්න ඕන. වෙනස් වෙන්නනම් මේ කමිටු සාමාජිකයන්. දැන් හොඳට කමිටු සාමාජිකයන්ට අවධාරණය කරනවා ඔය හොඳින් මේ වාර්තාව

තියෙන්නේ. අපි අදාළ සංවිධාන දන්න තොරතුරු තොපදින් කියවන්න. මේවා අදාළ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කරන්න. අදාළ ෆයිල් අරගෙන හිඟිල්ලා බලන්න. නැත්නම් නිකන්ම පත් උස්සලා රැකාඩ් වලටනම් පත් වෙන්නේ අර පරණ එකම තමයි. ඒ නිසා එහෙම කරන්න එපා. හරියට දැන් අපි මේක අනුමත කරන්න ඕනෙ නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී – ඩී. සජිත් ප්‍රමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමිය, මිනිතුමා මේ ගැන තව අවස්ථාවක් දෙනවාද කතා කරන්න. විශේෂයෙන් අපි මේකෙදි මම කතාවට යොමු කාරණාවක් තියෙනවා. ඒකට සභාවේ අනුමැතියක් ගන්න ඕනෑ. ඒ තමයි අපි සේවක දුක්ගැනවිලි කළමනාකරණය පිළිබඳ සහ කලාප මට්ටමින් තියෙන කටයුතු සහ ඵලදායීතා කළමනාකරණය අපිට ඔය කියපු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට තියෙන ප්‍රශ්න ටික විසඳ ගන්න පුළුවන් විදියට අපි මේ වෙනකොට ගරු සභාපතිතුමාගේ දායකත්වයෙන් සහ කමිටුවේ සුදේශ මන්ත්‍රීතුමා සහ අපි සියලුදෙනා තිලකසිරි මන්ත්‍රීතුමා අපි මේ කටයුතු කරගෙන යනවා. මේක තවදුරටත් මේ තියෙන කමිටු පුළුල් කරන්න පුළුවන්නම් පුළුල් කිරීමේ කටයුත්ත විශේෂම ප්‍රධාන වශයෙන් අපේපසු වෙච්ච කාරණයක් අපිට තියෙනවා. ඒක මේතාන පාලනයේදී ද අහලපසු ප්‍රශ්න අපේ පාලනයේ දිද කියන එක නෙමෙයි වැදගත් වෙන්නේ, කවුද කියන එක නෙමෙයි වැදගත් වෙන්නේ, මොකක්ද කියන කාරණාවත් එක්ක අපි මිතු කරන්න ඕන දෙයක් තියෙනවා. ඒ තමයි මේ සේවකයෝ ගැන කතා කළාට පස්සේ ගරු නගරාධිපතුමනි, සුජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනා එක ඉතාමත් වැදගත් ඒකේ යම් කාරණාවක් තියෙනවා. ඒ තමයි අපේ මේ වැඩ කරන සේවකයෝ යම් විදියකින් ගරු නගරාධිපතිතුමනි මේකෙන අපි තිතමු බෙල් එක කියලා. එතැනට යන්න යම් ආසාවක් තියෙන්න ඕන. අභිප්‍රේරණයක් තියෙන්න ඕන. එතකොට ගරු නගරාධිපතිතුමනි ඇති කරනවා වගේම විළඹට සෞඛ්‍ය සම්බන්ධ සේවකයන්ට මුහුණපාන ප්‍රශ්නය තමයි පසුගිය කාලේ සේවකයන් අපි දන්න විදියට කිහිපදෙනෙක් මියගියා මීට අවුරුදු කිහිපයකට කලින්. සමහරක් වෙලාවට ලෙප්ටොස්පයිරෝසිස් වෙන්න පුළුවන් මොකක්හරි ලෙඩක් නිසා. ඒ නිසා මේ වෙනකොටත් ඒ සේවකයන්ට ගරු නගරාධිපතිතුමනි එන්නත් ලබාදීම පසුගිය කාලයේ එන්නත් ලබාදීමක් සිද්ධවුණා. ඒ එන්නත් ලබාදීම මේ වෙනකොට නවමත් සිදුවෙලා නැහැ. එය අපි විසින් කළයුතු ප්‍රමුඛ කටයුත්තක්. ඒක එක්කම ඒ නිසා තමයි මම ගිය සභාවේ දී කටයුතු යොමු කලේ අපිට බලය පවරන්න නෙමෙයි අපේ ඉන්න ජීවිතේට ඩොක්ටර්ලා ටිකට මේතැනට ගෙන්න ගස්සෙන් ඔවුන්ට යම් ප්‍රතිපාදනයක් වෙන් වෙනවා මේ සේවකයන්ගේ තියෙන සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම සඳහා ඒක පාවිච්චි කරලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් එක්ක මේ කටයුත්ත කරන්න පුළුවන් හැකියි තිබිදු වෙලාවකාවත් තියෙන බලය ඔවුන් පවරා දීම නෙමෙයි. ඒ නිසා ඔවුන්වත් සම්බන්ධ කරගෙන කඩිනමින්ම ඒ අවශ්‍ය කරන එන්නත් ටික මේ සෞඛ්‍ය සේවකයන්ට දෙන්න ඕන ඔවුන්ගේ සෞඛ්‍ය පැත්තෙන්. අනිත් එක තමයි ගරු නගරාධිපතිතුමනි, අපි දකින කාරණාවක් පසුගිය කාලෙම මේ ට්‍රැක්ටරය පදවන ටියුටර් මේ ට්‍රැක්ටරෙන් වැටුණා. ඇත්තට වැටුණේ මොකද කියලා හේතුව බලද්දී සීනි අඩුවෙලා. මම මීට ඉස්සෙල්ලත් මේක කියුකළා. ඩ්‍රයිවර් දැවීලා පල්ලෙහා ඉන්නවා දත් ටික කඩාගෙන. ට්‍රැක්ටර් එක යනවා කාප්පේ වදිනවා. ඉන්පස්සේ ඒ කාප්පෙන් අපිට බැඳලා ගන්න වෙනවා. ඒ වගේ කිහිපයක් වුණා. සේවකයන්ට ලෙඩක් එක හැදුනා. ඒ නිසා නගරාධිපතිතුමනි, අපි විළඹ සභාවේදී ඉස්සෙල්ලා මේ සෞඛ්‍ය සේවකයන්ට අවශ්‍ය කරන මූලික කටයුතු ආරම්භ කරන්න කටයුතු කරන්න ඕන කියන එක මම අවධාරණයෙන් ප්‍රකාශ කරනවා. ඒත් එක්කම සේවකයන් යම් විදියකින් ඇයි මේ බෙල් එකෙන් ඉවත් වෙන්න කටයුතු කරන්නේ. ඔවුන්ට අනියම් පදනම මත ඔවුන්ට ලැබෙන වැටුප ප්‍රමාණවත් නැති නිසා. හැබැයි මේ වෙනකොට එන්ජිනේරු ලෙවල් එක 3,4 දීපු සේවකයෝ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ගරු නගරාධිපතිතුමනි අපේම මැදිහත්වීමෙන් අපි විශේෂයෙන්ම මහා නගර අමාත්‍යාංශය යටතේ ඉන්නපසු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ඔවුන්ට ප්‍රගුණුවක් ලබා දුන්නා. ඔවුන්ට එන්ජිනේරු ලෙවල් 4,5 කළාට පස්සේ සිව්ලෝමාර් ලෙවල් එකට එනවා. ඉසව්ව එක කරන්න පුළුවන් දැන් ඒකෙ කඩිනමුව එක දැන් හදාගෙන යනවා සිව්ලි ලෙවල් එකට එනවා. ඔවුන්ට හොඳ ඉල්ලුමක් ඇති වෙනවා ජාත්‍යන්තරවත්, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ පැත්තෙන්. අන්න ඒ අභිප්‍රේරණයත් එක්ක අන්න ඒ එන්ජිනේරු ලෙවල්

4 කරපු සේවකයෝ ටික එකතු කර ගන්නවා මේ වැඩෙන්. ඊළඟ එක තමයි නගරාධිපතිතුමනි, ඔවුන්ට දුක්ගැනවිලි තියෙනවා පුංචි පුංචි. හැබැයි ඒ දුක්ගැනවිලි කළමනාකරණය කරන්න පෙරමග වුණොත් අපි මානව සම්පත් කළමනාකරණය සාර්ථක වෙනවා. ඒ නිසා මේ කමිටු හරහා අපි මේ ටික යොමු කරලා ඊළඟ එක තමයි මට අවසාන වශයෙන් ඔබතුමාට කියන්න තියෙන අපි පසුගිය දවස් වල මේ සඟ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ පසුගිය මාස වලට පන්ලක්ෂ හැටදහසක් ඉපයුව අවස්ථා තියෙනවා. ඒක හරියට ගත්තොත් ලක්ෂ 60 ක් දක්වා වර්ධනය කරගන්න පුලුවන්. හැබැයි මේ ටෙන්ඩර් එක එක් ලක්ෂ දාහත්දාහ ගානේ ගියොත් අපිට ලක්ෂ 15ක්වත් ලබා ගන්න බැහැ. එතකොට මේ ගැප් එකට මොකද වුණේ? ඊ ගැප් එක නැති වුණේ අපිට මොකා නිසාද? හැබැයි නගරාධිපතිතුමා මම ඉස්සෙල්ලා කිව්ව විදියට ලක්ෂ 60ක් උපයපු තැන එක්ලක්ෂ දාහත්දහට මාසෙට වැටිලා. ඒක එකොළොස්ලක්ෂ හැත්තෑදාහයි. එහෙම නැතිනම් ලක්ෂ 130 වඩා කිව්වු වෙන්න යනවානම් අපිට ලක්ෂ 47ක වෙනසක් තියෙන්නේ. එතකොට එහෙනම් අපිරහේවනය අඩුවෙලා තියෙනවා. නමුත් එහෙම නෙවෙයි. ඔබත් මේ විෂය සම්බන්ධයෙන් මමත් විශ්ලේෂණ කරලා තියෙනවා. වැඩ කරලා තියෙනවා ආයතන වල එතකොට සකල කළමනාකරණය සම්බන්ධ සඟ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ හැකියාව අපිට තියෙන නිසා අපි දන්නවා. අනික් එක තමයි ඊළඟට අපි යන්නොත් නගරාධිපතිතුමනි, මම ඉස්සෙල්ලා කියපු එක්ස් ටෙන්ඩර් ප්‍රඩියුසර් රෙස්පොන්සිබිලිටි යටතේ අද නීතානුකූල අවස්ථාව තියෙනවා මේ ආයතන වලට උදවු කරන්න. එතකොට මේ ආයතනයේ තියෙන දක්ෂ ටිකත් වෙනම අපිට මධ්‍යම පරිසර අධිකාරියත් එක්ක ගිවිසුම් කරලා වෙනම අපිට ආදායම් නීරුවක් එකතු කරගන්න පුලුවන්.

<u>ගරු නගරාධිපති - එන්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා</u>
මන්ත්‍රීතුමා, අවසන් කරන්න. ඔබතුමා කමිටුවෙත් සාමාජිකයෙක්. මේ කමිටුවට සම්බන්ධ වෙලා ඔබතුමා ඉතාම හොඳ යෝජනාවක් මේ කියන්නේ. නමුත් මේ වෙලාවේ කාලය පිළිබඳව සලකා බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. මධුෂ හර්ෂණ අබේකූන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, අපේ මේ ලිඛිත මන්ත්‍රීතුමිය මතු කළා පොදු සේවා අර ගලි බවුසර් සම්බන්ධව. පොදු සේවා බස් නැවතුම්පොළ 1800 ක් එකක් ගහලා තියෙනවා. පහයි, හතයි, පහයි, දහය බස් නැවතුම්පොළ ආසන්නයේ පොදු සේවා 6000 ක් ගහලා තියෙනවා දවස් 02 ක් ඇතුළත. එතකොට 7800ක් ගහලා තියෙනවා දවස් දෙකක් ඇතුළත. ඉතින් නගරාධිපතිතුමනි, මේ පොදු සේවා වුණේ කොහොමද? ගරු සභාපතිතුමා දුලේෂ් මන්ත්‍රීතුමා මේක පොඩ්ඩක් බලන්න. දැන් 7800 ගහලා තියෙනවා බස් නැවතුම්පොළේ. එතකොට මේවා පොදු සේවා ගහන්නේ ඇයි මේක ටෙන්ඩර් කරලා තියෙන්නේ, ඒ මිනිස්සු සල්ලි ගෙවනවා. එතකොට එයා සල්ලි බදින්න එපැයි මේක පොදු සේවාවක් වෙන්නේ නැහැනේ ඒක. දවස් 02 කට 7800ක් ලීටර් ගහලා තියෙනවා. හැමදාම ලිය ලිය ඇවිල්ලා තියෙනවා නගරාධිපතිතුමා මේක හොයලා බලන්න ඕනා. අපේ කාලෙත් මේක ගැන ප්‍රශ්න කළා. ටිප්පර්ස් ඔබතුමා දන්නවා දිනපොළ දිගහරල්ලේ. එතෙන් ගහලා තියෙනවා. ඉතින් මේක දවස් දෙකට 7800 ක් ගහලා තියෙනවා. බෙල් එකක් තිබුවා වගේ බෙල් එකේ කිසිම දෙයක් ඇවිල්ලා නැහැ. ඇවිල්ලා තියෙන්නේ පෙට් බෝතල් වුදු යන අපට බෝතල් සාට් විතරයි ඇවිල්ලා තියෙන්නේ. අවන කිසිම දෙයක් ඇවිල්ලා නැහැ. පන්හර වලට මොකද වුණේ? කොන්ස් බෝර්ඩ් වලට මොකද වුණේ? ගෝනි කොළ වලට මොකද වුණේ? ඒ නිසා ඒ ගැන හොයලා බලන්න. ඒ නිසා අපේ ආදායම කොහෙන්හරි පිටට යනවා. ඒ නිසා හොයලා බලන්න නගරාධිපතිතුමා මෙන්න මේකයි වෙන්න ඕනා වැඩේ. හැබැයි සජිත් දුමින්ද මන්ත්‍රීතුමා කිව්වා වගේ පන්ලක්ෂ හැටදහසක් මාසෙට ගොරනම් කරලා හරි බැන්දා නගර සභාවට.

<u>ගරු නගරාධිපති - එන්. ඩී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීතුමා, මන්නොම් අවාන් ගානක් තියෙනවාලු ප්‍රසම්පාදන කමිටුව තිබුණේ නැති නිසා දැන් ප්‍රසම්පාදන කමිටුව දාලා තියෙන්නේ, එතකොට ඒ කමිටුව හරහා ක්‍රියාත්මක වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. සමුත්ත සිල්වා මහතා**

නගරාධිපතිතුමනි, ඇත්ත වශයෙන්ම කොටින් දූරට මේ වෙනකොට සේවකයො දෙන්නේ පෞද්ගලික කඩ යකඩ කඩ වලට යනවා. අපි නමින සභාවෙන් විශයෙන් අපි සභාවක ආදායම් ලබන්න පුළුවන් අභාවට. හැබැයි ඒ නියම මිල සේවකයන්ට දෙන්න ඕන. ඒ මිනිස්සු බලන්නේ ප්ලාස්ටික් ටික එකතු කරගෙන යකඩ කෑල්ලක් හම්බුවෙලාත් එකතු කරගෙන ඇවිල්ලා මෙතනට දෙනකොට යකඩ කඩේට වඩා මිලක් අඩුවෙන් දෙන්නේ. හැබැයි යකඩ කඩවලින් දෙන මිල ඒ අයට දෙන්න පුළුවන්නම් අපිට දෙන්න බැරිකමක් නැහැනේ. ප්ලාස්ටික් වලට බෝතල් වලට හැම එකටම නියම මිල දෙන්න සේවකයන්ට. එතකොට සේවකයන් මෙතනට සියලු දේවල් ගෙනෙයි. නොදෙන නිසා තමයි මොකද යකඩ කඩේන් 70 ක් දෙනවානම් මෙතන දෙන්නේ 50 යි. එහෙම වුණාම එතකොට සේවකයෝ බඩු ටික ගේන්නේ නැහැ. ඉතින් ඒ සේවකයාට කවුරුහරි හොයාගෙන ඒයා හොයාගෙන එක දේට මෙතෙන් ලාභයක් තියාගන්න ඕන නැහැ. අපි දෙන්නත් ඕන නියම මිලක් අපිට ගන්න පුළුවන් තැනකට. සේවකයාට හරි මිල දුන්නානම් සේවකයෝ ඔක්කොම බඩු ටික මෙතනට ගෙනෙයි. ගෙනල්ලා අපිත් නියම ස්ථානය තෝරගෙන නියම ස්ථානයේ නියම මිල ගෙවන තැන හඳුනාගෙන අපි බඩු ටික දෙනවානම් සභාවටත් ආදායමක් ලබන්න පුළුවන්. අපි යම් මිලක් දුන්නා සේවකයන්ට සේවකයො ඒකත් කරන්නේ නැහැනේ. ඒ දුන්න මිල දුන්නේ නැත්නම්. ඒ මිලක් දෙනවා අපි. ඒ සේවකයා ඒ ටික දුන්නාම ඒ අයට හරි මිලක් අපි ගෙවන්නේ නැහැ. ගෙදිය පිටින් ගන්න ගියොත් මුකුත්ම හම්බවෙන්නේ නැහැ. ඒතකොට එන්නෙම නැහැ. ඒ නිසා යකඩ කඩේකින් දෙන සාධාරණ මිල ඒ සේවකයන්ට දෙන්න ඕන. දුන්නාම අපිට පුළුවන් හරි මිලක් ගෙවන යකඩ ගන්න ආයතනයකට අපි දෙන්න ඕන. දුන්නාම සභාවටත් ආදායමක් එනවා, අන්න ඒ ක්‍රමයට ඇති කළොත් තමයි මේක සාර්ථකව කරගන්න පුළුවන් නැත්නම් මේක කරගන්න බැහැ.

**ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා**

ඒ පිළිබඳව යම් අවබෝධයක් තියෙන මන්ත්‍රීවරයෙක්. අපිට ඒක කරගන්න පුළුවන් වෙයි ගරු මන්ත්‍රීතුමා.

**මහා නගර සභා මන්ත්‍රී - එම්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මෙතුමා තමයි පත්තර පෙට්ටිවලින් වැඩිම මුදලක් අරන් දුන්නේ. අපි රුපියල් 10යි 15 යි පත්තර කිලෝ එක ගොඩිවෙට. මෙතුමා සම්පූර්ණ මුදලම අරන් දුන්නා මේ පත්තර වලින්. ඉතින් ඒ ගැන කතා කරන්න ගියොත් ගොඩක් දේවල් කතා කරන්න තියෙනවා නගරාධිපතිතුමා. දැන් පොල් කටු, අපි දන්නවා දැන් පොල්කටු මෙතෙට එන්න ඉස්සෙල්ලා වැලන්ටයින් එකට එනවා. එතනට ගියාම නියම මිල හම්බවෙනවා පොල් කටුවෙ. මෙතනට ආවාම ඒ මිල නැහැ. ඒ නිසා අවධානය යොමු කරන්න ඕන

**ගරු නගරාධිපති - ජේ. ටී. නිශාන්ත ප්‍රනාන්දු මහතා**

අපි අවධානය යොමු කරමු. ඔබතුමන් කියන දේ මම පිළිගන්නවා. නමුත් මතක තියාගන්න අපේ වාහන, අපේ ඉන්ධන, අපේ සේවකයෝ, අපේ අපි, අපේ අතිකාල මම කියන්නේ අපි ඒක්කොම දීලා එතනට මාසෙකට ගෙවලා අපිට සෝරල දෙනවා. එතකොට ප්‍රශ්නයක් තියෙනවා සාධාරණත්වයක් තියෙනවා අපේ සේවකයටත් ඉතිහාසින් කියන් හරි අඩු ප්‍රමාණ අතනට අනාගතින් මෙතනට ගෙනත් දෙන්න. ඉතින් අපි ඕන එයාට ඒත්තුගන්නන්න ඕන.

**මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. සමිත් දුමින්ද පීරිස් මහතා**

ඒ කොහොමත් වුනත් ඇත්තටම යුක්ති සාධාරණ මට්ටම අවුරුදුවෙන් නගරාධිපතිතුමා. මේක කෙරෙන්නේ නැහැ එහෙම වුණාම. ඒ අය වැඩි මිලක් හම්බෙනන තැනට තමයි දෙන්නේ. අපිට පුළුවන් වෙනම ලාභයක් ලබන්න හරි තැන තෝරන් විකුණුම්කරණය කරන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කෙටියෙන් සෞඛ්‍ය කමිටුව යන තැනදී විශේෂයෙන්ම කාණු කණ්ඩායම පිළිබඳ මට අදහසක් පළ කරන්න ඕන. කාණු කණ්ඩායම අපි දන්නවා සාමාන්‍යයෙන් කාණු කණ්ඩායම තියන්නේ ගරු නගරාධිපතිතුමනි, එළිපෙහෙළි සේවය කරන, එළියේ වැඩ කරන අව්ව වැස්ස මේ සියල්ලට සේවය කරන පිරිසක් දැන් මේ අය සාමාන්‍යයෙන් ගත්තොත් උදේ ඉඳලා හවස් වෙනකන් වැඩ කරන්න කිව්වොත් නගරාධිපතිතුමනි ප්‍රායෝගිකව ඒ අයට වැඩ කරන්න අමාරුයි. මොකද කම්බහෙල්ල වැඩ කරන ස්වභාවය කාණු මඩ එක්ක ඉන්නේ. එතකොට දැන් මම දන්න විදියට ඔවුන්ට කියලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි, හවස් වෙනකන්ම ඉන්න කියලා. ඉතින් මේ පිළිබඳව මම ඉල්ලීමක් කරන්නේ දැන් ෆෑන් එකක් යට ඒසී කාමරයක් යට ඉන්න කෙනෙකුට පුළුවන් උදේ 8 ඉඳලා සවස 5 වෙනකන් ඉන්න. දැන් මේ එළියේ වැඩ කරන කාණු මඩත් එක්ක හැප්පෙන අය. ඒ අයගේ 12, 1 වෙනකොට ඒ අයගේ ඇඟපත වල ශක්තියත් ඉවර. ඉතින් ඒ වගේ අයට සවස 4,5 වෙනකන් ඉන්න කිව්ව ඇඟලේ ගරු නගරාධිපතිතුමනි, ඒ අයට සෞඛ්‍ය ගැටලු මොකද ඒ අයට සෝදගන්නවත් සෞඛ්‍ය පහසුකම් නැහැ. මම මේ කියන්නේ වේලාසනින් යන්න කියන එකවත් ඒගොල්ලන් නැතිනම් අනිත් අයට නැති වරප්‍රසාදයක්වත් දෙන්න කියලා නෙවෙයි. නමුත් ප්‍රායෝගිකව නගරාධිපතිතුමනි, මම ඇස් දෙකෙන් දැක්ක දේ මේ කියන්නේ. ඒ අයට යම්කිසි ඉලක්කයක් දීලා මේ ප්‍රමාණයේ ඉඳන් මේ ප්‍රමාණය දක්වා අපි දන්නවා සාමාන්‍යයෙන් පැය 7, 8 ක් වැඩ කරන්න පුළුවන් ඉලක්කයක් දීලා ඒ අයට ඒ ඉලක්කය සම්පූර්ණ කිරීමට පස්සේ ඒ අයට යම්කිසි විදියක සහනයක් ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා නගරාධිපතිතුමනි. එහෙම නොවුණොත් ඒ අය ඉතාමත් අසරණ විදියට තැන්තැන් වල මොනවාද සත්තු වගේ කාණු ගැට්ට උඩ වැටිලා ඉන්නවා, රෝස්තා උඩ වැටිලා ඉන්නවා ඒ වගේ ස්වභාවයක් තියෙනවා. මම මේ කතා කරන්නේ විශේෂයෙන්ම එරන්ද සහෝදරයාගේ කාණු කණ්ඩායම ගැන ඉතින් ඒ නිසා යම් සානුකම්පිත බැලීමක් ඔවුන්ට සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න එන්නත්කරණය. ඒ සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**2025.06.27 දිනැති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06 (5) 2025.06.27 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. මිහිඳු හර්ෂණ අකමීමනතාන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අර ද සොයිසා ක්‍රීඩාංගනයේ ටිකට් එක සම්බන්ධයෙන් මොකක්ද ඒ ගැටලුව කියලා පොඩ්ඩක් මට කියන්නකෝ. ඒ ටිකට් එක නාරනාවාද? මොකද අපිට මේ පැමිණිලි තියෙනවා. එතකොට අපි සල්ලි දීලා බුක් කරන්න ඕන.

<u>ගරු නගරාධිපති - එස්. බී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව තවම අවසන් තීරණයක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. ඉන්දික දමියන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ අවස්ථාව වනවිට නමුත්තාන්ගේලා කට්ටිබද්ද ඇවිදින මංතීරුවේ අලුත්වැඩියා කටයුතු අරන් අරන් තියෙනවා. ඒ පාර එහෙම අඳින්න. ඒකට ස්තුතිවන්ත වෙනවා. නමුත් එතන දිනපතා ඇවිදින පුද්ගලයෙකු විදියට ඒ වගේම තව මන්ත්‍රීවරු කිහිපදෙනෙකුත් එහි ඇවිදිනවා. මේ ඇවිදින මංතීරුව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද කුඩා නිවාස ප්‍රමාණ වල ජීවත් වන ජනතාව ඊයකන් හමිටි උදේ සවස දවස් ගාණක් ඕක ප්‍රයෝජනයට ගන්නවා. එතනදී දැන් අර ගල් මතුවෙලා ඒ මංතීරුවේ ඇවිදගැනීමේ අපහසුතාවයක් තියෙනවා. ඒ නිසා එයට ක්‍රමවත් පිළිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලීමක්

කරනවා. ඒ පාසි ටික අදින එක කරලා තියෙනවා. නමුත් ඒ බංකු ටික තවම නිසිලෙස සකස් කරලා නැහැ. ක්‍රමික්‍රමයෙන් තමයි කොරෝන්න ඕන අවධානයයොමු කරනවා සහ එතන මම උදේ කතා කරලා තිබ්බා අපේ තරුණ කණ්ඩායම් ඉන්නවා ඉතාමත් අශෝභන ලෙස හැසිරෙනවා. අපේ මේ ආරක්ෂක අංශය දැඩිව ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒ අයට ශක්තියක් නැහැ ඒ නිසා පොලිසියක් පිටිපස්සෙන් ඉඳලා මේ ඇවිදීමේ මංතීරුව සකස් කරන්න ක්‍රමවත් වැඩපිළිවෙළක් හදන්න කියන ඉල්ලීම කරන ගමන්ම මම දන්නවා පසුගිය කාලසීමාව පුරාම සමහරක් මේ නගර සභාවේ උදවියගෙන් අනුමැතිය, ඇතිව සහ නැතිව අය සමහරක් අය ඕනෑතා තිබෙන විදියට කපලා නැත් තැන්වල ගස් කපාගෙන යනවා. ඒක අප ලේඛියට එදනවා. සමහර තැන්වලදී ස්වේච්ඡා සංවිධානත් ඇවිල්ලා. පහත් තීම සංවර්ධනයෙන් අපිට ලබලා දෙනකොට ඒ අය ප්‍රමිතියක් ඇතිව තමයි මේ ගස් වැවීම සිදු කළේ. දැන් අප් වැට දිගේම ගස් වවාගෙන යනවා. අකාඩමික් හිතලා බලන්න අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා කදවල පසෙරම මේ ඒ අය ඇවිදීමේ මංතීරුවක් තියෙනවා. දෙපැත්තෙන්ම ගස් වවලා අද ගහක් පේන්නේ නැහැ වැටක් පේන්නේ නැහැ. ඒක ඉතාමත් අශෝභන තත්ත්වයක් සහ එතකොට යන්තුත් අපහසුව ඇති වෙනවා. ඒ නිසා මේක ක්‍රමවත්ව ගස් වැවීමේදී සීමා කරලා අවශ්‍ය තැන් වල පමණක් සිදු කරන්න. ඇතුව මම ක්‍රමයේ සං මිනන්ගේ ප්‍රමාණවත් වෙයි. නව ඉදිරියේ දී එහෙම වෙනවානම් තීරණයක් ගන්න කියලා ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සම්පත් සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ක්‍රීඩා කමිටුවේ 04 අපේ රවීන්ද්‍ර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනා ඉතාම අගය කරනවා. අපි පාලනය කරන සභාවේ මම හොඳින් උත්සාහ කළා ක්‍රීඩාපිටිය ඉතාම දියුණු ක්‍රීඩා පිටියක් බවට පත්කරන්න. මුලින්ම අපි මැදිහත්වෙලා විවිධාංගගත මුදල් වලින් ක්‍රීඩාපිටියට මැටි හොඳලා සලාත් සහ මන්ත්‍රීතුමා රෝමෙිස් විජේරත්න මැතිතුමා එතුමාගේ ප්‍රතිපාදනත් අරගෙන අපි මේය සම්පූර්ණ මැටි අසාදලා මේ ක්‍රීඩාපිටියේ ක්‍රීඩා කරන්න පුළුවන් තත්ත්වයට ගෙනාවා. ඊට උම්තරට නගර සභා අරමුදල් වලින් ක්‍රීඩා නැරඹුම් මණ්ඩපයක් හදලා ඒකත් අපිට ඉවර කරගන්න බැරි වුණා. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ විශාල වශයෙන් වැඩක් කරන්න තිබුණ තත්ත්වේ තමාතන්ද කියලා ඔබතුමාට පැහැදිලි ඇති. ඒ බාධක මැද්දේ මේ කටයුත්ත අපි කරලා දැන් මේ වෙනකොට ක්‍රීඩාපිටියක් සහ පැවිලියන් එකක් හදලා තියෙනවා. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රදේශ වල ළමයි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමේ ප්‍රවණතාවය වැඩියි. ක්‍රීඩකත්වයට හැකි ඉක්මනින් කරන්න අපේත් සහයෝගය රංගන මන්ත්‍රීතුමාට ලබා දෙනවා. මේ ක්‍රීඩාපිටිය අංග සම්පූර්ණ ක්‍රීඩාපිටියක් බවට පත්කිරීමට ඔබතුමාගේ සහයෝගයත් ඉල්ලනවා.

**2025.06.27 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06 (6) 2025.06.27 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.06.27 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06 (7) 2025.06.30 දින පැවති වලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2025.06.30 දින පැවති වලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06 (8) 2025.06.30 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමින්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේ දැන් මේ වෙනකොට ව්‍යාපෘති 13 ක් ව්‍යාපෘති සම්මත වෙලා ඇස්තමේන්තු කරලා අද මේ මුදල් කමිටුවටත් එනවා. මම හිතන්නේ සභා අරමුදලින් තමයි මේ ව්‍යාපෘති 13 ම කරන්නේ. නමුත් ඔබතුමන්ලා මේ ව්‍යාපෘති 13 පිළිබඳව අවබෝධයක් තියෙනවාද? ස්ථානීය පරීක්ෂා කළාද?

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදර්ශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, බහුතරයක් තියෙන්නේ සභා අරමුදල් නෙවෙයි. බහුතරයක් තියෙන්නේ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන්. ඒ කියන්නේ පළාත් සභා සහ විමධ්‍යගත ප්‍රතිපාදන වලින් ආව වැඩසටහන්

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමින්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ ව්‍යාපෘති ටික වෙනයි. 07 (1) තියෙන ව්‍යාපෘති වෙනයි. එහි තුන්කෝටි අසූනවලක්ෂයක වැඩ කොටසක් කෙරෙනවා. මම හිතන්නේ ලක්ෂ 389ක සභා අරමුදල් තියෙනවාද කියන ප්‍රශ්නයක් තියෙනවා. මෙය සභාවට කරගෙන යන්න පුළුවන්ද කියලා ප්‍රශ්නයක් තියෙනවා. තුන්කෝටි අසූනවලක්ෂයක 07(01) සිට ව්‍යාපෘති 13ක් ඇස්තමේන්තු කරලා අද මුදල් කමිටුවට යොමු කරලා තියෙනවා. අද ඉඳලා ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්. නමුත්, මේවා පිළිබඳව ඔබතුමාලාට අවබෝධයක් තියෙනවාද? මෙය නිලධාරීන් පාලනය කරන කාලේ කරපු ඇස්තමේන්තු කිරීම්. ඊට වඩා දැන් රංගන මන්ත්‍රීතුමා කොන්ස්ටන්ටයින් ලේන් එක විශාල වශයෙන් යටවෙනවා. ඊළඟට ශ්‍රමදාන මාවත ගත්තත් එතනත් විශාල ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමන්ලා හඳුනාගත් ව්‍යාපෘති මම හිතන්නේ නැහැ අනිවාර්ය ඇති කියලා. ප්‍රායෝගිකව මේ වෙලාවේ මිනිස්සුන්ට අවශ්‍ය දේවල් ටිකක් තියෙනවා. මහජනතාව පීඩනයට ලක්වෙන ගොඩක් කරුණු මේ වෙලාවේ මේ වට්ටුව තුළ පවතිනවා. ඉතින් මේ කෝටි තුනයි අසූනවලක්ෂයක වැඩ කොටසක් කෙරෙනකොට මේක මම හිතන්නේ මීට වඩා ප්‍රායෝගිකව මේ ඇස්තමේන්තු සම්මත වුනත් වෙනස් කරන්න පුළුවන්. මම හිතන්නේ ප්‍රායෝගික වැඩකොටසක් කරන්න මේ වෙලාවේ උචිත වැඩකොටසක් හඳුනාගෙන කරනවානම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, 07 (11) යෝජනාව අපේ මේ සමින්ත මන්ත්‍රීතුමා කිව්වා වගේම වචනය කිරීමක් කරන්න එපා. මොකද කාලෝතුපිටිය පාර මම අවුරුදු 05 කට කලින් දැම්මා යෝජනාවක්. එය නැවත නැවතත් දැම්මා. ඒකට වෙන් කරපු මුදල් ජනතාව බලාපොරොත්තු සහගතව බලන් ඉන්නවා. ඒ පාර වෙනස් කරන්න එපා ඒ පාර ඉදිකරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාට හදිස්සි වුණොත් කරන්න දෙයක් නැහැ අපිට කතා කරන්න වෙනවා. මෙතෙක් ඔබතුමා පොඩ්ඩක් බලන්න ඕන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැටියට මේ නවක මන්ත්‍රීවරුන්ට පොඩ්ඩක් යෝජනාවක් දාන විදිය එහෙම කියලා දෙන්න ඕන. මම අවධානය යොමු කරනවා තුන්වෙනි කරුණ මේවා හදපුවේ නැතිනම් නැඟෙන්නේ නැහැ. ඒ නිසා ඒගොල්ලන්ට කියන්න පොඩි වරදක් වුණොත් එහෙම. තුන්වෙනි කරුණේ දාලා තියෙන්නේ තුසිත මන්ත්‍රීතුමා, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ කතා වූ කොන්ක්‍රීට් සිලින්ඩර යොදා හෝ වෙන ක්‍රමයකින් හෝ හැකි ඉක්මනින්ම නගර සභා අරමුදල් යොදවා මේ ජනතාවට පහසුවක් ලබා දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි. මෙහෙම යෝජනා දාන්නේ නැහැ. අනික සංවර්ධන කමිටුවේ ඒවා මෙහෙට දාන්නේ නැහැ. මෙහෙම යෝජනා දාන්නේ නැහැ. යෝජනා ලියන විදිය ඔබතුමා ටිකක් කියලා දෙන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට. එතුමාම දාලා තියෙනවා 04 වෙනි කරුණ මෙම තත්ත්වය තිරසාර ජලය නතර කිරීම සඳහා කාණු පද්ධතිය කොළඹට ගලියන් සැදිය යුතු බව එම කොටසකට අදාළ

ඔෆිසර් මහතාගේ යෝජනාවයි. මම මේ කියන්නේ අභිප්‍රායක් නිසායි, ගරු මන්ත්‍රීතුමාලා යෝජනාවක් ඉදිරිපත් කරනකොට මේ යෝජනා හරිහමං ප්‍රතිපත්තිමය වෙන්න ඕන. මෙහෙම ලියන්න බැහැ. මෙහෙම දාන්න බැහැ. එයින් මෙම ස්ථානය ඔබගේ පරීක්ෂණයට භාජනය කර සුදුසු පියවරක් හැකි ඉක්මනින් ගන්නා ලෙස කාරුණිකව දැනුම් දෙමි. ඔබගේ තීරණය මට හැකි ඉක්මනින් දැනුම් දෙන්නට කාරුණිකවන්න. ගරු නගරාධිපතිතුමිය, අපි ඇයව මෙහෙම අපහසුතාවයට පත්කරන්න එපා. මේ යෝජනා හැමතැනටම යනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධයෙන් පොඩි අවබෝධයක් ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. න්‍යායපත්‍රයේ 07 (1) මම අවධානය යොමු කරනවා. කොළඹ මහා නගර සභා පරිශ්‍රයේ අංක 02 ගොඩනැගිල්ල ඉහළට අලුත්වැඩියා කටයුතු සිදුකිරීම. මේවා කරලද තියෙන්නේ කරන්නද තියෙන්නේ. මොකක්ද අංක දෙකේ ගොඩනැගිල්ල කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුමේධ් ඉන්දුජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමිය, උප නගරාධිපතිතුමිය ඉන්න කොට්ටෙ එහා කෙළවර කොටස මම කියන්නේ. පාර්ටිමේන් කාරපු එක.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමිය, ගරු නගරාධිපතිතුමිය මම ඔබතුමියව යොමු කරනවා 11 වන කරුණට. මම හිතන්නේ ඒ කරුණ දාලා තියෙන්නේ ගරු සභාපතිතුමා. කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දැනට පවතින උපකරණ සහ උපකරණ, වාහන පිළිබඳ වාර්තාවක් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමින් කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ඇති අංශවල රාජකාරි කරන සියලු සේවකයන්ගේ නාම ලේඛනය සහිත පූර්ණ වාර්තාවක් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීම. මේක බොහෝම හොඳයි. ඉතින් මේවා සභාපතිවරයා හැටියට කමිටුවට දාන්න ඕන නැහැ. ඔබතුමාට බලය තියෙනවා එකවෙලේ ගෙන්නලා ගන්න. ඒ නිසා මම ඔබතුමියගේ අවධානය යොමු කරනවා මොකද මේවා කමිටුවට දාන්න ඕන දේවල් නෙවෙයි. ගරු නගරාධිපතිතුමිය 13 වෙනි කරුණ සම්බන්ධව මගේ අවධානය යොමු කරනවා. ඒ අනුව ගරු අයිතිකරු විසින් එම කටයුත්ත ප්‍රතික්ෂේප කර හෝ පැහැර හරින්නේනම් මහා නගර සභා ආඥා පනතේ 136 (02) උප වගන්තිය යටතේ එම කාර්යය ඉටුකරන්න ලැබිය හැකි අතර එම කටයුතු සභාව විසින් ඉටුකර ඒ සඳහා දරණ ලද වියදම් සභාවට අයත් බදු මුදලක් ලෙස අදාළ නැනැත්තාගෙන් අයකර ගත හැකි බව සඳහන් කර ඇත. දරණ ලද වියදම් සභාව අයවීම සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් නොමැති වීම. ඒකේ ඒ විත තියෙනවා. උක්ත කරුණ සලකා බැලූ කමිටුව අනුකූලදායක ගේ සම්බන්ධව ගත හැකි පියවර සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 136 (02) උප වගන්තිය යටතේ එම කාර්යය කරගනු ලැබිය හැකි අතර, එම කටයුත්ත සභාව විසින් ඉටුකර, ඒ සඳහා දරණු ලබන වියදම් සභාවට අයත් බදු ලෙස අදාළ නැනැත්තාගෙන් අයකර ගැනීම සඳහා ගත හැකි පියවර සම්බන්ධයෙන් නීති නිලධාරී වාර්තාවක් කියලා තියෙනවා. ගරු නගරාධිපතිතුමිය, මට අමතක් තියන පෙරලුව කමිටු අනුකූලදායක ගේ සම්බන්ධයෙන් මෙහෙම කල් ඇද්දලම නගරාධිපතිතුමා, හදිස්සියේ බොහොමහරි ඩිඟෙහාන් එහෙම ඒ නිසා මේවා මේ වාර්තා ඉල්ලල ඉල්ලල නොවෙයි මේක කරන්න ව්‍යවස්ථාවෙන් බලය තියෙනවා. ඒ නිසා ඒ වැඩේ කරන්න එම අනුකූලදායක ගේ කියන්නේ මෙන්පටී.

ගරු නගරාධිපතිතුමිය, ඔබ පත්වෙන්නේ නගරාධිපතිවරයා හැටියට තව සභා වාරයේ ගිය මාසේ දෙවෙනිදා. එතකොට අපි කියන දේවල් වැරදියටම තේරුම් ගන්න එපා ඔබතුමියලා. හැබැයි ඔබතුමිය නගරාධිපතිවරයා ලෙස පත්වුණාම කළමනාකරණ කමිටුව කියන එකේ බලය ලැබෙනවා. කළමනාකරණ කමිටුව ගන්න තීන්දු ඔබතුමා පත්වෙනකොට තිබුණානම් ඒ තීන්දු ඔබතුමා එක්ක සාකච්ඡා කරලා ඒවා අදාළ ස්ථාවර කමිටු වලට යොමු කරලා ඔබතුමාට කියලා ස්ථාවර කමිටු වලට දාගන්න ඕන. එහෙම නැතුව කළමනාකරණ කමිටුව ඉදිරියට ගෙනියන්න බැහැ. මහා නගර සභා ආඥා පනතේ කළමනාකරණ කමිටුව ගැන මුකුත් සඳහන් කිරීමක් කරලා නැහැ. හැබැයි මහා නගර සභා ආඥා පනතේ ස්ථාවර කමිටු ගැන සඳහන් කරලා තියෙනවා. එතකොට කළමනාකරණ කමිටුවෙන් ගන්න තීන්දු තීරණ ගන්නේ නාගරික කොමසාරිස්වරයා හෝ වර්ය

තමන් බලය පාලනය කරන අවධියේ තමන්ගේ පාලන පහසුව සඳහා යොදා ගන්නා වූ කමිටුවක් තමයි කළමනාකරණ කමිටුව කියන්නේ. නමුත් මම කර්මාන්ත කමිටුවේ සහ මුදල් කමිටුවේ කළමනාකරණ කමිටුවේ තීන්දු කිහිපයක්ම දාලා තිබුණා. එහෙම තීන්දු ගන්න විදියක් නැහැ. දැන් බලන්න මේ රාවතාවත්ත පොදු සුසාන භූමිය තමයි ඇමුණුමක් විදියට තියෙනවා. රාවතාවත්ත පොදු සුසාන භූමිය පිහිටි ඉඩම අවමංගල ශාලාවක් ඉදිකිරීම 2025.01.16 දින පරිපාලන කමිටු වාර්තාවේ සඳහන් පරිදි රාවතාවත්ත පොදු සුසාන භූමිය පිහිටි ඉඩමේ මහා සංඝ නැත්පත් කිරීමේ ස්ථානයක් අවමංගල ශාලාවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මම කියන්නේ ඔබතුමා එදා අපි කතා කළා ඒක ක්‍රියාත්මක කරගන්න අමාරුයි කියලා. ඇත්තටම මිනියක් වළලන්නවත් විදියක් නැහැ. ඉතින් ශාලාව එකක් හදන්න තියා මම හිතන්නේ හැරෙන්නවත් ඉඩක් නැහැ දැන් රාවතාවත්ත පොදු සුසාන භූමියේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ කළමනාකරණ කමිටුවෙන් ගත්ත තීන්දු තීරණ කිහිපයක් මුදල් කමිටුවේ කර්මාන්ත කමිටුවේ තියෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ පෞද්ගලික අවධානය යොමු කරන්න. මම දන්නා කළමනාකරණ කමිටුව නැවත වරක් පත්කරලා තියෙනවා ඔබතුමා විසින්. ඒවා නීත්‍යානුකූල නැහැ නගරාධිපතිතුමනි. ඔබතුමාට කළමනාකරණ කමිටුව කැඳවන්න පුළුවන්. ඒකේ අපිට තර්කයක් නැහැ. ඒකේ අයිතිය තියෙනවා ඔබතුමාට. නමුත් ඒක නීත්‍යානුකූල කමිටුවක් වෙන්නේ නැහැ. මේ ශාලාව ඒක සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, මෙය කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. සිසුද හර්ෂණ අබේසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇමුණුමට දාලා තියෙනවා අත්සන් ලේඛණ වගයක් අපරාදෙනේ කොළ යනවානේ.

<u>ගරු නගරාධිපති - ශේ. බී. නිශාන්ත පුෂ්පානන්ද මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ නවක මන්ත්‍රීවරු ගොඩාක් දේවල් ඉගෙනගන්න වෙනවා. ඒ කියන්නේ චීනන්නම් අනිවාර්යයෙන්ම වෙනවා. හැම මන්ත්‍රීවරයාම අලුත ආපුගමන් සියල්ල ඉගෙනගෙන නෙවෙයි වැඩ කළේ. අතපසුවීම් වැරදීම් ගොඩක් සිද්ධ වුණා. නමුත් දැන් මේ අත්දැකීම් ඇති මන්ත්‍රීවරු පෙන්නලා දෙනකොට ඒ ගැන සැලකිලිමත් වෙන්න. එතකොට අපිට මේ තරම් කාලය ගන්න ඕන වෙන එකක් නැහැ. තමන් හොඳින්නම් දන්න අංශයක් ඇතුළට කිසිදු බාධාවක් නැහැ. තමන්ගේ කාර්යභාරයට අමතරව ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. නිලධාරීන්ගෙන් විමසීමක් කළාට කමක් නැහැ. ඒ නිසා මම දන්නා සුජිත් මන්ත්‍රීතුමා පෙන්නලා දීපු කාරුණු ඇත්තටම තිබුණා. ඉදිරිපත් කිරීම් පැටලුම් සහගතයි. අරමුණක් යහපත්කමක් තියෙනවා. නමුත් ඒක කියව ගන්නකොට පැටලුම් සහගතයි. ඉතින් ඒ නිසා ඒ පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**2025.06.30 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් ඒකමතිකව සභා සම්මත විය.**

**06 (9) 2025.07.01 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ විශේෂයෙන් කියන්න තියෙන ඔබතුමා මේ කාලය සම්බන්ධයෙන් අප්‍රසාදයට හිතන්න එපා. මොකද පත්වුව අපිට එක දවසයිනේ තියෙන්නේ. අපි ඒ මාසයේ ඒ දවසේ දේවල් ටික තමයි අපි කතා කරන්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් මහාමහා ගෞරවයෙන් ඉල්ලනවා අපිට කතා කරන්න තියෙන දේවල් ටික කතා කරන්න දෙන්න. ගරු නගරාධිපතිතුමා, අංක 04 (3) 4 කාරුණ, නාගරික ඉංජිනේරු විසින් කර්මාන්ත පිළිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කරන ලදුව මුදල් කමිටුව වෙත යොමු කරන ලද පහත සඳහන් කරුණු සලකා බැලීම දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති ශේෂය වැඩසටහන කියලා විස්තර කරලා තියෙනවා. එනම් 04(3) 1, 04(3) 2, 04(3) 3, 04(3) 4, 04(3) 5, 04(3) 6, 04(3) 7, 04(4) , 04(5), 04 (6 ), 04(6) 1, 04(6) 2, 04(6) 3, 04(6) 4, 04(6) 5, 04(6) 6, 04(6) 7, 04(6) 8, 04(6) 9.

04(6) 10, 04(6) 11 ගරු නගරාධිපතිතුමිනි, මේ කර්මාන්ත කමිටුව පළමුවෙනි කර්මාන්ත කමිටුව. කමිටුවක් නීත්‍යානුකූල වෙන්නනම් ඒ කමිටුව මහා සභාවට ඇවිල්ලා සම්මත වෙන්න ඕන. මෙතන තියෙන්නේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත මුළු මුදල වන අදලක්ෂ තුන්දහස් හයසිය හැත්තෑනමයයි පහ හැත්තෑපහක මුදල අනුමත කිරීමට නිර්දේශ කරන ලදී කියලා මුදල් කමිටුවට දාලා තියනවා සම්මත වේවා. මේ එකක්වත් නීත්‍යානුකූල නැහැ. මුදල් කමිටුවට එන්න බැහැ.කර්මාන්ත කමිටුවේ අනුමත වුනාට පස්සේ තමයි ලබන සැර මුදල් කමිටුවට දාන්න ඕනා. එහෙම නැතුව කර්මාන්ත කමිටුවයි මුදල් කමිටුවයි එකට අනුමත කරන්න බැහැ. මේ සියලු දැක්කාවෙන්නෙ ඒක කර්මාන්ත කමිටුව හරහා මහා සභාවට යොමු වෙලා,මහා සභාවෙන් අනුමත වෙලා ඊට පස්සේ තමයි මුදල් කමිටුවට යොමු වෙන්නෙ. ඇස්තමේන්තුවත් කර්මාන්ත කමිටුවෙන් නිර්දේශ කරාට ඒක මහා සභාවේ අනුමත වෙනවාද නැද්ද කියන එක අවබෝධයක් ගන්න බැහැ. සාමාන්‍යයෙන් මොනාහරි හේතුවක් නිසා ඒ අදාල ඇස්තමේන්තුව මහා සභාවේ අනුමත නොවෙන්න පුළුවන්. එහෙම වුණොත් මුදල් කමිටුවට දාන්න බැහැ.ඇස්තමේන්තුව අනිවාර්යයෙන්ම මහා සභාවේ අනුමත වුනාට පස්සෙ තමයි මුදල් කමිටුවට දාන්න වෙන්නෙ. ඒ නිසා ඔබතුමාට මතක් කරනවා මේ සියලු කරුණු නීත්‍යානුකූල නැහැ.

ගරු නගරාධිපතිතුමිනි, විලනට 05 වන කරුණ, ආවරණ අනුමැතිය විසිහතක් ඔබතුමා දාලා තියනවා. ආවරණ අනුමැතියට අපේ විරුද්ධත්වයක් නැහැ. අපි කැමතියි. සමහර ඒවා කිසිම ප්‍රයෝජනයක් නැහැ ආවරණ අනුමැතියක් දෙන්න. සමහර ඒවා අවශ්‍යයි. ආවරණ අනුමැතිය අවශ්‍ය නැති ඒවා ගොඩාක් තියනවා. ඔබතුමා නගරාධිපති වෙන්න කලින් දාපු වියදම් ඔබතුමා ආවරණ අනුමැතියෙන් අනුමත කරලා තියනවා. ඒ නිසා හරි පරිස්සමෙන් වැඩ කරන්න වෙනවා. මම ඊයෙත් ගියා රසායනාගාරය බලන්න. ජනවාරි මාසයේ හත්වෙනිදා ඉඳලා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ෆුල් බ්ලඩ් කවුන්ට් බලන්න කෙමිකල් එක අද දවසේ ගේනවා කිව්වා. රුධිරයේ සීනි ප්‍රමාණය බලාගන්න විදියක් නැහැ. ඊයේ කතා කරලා ඇණවුම්පත යවනවා කිව්වා. මෙය ආවරණ අනුමැතියත් ඔබතුමා දීලා තියනවා. මම ඉල්ලීමක් කරනවා ඒ වැඩේ ඉක්මනට ක්‍රියාත්මක කරන්න කියලා. අංක 19 කරුණ රාජ්‍ය සේවා පුහුණු, නගර සභාවේ පුහුණු ගැන ඔබතුමා අධීක්ෂණය කරන්න. නිලධාරීන්ට කැමති මිනිසුන්ව විතරයි පුහුණුවට යවන්නෙ. අවශ්‍ය නැති මිනිසුන්ව යවන්නෙත් නැහැ. පුහුණුවට නම් දාලා තිබ්බත් පුහුණුව පැවැත්වෙන දිනය දැනුම් දෙන්නේ නැහැ.නගර සභාවේ මුදල් වියදම් කරන පුහුණු නිසා හැමෝටම එකසේ යන්න ඕනා. සමහර සේවකයන්ට ප්‍රමාණකාර අසාධාරණකම් සිදුවෙනවා නිළධාරීන්ගෙන්. ඔබතුමා අලුත් නගරාධිපතිවරයෙක්. අපි මේ ඔබතුමාට පුනපුනා කියන්නේ සේවකයන් බලාපොරොත්තු වෙනවා ඔබතුමාගෙන් සාධාරණ දෙයක් සේවකයන්ට ලැබෙයි කියලා. ඒකයි අපි හරහා මේ දේවල් කියන්නේ. අනෙක් එක පුහුණු බාරදීලා තියෙන්නේ තොරතුරු තාක්ෂණ අංශයට, ඒක කෙරෙන්න ඕනා ආයතන අංශයෙන්, නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයෙක් නැහැ. ලේකම්තුමා තමයි නියෝජ්‍ය නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බලන්නෙ. ලේකම්වරයෙක් කියන්නේ නගර සභාවේ අතිවිශාල වැඩ කොටසක් තියෙන තනතුරක්. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා නියෝජ්‍ය නාගරික කොමසාරිස්වරයෙක් ගන්න කියලා. ලේකම්තුමාට වැඩ වැඩියි. අපිට ලේකම්තුමාගෙන් ගන්න ඕනා වැඩකොටස ගන්න බැරුව යනවා.

ගරු නගරාධිපතිතුමිනි, අංක 21 කරුණ තාප්පය සම්බන්ධයෙන් දාපු හාරසිය රුපියල් දාහත්දහස් පන්සියයක් කඩුව අනුමැතියට ඉදිරිපත් කරනවා කියලා තියනවා. හැබැයි කමිටුවේදී ඒ සම්බන්ධව කරුණු කියන්නම් එයට අවශ්‍ය කටයුතු කියන්න පුළුවන්.විලයට ද්‍රව්‍ය ප්‍රතිදාන පහසුකම් මධ්‍යස්ථානය සම්බන්ධව මිනුම්පත් ඇගයීම පරීක්ෂණ විසින් ඉදිරිපත් කරලා තියන වාර්තාව. ඒ සම්බන්ධයෙන් ගැනුම්කරුවෝ නැහැ.ඒක ප්‍රශ්නයක්. මෙච්චර විකිණිලා නැහැ. ඒක නිසා සල්ලි එන්නෙ නැහැ. 25(1) කරුණ නාගරික ගණකාධිකාරීගෙන් දැනගන්න දෙයක් තියනවා. බැංකු ශේෂය සහ අයිරා පොළිය සහ ජංගම තැන්පත් පොළිය 2025.04.30 දින මුදල් පොත අනුව බැංකු ශේෂය එක්කෝටි දහනවලක්ෂ හැත්තෑනමදහස් හාරසිය පනස්එකයි. 2025.05.31 දෙකෝටි අසූඑක්ලක්ෂ හැත්තෑපන්දහස් පන්සිය හැත්තෑවක අයිරාවක් වෙලා තියනවා. ඒක කොහොමද වෙලා තියෙන්නේ අපි දන්නෙ නැහැ. ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න කියලා ඉල්ලීම

කරනවා. කළමනාකරණ කමිටුවෙන් ගත්ත තීන්දු තීරණ සම්බන්ධයෙන් නැවත වරක් අවධානය යොමු කරන්න කියලා කියනවා. 28 කරුණ නීත්‍යානුකූල නැහැ. මෙහි සඳහන් උපලේඛනයෙන් දැක්වෙන සභා ආවරණ අනුමැතිය යටතේ ඉටුකල ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සභා අනුමැතිය ලබාගැනීමට 2025 ජූනි මස මුදල් කමිටුවට නිර්දේශ සඳහා ඉදිරිපත් කරමි. 2025.06.13 දිනැති කළමනාකරණ කමිටුවේ නිර්දේශ වූ ප්‍රසම්පාදන කමිටුව හා විකල්ප සාමාජිකයින් පත්කිරීම හා ලන්සු විවෘත කිරීමේ කමිටු පත්කිරීම. කියලා කළමනාකරණ කමිටුවෙන් පත්කරලා තියෙන දේවල් ඔබතුමාත් පත්කරනවාද කළමනාකරණ කමිටුවෙන් පත්කරලා තියෙන ඒවාට තමයි මුදල් අනුමත වෙන්නෙ. මුදල් කමිටුවෙන් අනුමත වෙන්නෙ කළමනාකරණ කමිටුවෙන් පත්කරපුවානම් කළමනාකරණ කමිටුව ගත්ත තීන්දුවනම් දැන් ක්‍රියාත්මක වෙන්නෙ නගරාධිපතිවරයා ගන්න තීන්දුව මොකක්ද? මේවා අධීක්ෂණය කරලා හරිද වැරදිද කියලා බලන්න. අංක 29 කරුණ දුම්මාන යන්ත්‍ර දෙකක් අලුත්වැඩියා කරන්න වියදම් රුපියල් එක්ලක්ෂ හතලිස්පන්දහස් හාරසිය අසූවයි.ඒ ගැනත් අවධානය යොමු කරන්න. අංක 29 (03) සිවිලිම් ෆෑන් තුනක් ගෙනල්ලා තියනවා, හයලක්ෂ අසූදහස් තුන්සිය හතලිස්නමයයි සත හැත්තෑපහයි. එකපාර සිවිලිම් ෆෑන් 30 ක් මොන ප්‍රශ්නද නගර සභාවට? ඒස් මැෂින් ගෙනල්ලා තියෙනවා AC මැෂින් 19 ක්. එතකොට විශාල මුදලක්. AC මැෂින් 01ක් ගෙනල්ලා තියෙන්නෙ දෙලක්ෂ තිස්දාහ ගාණේ 16 ක් ගෙනල්ලා තියෙනවා. එක්ලක්ෂ විසිඅටදාහ ගාණේ 03 ක් ගෙනල්ලා තියෙනවා. ඉතින් එතකොට AC මැෂින් 19ක් ගෙනල්ලා. මම කියන්නෙ මෙහෙමයි අවශ්‍ය වෙන්න පුලුවන් හැබැයි මේ නගර සභාවේ සල්ලි නගර සභාවේ වැටුප් ගෙවා ගන්නවත් නොහැකි තත්වයක් තියෙන්නෙ ලබන මාස කීපය තුළ. AC මැෂින් දාන එකද කරන්න ඕන? අපි පුනපුනා කියන්නෙ ඒකයි මේ ගත්තු තීන්දු තීරණ මොනවාද කියලා අහන්නෙ ඒකයි. නගරාධිපතිතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ ඔක්කොම ආවරණ අනුමැතිය යටතේ යන දේවල්. ෆෑන් 30 ගත්තු එකත් ආවරණ අනුමැතියට දාලා. දැන් ෆෑන් 30 ගත්තු එක අරගෙන ඉවරනම් මොකට ආවරණ අනුමැතියට දාන්න ඕනද? සභාව ඉවර වෙනකන් ඉන්න බැරි එකක්ද මේ? මේවා ආවරණ අනුමැතියට දාලා ඔබතුමා අනුමත කරලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කාරුණිකව අවධානය යොමු කරන්න. අංක 29 (5) ඔබතුමා ෆෝන් එකක් ඉල්ලලා තියෙනවා. ඒකත් ආවරණ අනුමැතියට දාලා තියෙනවා. අංක 30 තියෙන්නෙ නාගරික ඉංජිනේරු විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද 2025 මැයි මස සැලසුම් කමිටුවේ මාසික ප්‍රගති වාර්තාව සලකා බැලීම. මේ මොකක්ද කියලා තේරුම්ගන්න බැහැ. මැයි මස පැවැත්වූ සැලසුම් කමිටු වාර ගණන 06 යි. ඉදිරිපත් කළ ලිපිගොනු සංඛ්‍යාව 98 යි. 2025 වර්ෂයේ මැයි මස සඳහා සැලසුම් කමිටු දීමනා ගෙවීම 85,000 යි. ඉන්පස්සේ 2025 වර්ෂයේ මැයි මාසය තුළ පෙරසැරි ගාස්තු ලැබීම් දෙලක්ෂ අනූතුන්දාහයි. 2025 වර්ෂයේ මැයි මාසයේ 1% හා විකුණුම් බදු මුදල් ලැබීම් හාරලක්ෂ හැටදහස් නවසිය විසිපහයි. ඉතින් ගරු නගරාධිපතිතුමා මේ කරුණු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලයට ගෙවපු මුදල් ඉදිරිපත් කරලා තියෙනවා. ඉතින් මේවා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න ඕන. මේවා මම කියන්නෙ මේ කමිටු වාර්තා අපි හරිහැටි කියවුවේ නැත්නම් අපිට ලොකු ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මොකද මීගොල්ලන්ට විගණන විමසුම් බලනකොට අන්තරේ අහු නිරිවැරුණ දේවල් තියෙනවා. අපි මේවාට අත ඉස්සුවා වගේ තත්වෙයි අධිකාර වෙන්න ආවාම.

ගරු නගරාධිපතිතුමනි, සභාවේ පෙට්‍රල් වියදම් දින 16කට ලීටර් .396ක් ගහලා තියෙනවා 2025.05.11 සිට 2025.05.26 දක්වා. ඒ වගේම 2025.05.26 සිට 2025.05.30 දක්වා ලීටර් 217 යි. පෙට්‍රල් 2025.05.31 සිට 2025.06.07 වෙනකන් ආපසු ලීටර් 347 යි. එතකොට මේ පෙට්‍රල් මෙච්චර ප්‍රමාණයක් යන්න මොනවාද පාවිච්චි කරපු වාහන. ත්‍රීවිල් එකයි බයික් මැෂින් එකයි දුවන්නෙ. එතකොට මෙච්චර පෙට්‍රල් ප්‍රමාණයක් යන්න ඒවායින් මොනවද කරලා තියෙන්නෙ. ඒ සම්බන්ධයෙන් කාරුණිකව අවධානය යොමු කරන්න. අංක 36(3) දෙලක්ෂ හැත්තෑඅටදහස් තුන්සිය අනූනවයක් ගෙවලා තියෙනවා. ඒකනම් කමක්නැහැ මොකද හේතුව ඒක ගෙවලා තියෙන්නෙ ආදාහනාගාරයට. ඒකට අපේ එකඟත්වය පළ කරනවා. ඊට පස්සේ හැටදහස්අටසිය පනහක් ගෙවලා තියෙනවා ඔබතුමාගේ උත්සවයට. ඒ උත්සවයේ වෙන්ට පුටු ගන්න. මේ ප්‍රසම්පාදන වාර්තාවේ තියෙනවා 2024.11.25 දිනැති ප්‍රසම්පාදන කමිටු නිර්දේශය අනුව අපිට

ප්‍රශ්නයක් තියෙනවා අවුරුද්දකට උඩදී ප්‍රසම්පාදන කමිටු නිර්දේශය කොහොමද ගන්නේ කියලා 2025.06.02 තිබුණ උත්තරයට. 2024.11.25 ප්‍රසම්පාදන කමිටුව කොහොමද ගත්තේ කියලා. ඉන් පස්සේ තියෙනවා සුපර් ඩීසල් ගහලා තියෙනවා. නගරාධිපතිතුමා සුපර් ඩීසල් ගැහුවේ නැහැ වාහන වලට අපි දැනුවත්ව. එතකොට සුපර් ඩීසල් ගැහුවේ මොකටද කියලා අපිට අවබෝධයක් නැහැ. හැබැයි සුපර් ඩීසල් ගහලා තියෙනවා. ලීටර් 71 දවස් 04කට. 2025.05.22 සිට දින 04කට ලීටර් 5යි. 2025.06.18 වෙනකොට නගරාධිපතිතුමාගේ අනුමැතිය ලැබිලා තියෙන්නේ දින 04කට 71යි. ආපහු දින 04කට 2025.05.26 ඉඳලා 2025.05.29 දක්වා දින 04කට ලීටර් 150යි. ආපසු දින 06කට ලීටර් 250යි. එතකොට එකතු දාලා තියෙනවා 23075 යි, 48750 යි, 81250 යි. එතකොට මේ සුපර් ඩීසල් ගැහුවේ මොනාවටද මෙච්චර සුපර් ඩීසල් වාහන තියනට ගහනවද මෙච්චර ගෙවුවේ කොහොමද කියලා. එතකොට සුපර් ඩීසල් මාසයකට ලීටර් 800ක අනුමැතිය ඉල්ලා තියෙනවා මෙලෙක්ම හැටිදාහක්.

ගරු නගරාධිපතිතුමනි, නාගරික ගණකාධිකාරී විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද අංක 18 ආවරණ අනුමැතිය යටතේ මෙදෙනිකට කුලී පදනම මත කම්කරු ශ්‍රමය සපයා ගැනීම සම්බන්ධයෙන් මම හිතන්නේ ඒක මෑන් පවර් එකට ගෙව්වා එක. ඒක පෙනෙටයි ගැටලුව නගරාධිපතිතුමා මම ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා මට අවශ්‍යතාවය තිබුණේ වාර්තාවේ ඇමුණුම ලෙසට ඉදිරිපත් වෙන යම් කිසිසි දේවල් විතරක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. 2025.06.13 මෙතෙරවුව මහා නගර සභාවේ නව කමිටු රැස්වීම් ශාලාවේදී කළමනාකරණ කමිටුව රැස්වෙලා තියෙනවා. 2025.06.02 දින පැවති ධුර ප්‍රාරම්භ ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාවේ සභා වාරයේ පරිපාලන කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. ඇමුණුම - 12. කමිටුවේ සංයුතිය ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමිය, නාගරික කොමසාරිස්, සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සියලුම අංශ ප්‍රධානීන්. එහි ක්‍රියාකිරීම අධිපාලන නිලධාරී (පරිපාලන). මෙතන අපිට ප්‍රශ්නය තියෙන්නේ කළමනාකරණ කමිටුව කියන්නේ මොකක්ද කියන එක සම්බන්ධයෙන් ගැටලුවක්. මෙතන නීත්‍යනුකූල භාවයක් නැහැ. නමුත් ඔබතුමාට උපදෙස් දෙන්න. ඔබතුමා පරිපාලන කටයුතු සාකච්ඡා කරන්න කියලා තමයි මෙහෙම ලීවලා කියන්නේ. නගරාධිපතිවරයා එක්ක පරිපාලන කටයුතු සාකච්ඡා කරන්න කළමනාකරණ කමිටු ඕනේ නැහැ, ඕනෑම වෙලාවක බලය තියෙනවා ගෙනල්ලා අදාළ නිලධාරීන් එක්ක සාකච්ඡා කරන්න. ඊටපස්සේ තියෙනවා අංක 02. නව සභා වාරය තුළදී මුදල් රෙගුලාසි 136 දැක්වෙන වියදම් සඳහා බලය දීමට අදාළව ඇස්තමේන්තු, ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සහ ගිවිසුම් අනුමැතිය සඳහා බලය මහ සභාව වෙත පැවරෙන පරිදි හා මු.රෙ. 137 පරිදි ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීමේදී රුපියල් ලක්ෂ දහයක දක්වා ගෙවීම් අනුමත කිරීමේ බලය නාගරික කොමසාරිස් වෙත පැවරීමටත්, මේ කළමනාකරණ කමිටුවෙන් පවරලා තියෙන්නේ. නාගරික කොමසාරිස් වෙත පැවරීමටත්, ලක්ෂ දහයකට වඩා වැඩි ගෙවීම් අනුමත කිරීමේ බලය ගරු නගරාධිපතිතුමා වෙත පැවරීමටත් මු.රෙ. 138 දැක්වෙන වියදම් සහතික කිරීමේ බලය එම ගෙවීම් වලට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරා දීමටත්, යන මූලික සීමාවන් ඇතුළත මූල්‍ය බලතල විධිමත් පරිදි පවරා දීම සඳහා සභා අනුමැතිය ලබාගැනීමට අදාළ වාර්තාව සභාව වෙත මුදල් කමිටුවට ඉදිරිපත් කරනවා කියලා තියෙනවා. ඔබතුමා මට කරුණාකරලා පෙන්වන්න මහා නගර සභා ආඥා පනතේ නාගරික කොමසාරිස්ට ලක්ෂ 10 ක් දක්වා අනුමත කිරීමේ බලය ලබාදෙන්න පුළුවන් වගන්තිය මොකක්ද? අපි දන්නේ නැති නිසා අහන්නේ. අපිත් මේක පරිශීලනය කරනවා, කියවනවා, අපිත් යම් යම් දේවල් මේකත් දන්නවා. නමුත් නාගරික කොමසාරිස්වරියට ලක්ෂ 10 දක්වා දෙන්න බැහැ, රු.15,000.00 උපරිම දෙන්න පුළුවන්. ඊට වඩා දෙන්න බැහැ. නමුත් මේකේ තියෙනවා ලක්ෂ 10 ක්. මේ ඔබතුමාට තියෙන බලතල ලක්ෂ 10 දක්වා නාගරික කොමසාරිස්වරියට දෙන්නේ මොනා පනතින්ද? මොකක්ද කොහෙද තියෙන්නේ? කරුණාකරලා අපිට කියන්න. මොකද අපිත් මන්ත්‍රීවරු හැටියට දැනගන්න ඕන ලක්ෂ 10 ක් දක්වා බලය නාගරික කොමසාරිස්වරියට කොහොමද දෙන්නේ කියලා. මේ කමිටුවට ඇවිල්ලා තියෙන නිසා මේ කියන්නේ, මහා නගර සභා

ආඥා පනතේ 32 වගන්තිය මගින් බලතල පවරා දීමට එක් එක් විෂයන් වලට අදාළ බලතල එම විෂයන් භාර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පවරා සුදුසු බවත්.

ගරු නගරාධිපති - ශේ.බී. නිශාන්ත සුදීකාන්ත මහතා

ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී නාගරික ලේකම්තුමාට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

නාගරික ලේකම් - එම්.ජේ.ඩී.ඒ. මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ පනතේ බලතල පැවරීම යටතේ රු.15,000.00 දක්වා ගෙවීම් අනුමත කිරීමේ බලය තමයි නාගරික කොමසාරිස්ට දීලා තියෙන්නේ. ඒක පනතේ පැහැදිලිව තියෙනවා. ඒකෙන් අදහස් කරන්නේ ඊට වඩා වැඩි සියලු ගෙවීම් අනුමත කිරීමේ බලය තියෙන්නේ මේ සභාවට. පිළිතුරට අපේ පනතේ 32 වගන්තියේ තියෙනවා සභාවට පැවරුණු බලයෙන් යම් කොටසක් නගරාධිපතිවරයාට, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ කොමසාරිස්වරයාට පවරලා දෙන්න පුළුවන් කියලා. එහෙකොට ඒකේ අර මූල්‍ය බලතලත් ඇතුළත්ව තමයි තියෙන්නේ. මීට කලින් සභා වලත් දීර්ඝ කාලීනව යම් මූල්‍ය සීමා වලට යටත්ව නාගරික කොමසාරිස්ට යම් ගෙවීම් අනුමත කිරීමේ බලයක් දීලා තිබුණා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, මූල්‍ය බලතල එහෙම පුළුවන් නම් මූල්‍ය බලතල කියලා මෙතන සඳහන් කරලා තියෙනවා. අනිකත් සඳහන් කරන්නේ නැතුව මූල්‍ය බලතල පවරන්න බැහැ. එහෙම කොහොමද කරන්නේ. ඔබතුමිය නීතිඥවරියක්නේ. අනික සඳහන් කරන්නේ නැතුව මූල්‍ය බලතල පවරන්න පුළුවන් ද? එහෙමනම් මූල්‍ය බලතල පවරන්න පුළුවන් නම් මෙතන සඳහන් කරලා තියෙන්න ඕනේ. මට තව වගන්තියක් තියෙනවා කියන්න. මට තේරෙන්නෙත් නැහැ මේක මොකක්ද කියලා. දැන්න කරුණ සළකා බැලූ කමිටුව මහා නගර සභා ආඥා පනතේ 32 වගන්තිය මගින් බලතල පවරා දීමට අදාළව එක් එක් විෂයන් වලට අදාළ බලතල එම විෂයන් භාර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පවරා දීම සුදුසු බව කමිටුව තීරණය කළ බැවින්, මේ කමිටුව කියලා කියන්නේ කළමනාකරණ කමිටුව, තීරණය කළ බැවින් ඒ සඳහා විධිමත් පරිදි සභා අනුමැතිය ලබා ගැනීමට එක් එක් නිලධාරීන් වෙත පැවරීමට අදාළ බලතල සම්බන්ධ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමට නියෝජ්‍ය නාගරික කොමසාරිස් වෙත පැවරීමට කමිටුව නිර්දේශ කරන ලදී. එහෙකොට මේ කමිටුව මොකක්ද මේ? මේ කමිටුව මොකක්ද කියන එකයි ප්‍රශ්නය. තව මෙතන විගණන වාර්තාව තියෙනවා. ඔබතුමාට වෙලාව යන නිසා මම මේක කතා කරන්නේ නැහැ. නමුත් මේවා අපි දැක්කි වෙලා එන්නේ ගරු නගරාධිපතිතුමා, දවස් ගණන් හිඳිමිරලා මේවා කියවන්නේ. අපේ ඇගේ අමාරුවකට නෙමෙයි මේවා කියවන්නේ. ඔබතුමා එක පැත්තකින් සංතෝෂ වෙන්න ඕනා මන්ත්‍රීවරු මේවා කියවලා එනවට. මේ කියවනනේ ඔබතුමා අපහසුතාවයට පත් කරන්න නෙමෙයි, නිලධාරීන්ට ඕනා විදිහට වැඩ කරන්න දෙන්න බැහැ. මොකද අපිත් ඉස්කෝලේ ගියානේ. අපිත් අකුරු දන්නවා මේවා කියවන්න. මේවා කියවලා සටහන් කරන් එන්නේ මොරටුවේ ජනතාව වෙනුවෙන්. ඒ නිසා ඒ අවස්ථාව අපිට දෙන්න. මේ විගණන වාර්තාව සම්බන්ධයෙන් මට කියන්න යන්නේ නැහැ. ගොඩක් දේවල් තියෙනවා විගණන වාර්තාව සම්බන්ධයෙන් කතා කරන්න. කාරුණිකව අපි ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් ඔබතුමාට දැන් වෙලාව යනවා නම් ඔබතුමා මේක කියවලා බලන්න. මේ කන්ත්‍රාව නම් දරුණුයි. ඒ වගේම මූල්‍ය වාර්තාව සම්බන්ධයෙනුත් ලොකු ප්‍රශ්න තියෙනවා. අපි ඒවත් සටහන් කරලා තියෙනවා. වෙලාව යන නිසා ඒවා කියවන්නෙත් නැහැ. අනිත් දවසේ ඒක හදාගෙන එන්න වෙලාව නොමැතිව, වැඩේ හරියට කරන්න. වැඩේ හරියට කරමු එකතු වෙලා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්මි මනීෂා ඔස්කාර් මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, නවක මන්ත්‍රීවරුන් ඉන්න නිසා මම කැමතියි පැහැදිලිව ඒගොල්ලොන්ටත් පැහැදිලි වන විදිහට මේ වාර්තාවෙන් අපි සටහන් කරනවා නම්. මුදල් කමිටුවේ පිටු අංක 20, අංක 23 කරුණ. අපි මොරටුව තැපැල් කාර්යාලයට ලක්ෂයක් ගෙවනවා. එහි කිසිම සඳහනක් නැහැ

මේක කොයි කාලයට ද අයවිත්වෙන්නේ, දවසකට ද මේ ලක්ෂය යවන්නේ? මාසෙකට ද? අවුරුද්දකට ද? ඔබතුමා මේ සියලු දත්තයි අත ඔසවලා එකඟ වෙනවා. නමුත් ඒගොල්ලෝ දන්නේ නැහැ මොනවාද මේ කාල සීමාව කියලා. ඒක සංශෝධනය කරන්න වෙනවා. එනිසා කාල සීමාව සඳහන් කරන්න වෙනවා. ඒ වගේම පිටු අංක 22 කරුණු 26, දරුවන්ගේ දිවා ආහාරය සම්බන්ධවයි. එහි දවස් 8 බැගින් දෙවතාවක් ගෙවීම් කරනවා. ආචරණ අනුමැතියට යවනවා. 2025.05.14 සිට 2025.05.23 දක්වා ගෙවනවා රු.198,000.00 ක් දවස් 8 ට. එක දවසකට අපිට වැය වෙනවා රු.24,772.00 ක්. මේක සඳහන් කරන්න ඕනෙ. නවක මන්ත්‍රීවරු දන්නේ නැහැ නැත්නම්. පෙර පාසල් කීයක් තියෙනවද? දරුවන් සම්පත්නය කීයක් ඉන්නවද කියලා. ඒ අදාල කමිටු සාමාජිකයන් දැනුවත් ඇති නමුත් අනෙක් සාමාජිකයන් වෙනුවෙන් මේක සඳහන් කළ යුතුයි. දවසට යන වියදම ගැන අපි සාකච්ඡා කරනවා. ඒ වගේම දෙවන පණිවිඩයේදී දවස් 8 කට අපි මුදල් ගෙවනවා. ඒ ගෙවන්නේ රු.291,360.00 ක්. එතැනදී රු.11,000.00 ක පොඩි වැඩි වීමක් තියෙනවා. එතැනදී පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ගිය සැරේ දවස් 8 කට දවසට රු.24,000.00 යි. මේ දවස් 8 ට රු.36,000.00 ක් වෙනවා. එතකොට එතන දරුවන් වැඩි වෙලාද? නැත්නම් අලුත් උත්සවයක් තිබුණද? සැපයුම්කරුවෝ ඉන්නවා තුන් දෙනෙක්. මොනවද මේගොල්ලන්ට දෙන ආහාර? ඔබතුමා පෝෂ්‍යදායී ආහාර තිබුවම ඒ ලැයිස්තුවකුත් තියෙන්න ඕනෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. එච්. අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 33 පිටුව දෙකක නිවැරදි කිරීමක් කරන්න යන්නේ. මේක ඔබතුමා ඇතුළත් කරලා තියෙනවා අත්සන් කරලා මුදල් කමිටුව. මේ මාසය මොකක්ද? හත්වෙනි මාසේ. ඔබතුමා හත්වෙනි මාසේ 25 වෙනිදා කියලයි අත්සන් කරලා තියෙන්නේ. පොඩ්ඩක් ඒක නිවැරදි කරගන්න.

<u>ගරු නගරාධිපති - කේ.ටී. නිශාන්ත ප්‍රදීපානන්ද මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, එය නිවැරදි වෙන්න ඕනෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂීනා ඉක්බාර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, විගණන වාර්තාව යටතේ පිටු අංක 4/15 අපි සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට අධිභාරයක් තියෙනවා මිලියන 1.5 ක්. කාලයක් තිස්සේ එක එනවා. නමුත් විගණන අධිභාරයට රු.1,088,000/- ක් අපි වියදම් ගෙවනවා ඒකට. නමුත් 2020 විගණන වාර්තාවේ අපි රු.1,088,000/- ක් ගෙවපු බවට සඳහනක් තියෙනවා. නමුත් මේ විගණන වාර්තාවට එය ඇතුළත් වෙන්නේ නැහැ, සම්පූර්ණ මුදලම අපි ගෙවිය යුතුයි කියන එක සඳහන් වෙනවා. ඒ නිසා එය සංශෝධනය විය යුතුයි නැත්නම් අපි ඒගොල්ලන්ට ලිඛිතව දැනුම් දිය යුතුයි. අනිත් එක තමයි අගරු චෙක්පත්. අපිට දිගින් දිගටම එනවා අගරු චෙක්පත්. රු.491,288.00 යි වටිනාකම චෙක්පත් 86 ක් තියෙනවා. මේ ව්‍යාපාරිකයෝ අපේ සාමාජිකයන් එක්ක අපි නාම ගනුදෙනු කරනවද නැත්නම් මේක ලබාගන්න කටයුතු කරනවද? නැත්නම මේ විගණන වාර්තාවෙන් ඉවත් කිරීම සඳහා කටයුතු කරනවද? සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුයි නැත්නම් දිගින් දිගටම මේක එනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ 4/15 විගණන වාර්තාවට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහි එක් කෝටි දහසය ලක්ෂ දෙදහස් තුන්සිය දහ අටයි. ඇමුණුම් වල විගණන වාර්තාවේ අංක 1329 දරණ මුදල් සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේ 2018 ජූලි 20 වන දින ලබාදුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ මුදල් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබිණි. මේක වගකිව යුත්තන්ගෙන් අය කරගන්න කියලා ඇවිත් තියෙනවා 11,600,000/- ක්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා අත ඔසවනකොට පරිස්සමෙන් අත ඔසවන්න ඒක තමයි කියන්න තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂීනා ඉක්බාර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පිටු අංක 8/15 මධ්‍යම වෙළඳපොළ කඩ කාමර දෙකක් දීර්ඝ කාලීනව වහලා තියෙනවා ජනෙල් දොරවල් නැති නිසා, විදුලි දොරවල් නැති නිසා. මුදල් උත්පාදනය

ගැන නිතරම කතා කරන අපි මේ සම්බන්ධව අවධානය යොමු කරලා නැහැ. දීර්ඝ කාලයක් අපිට ආදායමක් නැතිව තිබිලා තියෙනවා. ඒ වගේම තමයි වර්ෂය සඳහා 2024 ට මිලියන 300 ක් අපි ඇස්තමේන්තු කරනවා දෙසැම්බර් 31 වෙද්දී 2024 දී අපිට ලබාගන්න හැකිවෙලා තියෙන්නේ මිලියන 81 යි. එතකොට 27% යි අපි අත් කරගෙන තියෙන්නේ. සියයට හැත්තෑ ගණනක් අපිට බැරි වෙලා තියෙනවා. එයට මේ අවුරුද්දේ මුල අපි ලබාගැනීම සඳහා කටයුතු කරලා තියෙනවාද? අපි කරගෙන යනවද දැන් තියෙන ප්‍රගතිය මොකක්ද? එහිත් එක මට කියන්න ඕන අපි කමිටු 9 ක් නියෝජනය කරනවා ඒ වගේම අපි දන්නේ නැහැ මේ සභාවේ පුනරාවර්තන ආදායම කීයද? පුනරාවර්තන වියදම කීයද? ප්‍රාග්ධන ආදායම කීයද? ප්‍රාග්ධන වියදම කීයද? මේ මොකුත් දන්නේ නැතුව අපි කමිටු 9 ක් නියෝජනය කරනවා. ඒ නිසා අපි සියලු දෙනාටම 2025 අයවැය වාර්තාව ලබාදෙන ලෙසත් ඉතා කාරුණාවෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විගණන වාර්තාවේ 5/15 ඡේදයේ 1.7, ප්‍රමාණවත් අධිකාර බලයකින් තොරවූ ගෙවුම්දීම්. එහි (අ) කරුණ, මන්ත්‍රීවරුන් 27 දෙනෙක්ගේ රක්ෂණාවරණයක් සඳහා මිලියන 1.86 කුත් රු.953,000/- කුත් ගෙවලා තියෙනවා. නැවත අය කරගැනීමේ පදනම මත. ඒමක අය කරගෙන නැහැ තවම. කාගෙන්ද අය කරගෙන නැත්තේ සහ ඒ රක්ෂණාවරණය ගැන පොඩි විස්තරයක් කියනවා නම් හොඳයි. ගෙවලා නැත්තේ කවුද කියලා අපිට කියන්න. ඊළඟට ක්‍රියාකාරකම් ගැන එකක් තියෙනවා. ඡේදය 9/15 හි 3.1 කාර්ය සාධනය යටතේ (අ) කරුණ, මොරටුව මහා නගර සභාවේ 2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ව්‍යාපෘති 103 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 31 ක් පමණි. දැන් ඵලදායීතාවය 31% යි. නමුත් අඩු වෙච්ච එකේ, අනිකාල වෙච්ච එකේ මොකුත් සඳහන් කරලා නැහැ. ඒ ගැනත් මීට වඩා විස්තරයක් ලබාදෙනවා නම් ස්තූතිවන්ත වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව සම්බන්ධයෙන් කරුණු විස්තර වලට අමතරව තාක්ෂණික කරුණු ටිකක් තියෙනවා කතා කරන්න. ඔබතුමන්ලාගේ රජය ඔබතුමන්ලාව බලයට ගෙනාවේ හිටපු විපක්ෂය, අනිත් ඔක්කොම, මම එදා කිව්වා වගේ සමස්ත [illegible] බවට පත් කරලා. එතකොට ඔබතුමන්ලාට විශාලමක් තියෙනවා මොරටුව මහා නගර සභාවේ පවා මූල්‍ය බලය සම්බන්ධයෙන් කරපු සම්ප්‍රදායන් ඉවත්කරලා අලුත් කරනවද ඒකෙන් යම්කිසි අවකාශයක් ඇති කරනවද කියලා. මූල්‍ය ගත්තම මෙහෙයුම් පැත්තකුත් තියෙනවා. උපාය මාර්ගික පැත්තකුත් තියෙනවා. මේ වාර්තාව මෙහෙයුම් වාර්තාවක්. මේකට උපාය මාර්ගික පැත්තක් තියෙනවා. අපි කැමතියි ඔබතුමාගෙන් දැනගන්න, මේ නගර සභාව මීට අවුරුදු ගණනාවකට කලින් එවපු වාර්තාම තමයි ඒ ආකෘති, ඒ කරුණුම තමයි ඒ විදිහටම එන්නේ. එතකොට ඔබතුමා ඔබතුමාගේ පාලනය යටතේ මොනාවගේ වෙනස්කම් ද කරන්නේ. ඊළඟ සභාවට ඔබතුමා ඒක ඉදිරිපත් කරන්න ඕන. ඔබතුමා මේ ගිණුම්කරණ පද්ධති සම්බන්ධයෙන්, වැරදි සම්බන්ධයෙන් ඔබතුමා මොනාවද ගන්න නිර්දේශ. මේවා වෙනස් කරන්න. ඔබතුමා විගණන වාර්තාව බලන්න. එහි පළමුවනි පිටුව, මොරටුව මහා නගර සභාවේ විගණන වාර්තා අපි පරිශීලනය කරලා තියෙනවා පසුගිය අවුරුදු තුන හතරකම. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම, ප්‍රමිතියට අනුකූල නොවන කරුණු ගණනාවක් මෙහි තියෙනවා. ඒවා ගිණුම්කරණ වැරදි. මෙතන ඉන්නේ සුදුසුකම් ලත් ගණකාධිකාරීවරු. මෙතන ගිණුම්කරණ දෙපාර්තමේන්තුවක් තියෙනවා. නාගරික ගණකාධිකාරීවරියක් ඉන්නවා. පරිපාලන ක්ෂේත්‍රයේ උසස් නිලධාරීන්. ගිණුම්කරණය ගැන අපි කියලා දෙන්න ඕනේ නැහැ. අපි නීතිඥවරු, ගිණුම්කරණය ගැන අපි කියන්න ඕනෙ නැහැ. ඒක ඒගොල්ලන්ගේ විෂය. ගණකාධිකාරීවරු කොහොමද මේ වගේ තාක්ෂණික වැරදි කරන්නේ කියලා ලොකු ප්‍රශ්නයක් තියෙනවා. මෙතන පළාත් පාලන ආයතන සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2.1 යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් ප්‍රතිග්‍රහනය කර ගිණුම්ගත කිරීම, වත්කම් ක්ෂය කිරීම, ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් ආදායමට හඳුනා

ගැනීම ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණි. දැන් මේ වගේ කරුණු ගණනාවක් තියෙනවා. මේ වාර්තා හැමදාම අවුරුද්දෙන් අවුරුද්දට ඇවිල්ලා විගණකාධිපති මේවා විගණනය කරලා මේ වාර්තා දුන්නට වැඩක් නැහැනේ මේවා වලින් වෙනස්කම් වෙන්නේ නැත්නම්. දැන් ඔබතුමන්ලා රජයට ආවේ, ජනතාවට උද්ඝෝෂණ වේදිකා වල කිව්වේ ඔබතුමන්ලා වෙනස කරනවා කියලා. දැන් ඉතින් වෙනස කරන එක, අපි ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් ඔබතුමා එය කළ යුතුයි මම එදාත් කිව්වා වගේ. මීළඟ පාර විගණන වාර්තාව එනකොට මේ වගේ දේවල් මේකේ තියෙන්න බැහැ. ඔබතුමා නිලධාරීන්ගෙන් මේවා සම්බන්ධයෙන් ප්‍රශ්න කරලා මේවා වෙනස් කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා අපිට ඉදිරියේදී කියන්න ඕන. ඒ වගේම ඔබතුමා කරනු ලබන මෙහෙයුම් වෙනස්කම් මොනවාද? ඔබතුමා කරනු ලබන උපාය මාර්ගික වෙනස්කම් මොනවාද කියලා අපිට දැනුම් දෙන්න කියලා විපක්ෂයේ අපි ඉල්ලනවා.

ගරු නගරාධිපතිතුමනි, මේ වාර්තාවේ තියෙනවා ඔබතුමා බලය ලබා ගැනීමට පෙර කොමසාරිස්තුමිය විසින් කරනු ලැබූ වියදම් ගණනාවක්. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි ඒවා මේ වාර්තාවට ඇතුළත් කරන්න කලින් ඔබතුමා අධ්‍යයනයක් කළාද? මම කොමසාරිස්ට වැරදි කියන්නේ නැහැ, මම අහන්නේ කොමසාරිස් වියදම් කරලා තියෙන ඒවා ඔබතුමා විශ්ලේෂණය කරලා බැලුවද? ඒවා මේකට එවිය යුතුයි ද? දැන් මේ සභාවේ නවක මන්ත්‍රීවරු, මම ඔබලා වෙනුවෙනුයි මේ කතා කරන්නේ, මේ මන්ත්‍රීවරු ඒවට අත එසවුවාම කොමසාරිස් කළ දේවල් වලට මේ මන්ත්‍රීවරුත් වගකීමෙන් බැඳෙනවා. මේ මන්ත්‍රීවරු අපි ඇයි උසරණ කරන්නේ? මම දකින විදිහට නම් හරි නම් ඔබතුමා මේ වාර්තාව කොමසාරිස්ගේ ගිණුම්කරණ ප්‍රකාශ වෙනම, ඔබතුමාගේ ගිණුම්කරණ ප්‍රකාශ වෙනම වාර්තා දෙකක් ඉදිරිපත් කරන්න තිබුණා. ඔබතුමා බලය ගන්න කලින් මොනවාද කොමසාරිස් වියදම් කළේ? කොමසාරිස්ගේ ඒවට ඇයි අපි අත ඔසවන්නේ. මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා ඇයි අත ඔසවන්නේ? මම දකින ප්‍රධාන තාක්ෂණික වැරද්දක්. මේක වැරදි වාර්තාවක් කියලා මම කියනවා. අවසාන කරුණ විගණන වාර්තාව. සුජීව මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ විගණන වාර්තාව කියෙව්වාම ඇඟ කිළිපොලා යනවා. මේකේ තියෙනවා වරිපනම් නොගෙවපුවා, අය කරගත නොහැකි වරිපනම් ආදායම. අපි ආදායම ලබා ගැනීමට මොනවාද කරන්නේ? අපි කමිටු දාලා වරිපනම් කපා හැරලා වැඩක් නැහැනෙ. මේ සභාවට ලැබිය යුතු ආදායම. ඔබතුමාම කෑ ගහලා තියෙනවා අර පුටුවේ ඉඳලා සභාවට ලැබිය යුතු ආදායම ලැබෙන්නේ නැද්ද කියලා. මේවා අය කර ගැනීමට ඔබතුමා කටයුතු කරනවාද? මම ඉල්ලන්න කැමතියි මේ විගණන වාර්තාව විවාද කරන්න සහ මේ විගණන වාර්තාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා. මේක සම්බන්ධයෙන් තමන්ට ඉන්න අයට දැනුම් නැත්නම් එළියෙන් හරි තාක්ෂණික විශේෂඥයෙක් ගෙනැල්ලා මේ සම්බන්ධයෙන් ඔබතුමාලාගේ මූලාශ්‍රමය උපදෙස් ගන්න. මේ එක්දහස් නවසිය හැට ගණන්වල තියෙන වාර්තා. සමන්ලාල් නගරාධිපතිතුමා අවුරුදු 18 ක් හිටියා. ඒ කාලේ දෙන වාර්තා තමයි මේවා. මේවා නිසා තමයි මිනිස්සු හොරකම් කරන්නේ. මේ වාර්තා නිසයි රාජ්‍ය ආයතන වල දූෂණය වඩින්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලනවා ඔබතුමාගේ රජය වෙනසක් වෙනුවෙන් පැමිණියා නම් කරුණාකරලා ඒ වෙනස කරන්න. අපිට නෙමෙයි මහජනතාවටයි ඔබතුමාලා වගකියන්නේ. අපිට කොහොමත් අපි ඔක්කොම හොරු, දේශපාලන ඇස් වලට අපි ඔක්කොම හොරු. අපි සත පහක් වත් හොරකම් කරලා නැහැ. අපි හොරකම් කරලා නැහැ. එහෙම තමයි අපිව හංවඩු ගැහුවේ දේශපාලනය. එහෙම තමයි මිනිස්සු අපිව ප්‍රතික්ෂේප කළේ. ඔබතුමන්ලා 100% ක් නිවැරදියි. ඒ නිසා ඔබතුමාලාට වගකීමක් තියෙනවා ඔබතුමාලාගේ ආදායමයන් රටක් ලස්සන ජීවිතයක් කියන එක යථාර්ථයක් කරන්න. මේවා වෙනස් කරන්න. කරුණාකරලා මේ විගණන වාර්තාවේ මේ මූලික වැරදි තියෙන්න බැහැ ඔබතුමාගේ කාලයේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - වී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලිහිණි මන්ත්‍රීතුමිය කිව්ව කාරණයත් එක්ක මම මේ කාරණය මතු කරන්නේ. මම මෙතනදී අවධානය යොමු කරන්නේ මේ තිබෙන වාර්තා වල අපේ නිලධාරීන්ගේ වැරදි නිසා සිදුවුණ පාඩුවක් තියෙනවා. මේ පාඩුව විගණන වාර්තාවේ සඳහන් කරලා තියෙනවා:

නමුත් මේ පාඩුව නගර සභාවට අය කරගන්න කුමවේදයක් තියෙනවද? ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්නවද? අංක 2 ඒ නිලධාරීන් සම්බන්ධයෙන් රාජකාරිය පැහැර හැරලා තියෙනවද? නිසි උදෙයෝගයකින් කටයුතු කරලා නැහැ. මේ නිලධාරීන්ට විරුද්ධව යම් පියවරක් අරගෙන මේ මුදල්, මේ පාඩුව අය කරගන්න යම් ක්‍රියාමාර්ගයක් ගන්නවද? එහෙම නැත්නම් ඒක හරක පූර්වාදර්ශයක් වෙලා ඉදිරියටත් මේ කතාවම තමයි සිදු වන්නේ. ඒත් එක්කම පසුගිය මන්ත්‍රීතුමා කිව්වා වගේ විගණන වාර්තාවේ 4/15 පිටුවේ, රු.1,1600,000/- ක මුදලක් දැන් ගෙවන්න සිදු වෙලා තියෙනවා. මේ ඒ නිලධාරීන් අවශ්‍ය අවස්ථාවේ නිසි උද්‍යෝගයෙන් කටයුතු නොකිරීම නිසා. මේ සම්බන්ධයෙන් මම හිතන්නේ නඩු වලටත් විශාල වියදමක් යන්න ඇති. ඒ වගේම මේ මුදලත් ගෙවන්න සිදු වෙලා තියෙනවා. නමුත් මේ මුදල අය කරගන්න දැනට අදාළ පාර්ශවයන්, වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විභාගයක්, විමර්ශනයක් සිදු වෙනවද කියන කාරණයත් මට දැනගන්න අවශ්‍යයි. විළඟ කාරණය වෙන්දේසි 86 ක් සම්බන්ධයෙන් කරුණු දැක්වුවා. මේ වෙන්දේසි 86, 1998 සිට 2003 වෙනකම්. නීතිඥවරු කිව්වා විදිහට දැන්නවා මේ වෙන්දේසි සම්බන්ධයෙන් දැන් නීත්‍යානුකූල පියවර ගැනීමට හැකියාවක් නැහැ. අපරාධ නඩුවක් හෝ සිවිල් නඩුවක් පවරන්න හැකියාවක් නැහැ. අපේ මන්ත්‍රීතුමිය කිව්වා වගේ ඒ වෙන්දේසි වල නිලධාරීන්, අයිතිකරුවන් තවදුරටත් කටයුතු කරනවද නැද්ද කියන කාරණය සොයා බැලිය යුතුයි එනම්, මේ වෙන්දේසි සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් අරගෙන මුදල් අය කරගන්න හැකියාවක් නැහැ. නමුත් කාලාවරෝධය කියන නීතිය මඟින් අපිට බාධාවක් තියෙනවා. අවුරුදු 6 ක කාලයක් තුවරයි. ඒ නිසා මම කියන්නේ මේ අඩුපාඩු අපි දැකලා මේවා කතා කරලා මෙතනින් එහාට යනවා කියන්නේ ඒක හරක පූර්වාදර්ශයක්. ඉදිරියටත් මේ ආකාරයෙන්ම කටයුතු කරනවා නම් මේ පාඩුව දිගින් දිගටම නගර සභාවට සිදු වෙනවා. මම යෝජනා කරන්නේ මේ අඩුපාඩු වැරදි නිසා මේ නොසැලකිලිමත් ක්‍රියා නිසා නගර සභාවට යම් පාඩුවක් සිදුවෙලා තියෙනවා. අංක 1 ඒ පාඩුව අය කරගන්න කටයුතු කරන්න ඕන. අංක 2 ඒ නිලධාරීන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවරක් ගන්න ඕන. එහෙම නොවුණොත් මේ හරක පූර්වාදර්ශය මින් ඉදිරියටත් යනවා. ඒ සම්බන්ධයෙන් අදාළ පියවර ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ශ්‍රී. ශාන්තිනී වල්ගම ද සිල්වා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේම නීතිඥ මන්ත්‍රීවරු දෙන්නෙකුත්ම මුලා සම්බන්ධයෙන් කතා කරපු නිසා මම හිතනවා පත්වුණු නගරාධිපතිතුමා වෙනුවෙන් යම්කිසි සාධාරණයක් කරන්න යමක් කතා කළ යුතුයි කියලා. ලිහිණි මන්ත්‍රීතුමියටයි, මධුරංග මන්ත්‍රීතුමාටයි පළමුව මම අවධානය යොමු කරනවා මේ විගණන වාර්තාව ඔබතුමා බලන්න. කොළඹ මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා. එතකොට ඔබතුමන්ලා කියපු කාරණය හරි. හරිම අක්‍රමිකතාවල් තියෙනවා. මේ මුලය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක් නොවෙයි මම සාමාන්‍යයෙන් නීතිඥවරයෙක් මුලා කතන්දරයක් බලන විදිහට බැලුවේ. මට කියන්න තියෙන දේ මෙකයි. විශේෂයෙන් අපේ නීතිඥ මන්ත්‍රීවරු දෙන්නා ඒ කියපු කතා වල යම්කිසි උපදේශයක් දෙනවා අපේ අලුත් නගරාධිපතිතුමාට මේක නිවැරදි කරගෙන ඉස්සරහට යන්න ඕන කොහොමද කියලා. එතනදි මම ඒක පිළිගන්නවා. නමුත් මම අකමැති කතන්දරයක් ලිහිණි මන්ත්‍රීතුමියගෙන් කියවුණා අපේ ජාතික ජන බලවේගයේ පක්ෂපාලන වගයෙන් අපි ගෙනිච්ච කටයුතු පාඨ ගැන මෙතන කතා කරන්න එපා මොකද ඒ සටන් පාඨය අපි ඉතුරු අවුරුදු පහේම ගෙනියනවා. අනාරුන් කියන කතාව තොනමයි මෙතන තියෙන්නේ. අපි පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන දෙයට අනුගත වෙලා අපි 26 දෙනාම ඇවිත් ඉන්නේ. අපි පඩිය එපිට ගෙදර ගෙනියන්නේ නැහැ. අපි ඇවිල්ලා ඉන්නේ ඒ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන එක හදන්න තමයි. අපිට වෙන අරමුණක් නැහැ. එතකොට ඔබතුමියන්ලාගේ කාලය මේ නගරාධිපතිතුමාට එල්ල කරළ විගණන වාර්තාවත් එක්ක සම්බන්ධ කරලා හරියට මේ නගරාධිපතිතුමාගේ කාලයේ මේ විගණනයේ තිබුණු කාරණාවල් වුණා කියලා. ඔබතුමිය ඒ ආදර්ශය දෙන්න. මට විශේෂයෙන් කියන්න ඕන ඔබතුමියන්ලා අපට දෙන ආදර්ශය ඉස්සරහට ගෙනියන්න ඕන ක්‍රමය ගැන කියන එක ගැන අපි 100% ක් එකඟයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුජීව් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කෙටියෙන් මම ආණ්ඩු පක්ෂයේ විපක්ෂයෙන්ම ජාතික ජන බලවේගයේ මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා ලිඛිත මන්ත්‍රීතුමිය සඳහන් කළ කරුණු, ඉතින් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා සඳහන් කරන කරුණු, අපි සඳහන් කරන කරුණුත් විලිගයෙන් අල්ලන්නේ නැතුව මිලදීවත් අල්ලගන්න එහෙම නැති වුණොත් ගැන කතාවට විලිගහන් අල්ල ගත්තොත්. අපි මේ කරුණු ගැන කතා කළේ ඔබතුමන්ලාගේ යහපතත් එක්ක. එහෙම නැතුව ඔබතුමන්ලා දේශපාලනිකව මඩ ගහන්න හෝ අපහසුතාවයකට පත් කරන්න නෙවෙයි. ලිඛිත මන්ත්‍රීතුමිය ඉතාමත් වැදගත් කාරණා ටිකක් හරියටම ඉලක්ක කරලා අවශ්‍ය තැනට කිව්වේ. ඒක කිව්ව නිසාන්න අපේ නගරාධිපතිතුමාවත් ඔබතුමන්ලාවත් අපහසුතාවයට පත් කරන්න නෙවෙයි නැවත වරක් හිතන්න පොළඹවන්න ඒක කිව්වේ. ඔබතුමියලා කිසිම වැරදි විදිහට අන්දලම ගත්තොත් ගරු ආණ්ඩු මන්ත්‍රීතුමන්ලා අපිව වරදවා තේරුම් ගත්තොත් උපේ සරත් මන්ත්‍රීතුමා නිතරම කියපු කතාවක් තියෙනවා චෙක් ඇන්ඩ් බැලන්ස් කියලා. මෙහෙම ගියොත් චෙක් වෙන්නෙත් නැහැ බැලන්ස් වෙන්නෙත් නැහැ. චෙක් මේට් වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සජිත් ප්‍රවීන්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපේ මහරගමුවේ නගරාධිපතිතුමා. මේ සියලු කාරණා එක්ක ගත්තදී ඒක කිව්වේ නගරාධිපති සම්මන්ලාගේ මිත්‍රතුමා කළා ද, තියෙන්න පුද්ගලයෙක් මිත්‍රතුමා, සහෝදරයා කළාද කියන ප්‍රශ්නය නෙවෙයි මම කතාව එන්නේ පෞද්ගලික පුද්ගලභාවයක්. නගරාධිපති කියන්නේ පෞද්ගලික පුද්ගලභාවයක්. ඒ නිසා මේ පෞද්ගලික පුද්ගලභාවයට තමයි තදු දාන්නේ. ඒ නිසා ඒක ඉදිරියට ගෙනියන්න එපා මිනු. නාගරික කොමසාරිස්තුමියගේ පෞද්ගලික පුද්ගලභාවයක් තියෙන කෙනෙක්. නියෝජ්‍ය කොමසාරිස්තුමාත් එහෙමයි. මහා නගර සභා ආණ්ඩු පක්ෂිත් අපිට බලය පවරලා තියෙන්නේ පෞද්ගලික පුද්ගලභාවයක් තියෙන නිසා. ඒ නිසා මම හිතන්නේ මේ තදු කැපේ වෙනත්, පරණ තදු වුණත් ඉස්සරහට ගෙනියන්න එපා ඔබතුමා තමයි ඒ නාවුව. ඒ පෞද්ගලික පුද්ගලභාවය ආරක්ෂා කරගැනීම සහ නගරාධිපති ධුරයේ වගකීම භාරගැනීම, ඒවා ආරක්ෂා කරගැනීම පක්ෂයේ ඉන්න ඔබලාමියලා වගේම විපක්ෂයේ ඉන්න අප සතු යුතුකමක් හා වගකීමක් මේකාද මේ තිකත් කෙනෙකුත් නෙවෙයි නගරයේ ඉන්න ප්‍රධාන පුරවැසියා. මෙහි ඉන්න ප්‍රධාන නිලධාරිතුමිය තමයි කොමසාරිස්තුමිය. ඒ නිසා අපි කොහොමත් වාද විවාද තිබුණත් අවසාන වශයෙන් අපි මේ නගරයේ සුභසිද්ධිය වෙනුවෙන් තමයි වැඩ කරන්නේ. ඒ නිසා ඒක මතක් කරන්න එපා. විළඟ කාරණාව මේ කාරණාවට අදාළ නොවුණත් ඔබතුමාගේ සහ අපේ සභාවේ මුළු අවධානය යොමු කරනවා අද දවසේදී රු.5000/- නොවටිනා ලක්ෂ ගණනක් කොටස් කොළවටු සංසරණය වෙලා අපි නගරයට මහරගම පොලීසියෙන් ඒක අල්ලගෙන තියෙනවා. ඒ නිසා මෙට දවසේත් ගරු කොමසාරිස්තුමියනි අපේ මේ වර්ධනයේ අංශයට, ඒ වගේම අංශවල තැපැල් වලට රු.5000/- කොළ නෝට්ටු එන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ඔබතුමියලාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ වගේම මීට පෙර මුදල් කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වුණු ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු කියන අලුත් දෙයක. ඒ අදහසත් එක්ක තමයි මෙතුමියගේ මූල්‍ය කරගලාවයි පිළිබඳ ඉදිරිපත් කිරීමේ පහසුව සඳහා. ගෞරවයෙන් මම කිව්වා ඔබතුමාට එදාත් අපිට ඉදිරියට කාර් වුණත් වැඩ කරන්න බැරි තත්ත්වයක් තමයි මතු වෙන්නේ. සභාව ප්‍රසම්පාදන කමිටුවක් බවට පත් වෙන්නත් පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා මේක දෙපාර්තමේන්තු අංශාධිපති වලට ඉදිරිපත් කරපු ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු ව්‍යුහය මේ නගර සභාව වලට ගෙන ඒම පිළිබඳ නැවත වතාවක් සලකා බලන්න කියන එක අදාළ අංශාධිපතිවරුන්ට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඔබතුමා ඊයේ තිබුණ කමිටුවට පත්වෙන්නේ. ඊට පෙර ඒවාත් ආවරණ අනුමැතියට යවන් වෙලා තියෙනවා. මෙතෙක් අපිටත් ඡන්දය දෙන්න එපා අයිතිය ගොඩක් තියෙනවා. මේක වෙන ඉවතට තවත් කොහොමත් තුළ මම හිතන්නේ ඒ අවස්ථාවත් අපට මඟහැරෙන්න පුළුවන්. ගොඩක් අයිතිය තියෙනවා මුදල් කමිටුවේ අපිට ඡන්දය දෙන්න. මෙතුමාත් සඳහන් කරයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබගේ පක්ෂපාතී වෙන්න පුළුවන් හොඳ අයිතම තියෙනවා. ඒක පැහැදිලිව කියන්න ඕන. නමුත් අපිට ප්‍රශ්නයක් තියෙනවා මෙහි කාලවමක් තියෙන්නේ. ඒ නිසා අපිට අනුමත කරන්න බැහැ. ඒ නිසා විපක්ෂයක් හැටියට අපි මුදල් කමිටුවට විරුද්ධ වෙනවා. හේතුව ඔබතුමාගේ කාලයේ විතරක් නොවෙයි ඊට පෙර ගනුදෙනුත් තියෙන නිසා ඒකට අවසාන වෙන්න බැරි නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමින්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මූල්‍ය බලතල පැවරීම සම්බන්ධයෙන් මොකක් හෝ ප්‍රකාශයක් කරනවද ? අපි මුදල් කමිටුවේදී ඒක තීන්දු කලේ නැහැ නමුත් මෙතනට ඇවිල්ලා තියෙනවා. සාධාරණ අනුමැතියකට යටත්ව කටයුතු කරන්න අපි කතා කරගත් පරිදි. අපි සර්වජන බලවේග පක්ෂය වශයෙන් අපි සමස්ත මුදල් කමිටුවට නිහඬ විරෝධයක් සිදු කරනවා.

<u>ගරු නගරාධිපති - එන්.ඩී. නිශාන්ත ප්‍රදීකාන්ත මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම එකින් එක කියන්නේ නැහැ. කියන්න තිබුණා නම් හොඳයි. මේ වෙලාවේ බොහෝම අසීරුතාවයකට පත්වෙලා තියෙන්නේ නිලධාරීන්, හැබැයි අපි දන්නවා ඊට වඩා අපි අසීරුතාවයට පත් වෙනවා මේ තත්ත්වය මේ ආකාරයට මෙහෙම ගියොත්. ඒ නිසා මම හැම මන්ත්‍රීවරයෙකුටම ස්තුතිවන්ත වෙනවා මොකද පසුගිය කාලයේ තිබුණු ඉතාම හදිසි තත්වය කාර්ය බහුලතාව විසින් අම්බර ගම කියවා ගැනීම වලට අදාලත්වය, නමුත් ඒක නීතිය ඉදිරිපත් නිවැරදි කාරණාවක් නොවෙයි. ඒ නිසා ඔබ දන්නවා මම හැමදාම මේ මුදල් කමිටුව ඉතාම හොඳින් අනෙකුත් වාර්තා සමග කියවලා මේ සභාවට අපු කෙනෙක්. ඔය ඇතිවුණු තත්ත්වයම මෙතෙක් පතුරු වලියක්. මේ බලය බෙදීම කියන කාරණාව සම්බන්ධයෙන් ඉතාම අසීරු තත්වයකට මම මුහුණ දුන්නා. ඔබ දන්නවා රු.15,000/- ක් උඩ කොමසාරිස්තුමියට වියදම් කරන්න බැහැ. එතකොට ඒකත් එක්ක නගරාධිපතිවරයා මුහුණ දෙන අසීරුතාවය තමයි බොහෝ සේවකයින්ගේ ඉඳලම අතිකාල ඊට උඩින්. මට වෙන වැඩක් කරන්න නැහැ. අතිකාල ලිපිගොනුවේ ඉදලම අත්සන් කරමින් ඉන්න වෙනවා. ඒ නිසා හරිම අසීරුතාවයකට පත්වුණා. ඒ නිසා නියමිත ගාණකට යටත්ව මේ බල බෙදීම කරගන්නේ නැත්නම් සභාව කරගෙන යන්න බැහැ. නමුත් ඔබ මේ මතු කරපු එක හරි වැදගත්. ඒ මතුකලේ අපි එකඟ වුණු ඇමුණුමින් නොවෙයි මේ ඇවිල්ලා තියෙන්නේ. මෙතන විශාල ගැටලුවක් තියෙනවා. ඒ නිසා මේ අපි ඉවත් කරපු ඇමුණුමත් ඇවිල්ලා. ඒ නිසා මම මේ ගැන සොයා බැලුවොත්, විශේෂ කාරණාව වුණේ මැන් පවර් කාරණාට අදාලව තමයි මෙම ඇමුණුම ඇවිත් තියෙන්නේ. ඒ නිසා ලේකම්තුමියගේ පැහැදිලි කිරීම මෙම ඇමුණුම ඉවත් කරන්න. ඉවත් කළාට කමක් නැහැ. ඒක එහෙම වෙන්න ඕන. නමුත් ඊළඟ මුදල් කමිටුවට කොමසාරිස්තුමියට තිබිච්ච ප්‍රමාණ ඒ බලය ලබාදිය යුතුමයි. නැත්නම් මේ කටයුතු කරගෙන යන්න බැහැ. ඒ කියන්නේ රු.500,000/-ක් පහළ වියදම් දරන්න කොමසාරිස්තුමියටත්, රු.1,000,000/-ක් පහළ නගරාධිපතිවරයාටත්, ඊට උඩ සභාවටත් බලය ලබා දීම සම්බන්ධව ඊළඟ මුදල් කමිටුවේ සාකච්ඡා කරලා තමයි ඒ කටයුත්ත කරන්න වෙන්නේ. ඒ නිසා පසුගිය කාලයේම මේ තත්ත්වය විසින් සිදුවුණු බලපෑමේ ප්‍රතිඵල තමයි මේ ඔබ ගොඩක් ඒවා අරගෙන පෙන්නුවේ. ඒ නිසා මුදල් කමිටුවට යටත වෙනම පැහැදිලි කිරීම තිබුණොත් දැන් කරන්නේ නැහැ. මම හිතනවා මේ විගණන වාර්තාවට මේ මන්ත්‍රීවරු අද අත් තියලා සම්මත කලොත් ඒක වැරදක් වෙයි. මම හැමදාම හිටියා එතන සහ මෙය තවත් අධ්‍යයනය කළ යුතුයි. අධ්‍යයනය කරලා අපි ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග මොනවද කියලා සාකච්ඡා කළ යුතුයි. අද මම හිතනවා මුදල් කමිටුව අනුමත වෙනකොට මෙය අනුමත වෙනවා. මීට පෙර කරපු වැරදි ගොඩක්, විගණනය විසින් පෙන්නවලා තිබෙන බොහෝ දේවල් අපි අදහස් පළ කරගැනීමකින් තොරව අනුමත කළ බවට සම්මත වෙනවා. තවදුරටත් අධ්‍යයනය කරලා, නැවත සාකච්ඡා කරලා අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව තිබිය යුතුයි. ඒ නිසා මුදල් කමිටුවේ අංක 09 කරුණ 2024 විගණන වාර්තාව ඉවත් කරනවා. මුදල් කමිටු වාර්තාවේ අංක 38 කරුණේ, ඇමුණුම 12 ඉවත්කර මුදල් කමිටුව අනුමත කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒක කරන්න බැහැ. ඇමුණුම සම්පූර්ණයෙන්ම අයින් කරනවා නම් කරන්න පුළුවන්. නැත්නම් ඔබතුමා කොහොමද අර කෑල්ල විතරක් තියලා අනිත් ඒවා අයින් කරනවා කියලා කියන්නේ. අයින් කරනවා නම් සම්පූර්ණයෙන්ම අයින් කරන්න.

**<u>ගරු නගරාධිපති - එස්.ඩී. නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, අංක 38 කරුණේ මැන් පවර් එක ගැන ඇමුණුම ඇවිත් තියෙන්නේ. ඒ ඇමුණුම 12 ඉවත් කරනවා. ඒ නිසා අපි ඇමුණුම අයින් කරලා මැන් පවර් එක මාස තුනකින් දීර්ඝ කරන්න අනුමත කරමු. බලය පැවරීමට අදාළව මුදල් කමිටුවට අවශ්‍ය විදියට කාරණා ටික පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරනවා. අංක 09 කරුණ විගණන වාර්තාව පිළිබඳ කමිටුවේදී නැවත සලකා බලා සභාවට ඉදිරිපත් කරන්න එනතෙක් මුදල් කමිටුවට ඡන්දය විමසනවා.

**2025.07.01 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09 කරුණ හැර අංක 38 හි සඳහන් නිර්දේශයේ ඇමුණුම 12 ඉවත් කිරීමට යටත්ව සියලු කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - එස්.ඩී නිශාන්ත ප්‍රනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රකාශනී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. ගුණදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ලක්ෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමින් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.සී. ජසවිට්නදි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සී. යෝගේෂ ප්‍රියදර්ශන අමෝන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.ජේ. හර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.ජේ. ශ්‍රියංග මහේෂ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ජේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - සුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ටී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2025.07.01 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09 කරුණ හැර අංක 38 හි සඳහන් නිර්දේශයේ ඇමුණුම 12 ඉවත් කිරීමට යටත්ව, අංක 04(1), අංක 12, අංක 14, අංක 15, අංක 16, අංක 17, අංක 26, අංක 36(3), අංක 38 යන කමිටු නිර්දේශයන්ට සංශෝධිත අනෙකුත් කමිටු නිර්දේශයන්ට විරුද්ධවන් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සී ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.සුදීප් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ පෙරමියපෝත් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සචින් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - පු. සුදේශ් ශ්‍රියාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - පු.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - පු.එල්. තක්ෂිලා දමයන්ත ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - කෙමිරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - සිත්නි මයිනා ඔන්කාර් මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි තුෂාන්දිකා කුමරි මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එස්. විදුන් තරංගමින් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. මෙයාන් දුලිප් තිසේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රශාන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී. ජෙරොන්ඩන් නිරංකා ක්‍රිස්ටිල්කාන්ත මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා නිලන්මණී ප්‍රනාන්දු මෙනෙවිය
19. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන විලානවිතානගේ මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී. රංජලා එස්. ජයතුංග මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - බී.එම් මනෝජ් මධුරංග විජේරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - කේ. දිනූෂි ගෝනමලතා පෙරේරා මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්. තිලිනි ගොනපරණී මෙනෙවිය

**2025.07.01 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09 කරුණ හැර අංක 38 හි සඳහන් නිර්දේශයේ ඇමුණුම 12 ඉවත් කිරීමට යටත්ව, සියලු කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ටී. සමින්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ශ්‍රේෂ්ඨකුමාර ප්‍රනාන්දු මහතා

**2025.07.01 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09 කරුණ හැර අංක 38 හි සඳහන් නිර්දේශයේ ඇමුණුම 12 ඉවත් කිරීමට යටත්ව, සියලු කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

## 07. <u>වෙනත් කරුණු</u>

**07 (1)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා ලිපිද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධව හා මේ සියලුම මන්ත්‍රීවරුන්ට ලිපි ශීර්ෂ ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපි ලිපි ශීර්ෂ ඉක්මනට ලබාදෙනවා.

**07 (2)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නව සභා වාරයෙ තේරී පත්වූ සියලුම මහා නගර සභා මන්ත්‍රීවරුන්ගේ සමූහ ඡායාරූපය ලබාගන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම අපේ මන්ත්‍රීවරු පනස් දෙදෙනාගේම කොට්ඨාශය සහ දුරකථන අංක ටික ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, දැන් වට්ස්ඇප් ගෲප් එක් හැදුවාම ඒකට දාන්න පුළුවන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම සියලුම මන්ත්‍රීවරුන්ගේ හැඳුනුම්පත සාදා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අ.කලේ　කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2025.07.15 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.

2025.08.12 දිනැති මාසික සභා රැස්වීමේදී සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත වූ 2025.07.15 දිනැති මාසික සභා රැස්වීම් වාර්තාවේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

2025.09.02 වන දින,

මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.

ගරු නගරාධිපති,
මොරටුව මහා නගර සභාව.

කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු
නිල නොලත් මහේස්ත්‍රාත් හා සාම විනිසුරු
නගරාධිපති
මොරටුව මහා නගර සභාව